199 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 199 - இல. 7
**Volume 199 - No. 7**

2011 ජූනි 07 වන අඟහරුවාදා
2011 யூன் 07, செவ்வாய்க்கிழமை
**Tuesday, 07th June, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශ:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ඉන්දියානු නියෝජිතයන් විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ නිවේදනය:**
විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
ස්වාභිමානී දහම් සවිය (සංස්ථාගත කිරීමේ) - [ගරු ශාන්ත බණ්ඩාර මහතා] - පළමුවන වර කියවන ලදී

**ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත:**
නියෝගය

**මුදල් පනත:**
නියෝගය

**ආනයන හා අපනයන (පාලන) පනත:**
නියෝග

**රේගු ආඥාපනත:**
යෝජනාව

**ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත:**
නියෝග
නියමය

**කල්තැබීමේ යෝජනාව:**
කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ පැවැති සිද්ධියේදී මියගිය අයට සහ දේපළ හානිවලට වන්දි


# பிரதான உள்ளடக்கம்


**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**வெளிநாட்டலுவல்கள் அமைச்சர் மற்றும் இந்தியப் பிரதிநிதிகள் விடுத்த கூட்டறிக்கை:**
வெளிநாட்டலுவல்கள் அமைச்சரினது கூற்று

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
சுவாபிமானி தஹம் சவிய(கூட்டிணைத்தல்) - [மாண்புமிகு சாந்த பண்டார] – முதன்முறை மதிப்பிடப்பட்டது

**பதிவு செய்யப்பட்ட பங்குத்தொகுதி மற்றும் பிணையங்கள் கட்டளைச் சட்டம்:**
கட்டளை

**நிதிச் சட்டம் :**
கட்டளை

**இறக்குமதிகள் ஏற்றுமதிகள் (கட்டுப்பாட்டுச்) சட்டம்:**
ஒழுங்குவிதிகள்

**சுங்கக் கட்டளைச் சட்டம்:**
தீர்மானம்

**கொடுப்பனவு உபாயங்களின் மோசடிகள் சட்டம்:**
ஒழுங்குவிதிகள்
கட்டளை

**ஒத்திவைப்புப் பிரேரணை:**
கட்டுநாயக்க சுதந்திர வர்த்தக வலயத்தில் இடம்பெற்ற ஆர்ப்பாட்டத்தின்போதான மரணம் மற்றும் சேதங்களுக்கு நட்டஈடு


# PRINCIPAL CONTENTS


MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ORAL ANSWERS TO QUESTIONS

JOINT STATEMENT MADE BY MINISTER OF EXTERNAL AFFAIRS AND REPRESENTATIVES OF INDIA :
Statement by Minister of External Affairs

PRIVATE MEMBERS' BILLS:
Swabhimani Daham Saviya (Incorporation) – [The Hon. Shantha Bandara] – Read the First time

REGISTERED STOCK AND SECURITIES ORDINANCE:
Order

FINANCE ACT:
Order

IMPORTS AND EXPORTS (CONTROL) ACT:
Regulations

CUSTOMS ORDINANCE:
Resolution

PAYMENT DEVICES FRAUDS ACT:
Regulations
Order

ADJOURNMENT MOTION:
Compensation for Death and Destruction at Katunayake Free Trade Zone Incident

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2011 ජුනි 07 වන අඟහරුවාදා***
*2011 யூன் 07, செவ்வாய்க்கிழமை*
*Tuesday, 07th June, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා ] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA ] *in the Chair.*

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශ
## சனாதிபதியிடமிருந்து வந்த செய்திகள்
## MESSAGES FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

පහත දැක්වෙන සන්දේශ අතිගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා

### I

**"ශ්‍රී ලංකා ජනාධිපති**
இலங்கை சனாதிபதி
President of Sri Lanka

ජීජේඑල්/ඊආර්/146-12

2011 මැයි මස 30 වන දින.
කොළඹ දී ය.

ගරු කථානායකතුමනි,

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ 2011 මැයි මස 30 දාතමින් කරනු ලබන ප්‍රකාශනය මගින් ඉහත කී ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන, ශ්‍රී ලංකාව මුළුල්ලේ ම වර්ෂ 2011 මැයි මස 30 වන දින සිට ක්‍රියාත්මක විය යුතු බව මවිසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත කී ප්‍රකාශනය කිරීමට හේතුව මහජන සාමය ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාම සඳහා බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරමින් පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මහින්ද රාජපක්ෂ

පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා."

### II

**"ශ්‍රී ලංකා ජනාධිපති**
இலங்கை சனாதிபதி
President of Sri Lanka

අංකය : ජීජේඑල්/308

2011 ජුනි මස 06 වන දින
කොළඹ දී ය.

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයෙන් මා විසින් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සියලුම සාමාජිකයින් දිවයිනේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ සක්‍රිය සේවය සඳහා කැඳවන ලදී.

ඉහත කී ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව ත්‍රස්තවාදය සහ යම් මහජන කැළඹීමක් වැළැක්වීම සහ මැඩ පැවැත්වීම පිණිස බව පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මහින්ද රාජපක්ෂ"

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

(i) 2010 වර්ෂය සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2010 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2009 වර්ෂය සඳහා මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්.- [රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2007 වර්ෂය සඳහා තල් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2008 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### අකුරැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල් : යටිතල පහසුකම්
### அக்குரஸ்ஸ கோட்டக் கல்விக் காரியாலயம் நிருவகிக்கும் பாடசாலைகள்: உட்கட்டமைப்பு வசதிகள்
### SCHOOLS ADMINISTERED BY AKURESSA DIVISIONAL EDUCATION OFFICE : INFRASTRUCTURE FACILITIES

0802/'10

2. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අකුරැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවන්ගේ ඌනතාවන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව; සහ

(vi) ඉහත අඩු පාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩු පාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் அக்குரஸ்ஸ வலயக் கல்விக் காரியாலயத்தின் கீழ் வரும் அக்குரஸ்ஸ கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படுகின்ற பாடசாலை களில் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொதுத் தேவைகளில் பற்றாக்குறை காணப்படுகின்ற தென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி பாடசாலை முறைமையினுள் உள்ள,

(i) மின்சார வசதியில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) நூல்நிலையம் மற்றும் விஞ்ஞான ஆய்வுகூட வசதிகளில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iv) மின்சார வசதியில்லாத ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(v) தளபாடம் தேவையாகவுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(vi) மேற்படி குறைபாடுகள் நிலவுகின்ற பாடசாலை களின் பெயர்கள், முகவரிகள், தொலைபேசி இலக்கங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி பாடசாலைகளில் நிலவுகின்ற குறை பாடுகளை நிவர்த்தி செய்வதற்கு தேவையான நிதி ஒதுக்கீட்டினை மேற்கொள்வதற்கு அவர் நடவடிக்கையெடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்கு மென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that there is a shortage of infrastructure facilities and common amenities in the government schools administered by the Akuressa Divisional Education Office of the Akuressa Zonal Educational Office in the Matara District ?

(b) Will he state in relation to the above schools-

(i) the number of schools without electricity;

(ii) the number of schools without library and laboratory facilities;

(iii) the number of teachers' quarters;

(iv) the number of teachers' quarters without electricity;

(v) the number of schools with furniture requirements; and

(vi) the names, addresses and telephone numbers of schools with aforesaid shortages?

(c) Will he state-

(i) whether arrangements will be made to allocate the required funds to fulfil the shortcomings in the aforesaid schools; and

(ii) if so, the period of time taken for it?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා ( අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්. ඌනතාවන් සමනය කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) (i) විදුලිය නොමැති පාසල් 05.

(ii) පුස්තකාල සහ විද්‍යාගාර ශිෂ්‍ය සංඛ්‍යාව අනුව තීරණය වේ.

(iii) ගුරු නිවාස සංඛ්‍යාව 05.

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව 02.

(v) ලී භාණ්ඩ අවශ්‍යතා ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ලබා දේ.

(vi) ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ඇ) (i) අදාළ නැත.

(ii) අවශ්‍ය ප්‍රතිපාදන ලැබීම අනුව කාලය තීරණය වේ.

(ඈ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***

*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*

*Annex tabled:*

විදුලිය නොමැති පාසල් - අකුරැස්ස කොට්ඨාස අධ්‍යාපන කලාපය

| අනු අංකය | කොට්ඨාසය | පාසලේ නම | ලිපිනය |
|---|---|---|---|
| 01 | අකුරැස්ස | මාර/ ඇල්ලෙවෙල ක.වි. | මාරඹ |
| 02 | අකුරැස්ස | මාර/ බලකාවල ක.වි. | බලකාවල |
| 03 | අකුරැස්ස | මාර/ දිගනහේන ක.වි | දිගන ලේගම |
| 04 | අකුරැස්ස | මාර/ වැලිකැටිය ක.වි. (කොටසකට පමණක් ඇත.) | මල්දූව |
| 05 | අකුරැස්ස | මාර/ පහුරත්විල ධර්මරාජ ක.වි. | අකුරැස්ස |

විදුලිය නොමැති ගුරු නිවාස - අකුරැස්ස කොට්ඨාස අධ්‍යාපන කලාපය

| අනු අංකය | කොට්ඨාසය | පාසලේ නම | ලිපිනය |
|---|---|---|---|
| 01 | අකුරැස්ස | මාර/ බෝපිටිය ක.වි. | බෝපිටිය |
| 02 | අකුරැස්ස | මාර/ ගල්ලෙක.වි. | ගල්ලෙ, අකුරැස්ස |

**ගරු බුද්ධික පතිරණ මහතා**

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි.

සමහර ගුරුවරු ප්‍රධාන මාර්ග අසල පාසල්වල වසර 10ක් 15ක් ඉන්නවා. ඒ නිසා ප්‍රශ්නයට අදාළ මේ කලාපයේ සමහර දුෂ්කර පාසල්වල -ඈත ප්‍රදේශවලට වන්නට ඇති පාසල්වල- ගුරු හිඟයක් තිබෙනවා. ගුරු තුලනය පිළිබඳව අපි වසර ගණනාවක් තිස්සේ කථා කළත් ගුරු තුලනය ප්‍රායෝගික තත්ත්වයකට ගිහින් නැහැ.

**කථානායකතුමා**

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්න අහන ක්‍රමයක් තිබෙනවා. ඒ ක්‍රමය අනුගමනය කළොත් හොඳයි. දෙන පිළිතුරට අනුව අතුරු ප්‍රශ්න කෙටියෙන් අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගුරු තුලනය සඳහා අමාත්‍යාංශය විධියට මැදිහත් වෙලා කුමන ක්‍රියා මාර්ගයක් ගන්නවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, අවශ්‍යතා සලකා බලා, ඒ අවශ්‍ය ගුරුවරු විෂයානුබද්ධව තුලනය කරන්න කියා අපි දිගින් දිගටම පළාත් සභාවේ පළාත් අධ්‍යාපන ඇමතිවරයාට උපදෙස් දීලා තිබෙනවා. එතුමා මඟින් කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයටත්, පළාත් අධ්‍යාපන කාර්යාලයටත් අපි දැනුම් දීලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි. මේ කලාපයේ සහ අනෙකුත් සියලු කලාපවලත් තොරතුරු තාක්ෂණ විෂය සම්බන්ධයෙන් බරපතළ ගුරු හිඟයක් ඇති වෙලා තිබෙනවා. තොරතුරු තාක්ෂණ ගුරුවරුන් වැඩි ප්‍රමාණයක් පුහුණු කරන්නටත්, එම පාසල්වලට ඒ අය යොමු කරන්නටත් යොදන ක්‍රමවේද මොනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)

(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, ගම්බද පාසල්වලට තොරතුරු තාක්ෂණ විෂය හඳුන්වා දුන්නේ වර්තමාන රජය තුළිනුයි. විදුලිය නොමැති පාසල්වලට පවා තොරතුරු තාක්ෂණ මෙවලම් ලබා දීලා, සූර්යතාපයෙන් විදුලිබලය ලබා දීලා ඒ අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. මේ අංශයේ විශාල ගුරු හිඟයක් තිබෙනවා. ඒ නිසා මේ ගුරු හිඟය වළක්වා ගන්න රජයට අයිති පුහුණු මධ්‍යස්ථානවල ගුරුවරු පුහුණු කරනවා. ගරු කථානායකතුමනි, ඒ වාගේම පෞද්ගලික ආයතන මඟිනුත් දැනට ඒ පුහුණු කිරීම් විශාල ප්‍රමාණයෙන් ගෙන යනවා. ගරු කථානායකතුමනි, තාක්ෂණය ගමට ගෙන යාම සඳහා මධ්‍යම රජය ප්‍රබල මැදිහත් වීමක් කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මගේ අවසන් අතුරු ප්‍රශ්නය මෙසේයි. රජයේ සැලසුම් අනුව තොරතුරු තාක්ෂණ ගුරු හිඟයෙන් අවම වශයෙන් සියයට 80ක්වත් සම්පූර්ණ කරන්නට වසර කීයක් ගත වනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, එපමණ දීර්ඝ කාලයක් ගත වන්නේ නැහැ. ප්‍රශ්නය මේකයි. දැනටමත් ගුරුවරු මේ කටයුතු කර ගෙන යනවා. නමුත් ගුරුවරුන්ට වඩා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉදිරියෙන් ඉන්නවා. ඇත්ත කථාව ඒකයි. ඒ නිසා අපට ඉතා පුහුණු ගුරුවරුන්ගේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ ගුරුවරු ලබා දීමට අපි ඉතා ඉක්මනින් කටයුතු කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 3-0880/'10-(3), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම ගරු අධිකරණ අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, තුන්වැනි වරට අහන ප්‍රශ්නයකටයි මේ මාසයක් කල් ඉල්ලන්නේ.

මේක උත්තර දෙන්න බැරි විධියේ ප්‍රශ්නයක්ද දන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
උත්තර දෙන්න පුළුවන්. මාසයකින් උත්තර දෙන්න බලන්නම්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මාසයකින්? හොඳයි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වතුකරයේ ගර්භිණී මවුවරුන්ගේ මන්දපෝෂණය : ක්‍රියාමාර්ග
## பெருந்தோட்டத்துறை கர்ப்பிணித் தாய்மாரின் போஷாக்கின்மை: நடவடிக்கை
## MALNUTRITION IN PREGNANT MOTHERS OF ESTATE SECTOR: MEASURES TAKEN

1030/'10

4. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1) :

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ වතුකරයේ මන්ද පෝෂණයෙන් පෙළුණු ගර්භිණී මවුවරුන්ගේ ප්‍රතිශතය කවරේද;

(ii) එම මන්ද පෝෂණ තත්ත්වයන් මඟහැර වීමට රජය ගන්නා වූ පියවර කවරේද;

(iii) එම පියවර වතුකරයේ ගර්භිණී මවුවරුන්ගේ මන්ද පෝෂණය මඟ හැරවීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டு இறுதியளவில் இலங்கையில் பெருந்தோட்டத்துறையில் போஷாக்கின்மையால் பாதிக்கப்பட்டிருந்த கர்ப்பிணித் தாய்மார்களின் சதவீதம் எவ்வளவென்பதையும்;

(ii) இப்போஷாக்கின்மை நிலைமைகளைப் போக்கு வதற்கு அரசாங்கம் மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி நடவடிக்கைகள் பெருந்தோட்டத்துறையில் கர்ப்பிணித் தாய்மார்களின் போஷாக்கின்மையைப் போக்குவதற்கு போதுமானவையா என்பதையும்

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state-

(i) the percentage of pregnant mothers in the estate sector of Sri Lanka, who suffered from malnutrition as at the end of year 2010;

(ii) the steps to be taken by the Government to arrest that state of malnutrition;

(iii) whether such steps are sufficient to arrest the state of malnutrition prevalent among the pregnant mothers in the estate sector?

(b) If not, why ?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 41.7%

(ii) * සෑම ගර්භිණී මවකටම සති දොළහෙන් පසුව හා ප්‍රසූතියෙන් මාස 06ක් දක්වා යකඩ, ෆෝලික් අම්ලය හා විටමින් සී පෙති ලබා දීම;

* සෑම ගර්භිණී මවකටම පෝෂණීය ආහාර තම ආහාර වේලට එක් කර ගැනීමට උපදෙස් ලබා දීම;

* සෑම ගර්භිණී මවකටම මාතෘ සායනයේදී ත්‍රිපෝෂ පැකට් 2 බැගින් මාසිකව ලබා දීම;

* ගර්භිණී සමයේදී මන්ද පෝෂණයේ ලක්ෂණ පිළිබඳ මාතෘ සායනයේදී හා පවුල් සෞඛ්‍ය සේවිකාව ගෘහ පිවිසුම්වලදී නිරතුරු පරීක්ෂා කිරීම.

(iii) ඔව්.

(ආ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, අතුරු ප්‍රශ්න තුනක් තිබෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා දන්නවා, අපේ රටේ වැඩිම මාතෘ මරණ අනුපාතය තිබෙන්නේ වතුකර ක්ෂේත්‍රයේ බව. සජීවී උපත් 1,00,000කට මරණ 67ක් තිබෙනවා. ඒ නිසා මේ තත්ත්වය මඟ හරවා ගන්නට, වතුකර ක්ෂේත්‍රයේ මවුවරුන්ගේ පෝෂණ මට්ටම වර්ධනය කරන්නට රජය ක්‍රියාත්මක කරන විශේෂ වැඩසටහන මොකක්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, පෝෂණ තත්ත්වයන් සහ මේ දර්ශකයන් අනුව, නුවරඑළිය දිස්ත්‍රික්කයේ කරන ලද පළමු දේ තමයි, පෝෂණ මට්ටම වර්ධනය කිරීම සඳහා විශේෂ වැඩසටහනක් පසු ගිය 03 වන දා ක්‍රියාත්මක කර තිබීම. එය ක්‍රියාත්මක කළේ නුවරඑළිය දිස්ත්‍රික්කය වෙනුවෙන්මයි. මොකද මේ පෝෂණ වැඩසටහනේදී නුවරඑළිය ප්‍රදේශයට විශේෂත්වයක් දැක්විය යුතු නිසයි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ "පෝෂණ ප්‍රවර්ධන සහ සහයෝගිතා" යනුවෙන් විශේෂ වූ වැඩ පිළිවෙළක් මේ සඳහා ක්‍රියාත්මක වනවා. ඒ වාගේම නුවරඑළිය දිසා රෝහල රජයට පවරා ගෙන ඒක මූලික රෝහලක් බවට පත් කරලා එහි වැඩිදියුණු කිරීම් කර තිබෙනවා. වතුකරයේ ජාතික මට්ටම කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්නට කැමැතියි. අපේ දර්ශකයන් ගත්තාම මාතෘ මරණ සංඛ්‍යාව සජීවී උපත් ලක්ෂයකට 39.3යි. ඒ කියන්නේ ආසියානු කලාපයේ සහ ලෝකයේ දර්ශකයන් ගත්තාම අපි ඉතාම හොඳ මට්ටමක සිටින බවයි. විශේෂයෙන්ම අවබෝධතාව අඩු වීම වාගේ කටයුතු නිසා තමයි නුවරඑළිය ප්‍රදේශයේ -වතුකරයේ- මේ තත්ත්වය සිදු වන්නේ. රජය මේ සඳහා විශේෂ වූ වැඩසටහනක් පසු ගිය තුන්වැනිදා ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ වැඩසටහන් දැන් ඒ ප්‍රදේශයේ ක්‍රියාත්මක වනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් ඔබතුමා ප්‍රකාශ කළා, වතු ක්ෂේත්‍රයේ මවුවරුන්ගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කරන්නට රජය මැදිහත් වෙලා තිබෙනවාය කියලා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, වතු ක්ෂේත්‍රයේ හෙදියන් 143 දෙනකුගේ අඩු පාඩුවක් තිබෙනවා නම්; දොස්තරවරු 207ක් ඉන්න ඕනෑ තැන දොස්තරවරු ඉන්නේ 128 නම්; රිකිල්ලගස්කඩ රෝහලේ වෛද්‍ය හිඟයක් තිබෙනවා නම්; නවතිස්පනේ මධ්‍යම බෙහෙත් ශාලාව දොස්තරවරුන්ගේ හිඟතාව මත සම්පූර්ණයෙන්ම වැහිලා තිබෙනවා නම්; බගවන්තලාව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස කාර්යාලය දොස්තරවරුන්ගේ හිඟය නිසා ක්‍රියාත්මක නොවන්නේ නම් මේ මානව සම්පත් හිඟයට සෞඛ්‍ය අමාත්‍යාංශය මැදිහත් වෙලා ලබා දෙන විසඳුම මොකක්ද කියලා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, එතුමා ඒ ගැන වෙනම ප්‍රශ්නයක් ඇසුවා නම් මට ඒකට උත්තර දෙන්න පුළුවන්. එතුමාත් සෞඛ්‍ය නියෝජ්‍ය ඇමති වශයෙන් සිටියා. ඒ නිසා එතුමාත් දන්නවා-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද වෙනම ප්‍රශ්නයක් කියන්නේ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ ප්‍රශ්නය මට අදාළ වෙන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට සෘජුවම අදාළ වන දෙයකුයි මම ඇහුවේ. ඒක මගේ දෙවන අතුරු ප්‍රශ්නය. කරුණාකරලා ඒකට උත්තර දෙන්නය කියා මම ඉල්ලනවා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයෙන් ඒ අදාළ දේවල් අහලා නැහැ. වතුකරයේ ගර්භිණී මව්වරුන්ගේ මන්දපෝෂණ තත්ත්වයන් මඟ හැරවීම සම්බන්ධයෙනුයි ඒ ගරු මන්ත්‍රීතුමා අසා තිබුණේ. ඒ සම්බන්ධයෙන් මම උත්තර දුන්නා. වෛද්‍යවරුන්ගේ අඩුකම සම්බන්ධයෙන් වෙනම ප්‍රශ්නයක් ඇසුවොත් මට ඒකට උත්තර දෙන්න පුළුවන්.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, ඒ ඒ රෝහල්වල වෛද්‍ය හිඟය ගැන සෞඛ්‍ය ඇමතිතුමාගෙන් එතුමා වෙනමම ප්‍රශ්නයක් ඇසුවා නම් ඒ පිළිබඳව කරුණු සොයා බලා, ඒ ගරු මන්ත්‍රීතුමා කියන කරුණු හරිද කියන කාරණය පිළිබඳව සමීක්ෂණයක් කරලා ඒකට

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

හේතුව කියන්න පුළුවන්. නමුත් සෞඛ්‍ය ඇමතිතුමාගෙන් මන්දපෝෂණය පිළිබඳව ප්‍රශ්නයක් අහලා, ඒ එක්කම වෛද්‍යවරුන්ගේ හිඟය පිළිබඳව ප්‍රශ්නයක් අසනවා. ඒ ප්‍රශ්නයට දුන් උත්තරය මත වෛද්‍යවරුන්ගේ හිඟයක් පිළිබඳව පැන නඟින්නේ නැහැ. ඒ නිසා එවැනි දෙයක් උපකල්පනය කරන්න බැහැ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සාධාරණව එය වෙනම ප්‍රශ්නයක් විධියට අහන්න. එතකොට රජය විසින් ඊට අදාළ කරුණු පරීක්ෂා කර බලාවි. ගරු මන්ත්‍රීතුමා කියන විධියට ඒ මධ්‍යස්ථාන වසා තිබෙනවාද, 126 දෙනෙකුගේ හිඟයක් තිබෙනවාද කියන කාරණා පිළිබඳව විස්තර ගරු නියෝජ්‍ය ඇමතිතුමා ළඟ නැහැ නේ. ඒ තොරතුරු සත්‍යද, අසත්‍යද කියා ඒවා එතුමා අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවලින් සොයා ගන්න ඕනෑ. එහෙම තමයි උත්තරයක් දෙන්න වෙන්නේ. ඒ නිසා සාධාරණ වශයෙන් ඒක වෙනම ප්‍රශ්නයක් හැටියට අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම කනගාටු වෙනවා. අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා ජ්‍යෙෂ්ඨ ඇමතිතුමා සෞඛ්‍ය ඇමතිවරයකු හැටියට වසර ගණනාවක සේවාවක් ඉටු කරපු පුද්ගලයෙක්. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මානව සම්පත් හිඟතාවත්, මාතෘ මන්ද පෝෂණයත් අතර සෘජු සම්බන්ධතාවක් තිබෙනවා, අනිවාර්යයෙන්ම. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිතුමියන්ලාගේ හිඟයක් තිබෙනවා නම් කොහොමද ගර්භිණී සහ ළමා සෞඛ්‍ය සායන ක්‍රියාත්මක කරන්නේ? ඒවායේ සෘජු සම්බන්ධතාවක් තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, මානව සම්පත වැඩි කිරීම සඳහා අප හෙදියන් 15,000ක් බඳවා ගත්තා. අග්නිදිග ආසියාකරයේ වෛද්‍යවරුන්ගේ වැඩිම අනුපාතය තිබෙන්නේ ලංකාවෙයි. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා එහෙම කියන්න එපා. එවැනි අඩු පාඩුවක් නැහැ. යම් යම් අඩු පාඩුකම් යම් යම් තැන්වල තිබෙන්න පුළුවන්. නමුත් සංසන්දනාත්මකව බැලුවොත් පෙනී යනවා, ශ්‍රී ලංකාව ඉතාම ඉහළ මට්ටමින් ඒ වැඩ කටයුතු කර තිබෙන බව. 3,000කට එක් කෙනෙක් වශයෙන් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් ඉන්නවා. ඒක අපි 1,500කට එක් කෙනෙක් කිරීම සඳහා වැඩ කටයුතු කර ගෙන ගියා. ඒ නිසා ඔබතුමාට වඩා හොඳ උත්තරයක් ලබා ගන්න පුළුවන් නියම ආකාරයට ඒ ප්‍රශ්නය ඇහුවා නම්. ඒ වාගේම මම ගරු මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ අපේ රජයෙන් තමයි වතුකරයේ රෝහල් සියල්ල රජයට පවරා ගැනීමට කටයුතු කරලා, කෝටි ගණනක් වියදම් කරලා MBBS වෛද්‍යවරු වතු රෝහල්වලට ලබා දීලා, ඒවායේ මානව සම්පත්වල විශාල දියුණු කිරීමක් කළේ කියන එක. ඒ නිසා -[බාධා කිරීමක්] නැහැ, නැහැ. මම කියන්න ඕනෑ. නැත්නම් එතුමා-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මගේ තුන් වැනි අතුරු ප්‍රශ්නය-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ස්ථාවර නියෝග 28(2)හි පැහැදිලිව මෙසේ සඳහන් වෙනවා:

"මුල් ප්‍රශ්නයට ඇතුළත් නොවූ කරුණු අතුරු ප්‍රශ්නයක ඇතුළත් නොකළ යුතුය."

ඒකයි මේ ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මම සතුටු වෙනවා සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා ඒ උත්තර ටික ලබා දුන්නා නම්.

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මේකයි. ගරු කථානායකතුමනි, අප මේ කථා කරන්නේ වතුකර ක්ෂේත්‍රයේ ගර්භිණී මවුවරුන්ගේ මන්ද පෝෂණය පිළිබඳවයි. ගර්භිණී මව්වරුන්ගේ මන්ද පෝෂණයත්, පවුල ලබන ආදායම් මට්ටමත් අතර සෘජු සම්බන්ධතාවක් තිබෙනවා. මම විශේෂයෙන්ම අහන්න කැමැතියි, වර්තමාන ආණ්ඩුව වතුකර ක්ෂේත්‍රයේ සේවකයන්ට සාධාරණ වැටුප් වැඩි වීමක් ලබා දුන්නොත්, ඒ කියන්නේ හැම සේවකයකුටම අඩුම ගණනේ රුපියල් 500ක අවම වැටුපක් ලබා දුන්නොත් ඒ පවුලට තමන්ගේ ආහාර-පාන ලබා ගැනීමට- [බාධා කිරීම්] ඒ වෙනුවෙන් වියදම් කිරීම සඳහා ඒ මුදල අතට ලැබෙනවා. ඒ සඳහා මොකක් හෝ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවාද? [බාධා කිරීම්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මම හිතන්නේ ඔබතුමා- [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

ඒ ගරු මන්ත්‍රීතුමා කථාවක් කරනවා. [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැහැ, නැහැ, නැහැ. 380යි. [බාධා කිරීම්] 380යි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකරලා මෙතැන ප්‍රශ්න අහන වෙලාවට වාද විවාද කරන්න තියා ගන්න එපා.

ප්‍රශ්න අංක 6 -1164/'11-(1), ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

සංඛ්‍යා ලේඛනද සමඟ දීර්ඝ පිළිතුරක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

සංඛ්‍යා ලේඛන නම් ඉල්ලා නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 7-0449/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## හක්මන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්: ගුරු ඌනතා
## ஹக்மன கோட்டக் கல்வி காரியாலயம் நிர்வகிக்கும் பாடசாலைகள்:ஆசிரியர் பற்றாக்குறை
## SCHOOLS ADMINISTERED BY HAKMANA DIVISIONAL EDUCATION OFFICE : TEACHER SHORTAGE

0822/’10

8\. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හක්මන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) ඒ අතුරින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයේ ගුරු අතිරික්තයක් ඇති පාසල්වල හා ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(ii) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(iii) මෙම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබා දෙන්නේද;

(iv) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත අ (i) හි සඳහන් පාසල් සංඛ්‍යාවෙන්,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව හා එම අවශ්‍යතාවල ස්වභාවය;

(iii) විද්‍යාගාර හා පුස්තකාල පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් පහසුකම් ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් වෙත වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் முலட்டியன வலயக் கல்வி காரியாலயத்திற்குட்பட்ட ஹக்மன கோட்டக் கல்வி காரியாலயத்தின் கீழ் நிர்வகிக்கப்படும் அரச பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவென் பதையும்;

(ii) அப்பாடசாலைகளின் பெயர்கள், விலாசங்கள், மற்றும் தொலைபேசி இலக்கங்கள் யாவை யென்பதையும்;

(iii) இவற்றில் தற்போது மூடப்பட்டுள்ள அல்லது மூடிவிடுவதற்கு தீர்மானிக்கப்பட்டுள்ள பாடசாலை களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;

(iv) அவற்றின் பெயர்கள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இக்கோட்டத்தில் ஆசிரியர் மிகையை கொண்டுள்ள பாடசாலைகளினதும் ஆசிரியர் பற்றாக்குறையைக் கொண்டுள்ள பாடசாலைகளினதும் பெயர்கள் யாவையென்பதையும்;

(ii) ஆசிரியர் பற்றாக்குறை நிலவும் பாடங்கள் யாவையென்பதையும்;

(iii) மேற்படி ஆசிரியர் பற்றாக்குறை நிலவும் பாடசாலைகளுக்கு ஆசிரியர்கள் பெற்றுக்கொடுக் கப்படுவார்களா என்பதையும்;

(iv) அதற்கு எடுக்கும் காலம் எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) மேற்படி அ (i) இல் குறிப்பிடப்பட்டுள்ள பாடசாலை களில்;

(i) மின்சார வசதி இல்லாத பாடசாலைகளின் எண்ணிக்கையையும்;

(ii) தளபாடத் தேவைகளைக் கொண்டுள்ள பாடசாலை களின் எண்ணிக்கை மற்றும் அத்தேவைகளின் தன்மையையும்;

(iii) விஞ்ஞான ஆய்வு கூட மற்றும் நூலக வசதிகளற்ற பாடசாலைகளின் எண்ணிக்கையையும் அவற்றின் பெயர்களையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ඈ) (i) மேலே குறிப்பிடப்பட்டுள்ள வசதிகளை பெற்றுக் கொடுப்பதற்கு தேவையான நிதியை அப்பாட சாலைகளுக்கு ஒதுக்கித்தர நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அதற்காக எடுக்கும் காலம் எவ்வள வென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Will he inform this House of -

(i) the number of schools administered by the Hakmana Divisional Education Office of the Mulatiyana Zonal Educational Office in the Matara District ?

(ii) the names, addresses and telephone numbers of those schools;

(iii) the number of schools that have been closed down or identified to be closed down out of these schools ?

(iv) the names of those schools; and

(b) Will he state-

(i) the names of the schools in which there are excess teachers and those in which there is a shortage of teachers in this Division ; and

(ii) the subjects for which there is a shortage of teachers ;

(iii) whether teachers will be provided to the schools where there is a shortage of teachers ;and

the period of time within which it will be done ?

(c) Will he inform this House in relation to the schools in (a) (i) above-

(ii) the number of schools without electricity ;

(ii) the number of schools with furniture requirements and the nature of the requirements ;

(iii) the number of schools without laboratory and library facilities and their names ?

(d) Will he state-

(i) whether arrangements will be made to allocate the required funds to provide the above-mentioned facilities to those schools; and

(ii) if so, the period of time taken for it ?

(e) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා මෙම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රජයේ පාසල් 26යි.

(ii) පාසල්වල නම් හා ලිපිනයන් ඇමුණුම 1හි දැක්වේ. දුරකථන අංක දුරකථන නාමාවලියෙන් ලබා ගත හැක.

(iii) ඉන් කිසිවක් වසා දැමීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙතෙක් තීරණය කර නොමැත.

(iv) අදාළ නොවේ.

(ආ) (i) ගුරු ඌනතා පවතින පාසල් නොමැත. ගුරු අතිරික්තයක් පවතින පාසල්වල නම් හා ලිපිනයන් ඇමුණුම 2 හි දැක්වේ.

(ii) ගුරු ඌනතා පවතින පාසල් නොමැත.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ඇ) (i) 01යි.

(ii) 04යි. ඩෙස්ක් හා පුටු.

(iii) 13යි. ඇමුණුම 3හි දක්වා ඇත. ඇමුණුම් **සභාගත*** කරමි.

(ඈ) (i) දැනට පුස්තකාලයක් නොමැති වුවත් පුස්තකාල පොත් ලබා ගෙන පොත් එකතුවක් පාසලේ පවත්වා ගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන ගුණාත්මක යෙදවුම් යටතේ වාර්ෂිකව මෙම පාසල්වලට ලබා දෙයි. ශිෂ්‍ය ප්‍රමාණය කුඩා බැවින් විධිමත් පුස්තකාලයක් වෙනුවට පන්තිකාමර පසෙක පොත් එකතුවක් (Corner Library) පවත්වා ගෙන යාමට හැකියාව ඇති කර දී ඇත.

විද්‍යාගාර ලබා දීම සඳහා ශිෂ්‍ය සංඛ්‍යාව 500කට වැඩි විය යුතු අතර, 06 වසරෙන් ඉහළ පන්ති පැවැත්වෙන පාසල් විය යුතුය.

කෙසේ වෙතත් ශිෂ්‍ය සංඛ්‍යාව අඩු පාසල්වලට ජංගම විද්‍යාගාර (මිනි ලැබ්) ලබා දීමේ වැඩ සටහනක් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

(ii) අදාළ නොවේ.

(ඉ) අදාළ නොවේ.

** සභාමේසය මත තබන ලද ඇමුණුම්:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
** Annex tabled:*

***ඇමුණුම - 01***

හක්මණ රජයේ පාසල් ලේඛනය

| | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | කොහුලියැද්ද ක.වි. | කොහුලියැද්ද , හක්මණ |
| 2 | කුඹල්ගොඩ ක.වි | කුඹල්ගොඩ , කරතොට |
| 3 | ඇල්ලේවෙල ක.වි. | ඇල්ලේවෙල, හක්මණ |
| 4 | සපුගහර ක.වි. | නරවැල්පිට නැගෙනහිර, හක්මණ |
| 5 | උඩුපිල්ලේගොඩ ක.වි. | හක්මණ |
| 6 | මිද්දෙනෝගොඩ ක.වි. | හක්මණ |
| 7 | බෙරුවෙල ක.වි. | බෙරුවෙල, හක්මණ |
| 8 | කැබිලියපොල ක.වි. | කැබිලියපොළ, හක්මණ |
| 9 | දෙනගම (නැගෙ.) ක.වි. | දෙනගම, හක්මණ |
| 10 | ලාල්පෙ ක.වි. | ලාල්පෙ, හක්මණ |
| 11 | කන්දේගොඩ ක.වි. | කන්දෙගොඩ, හක්මණ |
| 12 | බඩබැද්ද ම.වි. | මීඇල්ල |
| 13 | වේපත ඉර ගුණසේකර ම.වි. | වැල්පතිර, හක්මණ |
| 14 | පනන්වෙල ක.වි. | පනන්වෙල, මීඇල්ල |
| 15 | මීඇල්ල කරගොඩ ක.වි. | මීඇල්ල, හක්මණ |
| 16 | කරතොට ක.වි. | කරතොට, හක්මණ |
| 17 | දෙනගම ම.වි. | දෙනගම, හක්මණ |
| 18 | කැබිලියපොල ශ්‍රී ගුණරතන ක.වි. | කැබිලියපොළ, හක්මණ |
| 19 | ගන්ගොඩගම ජයවර්ධන ම.වි. | ගන්ගොඩගම, හක්මණ |
| 20 | අල්-මීනා ම.වි. | මීඇල්ල, හක්මණ |
| 21 | හෙන්රි ආරියරත්න ම.වි. | නරවැල්පිට උතුර, හක්මණ |
| 22 | බුද්ධ ජයන්ති ක.වි. | හක්මණ |
| 23 | කෝන්ගල ක.වි. | හක්මණ |
| 24 | කෝන්ගල ම.ම.වි. | හක්මණ |
| 25 | මෙතෝදිස්ත ම.ම.වි. | හක්මණ |
| 26 | නරවැල්පිට දකුණ ම.ම.වි. | හක්මණ |

ඇමුණුම - 02

හක්මණ ගුරු අතිරික්තයක් පවතින පාසල් ලේඛනය

| | පාසලේ නම | ලිපිනය |
|---|---|---|
| 1 | කොහුලියැද්ද ක.වි. | කොහුලියැද්ද , හක්මණ |
| 2 | කුඹල්ගොඩ ක.වි | කුඹල්ගොඩ , කරතොට |
| 3 | ඇල්ලේවෙල ක.වි. | ඇල්ලේවෙල, හක්මණ |
| 4 | සපුගහර ක.වි. | නරවැල්පිට නැගෙනහිර, හක්මණ |
| 5 | උඩුපිල්ලේගොඩ ක.වි. | හක්මණ |
| 6 | මිද්දෙනෝගොඩ ක.වි. | හක්මණ |
| 7 | බෙරුවෙල ක.වි. | බෙරුවෙල, හක්මණ |
| 8 | කැබිලියපොල ක.වි. | කැබිලියපොළ, හක්මණ |
| 9 | දෙනගම (නැගෙ.) ක.වි. | දෙනගම, හක්මණ |
| 10 | ලාල්පෙ ක.වි. | ලාල්පෙ, හක්මණ |
| 11 | කන්දේගොඩ ක.වි. | කන්දෙගොඩ, හක්මණ |
| 12 | බඩබැද්ද ම.වි. | මීඇල්ල |
| 13 | වේපත ඉර ගුණසේකර ම.වි. | වැල්පතිර, හක්මණ |
| 14 | පනන්වෙල ක.වි. | පනන්වෙල, මීඇල්ල |
| 15 | මීඇල්ල කරගොඩ ක.වි. | මීඇල්ල, හක්මණ |
| 16 | කරතොට ක.වි. | කරතොට, හක්මණ |
| 17 | දෙනගම ම.වි. | දෙනගම, හක්මණ |
| 18 | කැබිලියපොල ශ්‍රී ගුණරතන ක.වි. | කැබිලියපොළ, හක්මණ |
| 19 | ගන්ගොඩගම ජයවර්ධන ම.වි. | ගන්ගොඩගම, හක්මණ |
| 20 | අල්-මීනා ම.වි. | මීඇල්ල, හක්මණ |
| 21 | හෙන්රි ආරියරත්න ම.වි. | නරවැල්පිට උතුර, හක්මණ |
| 22 | බුද්ධ ජයන්ති ක.වි. | හක්මණ |
| 23 | කෝන්ගල ක.වි. | හක්මණ |
| 24 | කෝන්ගල ම.ම.වි. | හක්මණ |
| 25 | මෙතෝදිස්ත ම.ම.වි. | හක්මණ |

ඇමුණුම - 03

විද්‍යාගාර සහ පුසතකාල පහසුකම් නොමැති පාසල්

- බුද්ධ ජයන්ති ක.වි.
- කොහුලියැද්ද ක.වි.
- දෙනගම නැගෙනහිර ක.වි.
- කැබිලියපොල ශ්‍රී ගුණරත්න ක.වි.
- ලාල්පේ ක.වි.
- මිද්දෙනිගොඩ ක.වි.
- කෝන්ගල ක.වි.
- කැබිලියපොල ක.වි.
- බෙරුවෙල ක.වි.
- සපුගහර ක.වි.
- කුඹල්ගොඩ ක.වි.
- උඩුපිල්ලේගොඩ ක.වි.
- ඇල්ලේවෙල ක.වි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කරන්නට යෙදුණා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම ගුරු භවතුන්ගේ දැනුමට වඩා වැඩියි කියලා. ඇත්තටම ඒක එහෙම නම් ඒක බරපතළ ප්‍රශ්නයක්. ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය මේකයි. තාක්ෂණය නිතර නිතර අලුත් වෙනවා. ඒකට ගැළපෙන විධියට ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ වැඩ පිළිවෙළක් නැති බව නේද මෙයින් අදහස් වෙන්නේ? එහෙම නම් ඒකට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, ඒ දරුවන්ගේ දැනුම වැඩි වෙලා තිබෙන්නේ බාහිර පන්ති සහ සමාජයේ තිබෙන අනෙකුත් දැනුම් සම්භාරයන් ගලා ඒම තුළින්. ඊට අවශ්‍ය කිසිම ගුරුවරයෙක් මේ රටේ සිටියේ නැහැ. නමුත් අප ඒ අවශ්‍යතාව සඳහා දැනට ගුරුවරුන් වශයෙන් ලබා දීලා තිබෙන්නේ ඒ ඒ පාසල්වලින් එම විෂයය පිළිබඳ යම් දැනුමක් ඇති අයයි. සමහර පාසල්වල තත්ත්වය එයයි. මේ රජය මඟින් මේ රටේ තිබෙන පාසල් පද්ධතිය පුරාම පරිගණක තාක්ෂණය ව්‍යාප්ත කරලා තිබෙනවා. එනිසා තමයි මේ ගැටලුව මතු වෙලා තිබෙන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය. මේ කලාපයේත් අර පාසල් රෙදි පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, මම වැරදි රෙදි කෑලි ගෙනාවා ආදි කාරණා. එතුමා වරප්‍රසාදවලට අදාළව ප්‍රකාශයක් කළා, මට උත්තර දෙන්න බැරි. නමුත් මේ කලාපයේ ඉස්කෝලවලට ඒ වාගේ රෙදි අදටත් ලැබෙමින් තිබෙනවා. ඒ සමහර ඒවායෙහි seal නැහැ. ගරු කථානායකතුමනි, මේ රෙදි අප අර ගෙන ආවොත් ප්‍රශ්නයක් වෙන හින්දා මා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. විජයමුණි ද සොයිසා මැතිතුමා, නොම්මර 336/1/බී, රෝහල පාර, කළුබෝවිල, දෙහිවල හෝ නොම්මර 95 මොණරාගල හන්දිය, බිබිල කියන address දෙකෙන් මොන එකටද, ඒ හම්බ වෙච්ච ජරා රෙදි ලියාපදිංචි තැපෑලෙන් එවන්න ඕනෑ කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කරන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, පොත් රාක්කේ ඉන්න කායා පුංචි සතෙක්. කායා හිතනවා-

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

කායා නොවෙයි, කාවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, කාවා හිතනවා, මිනිසුන් පොත් කන්නේ නැත්තේ මෝඩකමට කියලා. අපි රෙදි ප්‍රශ්නය අපි විසඳුවා. ඒ ගැන කථා කළා; ප්‍රකාශ නිකුත් කළා. එය යථා තත්ත්වයට පත් කරලා තිබෙනවා. කාවා වෙන්න එපා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, එතුමා කායා කියන්නේ මොකාටද කියලා මම දන්නේ නැහැ. අපි නම් දන්නේ "කාවා" කියලායි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

කාවා. එහෙම වරදිනවා. කාවා, වැයා, වේයා, නැයා. මේ ඔක්කෝම කන අය.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

නමුත් ඇත්ත කථාව දරුවන්ට ලැබිලා තිබෙන්නේ ප්‍රමිතියෙන් තොර බාල රෙදියි. දරුවන්ට ඒ බාල රෙදි ලැබීම සම්බන්ධයෙන් ආණ්ඩුව ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

කාවා, වැයා, වේයා, විපක්ෂය.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

විපක්ෂය කෑවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කෙටියෙන් අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා දන්නවා, ඒ රෙදි සැපයුම් කරපු අයගේ යම් අක්‍රමිකතා තිබුණාය කියා. ඒක නියෝජ්‍ය ඇමතිතුමාගේ හෘදය සාක්ෂියත් දන්නවා. මේ සැපයුම්කරුවන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරනවාද, නැද්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නයෙන් රෙදි ගැන අහලා නැහැ නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, ආයෙත් මෙතුමා රෙද්ද උස්සනවා. මේක අවසන් කරන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
රෙද්ද පහතට දාන්න.

## ත්‍රිවිධ හමුදාවට අවි ආයුධ මිලදී ගැනීමේදී සිදු වූ අක්‍රමිකතා : කොමිෂන් සභා වාර්තාව

## முப்படைகளுக்கான ஆயுதக் கொள்வனவு மோசடிகள்: ஆணைக்குழு அறிக்கை

## IRREGULARITIES IN PURCHASING ARMS AND AMMUNITION FOR THE ARMED FORCES: COMMISSION REPORT

0904/'10

9\. **ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ යුද, නාවික සහ ගුවන් හමුදා සඳහා අවි ආයුධ සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීමේදී සිදු වූ බව කියන අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු ශිරානි තිලකවර්ධන මහත්මිය සභාපතිත්වය දැරූ කොමිෂන් සභාවක් අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම කොමිසම පත් කරන ලද දිනය කවරේද;

(iii) එකී කොමිසමේ සාමාජිකත්වය දැරූ අය කවුරුන්ද;

(iv) එම කොමිසමේ වාර්තාව අතිගරු ජනාධිපතිතුමා වෙත භාර දෙන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම කොමිසමේ විෂය පරාසය කුමක්ද;

(ii) එමගින් ආවරණය කරන ලද කාලසීමාව කවරේද;

(iii) එම කොමිෂන් සභා වාර්තාව පරිදි අක්‍රමිකතා හඳුනා ගත්තේ නම්, ඒවා කවරේද;

(iv) එම වාර්තාව සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම වාර්තාව මගින් අක්‍රමිකතා සඳහා වග කිව යුතු පුද්ගලයින් හඳුනා ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවුරුන්ද;

(iii) එම තැනැත්තන්ට එරෙහිව මේ වන විට ගෙන ඇති නීතිමය හෝ විනයානුකූල පියවර කවරේද;

(iv) එසේ පියවර නොගන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் இராணுவம், கடற்படை மற்றும் விமானப் படைகளுக்கான ஆயுதங்களையும் ஏனைய உபகரணங்களையும் கொள்வனவு செய்கின்றபோது நடைபெற்றுள்ளதாகக் கூறப்படு கின்ற மோசடிகள் சம்பந்தமாக விசாரணைகளை நடத்துவதற்காக உயர் நீதிமன்ற நீதிபதி கௌரவ திருமதி சிரானி திலகவர்தனவின் தலைமையிலான ஆணைக்குழுவொன்று மேதகு சனாதிபதியினால் நியமிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி ஆணைக்குழு நியமிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(iii) மேற்படி ஆணைக்குழுவில் அங்கத்துவம் வகித்தவர்கள் யாரென்பதையும் ;

(iv) மேற்படி ஆணைக்குழுவின் அறிக்கை மேதகு சனாதிபதியிடம் கையளிக்கப்பட்ட திகதி யாதென்பதையும்

அவர் இச்சபைக்கு தெரிவிப்பாரா?

(ஆ) (i) மேற்படி ஆணைக்குழுவின் விடயப்பரப்பு யாதென்பதையும்;

(ii) அதில் உள்ளடக்கப்பட்ட கால எல்லை யாதென் பதையும்;

(iii) மேற்படி ஆணைக்குழுவின் அறிக்கையின்படி மோசடிகள் இனங்காணப்பட்டிருப்பின் அவை யாவையென்பதையும்;

(iv) மேற்படி அறிக்கையை சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா ?

(இ) (i) மேற்படி அறிக்கையின் பிரகாரம் மோசடிகள் சம்பந்தமாக பொறுப்புக்கூற வேண்டியவர்கள் இனங்காணப்பட்டுள்ளனரா என்பதையும்;

(ii) ஆமெனில் அவர்கள் யாரென்பதையும்;

(iii) மேற்படி நபர்களுக்கு எதிராகத் தற்போது மேற்கொள்ளப்பட்டுள்ள சட்ட ரீதியிலான அல்லது ஒழுக்காற்று ரீதியிலான நடவடிக்கைகள் யாவை யென்பதையும்;

(iv) அவ்வாறு நடவடிக்கை எடுக்கப்படவில்லையெனில் அதற்கான காரணங்கள் யாவையென்பதையும்

அவர் இச்சபைக்கு தெரிவிப்பாரா ?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House-

(i) whether His Excellency the President appointed a commission, presided over by Hon. (Mrs.) Shirani Thilakawardhana to investigate into the irregularities that are alleged to have been committed in purchasing arms, ammunition and other equipment for Sri Lanka Army, Navy and Air Force?

(ii) if so, the date on which the above mentioned commission was appointed;

(iii) of the names of the members of that commission;

(iv) of the date on which the report of that commission was handed over to His Excellency the President ?

(b) Will he state-

(i) the scope of that commission;

(ii) the period of time covered by it;

(iii) if irregularities have been identified in the report of that commission, what they are;

(iv) whether that report be tabled ?

(c) Will he inform this House-

(i) whether persons who are responsible for the irregularities have been identified in that report;

(ii) if so, who they are;

(iii) the legal or disciplinary action that has been taken against them by now;

(iv) if such action is not taken, the reasons for that ?

(d) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) 2006.04.24

(iii) ගරු ශිරාණි තිලකවර්ධන මැතිතුමිය - සභාපති
ගරු නිශ්ශංක කුමාර උදලාගම මැතිතුමා - සාමාජික
ගරු නිමල් එඩ්වඩ් දිසානායක මැතිතුමා - සාමාජික

(iv) 2007.01.28 දින අතිගරු ජනාධිපතිතුමා වෙත භාර දී ඇති එම වාර්තාව රහස්‍ය සහ ජාතික ආරක්ෂාව සම්බන්ධ හේතු මත ප්‍රසිද්ධ නොකිරීමට තීරණය කර ඇත.

(ආ) (i) ඉහත (අ) (iv) හි පිළිතුරට අනුව අදාළ නොවේ.

(ii) ඉහත (අ) (iv) හි පිළිතුරට අනුව අදාළ නොවේ.

(iii) ඉහත (අ) (iv) හි පිළිතුරට අනුව අදාළ නොවේ.

(iv) ඉහත (අ) (iv) හි පිළිතුරට අනුව අදාළ නොවේ.

(ඇ) (i) ඉහත (අ) (iv) හි පිළිතුරට අනුව අදාළ නොවේ.

(ii) ඉහත (අ) (iv) හි පිළිතුරට අනුව අදාළ නොවේ.

(iii) ඉහත (අ) (iv) හි පිළිතුරට අනුව අදාළ නොවේ.

(iv) ඉහත (අ) (iv) හි පිළිතුරට අනුව අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය අහලා තිබෙන්නේ යුද හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව සඳහා ආයුධ මිල දී ගැනීමේ දී සිදු වුණු බරපතළ අක්‍රමිකතා ගැන පරීක්ෂණ පැවැත්වීම සඳහා ආණ්ඩුවම පත් කරපු කොමිසමක ප්‍රතිඵල ගැනයි. අපට එම කොමිසමේ වාර්තාවේ අන්තර්ගතය අවශ්‍ය නැහැ. නමුත් මෙම අක්‍රමිකතාවලට වග කිව යුතු පුද්ගලයන් කී දෙනෙකුට චෝදනා නඟා තිබෙනවාද කියන එකවත් අඩු ගණනේ කියන්න පුළුවන් වෙන්නට ඕනෑ. නැත්නම් ආරක්ෂාව ගැන රාජ්‍ය මූල්‍ය පිළිබඳව පාර්ලිමේන්තුවට තිබෙන පාලනය මොකක්ද? රාජ්‍ය ආරක්ෂාව, ජාතික ආරක්ෂාව කියලා සැඟවිලා මේ සියලු දේවල් වහලා දමන්න දෙන්න පුළුවන්කමක් නැහැ නේ ගරු කථානායකතුමනි. කරුණාකරලා අඩු ගණනේ නම් ටිකවත් කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුරක් දීලා තිබෙනවා. පිළිතුර නොදී සිටින්නටත් තිබුණා. මේ බරපතළ කරුණු සමහරක් රාජ්‍ය ආරක්ෂාවට අවශ්‍යයි. ඒ නිසා මෙම කමිටුව ගරු ජනාධිපතිතුමා පත් කළා. එහි වාර්තාව ගරු ජනාධිපතිතුමාට ලබා දී තිබෙනවා. ඒ වාර්තාව අනුව ජනාධිපතිතුමා සහ අදාළ බලධාරීන් කටයුතු කරනවා ඇති. පසු ගිය කාල පරිච්ඡේදයේ අපේ රට ජයග්‍රහණය ලැබූ මහා සටනේ තොරතුරු සම්පූර්ණයෙන් එළිදරවු කිරීමට තිබෙන අපහසුතාව ගරු මන්ත්‍රීතුමා අවබෝධ කර ගන්නවා ඇති කියලායි ගරු මන්ත්‍රීතුමා නඟන තර්කයට පිළිතුර වශයෙන් කියන්න තිබෙන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ අහන්නේ යුද්ධයේ ජයග්‍රහණය පසු පසට ඇදපු ද්‍රෝහීන් ගැනයි. අඩු ගණනේ ඒ ද්‍රෝහීන් කවුද කියලා නම් ටික එළිදරවු කරන්නය කියලා මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලන්න අයිතියක් නැද්ද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මේ රටේ ජාතික නිදහසේ ඒකීයභාවයට එරෙහිව හා වෙනම රටක් කිරීමට පෙනී හිටපු ද්‍රෝහීන් කවුද කියා එතුමා දන්නේ නැති වීම ගැන මා කනගාටු වනවා. අපේ රජය මේ රටේ ඒකීයභාවය ආරක්ෂා කොට, මේ රට සිංහල, දෙමළ, මුස්ලිම් සැම දෙනාට රට පුරා ගමන් කළ හැකි, ජීවත් විය හැකි ලංකාවක් බවට අද පත් කරලා තිබෙනවා. සමහර විට ඔබතුමාට මේ තොරතුරු ආරක්ෂක කමිටුවට ගිහින් වාචිකව දැන ගන්න පුළුවන් වෙයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමාගේ පිළිතුරෙන් හෙළිදරවු වුණා, බරපතළ කාරණා ගැන පිළිතුරු දීමේ ප්‍රශ්නයක් තිබෙනවාය කියලා. බරපතළ කාරණා ගැන මේ ගරු පාර්ලිමේන්තුවේ, උත්තරීතර ව්‍යවස්ථාදායකයේ ප්‍රශ්න කරන්න මන්ත්‍රීවරයකුට අයිතියක් නැත්නම් අපි මේවා ප්‍රශ්න කරන්නේ කොහිදීද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න අහන්න තිබෙන අයිතිය වාගේම සමහර කරුණු මත එයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතියත් අමාත්‍යවරුන්ට තිබෙනවා. 1948 සිට පාර්ලිමේන්තුවේ විවිධ අමාත්‍යවරු, අග්‍රාමාත්‍යවරු එසේ කරලා තිබෙනවා. ඔබතුමාට වාචිකව කරුණු දැන ගන්න පුළුවන් කමිටු තිබෙනවා. මා මීට ප්‍රථම මේ ප්‍රකාශය මේ ගරු සභාවේ කරලා ආරක්ෂිත රහස්‍යභාවය මත සමහර ප්‍රශ්නවලට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරලා තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මා මෙම ප්‍රශ්නය අහනවා. තොරතුරු දැන ගැනීමට ඇති නිදහස පිළිබඳව නීතියක් මේ රටට අවශ්‍යයි කියා ඔබතුමා පිළිගන්නවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 10, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## උතුරු පළාතේ ගර්භිණී මව්වරුන්ගේ මන්දපෝෂණය : ක්‍රියාමාර්ග

### வட மாகாணக் கர்ப்பிணித் தாய்மாரின் போஷாக்கின்மை: நடவடிக்கை

### MALNUTRITION IN PREGNANT MOTHERS OF NORTHERN PROVINCE : MEASURES TAKEN

1032/'10

10. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
( மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ මන්ද පෝෂණයෙන් පෙළුණු ගර්භිණී මව්වරුන්ගේ ප්‍රතිශතය කවරේද;

(ii) එම මන්ද පෝෂණ තත්වයන් මග හැර වීමට රජය ගන්නා වූ පියවර කවරේද;

(iii) එම පියවර උතුරු පළාතේ ගර්භිණී මව්වරුන්ගේ මන්ද පෝෂණය මග හැර වීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්,ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டு இறுதியளவில் இலங்கையின் வட மாகாணத்தில் போஷாக்கின்மையால் பாதிக்கப் பட்டிருந்த கர்ப்பிணித் தாய்மார்களின் சதவீதம் எவ்வளவென்பதையும்;

(ii) இப்போஷாக்கின்மை நிலைமைகளைப் போக்கு வதற்கு அரசாங்கம் மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி நடவடிக்கைகள் வட மாகாணத்தில் கர்ப் பிணித் தாய்மார்களின் போஷாக்கின்மையைப் போக்குவதற்கு போதுமானவையா என்பதையும்

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state-

(i) the percentage of pregnant mothers in the Northern Province of Sri Lanka, who suffered from malnutrition as at the end of year 2010;

(ii) the steps to be taken by the government to arrest that state of malnutrition;

(iii) whether such steps are sufficient to arrest the state of malnutrition prevalent among the pregnant mothers in the Northern Province ?

(b) If not, why ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

ගරු කථානායකතුමනි, පෝෂණය ගැනයි එතුමා දිගටම අහන්නේ. ඉස්සෙල්ලා ජාතික මට්ටමෙන් ඇහුවා. දැන් එතුමා පළාත් මට්ටමට ගිහින් තිබෙනවා. හෙට වන විට මා හිතන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමටත් යාවි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඉතින් ඒක වරදක්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

නැහැ, වරදක් නැහැ. එකම දේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

වරදක්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
වරදක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අහලා තිබෙන ප්‍රශ්නයට උත්තර දුන්නාම ප්‍රමාණවත්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, උත්තරය දෙන්නකෝ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
කලින් කියාපු දේම තමයි මේකෙදීත් කියන්න තිබෙන්නේ. මේක ජාතික වැඩසටහනක්. උතුරට, නැඟෙනහිරට කියලා වෙනම වැඩසටහනක් නැහැ. ඔබතුමාට මේ ප්‍රශ්නය අහන්නත් අද පුළුවන් වෙලා තිබෙන්නේ අපේ අතිගරු ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්නයි. මොකද, උතුරු නැඟෙනහිර ප්‍රදේශය මුදා ගෙන හොඳ සේවාවක් කර තිබෙනවා. ඒක ගැන අපි සතුටු වෙනවා. මේ ත්‍රස්තවාදය නිසා ඔබතුමන්ගේ පියාණන්ටත් ජීවිතය පූජා කරන්න සිදු වුණා. නමුත් අපේ අතිගරු ජනාධිපතිතුමා ඒ පළාත නිදහස් කර ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි අද සතුටු වෙනවා, උතුරු ප්‍රදේශය ගැන විපක්ෂයේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නයට මේ පාර්ලිමේන්තුවේ උත්තර දෙන්න ලැබීම ගැන. මේකෙදීත් කලින් කියාපු දේම තමයි කියන්න තිබෙන්නේ. මොකද, මේ ජාතික පෝෂණ වැඩසටහන උතුරටත් එකයි, නැඟෙනහිරටත් එකයි. සමානව ක්‍රියාත්මක වන වැඩසටහනක්.

මේ ප්‍රශ්නයට පිළිතුර මෙයයි:

(අ) (i) 14.8%

(ii) සෑම ගර්භිණී මවකටම සති 12න් පසුව හා ප්‍රසූතියෙන් මාස 06ක් දක්වා යකඩ, ෆෝලික් අම්ලය හා විටමින් සී පෙති ලබා දීම.

සෑම ගර්භිණී මවකටම පෝෂණීය ආහාර තම ආහාර වේලට එක් කර ගැනීමට උපදෙස් ලබා දීම.

සෑම ගර්භිණී මවකටම මාතෘ සායනයේදී ත්‍රිපෝෂ පැකට් 2 බැගින් මාසිකව ලබා දීම.

ගර්භිණී සමයේ මන්දපෝෂණයේ ලක්ෂණ පිළිබඳ මාතෘ සායනයේදී හා පවුල් සෞඛ්‍ය සේවිකාව ගෘහ පිවිසුම්වලදී නිරතුරු පරීක්ෂා කිරීම.

(iii) ඔව්.

(ආ) පැන නොනඟී.

ඊළඟට ගරු කථානායකතුමනි, යම් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මෙම පෝෂණ වැඩසටහනට හැම අමාත්‍යාංශයක්ම සම්බන්ධ කර ගන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ ගරු ඇමතිතුමා පසු ගිය සතියේ සිකුරාදා නුවරඑළියේදී මේක ආරම්භ කළ වෙලාවේ යුනිසෙෆ් ආයතනයේ ලංකාවේ නිත්‍ය නියෝජිත මහත්මා එය ඉතාම අගය කළා. එතුමා බොහොම සතුටු වුණා. අනෙකුත් අමාත්‍යාංශත් එක්ක තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ ගැන එතුමා සතුටු වන බව කිව්වා. ඒ වාගේම ඉතාම ඵලදායී වැඩසටහනක් කියලා කිව්වා. ප්‍රතිශක්තීකරණය එන්නතක් මාර්ගයෙන් ක්‍රියාත්මක වනවා. නමුත් මේ පෝෂණ වැඩසටහනට අනෙකුත් සියලු අංශ සම්බන්ධ වෙන්න ඕනෑ. ළදරුවාට මව් කිරි දෙන්න කිව්වාම ඒක දෙන්න ඕනෑ. ඊළඟට දරුවා හම්බ වෙන්න කලින් ගැබිනි මාතෘ කාල සීමාව තුළ ඒ වෛද්‍යවරුන් හමු වෙන්න තිබෙන වැඩසටහන්වලට යන්න ඕනෑ. ඒ කටයුතු අඩු වුණොත් පෝෂණ තත්ත්වයට ඒක බලපානවා. ජාතික පෝෂණ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මේ වාර්තාවේ 4වැනි පිටුවේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. 2000 දී සියයට 57.6ක්වූ මව් කිරි දීම -ප්‍රධාන වශයෙන් පළමු මාස හතර තුළ මව් කිරි දීම- 2007 වෙනකොට සියයට 75.8 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ මේ වැඩ සටහන්වල ඵලදායීතාවක් තිබෙනවා. ඒ නිසා මේ වැඩ සටහන්වලට ජනතාවගේ දායකත්වය ලබා දෙන්න ඕනෑ. මේවා ක්ෂණිකව ක්‍රියාත්මක කරන්න බැහැ. උතුරු ප්‍රදේශයේ මේ වැඩ පිළිවෙළ හොඳින් ක්‍රියාත්මක වෙනවා. අපේ ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්න උතුරු ප්‍රදේශයේ මව්වරුන් සඳහා හොඳ වැඩ සටහනක් ක්‍රියාත්මක වෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මේකයි. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා දුන් පිළිතුරේ එතුමා ප්‍රකාශ කළා, එක හා සමානව ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වෙනවා කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා අපි සියලු දෙනාම දන්නවා, උතුරුකරය කොටි ත්‍රස්තවාදය නිසා වැනසුණු ප්‍රදේශයක් බව. උතුරු පළාතේ ගර්භිණී මව්වරුන්ගේ මන්ද පෝෂණ තත්ත්වය මඟ හරවා ගන්නට සෞඛ්‍ය සේවකයින්ගේ අවශ්‍යතාව දැඩි ලෙස තිබෙනවා. පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස 535ක, ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන තියෙන්නේ 111යි. තවත් ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන සියයකට වැඩි ප්‍රමාණයකට ඉල්ලුමක් තිබෙනවා. ඒ වෙන මොනවාටවත් නොවෙයි, මේ මව්වරුන්ගේ පෝෂණ මට්ටම වර්ධනය කරන්නයි. මා අහන්න කැමැතියි, උතුරු වසන්තය යටතේ ඒ අත්‍යවශ්‍යව තිබෙන සෞඛ්‍ය මධ්‍යස්ථාන සියය ඇති කරන්නේ කවදාද කියලා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒක මේ ප්‍රශ්නයට නම් අදාළ නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකද අදාළ නැත්තේ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු මන්ත්‍රීතුමනි, මා පැහැදිලිව ඔබතුමාට කියන්න ඕනෑ, මේ ජාතික වැඩ පිළිවෙළ හැම පැත්තකටම එක හා සමානව ක්‍රියාත්මක වන බව. අවුරුදු 33ක් කොටි ත්‍රස්තවාදයට යටත් වෙලා තිබුණු භූමි ප්‍රමාණයක් නිදහස් කර ගත්තත් ඒ ගොඩ නැඟීම් ක්ෂණිකව කරන්න බැහැ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පියාණනුත් "ජනසවිය" කියන වැඩ සටහන ක්‍රියාත්මක කළා. නමුත් ක්ෂණිකව සියල්ලම දුන්නේ නැහැ. හැම දිස්ත්‍රික්කයකටම ජනසවිය දුන්නේ නැහැ. ඔක්කෝටම දෙනවා කිව්වත්, අරණායකට දෙනකොට මාවනැල්ලට දුන්නේ නැහැ. ඒ විධියටයි ක්‍රියාත්මක කළේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා ඇහුවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් බඳවා ගන්නවාද කියන ප්‍රශ්නයයි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒ වැඩසටහන පොදුවේ රජයේ වැඩසටහනක් විධියට ක්‍රියාත්මක වෙනවා. "උතුරු වසන්තය" වැඩසටහන යටතේ යම් යම් සෞඛ්‍ය මධ්‍යස්ථාන හදන්න තිබෙනවා නම් ඒවාත් කෙරෙනවා. උතුරු ප්‍රදේශයේ සෞඛ්‍ය ගොඩ නැඟීම සම්බන්ධයෙන් වෙනම ප්‍රශ්නයක් ඔබතුමා අහන්න. නමුත් අපි පැහැදිලිව කියනවා, උතුරු ප්‍රදේශයට පවුල් සෞඛ්‍ය සේවිකාවන් බඳවා ගැනීමට ගැසට් කරලා දැනට 500ක් බඳවා ගෙන පුහුණු කරනවා කියලා. ඉතිරි 500 බඳවා ගැනීමට දැන් කටයුතු සූදානම් කරලා තිබෙනවා. මේ මානව සම්පත විශේෂයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයට එක පාරටම -ක්ෂණිකව- දමන්න බැහැ. ප්‍රමිතියක් ඇතුව ඔවුන් පුහුණු කරන්න ඕනෑ. ඒ අනුව අලුතෙන් බඳවා ගෙන පුහුණු කරන්න කටයුතු කර ගෙන යනවා. දැන් 500ක් බඳවා ගෙන තිබෙනවා. විශේෂයෙන්ම උතුරු ප්‍රදේශය ඉලක්ක කර ගෙන තව 500ක් බඳවා ගන්න කටයුතු කරලා තිබෙනවා. මේ ප්‍රදේශයට යන්නවත් බැරිව නේ තිබුණේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ලබා දුන් පිළිතුර අනුව මම මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

එතුමා ප්‍රකාශ කළා, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් බඳවා ගැනීම ගැන. උතුරු පළාතේ පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස 535ක් තිබෙනවා. නමුත් දැනට සේවය කරන්නේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් 206යි. තවත් 300කට වැඩි ප්‍රමාණයක පුරප්පාඩු තිබෙනවා. "උතුරු වසන්තය" යටතේ මේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් 300කගේ ඇබෑර්තු ටික පුරවන්නේ කවදාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, දැනට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් 1,000ක් බඳවා ගැනීමට කටයුතු කර තිබෙන අතර එයින් 500ක් බඳවා ගෙන තිබෙනවා. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් බඳවා ගෙන ඔවුන් පුහුණු කරන්න ඕනෑ. 500ක් දැනට බඳවා ගෙන තිබෙනවා. ඉතිරි 500ත් බඳවා ගත්තාම මේ අවශ්‍යතාව ඉටු කරන්න පුළුවන්. නමුත් ක්ෂණිකව මේක කරන්න අමාරුයි. සියයට සියයක්, එක පාරට මේ පුරප්පාඩු සම්පූර්ණ කරන්න බැහැ. දැන් 500ක් බඳවා ගෙන තිබෙනවා. ඉතිරි 500ත් බඳවා ගත්තාම යම් ප්‍රමාණයකට මේ අවශ්‍යතාව ඉටු කරන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය. ගරු නියෝජ්‍ය ඇමතිතුමා එතුමාගේ පිළිතුරට මේ කරුණ අඩංගු කළේ නැහැ. ඒ නිසා එතුමාගේ දැන ගැනීමට මේ කරුණ කියන්න කැමැතියි. ජපන් සමාජ සංවර්ධන අරමුදල ලෝක බැංකුව හරහා ඩොලර් මිලියන 2.7ක ප්‍රදානයක්, ඒ කියන්නේ රුපියල් මිලියන 270ක ප්‍රදානයක් ලබා දීලා තිබෙනවා, මවුවරුන්ගේ සහ ළදරුවන්ගේ පෝෂණ මට්ටම වර්ධනය කරන්න.

මෙයින් ආවරණය වන්නේ 125,000ක් වූ ජනගහනයක් පමණයි. ඒ කියන්නේ සියයට 11ක් පමණයි. ඉතිරි සියයට 89ක් වූ මවුවරුන්ගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීම වෙනුවෙන් වර්තමාන ආණ්ඩුව කොපමණ මුදලක් වැය කරනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය මේකට අදාළ නැහැ. මේ සම්බන්ධයෙන් එතුමා වෙනම ප්‍රශ්නයක් මතු කරනවා නම් උත්තර දෙන්න පුළුවන්. නමුත් මවුවරුන්ගේ පෝෂණය සම්බන්ධයෙන් මෙම ජාතික වැඩසටහන සම්බන්ධව අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය ක්‍රියාත්මක වෙනවා. UNICEF වාගේ ආයතනත් ඒ සඳහා උදවු කරනවා. ඒ සියල්ලම ඒකාබද්ධ කර ගෙන තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11-1165/'11 - (1), ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன )
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 12-0454/'10 - (1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කඹුරුපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල් : යටිතල පහසුකම්
## கம்புறுப்பிட்டிய கோட்டக் கல்விக் காரியாலயம் நிருவகிக்கும் பாடசாலைகள்: உட்கட்டமைப்பு வசதிகள்
## SCHOOLS ADMINISTERED BY KAMBURUPITIYA DIVISIONAL EDUCATION OFFICE : INFRASTRUCTURE FACILITIES

0823/'10

13. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කඹුරුපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවන්ගේ ඌනතාවන් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) එම පාසල් පද්ධතිය තුළ ඇති,

(i) විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව;

(ii) පුස්තකාල සහ විද්‍යාගාර පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව;

(iii) ගුරු නිවාස සංඛ්‍යාව;

(iv) විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව;

(vi) ඉහත අඩු පාඩු සහිත පාසල්වල නම්, ලිපිනයන් සහ දුරකථන අංක;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පාසල්වල පවතින අඩු පාඩු සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் முலடியன வலயக் கல்விக் காரியாலயத்தின் கீழ் வரும் கம்புறுப்பிட்டிய கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படுகின்ற பாடசாலைகளில் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் பொதுத் தேவைகளில் பற்றாக்குறை காணப்படு கின்றதென்பதை அவர் அறிவாரா?

(ஆ) மேற்படி பாடசாலை முறைமையினுள் உள்ள,

(i) மின்சார வசதியில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) நூல்நிலையம் மற்றும் விஞ்ஞான ஆய்வுகூட வசதிகளில்லாத பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iii) ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(iv) மின்சார வசதியில்லாத ஆசிரிய இல்லங்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(v) தளபாடம் தேவையாகவுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(vi) மேற்படி குறைபாடுகள் நிலவுகின்ற பாடசாலை களின் பெயர்கள், முகவரிகள், தொலைபேசி இலக்கங்கள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) மேற்படி பாடசாலைகளில் நிலவுகின்ற குறைபாடு களை நிவர்த்தி செய்வதற்கு தேவையான நிதி ஒதுக்கீட்டினை மேற்கொள்வதற்கு அவர் நடவடிக்கையெடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், இதற்கு எவ்வளவு காலம் எடுக்கு மென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that there is a shortage of infrastructure facilities and common amenities in the Government schools administered by the Kamburupitiya Divisional Education Office of the Mulatiyana Zonal Educational Office in the Matara District ?

(b) Will he state in relation to the above schools-

(i) the number of schools without electricity;

(ii) the number of schools without library and laboratory facilities;

(iii) the number of teachers' quarters;

(iv) the number of teachers' quarters without electricity;

(v) the number of schools with furniture requirements; and

(vi) the names, addresses and telephone numbers of schools with aforesaid shortages?

(c) Will he state-

(i) whether arrangements will be made to allocate the required funds to fulfil the shortcomings in the aforesaid schools; and

(ii) if so, the period of time taken for it?

(d) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඌනතාවන් සමනය කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) (i) විදුලිය නොමැති පාසල් නොමැත.

(ii) පුස්තකාල සහ විද්‍යාගාර ශිෂ්‍ය සංඛ්‍යාව අනුව තීරණය වේ. සමහර පාසල්වල පංති කාමරය තුළ කුඩා පුස්තකාල ඇත.

(iii) ගුරු නිවාස සංඛ්‍යාව 04යි.

(iv) විදුලිය නොමැති ගුරු නිවාස 02යි.

(v) ලී භාණ්ඩ අවශ්‍යතා ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ලබා දේ.

(vi) සඳහන් කරමි. ඇමුණුමෙහි දක්වා ඇත.

දුරකථන අංක දුරකථන නාමාවලියෙන් ලබා ගත හැක.

(ඈ) (i) වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත පළාත් සභාව මඟින් කළමනාකරණය කරනු ලැබේ.

(ii) මූල්‍ය පහසුකම් ලැබෙන ආකාරය අනුව කාලය තීරණය වේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, පිළිතුර ගැන සෑහීමකට පත් වෙනවා. ඒ නිසා අතුරු ප්‍රශ්න නැහැ.

## නැඟෙනහිර පළාතේ ගර්භිණී මව්වරුන්ගේ මන්දපෝෂණය: ක්‍රියාමාර්ග
## கிழக்கு மாகாண கர்ப்பிணித் தாய்மாரின் போஷாக்கின்மை: நடவடிக்கை
## MALNUTRITION IN PREGNANT MOTHERS OF EASTERN PROVINCE : MEASURES TAKEN

1033/'10

14. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2010 අවසන් වන විට ශ්‍රී ලංකාවේ නැඟෙනහිර පළාතේ මන්දපෝෂණයෙන් පෙළුණු ගර්භිණී මව්වරුන්ගේ ප්‍රතිශතය කවරේද;

(ii) එම මන්දපෝෂණ තත්ත්වය මඟ හැරවීමට රජය ගන්නා වූ පියවර කවරේද;

(iii) එම පියවර නැඟෙනහිර පළාතේ ගර්භිණී මව්වරුන්ගේ මන්දපෝෂණය මඟ හැරවීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டு இறுதியளவில் இலங்கையின் கிழக்கு மாகாணத்தில் போஷாக்கின்மையால் பாதிக்கப்பட்டிருந்த கர்ப்பிணித் தாய்மார்களின் சதவீதம் எவ்வளவென்பதையும்;

(ii) இப்போஷாக்கின்மை நிலைமைகளைப் போக்குவதற்கு அரசாங்கம் மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி நடவடிக்கைகள் கிழக்கு மாகாணத்தில் கர்ப்பிணித் தாய்மார்களின் போஷாக்கின்மையைப் போக்குவதற்கு போதுமானவையா என்பதையும்

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Will he state-

(i) the percentage of pregnant mothers in the Eastern Province of Sri Lanka, who suffered from malnutrition as at the end of year 2010;

(ii) the steps to be taken by the Government to arrest that state of malnutrition;

(iii) whether such steps are sufficient to arrest the state of malnutrition prevalent among the pregnant mothers in the estate sector ?

(b) If not, why ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) සියයට 10.8යි.

(ii) සෑම ගර්භිණී මවකටම සති 12න් පසුව හා ප්‍රසූතියෙන් මාස 06ක් දක්වා යකඩ, ෆෝලික් අම්ලය හා විටමින් සී පෙති ලබා දීම.

සෑම ගර්භිණී මවකටම පෝෂණීය ආහාර, තම ආහාර වේලට එක්කර ගැනීමට උපදෙස් ලබා දීම.

සෑම ගර්භිණී මවකටම මාතෘ සායනයේදී ත්‍රිපෝෂ පැකට් 2 බැගින් මාසිකව ලබා දීම.

ගර්භිණී සමයේ මන්දපෝෂණයේ ලක්ෂණ පිළිබඳව මාතෘ සායනයේදී හා පවුල් සෞඛ්‍ය සේවිකාව ගෘහ පිවිසුම්වලදී නිරතුරු පරීක්ෂා කිරීම.

(iii) ඔව්.

(ආ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සමාවන්න, සියයට කීයද කිව්වේ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
සියයට 10.8ක්. ඒ කාලයේ නැඟෙනහිර පළාතට යන්නත් බැරි වුණා. දැන් අපේ ජනාධිපතිතුමා ඒ පළාත් සභාවත් පිහිටුවලා, පරිපාලනයක් ඇති කරලා සියලු කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා තමයි මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න පුළුවන් වන්නේ; මේ වාගේ සේවාවක් කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේට ප්‍රශ්න අහන්න පුළුවන් වෙලා තිබෙන්නේත් ඒ නිසා. ඒ කාලයේ මේ පළාත් අල්ලා ගන්නකොට තමුන්නාන්සේලාගේ නායකතුමා තොප්පිගල කැලයක් කිව්වා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා ලබා දුන්න පළමුවෙනි පිළිතුර ගැන මට ගැටලුවක් තිබෙනවා. මා ළඟ තිබෙන සංඛ්‍යාලේඛන අනුව ඒ ප්‍රතිශතය සියයට 29.6යි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
නැහැ. සියයට 10.8යි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා වග කීමෙන් කියනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
වග කීමෙන් කියනවා, සියයට 10.8යි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, එහෙම නම් මාගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මවුවරුන් 31,000ක් සිටින නැඟෙනහිර පළාතේ ත්‍රිපෝෂ ලබා දීම තුළින් ආවරණය වන්නේ මවුවරුන් 25,000ක් පමණයි. ඒ කියන්නේ සියයට 80ක ආවරණයක් තිබෙනවා. නමුත් ඉතිරි සියයට 20ට ත්‍රිපෝෂ නොලැබෙන තත්ත්වයක් තිබෙනවා. ඒක මඟ හරවා ගන්නට ගන්නා වූ පියවර මොනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
වාර්තා වන මවුවරුන් සියලු දෙනාටම ත්‍රිපෝෂ ලබා දීම කරන්නේ නැහැ. අඩු ආදායම් ලබන, ඒ අවශ්‍යතාව තිබෙන සියලු දෙනාට ඒවා ලබා දීමට අපි කටයුතු කරනවා. අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ සටහන යටතේ පෝෂණ මල්ල ලබා දෙන්නත්, සමෘද්ධි ප්‍රතිලාභ ලබන අයට රුපියල් 500ක වෙනම දීමනාවක් ලබා දෙන්නත් කටයුතු කර තිබෙනවා. මේ ප්‍රමාණය සියයට 80ක් වෙන්නේ ඒකයි. මුළු පිරිසටම ලබා දෙන්න අවශ්‍ය නැහැ. අවශ්‍ය අයට පමණක් ත්‍රිපෝෂ ලබා දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා ලබා දුන් පිළිතුර ප්‍රකාරව මම මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. නැඟෙනහිර පළාතේ සෞඛ්‍ය සේවා කොට්ඨාස 690ක් තිබෙනවා. නමුත් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් ඉන්නේ 490යි. 200ක පුරප්පාඩු තිබෙනවා. නැඟෙනහිර නවෝදය යටතේ මේ පුරප්පාඩු 200 පුරවන්නේ කවදාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
නැඟෙනහිර නවෝදය යටතේ නොවෙයි, රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ දැනට 1000ක් බඳවා ගැනීමට කටයුතු කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඉදිරි කාලයේ දෙවැනි කණ්ඩායම බඳවා ගන්න කොට මේ අවශ්‍යතා ඉටු කරන්න පුළුවන්. තමුන්නාන්සේලාත් සතුටු වන්න ඕනෑ, අපේ ජනාධිපතිතුමා නැඟෙනහිර සාමයක් ඇති කරලා, පිල්ලෙයාන් කියන මහ ඇමතිතුමා පත් කරලා, පාලනයක් ඇති කරලා කටයුතු කරන එක ගැන. මේක තමයි ජයග්‍රහණය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
උත්තරය කෙටියෙන් දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතකොට පිල්ලෙයාන්ද මන්ද පෝෂණය පිළිබඳව කටයුතු කරන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නයත් අහනවාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මාගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස 544ක් තිබියදීත්, ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන තිබෙන්නේ 180යි. 364ක අඩුවක් තිබෙනවා. ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන 364ක් නැඟෙනහිර පළාතේ ස්ථාපනය කරන්න කටයුතු කරන්නේ කවදාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ගරු කථානායකතුමනි, පුළුවන් ආකාරයට ඉතා ඉක්මනින් ඒ සම්බන්ධව කටයුතු කරනවා. සෞඛ්‍ය මධ්‍යස්ථාන නැති වුණත් ප්‍රජා සෞඛ්‍ය සේවාව ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය හරහා තමයි ක්‍රියාත්මක කරන්නේ. ඊට සුදුසු ස්ථානයක් අවශ්‍යයි. එය ගමේ ප්‍රජාව එකතු වෙන පොදු ස්ථානයක් වන්න පුළුවන්; ඉස්කෝලයක් වන්න පුළුවන්. මේ ආයතනය නොතිබීම මේ පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කරන්න බාධකයක් වෙන්නේ නැහැ. නමුත් සුදුසු ස්ථාන අවශ්‍යයි. ඉදිරි කාලයේදී ඒ කටයුත්ත ඉටු කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 15 -1166/'11- (1), ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ආනයනික භාණ්ඩ මත පැනවෙන තීරු බදු : විස්තර
## இறக்குமதிப் பொருட்கள் மீதான வரிகள்: விபரம்
## DUTY IMPOSED ON IMPORTED ITEMS: DETAILS

0376/'10

1. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (5):

(අ) (i) ආනයනික භාණ්ඩ වන කිරි පිටි, ගෑස්, සීනි, පරිප්පු, ලූනු, අර්තාපල්, සහල්, ටින් මාළු සහ ඛනිජ තෙල් මත පැනවෙන තීරු බදු සහ අනෙකුත් සියලු ආකාරයේ බදු ප්‍රමාණ කොපමණද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ ඉහත සඳහන් භාණ්ඩ ආනයනය කරන ලද ප්‍රමාණයන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 5 තුළ බදු පැනවීමෙන් උපයා ගත් ආදායම කොපමණද;

(iv) එකී භාණ්ඩ අතරින් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන යම් භාණ්ඩ වේ නම්, පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල නිෂ්පාදන ප්‍රමාණයන් වාර්ෂික පදනමින් කොපමණද;

(v) පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල වාර්ෂික පරිභෝජනය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பால்மா, எரிவாயு, சீனி, பருப்பு, வெங்காயம், உருளைக்கிழங்கு, அரிசி, தகரத்தில் அடைக்கப்பட்ட மீன், பெற்றோலியம் ஆகிய இறக்குமதிப் பொருட்கள்மீது விதிக்கப்படும் சுங்கவரி மற்றும் ஏனைய சகல விதமான வரிகளையும்;

(ii) கடந்த 10 வருடங்களாக இறக்குமதி செய்யப்பட்ட மேற்படி பொருட்களின் அளவையும்;

(iii) கடந்த 5 வருடங்களாக வரி விதிப்பின்மூலம் ஈட்டப்பட்ட வருமானத்தையும்;

(iv) மேற்படி பொருட்களில் ஏதாவது கடந்த 5 வருடங்களில் உள்ளூரில் உற்பத்தி செய்யப்பட்டிருப்பின் அவற்றின் அளவை வருடாந்த அடிப்படையிலும்;

(v) கடந்த 5 வருடங்களுக்கான மேற்படி பொருட்களின் வருடாந்த நுகர்வையும்

தனித்தனியாக அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning :

(a) Will he inform this House, separately -

(i) the amounts of duty and all other forms of taxes imposed on imported items, namely milk powder, gas, sugar, dhal, onions, potatoes, rice, canned fish and petroleum;

(ii) the quantities of the aforesaid items imported for the last 10 years;

(iii) the revenue earned through imposition of taxes for the last five years;

(iv) the quantities of them produced locally, if any, for the last five years on per year basis; and

(v) the annual consumption of those items for last the last years?

(b) If not, why?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன )
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, දීර්ඝ පිළිතුරක්. ඔබතුමන්ගේ අවසරය ලැබෙනවා නම් පිළිතුර සභාගත කරන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දීර්ඝ පිළිතුරක් නම් සභාගත කරන්න.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ආනයනික භාණ්ඩ වන කිරි පිටි, ගෑස්, සීනි, පරිප්පු, ලූනු, අර්තාපල්, සහල්, ටින් මාළු සහ ඛනිජ තෙල් මත පැනවෙන තීරුබදු සහ අනෙකුත් සියලු ආකාරයේ බදු ප්‍රමාණයන් පහත වගුවේ දැක්වේ.

| | ආනයනික භාණ්ඩ සඳහා 2011.06.02 දිනට පවතින බදු ප්‍රමාණ | | | | | |
|---|---|---|---|---|---|---|
| භාණ්ඩය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | තීරුබදු | එකතුකළ අගය මත බදු | නිෂ්පාදන බදු | වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු | ජාතිය ගොඩනැගීමේ බදු |
| කිරිපිටි | නැත | නිදහස් (තීරුබදු සම්පූර්ණයෙන්ම ඉවත්කර ඇත) | - | නැත | 5% | 2% |
| ගෑස් | නැත | නිදහස් | නිදහස් | නැත | 5% | 2% |
| සීනි | කි.ග්‍රෑමයට රු.5/- | - | - | - | - | |
| පරිප්පු - සම්පූර්ණ | කි.ග්‍රෑමයට රු.10/- | - | - | - | - | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පරිප්පු - පියලි කල | කි.ග්‍රෑමයට රු.15/- | — | — | — | — | — |
| ළූනු - ලොකු ළූනු | කි.ග්‍රෑමයට රු.10/- | — | — | — | — | — |
| ළූනු - රතු ළූනු | කි.ග්‍රෑමයට රු.25/- | — | — | — | — | — |
| ළූනු - සුදු ළූනු | කි.ග්‍රෑමයට රු.10/- | — | — | — | — | — |
| අර්තාපල් | කි.ග්‍රෑමයට රු.30/- | — | — | — | — | — |
| සහල් | නැත | කි.ග්‍රෑමයට රු.20/- | නැත | නැත | 5% | 2% |
| ටින් මාළු | කි.ග්‍රෑමයට රු.85/- | — | — | — | — | — |
| ඛනිජ තෙල් - පෙට්‍රල් | — | නිදහස් (ලීටරයකට රු.35/- කිරුබද්ද සම්පූර්ණයෙන්ම ඉවත්කර ඇත) | — | ලීටරයට රු.25/- | 5% | 2% |
| ඛනිජ තෙල් - ඩීසල් | — | නිදහස් (ලීටරයකට රු.15/- කිරුබද්ද සම්පූර්ණයෙන්ම ඉවත්කර ඇත) | — | ලීටරයට රු.2.50 | 5% | 2% — |

(ii) පසුගිය වර්ෂ 08ක් තුළ (2003 සිට 2010 මැයි දක්වා) ආනයනික භාණ්ඩ වන කිරි පිටි, ගැස්, සීනි, පරිප්පු, ළූනු, අර්තාපල්, සහල්, ටින් මාළු සහ ඛනිජ තෙල් ආනයනය කරන ලද ප්‍රමාණයන් පහත වගු මගින් දැක්වේ.

| අනු අංකය | භාණ්ඩ වර්ගය | 2010 ජුනි මස දක්වා | | 2009 | | 2008 | | 2007 | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඒකක ප්‍රමාණය කි.ග්‍රෑ | මි.ර.ගැ. වටිනාකම (රු.) | ඒකක ප්‍රමාණය කි.ග්‍රෑ | මි.ර.ගැ. වටිනාකම (රු.) | ඒකක ප්‍රමාණය කි.ග්‍රෑ | මි.ර.ගැ. වටිනාකම (රු.) | ඒකක ප්‍රමාණය කි.ග්‍රෑ | මි.ර.ගැ. වටිනාකම (රු.) |
| 1 | කිරිපිටි | 38,090,734.94 | 14,019,112,087.00 | 63,493,651.24 | 18,374,651,198.00 | 63,774,381.11 | 30,581,380,716.00 | 65,587,138.22 | 21,285,682,061.00 |
| 2 | ගැස් | 118,185,868 | 7,825,261,680.00 | 160,157,525.60 | 11,445,690,146.00 | 147,781,351 | 14,662,233,932.00 | 159,441,328.60 | 12,247,322,649.00 |
| 3 | සීනි | 317,196,628 | 25,196,623,933.00 | 515,089,670.70 | 28,559,475,996.00 | 90,406,239.56 | 3,746,668,952.00 | 589,385,299 | 20,144,275,177.00 |
| 4 | පරිප්පු - සම්පූර්ණ සහ පියලි කල | 86,066,911 | 9,850,084,188.00 | 78,327,412 | 8,945,017,162.00 | 67,860,571 | 7,737,224,686.00 | 12,260,298 | 1,005,388,163.00 |
| 5 | ළූනු - ලොකු | 103,381,440.20 | 3,728,108,380.00 | 148,927,068.40 | 4,838,368,213.00 | 20,907,982.10 | 761,962,163.00 | 146,182,384.90 | 4,530,183,963.00 |
| 6 | ළූනු - රතු ළූනු | 10,476,935 | 532,278,497.00 | 16,731,422.54 | 1,103,861,120.00 | 3,219,905 | 201,752,604.00 | 24,510,862.56 | 972,157,012.00 |
| 7 | අර්තාපල් | 79,108,242.81 | 2,230,178,821.00 | 104,060,190.50 | 2,728,250,232.00 | 105,544,448.60 | 2,672,544,632.00 | 96,271,456 | 2,290,408,644.00 |
| 8 | සහල් | 137,224,205 | 7,180,735,011.00 | 64,580,771.76 | 3,202,304,913.00 | 118,503,981.80 | 5,063,564,003.00 | 89,318,302.41 | 4,322,749,161.00 |
| 9 | ටින් මාළු | 10,417,999.90 | 2,183,025,524.00 | 13,880,347.94 | 3,634,872,936.00 | 18,500,666.56 | 4,139,484,686.00 | 24,166,801.62 | 3,894,739,571.00 |
| 10 | ඛනිජ තෙල් | 2,113,942,823 | 158,285,637,477.00 | 3,531,163,567 | 238,812,990,524.00 | 1,520,034,649 | 222,046,862,709.00 | 542,107,117 | 100,452,052,346.00 |

| අනු අංකය | භාණ්ඩ වර්ගය | 2006 | | 2005 | | 2004 | | 2003 | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඒකක ප්‍රමාණය කි.ග්‍රෑ | මි.ර.ගැ. වටිනාකම (රු.) | ඒකක ප්‍රමාණය කි.ග්‍රෑ | මි.ර.ගැ. වටිනාකම (රු.) | ඒකක ප්‍රමාණය කි.ග්‍රෑ | මි.ර.ගැ. වටිනාකම (රු.) | ඒකක ප්‍රමාණය කි.ග්‍රෑ | මි.ර.ගැ. වටිනාකම (රු.) |
| 1 | කිරිපිටි | 74,812,257.17 | 18,182,262,237.00 | 81,461,243.08 | 16,578,950,718.00 | 83,017,739.07 | 13,628,634,738.00 | 64,132,102.85 | 11,126,957,390 |
| 2 | ගෑස් | 137,673,651.20 | 9,220,799,395.00 | 152,584,685.70 | 7,488,075,766.00 | 131,125,397.40 | 6,010,271,477.00 | 141,650,532.70 | 4,723,915,470 |
| 3 | සීනි | 634,714,492.50 | 23,583,734,465.00 | 529,040,934 | 17,047,420,335.00 | 525,548,109.60 | 13,201,142,279.00 | 566,140,048.80 | 12,176,021,341 |
| 4 | පරිප්පු - සම්පූර්ණ සහ පියලි කළ | 115,929,382 | 4,021,770,522.00 | 99,441,769 | 3,620,118,261.00 | 91,691,152 | 3,211,213,378.00 | 103,813,502 | 2,954,603,583 |
| 5 | ලූනු - ලොකු ලූනු | 128,736,374.50 | 2,089,269,422.00 | 130,586,512.40 | 2,131,605,577.00 | 126,830,605.60 | 2,345,837,829.00 | 134,213,569.20 | 2,083,441,766 |
| 6 | ලූනු - රතු ලූනු | 11,717,525 | 408,068,457.00 | 11,380,096 | 339,386,449.00 | 2,565,601.25 | 74,102,239.00 | 30,730 | 771,650 |
| 7 | අර්තාපල් | 48,986,603.15 | 1,124,095,850.00 | 48,222,547 | 891,548,739.00 | 32,155,287 | 490,235,336.00 | 41,257,870.20 | 540,014,044 |
| 8 | සහල් | 11,207,345.82.00 | 556,063,695.00 | 64,572,045.86 | 1,980,722,079.00 | 258,483,609.30 | 7,387,093,468.00 | 33,203,282.85 | 797,694,180 |
| 9 | ටින් මාළු | 20,190,660.24.00 | 2,828,383,165.00 | 23,907,279.81 | 2,699,355,794.00 | 18,251,963.67 | 1,940,711,843.00 | 18,296,586.59 | 1,742,071,309 |
| 10 | බනිජ තෙල් | 137,673,651.20 | 9,220,799,395.00 | 1,532,551,414 | 62,862,104,414.00 | 2,482,489,834 | 84,529,330,565.00 | 2,202,705,720 | 53,954,225,724 |

(iii) පසුගිය වර්ෂ 5 තුළ ආනයනික භාණ්ඩ වන කිරි පිටි, ගෑස්, සීනි, පරිප්පු, ලූනු, අර්තාපල්, සහල්, ටින් මාළු සහ බනිජ තෙල් මත බදු පැනවීමෙන් උපයාගත් ආදායම (රු. මිලියන වලින්) පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | බදු වර්ගය | කිරිපිටි | ගෑස් | සීනි | පරිප්පු | ලූනු | අර්තාපල් | සහල් | ටින්මාළු | බනිජ තෙල් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2005 | ආනයන තීරුබදු | 1,494.16 | 0.00 | 29.71 | 0.23 | 1,364.19 | 885.99 | 89.60 | 300.07 | 0.00 |
| | ආනයන සෙස් බදු | 0.00 | 0.00 | 0.00 | 0.00 | 17.86 | 11.66 | 0.05 | 0.00 | 0.00 |
| | නිෂ්පාදන බදු | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 528.20 |
| | සමාජ ආරක්ෂණ බදු | 3.69 | 0.00 | 0.07 | 0.00 | 3.41 | 2.21 | 0.23 | 0.83 | 0.03 |
| | වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු | 246.24 | 112.33 | 255.50 | 53.61 | 37.09 | 13.37 | 29.60 | 39.92 | 909.29 |
| | අධිභාරය | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.05 | 0.00 | 30.01 | 0.00 |
| | එකතුකළ අගය මත බදු | 558.17 | 581.52 | 909.31 | 190.30 | 205.16 | 95.30 | 0.00 | 474.66 | 324.87 |
| | **2005 වසරේ මුළු වටිනාකම** | **2,302.25** | **639.85** | **1,194.59** | **244.13** | **1,627.71** | **1,008.58** | **119.48** | **845.48** | **1,762.39** |
| 2006 | ආනයන තීරුබදු | 1,644.71 | 0.00 | 267.67 | 0.08 | 1,185.94 | 647.29 | 126.94 | 296.20 | 0.00 |
| | ආනයන සෙස් බදු | 0.00 | 0.00 | 0.00 | 0.00 | 113.85 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | නිෂ්පාදන බදු | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 17.12 |
| | සමාජ ආරක්ෂණ බදු | 16.41 | 0.00 | 2.68 | 0.00 | 11.86 | 6.47 | 1.27 | 3.26 | 0.17 |
| | වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු | 454.07 | 230.50 | 589.09 | 100.45 | 62.43 | 28.10 | 13.90 | 70.71 | 2,011.67 |
| | අධිභාරය | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 29.62 | 0.00 |
| | එකතුකළ අගය මත බදු | 0.00 | 0.00 | 1,308.50 | 221.27 | 202.61 | 94.59 | 0.00 | 515.47 | 0.01 |
| | **2006 වසරේ මුළු වටිනාකම** | **2,115.20** | **230.50** | **2,167.93** | **321.80** | **1,576.69** | **776.45** | **142.10** | **915.26** | **2,028.97** |
| 2007 | ආනයන තීරුබදු | 1,299.88 | 0.01 | 3,890.58 | 129.31 | 1,091.20 | 877.58 | 127.03 | 186.67 | 170.10 |
| | ආනයන සෙස් බදු | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | නිෂ්පාදන බදු | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 1,417.75 |
| | සමාජ ආරක්ෂණ බදු | 12.06 | 0.00 | 16.72 | 0.00 | 8.17 | 5.03 | 1.27 | 0.11 | 16.05 |
| | වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු | 401.19 | 367.41 | 318.32 | 90.49 | 109.78 | 38.90 | 125.09 | 52.32 | 228.42 |
| | අධිභාරය | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.02 | 0.00 | 1.00 | 17.01 |
| | එකතුකළ අගය මත බදු | 0.00 | 0.00 | 683.12 | 170.43 | 247.60 | 98.48 | 0.00 | 256.83 | 708.86 |
| | **2007 වසරේ මුළු වටිනාකම** | **1,713.13** | **367.42** | **4,908.74** | **390.23** | **1,456.74** | **1,020.00** | **253.38** | **496.93** | **2,558.19** |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2008 | ආනයන තීරුබදු | 139.26 | 0.00 | 487.75 | 33.98 | 257.81 | 541.31 | 185.35 | 16.22 | 6,486.65 |
| | ආනයන සෙස් බදු | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.07 | 0.00 | 1,144.45 |
| | නිෂ්පාදන බදු | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 18,789.53 |
| | සමාජ ආරක්ෂණ බදු | 0.05 | 0.00 | 5.39 | 0.07 | 2.68 | 0.51 | 2.78 | 0.02 | 356.48 |
| | විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 259.93 | 0.00 | 7,108.74 | 382.44 | 2,961.78 | 1,203.56 | 0.00 | 445.96 | 0.00 |
| | වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු | 0.53 | 439.87 | 41.79 | 6.37 | 50.19 | 1.95 | 137.78 | 0.29 | 10,434.41 |
| | අධිභාරය | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.21 | 0.17 | 946.69 |
| | එකතුකළ අගය මත බදු | 0.00 | 0.00 | 97.48 | 12.27 | 103.51 | 5.48 | 1.12 | 0.69 | 5,125.88 |
| | **2008 වසරේ මුළු වටිනාකම** | **399.76** | **439.87** | **7,741.16** | **435.13** | **3,375.97** | **1,752.82** | **327.31** | **463.33** | **43,284.07** |
| 2009 | ආනයන තීරුබදු | 4,935.08 | 0.00 | 179.31 | 0.00 | 68.27 | 0.00 | 287.24 | 0.00 | 6,531.45 |
| | ආනයන සෙස් බදු | 0.00 | 76.15 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.02 | 0.00 | 2.46 |
| | නිෂ්පාදන බදු | 0.00 | 2,963.56 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 6,369.42 |
| | සමාජ ආරක්ෂණ බදු | 74.02 | 45.60 | 2.69 | 0.00 | 1.02 | 0.00 | 4.31 | 0.00 | 208.20 |
| | විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 556.59 | 0.00 | 7,135.11 | 804.93 | 3,229.47 | 2,214.54 | 24.69 | 1,017.91 | 0.00 |
| | වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු | 633.21 | 482.97 | 34.72 | 0.00 | 44.05 | 0.00 | 65.76 | 0.00 | 2,240.22 |
| | අධිභාරය | 2.75 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.04 | 0.00 | 979.72 |
| | ජාතිය ගොඩනැගීමේ බදු | 561.40 | 0.00 | 15.24 | 0.57 | 17.16 | 0.44 | 34.09 | 0.16 | 0.00 |
| | එකතුකළ අගය මත බදු | 0.00 | 0.00 | 116.80 | 0.00 | 123.89 | 0.00 | 0.19 | 0.00 | 2,757.92 |
| | **2009 වසරේ මුළු වටිනාකම** | **6,763.05** | **3,568.28** | **7,483.88** | **805.50** | **3,483.86** | **2,214.98** | **416.33** | **1,018.07** | **19,089.37** |

(iv) කිරි පිටි, ගෑස්, සීනි, පරිප්පු, ළූනු අර්තාපල්, සහල්,ටින් මාළු සහ බනිජ තෙල් අතුරින් දේශිය වශයෙන් නිෂ්පාදනය කෙරෙන භාණ්ඩ ප්‍රමාණය වාර්ෂික පදනමින් පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | දේශිය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කිරිපිටි | ගෑස් | සීනි | පරිප්පු | රතු ළූනු | ලොකු ළූනු | අර්තාපල් | සහල් | ටින් මාළු | බනිජ තෙල් |
| 2006 | 6,980.00 | 14,522.20 | 56,000.00 | - | 60,760.00 | 73,610.00 | 78,490.00 | 2,071,906.00 | - | 2,047,543.00 |
| 2007 | 7,240.00 | 16,523.60 | 31,630.00 | - | 57,040.00 | 92,160.00 | 77,390.00 | 1,938,966.00 | - | 1,791,813.00 |
| 2008 | 7,530.00 | 15,911.20 | 37,990.00 | - | 49,290.00 | 57,370.00 | 74,820.00 | 2,398,258.00 | - | 1,776,787.00 |
| 2009 | 8,660.00 | 24.513.80 | 32,000.00 | - | 46,230.00 | 81,710.00 | 61,700.00 | 2,262,965.00 | - | 1,894,910.00 |
| 2010 | | 17,171.00 (ජනවාරි සිට සැප්තැම්බර් දක්වා) | | - | 59,310.00 | 58,890.00 | 51,930.00 | 2,674,603.00 | - | 1,649,474.00 |

(v) පසුගිය වර්ෂ 5 තුළ කිරි පිටි, ගෑස්, සීනි, පරිප්පු, ළූනු , අර්තාපල්, සහල්, ටින් මාළු සහ බනිජ තෙල් වල වාර්ෂික ගෘහස්ථ පරිභෝජනය පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | ගෘහස්ථ පරිභෝජනය මෙට්‍රික් ටොන් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | කිරිපිටි (ළදරු කිරිපිටි ඇතුළත් නොවේ) | ගෑස් | සීනි | පරිප්පු | රතු ළූනු | ලොකු ළූනු | අර්තාපල් | සහල් | ටින් මාළු |
| 2002 (උතුරු නැගෙනහිර පළාත් දත්ත හැර) | 58,319.00 | 98,784.00 | 255,867.00 | 115,694.00 | 30,349.00 | 108,580.00 | 70,467.00 | 1,697,881.00 | - |
| 2006/07 (උතුරු පළාතේ සහ නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දත්ත හැර) | 78,249.00 | 106,706.00 | 281,626.00 | 124,898.00 | 49,139.00 | 125,810.00 | 102,789.00 | 1,986,127.00 | 12,926.00 |
| 2009/10 (මන්නාරම, කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික් දත්ත හැර) | 82,013.00 | 107,104.00 | 298,948.00 | 123.595.00 | 55,188.00 | 143,625.00 | 119,215.00 | 2,234,857.00 | 13,603.00 |

| වර්ෂය | දේශිය බනිජ තෙල් පරිභෝජනය - මෙට්‍රික් ටොන් | | |
|---|---|---|---|
| | පෙට්‍රල් | ඩීසල් | අනෙකුත් ඉන්ධන |
| 2010 | 633,667 | 1,631,453 | 1,416,678 |
| 2009 | 552,901 | 1,601,010 | 1,559,974 |
| 2008 | 550,345 | 1,523,250 | 1,457,885 |
| 2007 | 521,860 | 1,682,850 | 1,423,200 |
| 2006 | 506,346 | 1,588,990 | 1,358,316 |

(අ) (i) කොටස මම පැහැදිලි කිරීමක් කරන්නම්. කිරිපිටිවලට විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් නැත. තීරු බදු නිදහස්; සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත. එකතු කළ අගය මත බදු නැත. නිෂ්පාදන බදු නැත. වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සියයට 5යි. ජාතිය ගොඩ නැඟීමේ බදු සියයට 2යි.

ගෑස් සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද නැත. තීරු බදු නිදහස්. එකතු කළ අගය මත බදු නිදහස්. නිෂ්පාදන බදු නැත. වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද සියයට 5යි. ජාතිය ගොඩනැඟීමේ බද්ද සියයට 2යි.

සීනි සඳහා කිලෝ ග්‍රෑමයකට රුපියල් 5ක් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද යටතේ අය කරනවා. අනෙක් සියලුම බදුවලින් නිදහස් කර තිබෙනවා. සම්පූර්ණ පරිප්පු සඳහාත් කිලෝ ග්‍රෑමයට රුපියල් 10 බැගින් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පමණක් අය කරනවා. අනෙක් සියලුම බදුවලින් නිදහස් කර තිබෙනවා. පියලි කළ පරිප්පුවලටත් කිලෝ ග්‍රෑමයකට රුපියල් 15ක් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද අය කරනවා. අනෙක් බදුවලින් නිදහස් කර තිබෙනවා. ලූනු - ලොකු ලූනු- කිලෝ ග්‍රෑමයට විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද රුපියල් 10යි. අනෙක් බදුවලින් නිදහස් කර තිබෙනවා. ලූනු - රතු ලූනු- කිලෝ ග්‍රෑමයට රුපියල් 25ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් අය කරනවා. අනෙක් බදුවලින් නිදහස් කර තිබෙනවා. සුදු ලූනු කිලෝ ග්‍රෑමයට රුපියල් 10ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් අය කරනවා. අනෙක් බදුවලින් නිදහස් කර තිබෙනවා. අර්තාපල් කිලෝ ග්‍රෑමයකට රුපියල් 30යි. අනෙක් බදුවලින් නිදහස් කර තිබෙනවා. අර්තාපල් සඳහා බද්ද බල පැවැත්වෙන්නේ මැයි මාසයේ 03 වැනිදා සිටයි. සහල් සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක් නැත. තීරු බදු වශයෙන් කිලෝ ග්‍රෑමයකට රුපියල් 20යි. එකතු කළ අගය මත බදු නැත. නිෂ්පාදන බදු නැත. PAL සියයට 5යි. ඒ වාගේව NBT සියයට 2යි. ටින් මාළු සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට සියයට 85යි. අනෙකුත් බදුවලින් නිදහස් කර තිබෙනවා. ඛනිජ තෙල් - පෙට්‍රල්- සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද නැත. තීරු බදුවලින් නිදහස් කරලා, රුපියල් 35ක තීරු බද්ද සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත. එකතු කළ අගය මත බදුවලින් නිදහස් කර තිබෙනවා. නිෂ්පාදන බදු ලීටරයකට රුපියල් 25 බැගින් එකතු කරනවා. PAL සියයට 5 NBT සියයට 2යි. ඛනිජ තෙල්- ඩීසල්- සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද නැත. තීරුබදුවලින් නිදහස් කරලා, රුපියල් 15ක තීරු බද්ද සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබෙනවා. එකතු කළ අගය මත බදුවලින් නිදහස් කර තිබෙනවා. නිෂ්පාදන බදු ලීටරයකට රුපියල් 2.50 බැගින් තිබෙනවා. PAL සියයට 5යි. NBT සියයට 2යි.

(අ) (ii) කොටසෙන් ගරු මන්ත්‍රීතුමා අසා තිබෙන්නේ පසු ගිය වර්ෂ 08ක කාලය තුළ -2003සිට 2010 මැයි දක්වා- කිරිපිටි, ගෑස්, සීනි, පරිප්පු, ලූනු, අර්තාපල්, ටින් මාළු සහ ඛනිජ තෙල් ආනයනය කරන ලද ප්‍රමාණයන්. සභාගත කරන ලද පිළිතුරේ ඒ කොටසට අදාළ පිළිතුරත් ඇතුළත් වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
If you can, just give me the total for last year.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
The total for last year? ඒ කියන්නේ තෙල් සම්බන්ධවද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, තෙල් සම්බන්ධව.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
තෙල් පරිභෝජනයද? ඒ සියල්ලම කියවන්න ඕනෑද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අන්තිම අවුරුද්දේ ඒවා විතරක් කිව්වොත් ඇති.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
2010 කිරිපිටි -ළදරු කිරිපිටි ඇතුළත් නොවේ- මෙට්‍රික් ටොන් 82,013.00යි. ගෑස් මෙට්‍රික් ටොන් 107,104.00යි. සීනි මෙට්‍රික් ටොන් 298,948.00යි. පරිප්පු මෙට්‍රික් ටොන් 123,595.00යි. මම එය **table*** කර තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම අගය කරනවා, කල් ගිහිල්ලා හෝ මට උත්තරය ලබා දීම සම්බන්ධයෙන්.

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මම මුදල් අමාත්‍යාංශයෙන් අහන්නේ, සාමාන්‍යයෙන් කිරිපිටි පැකට් එකකට සියයට 7කුත්, ගෑස්වලට සියයට7කුත් ඒ වාගේම ටින් මාළු කිලෝ ග්රෑමයකට රුපියල් 85කුත් බදු අය කරනවායි කියන ආණ්ඩුව, ෂැංග්‍රි-ලා කොම්පැනියෙන් -විදේශ ආයෝජන සම්බන්ධයෙන්- සියයට 100ක බදු එනම් රුපියල් මිලියන 2,100ක් අය කරලා නැහැ. මේ ප්‍රමාණය අය කළා නම් මෙතැන මේ තිබෙන සම්පූර්ණ බදු ප්‍රමාණය අහක් කරන්නට තිබුණා. ඉතින් සුද්දන්ගේ බදු අහක් කරලා, අපේ අහිංසක ශ්‍රී ලංකා ජනතාවට මේ බදු දමන එක සාධාරණද නියෝජ්‍ය ඇමතිතුමනි?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, එය මේ ප්‍රශ්නයට අදාළ නැහැ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මේ පිළිබඳව කීප වතාවක්ම පිළිතුර සපයා තිබෙනවා. ඒ නිසා මම හිතන්නේ හැන්සාඩ්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මේක අහන්නේ මුදල් අමාත්‍යාංශයෙන්. බදු දමන්නේ මුදල් අමාත්‍යාංශයෙන්.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මෙම ප්‍රශ්නයට එය අදාළ නැහැ. අහපු ප්‍රශ්නයකට ඒක විශේෂ ව්‍යාපෘතියක් හැටියට ඔබතුමාට උත්තර දීලා තිබෙනවා. මේ වෙලාවේ මම ඒකට උත්තර සපයන්නේ නැහැ. ඔබතුමා වෙනම ප්‍රශ්නයක් හැටියට ඇහුවොත් අපි උත්තර දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි,-

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඔබතුමා මේක වෙනම ප්‍රශ්නයක් හැටියට යොමු කළොත් උත්තර දෙන්නම්. මෙයට අදාළ නැහැ. කිරිපිටියි, ෂැංග්‍රි-ලායි එකට යන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එතුමා නියෝජනය කරන්නේ මුදල් අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමති පදවිය.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවන අතුරු ප්‍රශ්නයත් අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි මේ පාර්ලිමේන්තුවේ ඇති කරන බදු ක්‍රියාත්මක කරන්නේ මුදල් අමාත්‍යාංශයෙන්; ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් නොවෙයි. මේ පාර්ලිමේන්තුවෙන් ඒ සුද්දන්ගේ ආයෝජනවලට සියයට 100ක් බදු ගැහුවා වුණත් ඒක මුදල් අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කරන්න තිබෙන එක පැහැර හැරලා-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නයට අදාළ නැහැ. මේකට අදාළ නැති නිසා-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අදාළ වෙනවා, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අදාළ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක අදාළ නොවන්නේ කොහොමද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. He cannot question the Chair.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ෂැංග්‍රි-ලා ගැන සඳහන් වුණේ නැහැ. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට දුන්නු පිළිතුරට ඒක අදාළ වන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවෙන් අපි පනවන බදු ක්‍රියාත්මක කරන්නේ මුදල් අමාත්‍යාංශයෙන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හරි, ඒක තමයි අහන ප්‍රශ්නවලට හැම තිස්සේම ප්‍රශ්න අහන්න අවස්ථාව තිබෙන්නේ. දැන් අපට පැහැදිලිව තිබෙන්නේ දීපු පිළිතුරට අනුව ප්‍රශ්නයක් අහන්න නේ. ඉතින් එහෙම ඇහුවොත් කියයි. එහෙමත් අහලා බලන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඛනිජ තෙල් ගැන ප්‍රශ්නයක් අහලා තිබෙනවා නේ. ඒකට ඔබතුමා කියයි "අහන්න ඛනිජ තෙල් ඇමතිතුමාගෙන්" කියලා. මම අහන්නේ මේකයි. මේ ඛනිජ තෙල් අද වරායට ගෙනෙන්න පුළුවන් රුපියල් 69ට. ඔබතුමන්ලා මේක විකුණන්නේ රුපියල් 125ට. මේ කළු කඩ ව්‍යාපාරය ගෙනි යන්නේ ආණ්ඩුවෙන් නොවෙයිද කියලා අපට උත්තර දෙන්න පුළුවන්ද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව ජනතාව විසින් පත් කරපු ආණ්ඩුවක්; වැඩ කරන ජනතාව විසින් පත් කරපු ආණ්ඩුවක්. අපි 2005 සිට මේ රටේ ජන වරම් පහක් ලබා තිබෙනවා. ඒ ප්‍රතිපත්තිය තුළ ජනතාවට සහනය දෙන්නට හැම විටම අපි කැප වෙලා තිබෙනවා. සුද්දන්ට සහනය දෙන්නට නොවෙයි; සුද්දන්ට ගැතිකම් කරන්නට නොවෙයි. තෙල් මිල ඉහළ ගිය වෙලාවේත් ඒ සහනයන් ලබා දෙන්නට මේ ආණ්ඩුව විසින් පසු ගිය කාලයේ කටයුතු කළා. මම කිව්වා අර වැට් බදු ඉවත් කරපු කථා සහ අනික් බදු ඉවත් කරපු කථා ගැන. මේ ආණ්ඩුව බැඳිලා සිටින්නේ අපේ ත්‍රී විලර් එළවන කෙනාගේ සිට අපේ පරිභෝජනය සඳහා වූ භාණ්ඩ ප්‍රවාහනය කරන ලොරි සහ ඒ ප්‍රවාහන සේවාවටත්, මගී බස් රථ ප්‍රවාහන සේවාවටත් මේ සියලුම දේට අවශ්‍ය සහන ලබා දීමටයි. ඒ සඳහා වක්‍රාකාරයෙන් සහ ඍජුව කියන දෙකෙන්ම අපි කටයුතු කර තිබෙනවා. එක පැත්තකින් ඒ බදු මිල වැඩි වෙනවා නම් අනික් පැත්තෙන් ඒ සහනය දෙනවා. ශ්‍රී ලංගමයට ලබා දෙන සහනය ගැන, මේ රටේ දුම්රියට ලබා දෙන සහනය ගැන -මේ රටේ මගී ප්‍රවාහනයට ලබා දෙන සහනය ගැන- අපේ සහෝදර මන්ත්‍රීතුමා ප්‍රශ්න කරනවා නම් වඩා හොඳයි. නමුත් ඒ පිළිබඳව අමතක කර එක පැත්තක් පිළිබඳව පමණක් අවධානය යොමු කිරීම පිළිබඳව අපි කනගාටුව ප්‍රකාශ කරනවා. "අදාළ නැහැ"යි කියන එක තමයි කියන්න ඕනෑ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන්වැනි අතුරු ප්‍රශ්නය වශයෙන් ඉදිරිපත් කරන්නේ මෙයයි. මම ගරු කථානායකතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා. අපේ මාධ්‍ය තුළින් සංස්කරණය කරන්නේ නැතිව මේක -මම අහපු ප්‍රශ්නයටත් දුන්නු උත්තරත් දීලා- [බාධා කිරීමක්] මේ ආණ්ඩුව ජනතාව පත් කරලා තිබුණා නම් මම අහන්නේ මෙන්න මේකයි. තමුන්නාන්සේලා කිව්වා රුපියල් 2,500 ලබා දෙනවා කියලා. ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් තමයි ඒ මුදල් වෙන් කරන්න තිබෙන්නේ. ඒ ආණ්ඩුව පත් කරපු ජනතාවට කනේ පාරක් ගහන්නද රුපියල් 2,500 නොදෙන්නේ කියන එක මම මේ අවස්ථාවේදී අහනවා. සුද්දන්ට දීලා අපේ ලංකාවේ අයට නොදෙන්නේ ඒක සුද්දන්ගේ ප්‍රතිපත්තියක්ද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
සුද්දන්ට නොවෙයි, කළු සුද්දන්ට.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු කථානායකතුමනි, අදත් සුද්දන්ට උඩ ගෙඩි දෙන්නේ කවුද කියන ටික අපි දන්නවා. සුද්දන්ට උඩ ගෙඩි දෙන්න; මේ රටේ රණ විරුවන් දිනා ගත්තු භූමිය ආපසු පාවා දෙන්න මේ උඩ ගෙඩි දෙන මිනිස්සුන්ට තිබෙන කැක්කුම, කිඹුල් කඳුළු හෙළන කැක්කුමක්ය කියන එක අපි මතක් කරන්න ඕනෑ. මේ රජයට ලබා දුන්නු වරම නිසා ජනතාව වෙනුවෙන් ඕනෑම වෙලාවක හිස නමන්නට ලෑස්තියි කියන එකයි අතිගරු ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව ප්‍රකාශ කළේ. ටයි කෝට් දමා ගෙන ඇවිල්ලා සුද්දන් ගැන කතා කරන අයට හැට දෙකේ කුමන්ත්‍රණය මතක් කරලා දෙන්න ඕනෑ. මේ රටේ ජනතාව වෙනුවෙන් එදා බණ්ඩාරනායක ආණ්ඩුව තෙල් ජනසතු කරන කොට, බැංකු ජනසතු කරන කොට කුමන්ත්‍රණය කළා. අදත් ඒ රුදාව තමයි මේ ඇති වෙලා තිබෙන්නේ කියන එකත් අපි මතක් කරන්න ඕනෑ. මේ රටේ ස්වාධීනත්වය, මේ රටේ භෞමික අඛණ්ඩතාව සහ ඒකීයභාවයත්, ජනතා පරමාධිපත්‍යයත් අපි පාවා දෙන්නේ නැහැ කියන ටික ඉතා ඕනෑකමින් මතක් කරන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දවල් දෙක වනකොට නිදිමත ගතියක් දැනෙනවා නේ. ඒක නැති වෙන්න පොඩ්ඩක් කථා කළාට කමක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග යටතේ පාර්ලිමේන්තුවට අසත්‍ය ප්‍රකාශ කිරීම වැරැද්දක්. අපි අහලා තිබෙන ප්‍රශ්නවලට මේ වාගේ පිළිතුරු දීම තමයි තිබෙන ප්‍රශ්නය. කරුණාකරලා ජනමාධ්‍ය තුළින් සංස්කරණය කරන්නේ නැතුව ඒ උත්තරය ලබා දෙන්නය කියා මම ඉල්ලනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා අහන අතුරු ප්‍රශ්නත් ඉස්සෙල්ලාම දුන්නා නම් හොඳයි. එතකොට සූදානම් වෙලා ඒවි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා නියෝගයක් දුන්නා නම් හරි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 5-1045/'10-(1), ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය වෙනුවෙන් මම 5 වන ප්‍රශ්නය අහනවා. [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අහනවා. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැත්තේ? ඒක අහලා තිබෙන්නේ මා ගැනයි. [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය ඇහුවේ මමයි. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කරුණාකර උත්තර දෙන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අපට ඕනෑ විධියට උත්තරය දෙනවා. වාඩි වෙන්න. තමුන්නාන්සේ පාමංකඩ යන්න. [බාධා කිරීමක්] රණ විරුවන්ට අවමන්- [බාධා කිරීමක්] සංවිධායකටත් දුන්නා- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාගත කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ නම නැහැ. [බාධා කිරීම]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලනවා. [බාධා කිරීම]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අහනවා, ඇයි උත්තර දෙන්නේ නැත්තේ කියලා. [බාධා කිරීම්] උත්තර දෙන්න ඉතින්. චන්ද්‍රිකා කුමාරතුංග-[බාධා කිරීම්]

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් තිබෙන්නේ අමාත්‍යාංශ නිවේදන, ගරු විදේශ කටයුතු ඇමතිතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඊට පෙර ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද ඒ? ඔව්, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අද දින -2011 ජුනි මස 7 වැනි දා- පාර්ලිමේන්තුවේ වැඩ පිළිවෙළ පිළිබඳව න්‍යාය පත්‍රය ඉදිරිපත් කර තිබෙනවා. මේ න්‍යාය පත්‍රයේ අංක 14 කියන යෝජනාව කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්න මා කැමැතියි. අංක 14 කියන යෝජනාවේ තිබෙන්නේ, "සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත - දෙවැනි වර කියවීම" කියලායි. ගරු කථානායකතුමනි, රජය විසින් දිගින් දිගටම පවසා සිටියා මේ පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගත්තා කියලා. මේ පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගැනීම ගැන කැබිනට් තීරණ තිබෙනවාය කිව්වා; ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මධ්‍යම කාරක සභාවේ තීරණ තිබෙනවා කිව්වා. අමාත්‍යවරු විවිධ අවස්ථාවල ඒ පිළිබඳව එවැනි ප්‍රකාශ කර තිබුණා. නමුත් ගරු කථානායකතුමනි, එම පනත් කෙටුම්පත තවමත් මෙම න්‍යාය පත්‍රයෙන් ඉවත් වෙලා නැහැ. ඒ නිසා ගරු කථානායකතුමාගෙන් මා දැන ගන්න කැමැතියි දැන් එය ඉවත් කර තිබෙනවාද, නැද්ද කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒක පක්ෂ නායකවරුන්ගේ රැස්වීමේදී කථා කරලා තීරණයකට එමු.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නැහැ, ගරු කථානායකතුමනි, සාමාන්‍ය සම්ප්‍රදායය නම් ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත මෙම සභා ගර්භය තුළින්ම ඉල්ලා අස් කර ගැනීමයි. එය පාර්ලිමේන්තුවේ පක්ෂ නායකයන්ගේ රැස්වීමේ කාර්ය භාරයක් නොවෙයි. ඉල්ලා අස් කර ගනු ලබනවා නම් මෙම ගරු සභාව ඇතුළේ එම පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
යථා කාලයේදී එයට අවශ්‍ය කටයුතු සඳහා විධිවිධාන යොදන්න. එතකොට එය න්‍යාය පත්‍රයෙන් ඉවත් කර ගන්න පුළුවන්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, පළමුවෙන්ම කැබිනට් මණ්ඩලය අනුමත කරලා තමයි මේ පනත් කෙටුම්පත න්‍යාය පත්‍රයට ගෙනාවේ. එහෙම නම් කැබිනට් එක තීරණයක් අරගෙන තිබෙනවාද, මේ පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගන්න? තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලය මේ ගැන තීරණයක් අරගෙන තිබෙනවාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒකත් රීති ප්‍රශ්නයක්ද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, ඒක අපේ මේ අනුර දිසානායක මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට අදාළ ප්‍රශ්නයක්. මේ ගරු සභාවේ ක්‍රියා කලාපය ගැනයි මම මේ අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීතුමා, මම හිතන්නේ ඒක යථා කාලයේදී ඉල්ලා අස් කර ගන්නවා කියලායි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, න්‍යාය පත්‍රයේ සඳහන් පනත් කෙටුම්පත් ඉල්ලා අස් කර ගැනීම පිළිබඳ සම්ප්‍රදායක් තිබෙනවා. ඒ සම්ප්‍රදායය අනුව රජය කටයුතු කරනවා. මේ පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගන්නා බවට රජය ඉතා පැහැදිලිව තීරණයක් අරගෙන තිබෙන්නේ. නමුත් න්‍යාය පත්‍රයෙන් ඉවත් කිරීමේ ක්‍රමය වන්නේ පක්ෂ නායක රැස්වීමේදී ඒ පිළිබඳ දන්වලා, ඊට පසුව යෝජනාවක් ඉදිරිපත් කිරීමෙනුයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. මතක් කර දුන් එකත් හොඳයි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එතුමන්ලා ඒ සම්ප්‍රදායය පිළිබඳව නොදැනුවත් වීම ගැන අප කනගාටු වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් අමාත්‍යාංශ නිවේදන. ගරු විදේශ කටයුතු ඇමතිතුමා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. දැන් විදේශ කටයුතු ඇමතිතුමා කථා කරනවා.

## විදේශ කටයුතු අමාත්‍යතුමා සහ ඉන්දියානු නියෝජිතයන් විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ නිවේදනය: විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
வெளிநாட்டலுவல்கள் அமைச்சர் மற்றும் இந்திய பிரதிநிதிகள் விடுத்த கூட்டறிக்கை: வெளிநாட்டலுவல்கள் அமைச்சரினது கூற்று
JOINT STATEMENT MADE BY MINISTER OF EXTERNAL AFFAIRS AND REPRESENTATIVES OF INDIA : STATEMENT BY MINISTER OF EXTERNAL AFFAIRS

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ. எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝගය 23(2) යටතේ මැයි 25 වනදා ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඇසූ ප්‍රශ්නයකට මේ අවස්ථාවේදී පිළිතුරු වශයෙන් විශේෂ ප්‍රකාශයක් කිරීමට මට අවසර දීම ගැන ඔබතුමාට කෘතඥ වෙනවා. ඉන්දුනීසියාවේ පැවැති නොබැඳි ජාතීන්ගේ සමුළුවට රජය නියෝජනය කිරීම වෙනුවෙන් මම ඒ අවස්ථාවේදී විදේශගත වෙලායි සිටියේ. එම නිසා ප්‍රථම වතාවට මේ ප්‍රශ්නය පිළිබඳ කරුණු මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට මම උත්සුක වෙනවා.

ගරු අනුරු කුමාර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු විවේචන සම්බන්ධයෙන් සමස්තයක් හැටියට කියන්න පුළුවන් වෙන්නේ, එතුමාගේ විවේචන හා මේ ඒකාබද්ධ නිවේදනයේ අඩංගු කරුණු අතර කිසිම සම්බන්ධයක් නැහැ කියලා. එතුමා ප්‍රකාශ කරපු අදහස් හා ඒ නිවේදනයේ අන්තර්ගත වගන්ති අතර විශාල පරතරයක් තිබෙනවා. ඒක මම ඔබතුමාට පෙන්වා දෙන්නම්. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතුව මම එයට නිදර්ශන කිහිපයක් මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට කැමැතියි. නිදසුනක් වශයෙන් ගරු මන්ත්‍රීතුමා එතුමාගේ ප්‍රකාශයේ කියනවා, "කන්කසන්තුරේ වරාය හා පලාලි ගුවන් තොටු පොළ කටයුතු ඉන්දියාවට භාර දීම- [බාධා කිරීමක්] නැහැ, නැහැ. හැන්සාඩ් වාර්තාවෙන් මම ඔබතුමාගේ වචන කියවන්නේ. මම නැවත වතාවක් කියන්නම්. "කන්කසන්තුරේ වරාය හා පලාලි ගුවන් තොටු පොළ කටයුතු ඉන්දියාවට භාර දීම ආර්ථික වශයෙන් මෙන්ම ආරක්ෂක ක්ෂේත්‍රය තුළ ද බරපතළ ප්‍රශ්න ඇති කරන බව පැහැදිලිය. මෙවැනි ආරක්ෂක මර්මස්ථානවලට ඉන්දියාව මැදිහත් වීම අපේ රටේ ජාතික ආරක්ෂාවට බරපතළ තර්ජනයක් එල්ල කරනවා" කියලා එතුමා ප්‍රකාශ කරනවා. බැලූ බැල්මට, මේක කියවන පුද්ගලයන් තුළ ලොකු භයක් ඇති වෙනවා, මේක මහ විශාල ප්‍රශ්නයක්; ආරක්ෂක ප්‍රශ්නයක් කියලා. හැබැයි ඒ පිළිබඳ ඇත්ත කථාව මොකක්ද ගරු කථානායකතුමනි? මේ ඒකාබද්ධ නිවේදනයේ කිසිම දෙයක් සඳහන් වෙලා නැහැ වරාය ගැන හෝ ගුවන් තොටු පොළ ගැන. වචනයක්වත් සඳහන් වෙලා නැහැ. මේ නිවේදනයේ සඳහන් වෙලා තිබෙන්නේ දුම්රිය මාර්ගයක් ගැන. මේ නිවේදනයේ සඳහන්ව තිබෙන්නේ ගරු කථානායකතුමනි, "Palai-KKS Railway Line" කියලා. මේ නිවේදනයේ "පලාලි" කියා සඳහන් කළ පමණින්ම මේක පලාලි ගුවන් තොටු පොළ වෙන්නේ නැහැ. "KKS" කියා සඳහන් කළ පමණින් මේක කන්කසන්තුරේ වරාය වෙන්නේ නැහැ. මේ ස්ථාන දෙක සම්බන්ධ කරන දුම්රිය මාර්ගය ගැන තමයි මේ නිවේදනයේ සඳහන් කරලා තිබෙන්නේ. ඉතින් ඒක ද්වේෂ සහගතව නොවෙයි ගරු මන්ත්‍රීතුමා කියන්න ඕනෑ. මේ පිළිබඳව නියම තත්ත්වය ගරු සභාව තුළින් අපේ රටට ඉදිරිපත් කළ යුතුයි.

මේ සම්බන්ධයෙන් මා කරුණු දෙකක් කියන්නට කැමැතියි. එකක් මේකයි. වරාය ගැන කිසිවක් සඳහන් වෙලා නැහැ, ගුවන් තොටුපළ ගැන කිසිවක් සඳහන් වෙලා නැහැ. දුම්රිය මාර්ගයක් ගැනයි කියන්නේ. දුම්රිය මාර්ගය ගැනත් මෙහි සඳහන් වී තිබෙන්නේ "finalisation of remaining agreements" කියලායි ගරු කථානායකතුමනි. ඒ කියන්නේ අනාගතය සම්බන්ධයෙන්. දැනට කිසිම එකඟතාවක් ඇති වෙලා නැහැ. අනාගතයේ මේ කරුණු සාකච්ඡා කර එකඟතාවකට එළඹීම ගැන පමණයි මේ නිවේදනයේ තිබෙන්නේ. ඒ කියන්නේ ගරු මන්ත්‍රීතුමනි, ගිවිසුම - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න ගරු මන්ත්‍රීතුමා, මා ඔබතුමාට බාධා කළේ නැහැ නේ. එකඟත්වයකට පැමිණෙන්නේ අපේ රටේ උන්නතිය, අපේ රටේ සුබ සිද්ධිය සලකා බලායි. දැනට එහෙම කිසිම එකඟත්වයක් නැහැ. එකඟත්වයකට අනාගතයේ එළඹීමට උත්සාහ දරන බව පමණයි මෙහි සඳහන් වී තිබෙන්නේ. එම නිසා මේ නිර්මාණය කර තිබෙන භීතිකාවට කිසිම පදනමක් නැති බව මා ඉතා අවධාරණාත්මකව කියන්නට කැමතියි. ගරු කථානායකතුමනි, ඒක එකක්.

ඊළඟට එතුමා සාම්පූර් ගැන මෙන්න මෙහෙම කියනවා. මෙන්න මෙහෙම වාක්‍යයක් තිබෙනවා, එතුමාගේ ප්‍රකාශයේ. "ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර විදුලිබල පද්ධතිවල අන්තර් සබඳතාවක් ඇති කිරීම සහ සාම්පූර් විදුලිබල ව්‍යාපෘතිය මඟින් අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රයට ඇති වන බලපෑම." ඒ පිළිබඳව එතුමා සඳහන් කරනවා. මෙතැන කරුණු දෙකක් තිබෙනවා ගරු කථානායකතුමනි. එකක් තමයි ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර විදුලිබල පද්ධතිවල සම්බන්ධය ඇති කිරීම. අනෙක් එක සාම්පූර් ව්‍යාපෘතිය. අපි ඒ කරුණු දෙක වෙන වෙනම ගනිමු. මේ පිළිබඳ මෙන්න මෙහෙම දෙයක් තමයි මේ ඒකාබද්ධ නිවේදනයේ සඳහන් වෙලා තිබෙන්නේ ගරු කථානායකතුමනි. ඒ වාක්‍යය මෙසේයි:

"Progress on the feasibility study for the interconnection of India Sri Lanka electricity grids was reviewed."

අතීතයේ වෙච්ච දේවල් පසු විපරමකට ලක් කර තිබෙනවා. අතීතයේ වෙච්ච දේවල් පිළිබඳව යම් කිසි අධීක්ෂණයක් කර තිබෙනවා. අනාගතය සම්බන්ධයෙන් මේකේ කිසිම එකඟත්වයක් හෝ පොරොන්දුවක් නැහැ. අතීතය පිළිබඳව; අතීතයේ සිදු වෙලා තිබෙන දේවල් හොඳද නරකද, ඒවා දියුණු කළ යුතුද, ඒවා සම්බන්ධයෙන් සෑහීමකට පත් වන්නට පුළුවන් ද යන මේවා ගැන විමර්ශනයක් කළ බව පමණයි මෙහි සඳහන් වන්නේ. එහෙම නැත්නම් ඉන්දියාවට පොරොන්දුවක් දීලා නැහැ. එකඟත්වයකට එළඹිලා නැහැ. ඒක සම්පූර්ණ වැරදි අදහසක්. මේ වචනවලින් ඒක පැහැදිලි වෙනවා. මේක මගේ අර්ථ කථනයක් නොවෙයි. මේ වචනවල සරල අර්ථය එයයි ගරු කථානායකතුමනි. එතකොට සාම්පූර් ගැන මොකක්ද සඳහන් වන්නේ? මහා ලොකු භීතිකාවක් ඇති කර ගෙන. මේ රටට අතිවිශාල විනාශයක් ඇති වෙනවාය

කියන මතය ඇති කිරීමට කිසිම පදනමක් නැහැ ගරු කථානායකතුමනි.

සාම්පූර් ගැන මොකක්ද මෙහි සඳහන් වන්නේ?

"both sides agreed to the early conclusion of Agreements related to the Joint Venture Thermal Power Project between NTPC and CEB at Sampur-"

අනාගතයේ මේක කරන්න සාකච්ඡා කර ගෙන යමු කියලායි සඳහන් වන්නේ. මොකක්ද එහි වරද? සාකච්ඡාවල වරදක් නැහැ. සාකච්ඡාවේ ප්‍රතිඵලයක් වශයෙන් අහිතකර දෙයක් වෙනවා නම් එතකොට විවේචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. මේ අවස්ථාවේදී සාම්පූර් සම්බන්ධයෙන් කිසිම එකඟත්වයක් නැහැ. එතුමා සඳහන් කරපු අදහසයි මේ නිවේදනයේ තිබෙන එකයි අහසයි පොළොවයි වාගේ වෙනස්. එක පැත්තක තිබෙනවා ඒකාබද්ධ නිවේදනය. අනෙක් පැත්තේ තිබෙනවා ගරු මන්ත්‍රීතුමාගේ විවේචනය. මේ දෙක කිසිසේත් සම්බන්ධ කරන්න බැහැ. අහසයි පොළොවයි වාගේ වෙනසක් මේ දෙක අතර තිබෙනවා.

එපමණක් නොවෙයි ගරු කථානායකතුමනි. බලන්න, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය කියවන ඕනෑම කෙනකුට පැහැදිලි වෙන්නේ මොකක්ද කියලා. ඒ කියන්නේ, මේ ඒකාබද්ධ නිවේදනය බලන්නේ නැතිව ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය කියවනවා නම් පැහැදිලි වෙන්නේ මොකක්ද? සම්පූර්ණ වැරදි චිත්‍රයකුයි මේ සම්බන්ධයෙන් මතු වන්නේ.

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයේ සඳහන් වෙනවා දුම්රිය සහ ධීවර යන ක්ෂේත්‍රවලට ඉන්දියාවට අවශ්‍ය ලෙස මැදිහත් වීමට මේකෙන් ඉඩ ලැබෙනවාය කියලා. ගරු කථානායකතුමනි, දැන් අපි පොඩ්ඩක් බලමු ධීවර හා දුම්රිය ගැන මෙහි -ඒකාබද්ධ නිවේදනයේ - සඳහන් වෙලා තිබෙන්නේ මොකක්ද කියලා. දුම්රිය ගැන සඳහන් වෙලා තිබෙන්නේ මෙපමණයි.

"…..establishment of a new signalling and telecommunication system and procurement of rolling stock…."

මේ කථා කරන්නේ මහා ලොකු ආරක්ෂක ප්‍රශ්න ගැන නොවෙයි. දුම්රිය මැදිරි ගැන. Rolling stock, signalling කරන උපකරණ ගැන. මගීන්ගේ පහසුව සඳහා සපයා දෙන ලීවලින් හදලා තිබෙන rolling stock උපකරණ ගැන. එතකොට මේකෙන් ඇති වන මහා ලොකු භීතිය මොකක්ද ගරු කථානායකතුමනි? දුම්රිය ගැන එපමණයි. අනෙක් එක ධීවර අංශය. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය කියවන ඕනෑම කෙනකුට අදහසක් ඇති වෙනවා අපේ සමුද්‍ර සම්පත්, මේ දිවයින වටා තිබෙන සමුද්‍ර තීරය සම්බන්ධයෙන් පවතින අපේ ස්වාධිපත්‍ය කාට හරි පවරලා දීලා තිබෙනවාය කියලා. සම්පූර්ණ මිථ්‍යාවක් ගරු කථානායකතුමනි. ධීවර ක්ෂේත්‍රය ගැන මොකක්ද මේ ඒකාබද්ධ නිවේදනයේ සඳහන් වෙලා තිබෙන්නේ? මෙන්න මෙපමණයි එහි සඳහන් වෙලා තිබෙන්නේ:

"….the two sides emphasised the importance of an early conclusion of the draft Memorandum of Understanding on Development and Cooperation in the field of Fisheries between India and Sri Lanka."

ඒ කියන්නේ මොකක්ද? "මේ ප්‍රශ්නය විසඳීම සඳහා යන්ත්‍රණයක් හදලා තිබෙනවා, අපි ඒ සාකච්ඡා ඉදිරියට කර ගෙන යමු, අනාගතයේදී දෙපාර්ශ්වයම සෑහීමට පත් වන පරිදි ඒකාබද්ධතා ගිවිසුමකට එළඹීමට අපි ප්‍රයත්න දරමු" කියන අදහස පමණයි මේ ප්‍රකාශනයේ අන්තර්ගත වෙලා තිබෙන්නේ. මම අහනවා, ඒකේ තිබෙන වරද කුමක්ද, මේ රටට ඇති වන තර්ජනය කුමක්ද කියා.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයේ සඳහන් වෙනවා, "බලශක්ති ක්ෂේත්‍රය මෙන්ම විදුලි සන්දේශ ක්ෂේත්‍රයටද අත පෙවීම සඳහා ඉන්දියාවට ආධිපත්‍යය ලබා දීලා තිබෙනවා" කියා. විදුලි සන්දේශ ක්ෂේත්‍රය ගැන මේ නිවේදනයේ සඳහන් වෙලා තිබෙන දේවල් දුම්රියට සම්බන්ධ දේවල් පමණයි. දුම්රිය signalling යන්ත්‍රණ, මගීන්ගේ පහසුකම් සඳහා සපයා දෙන උපකරණ ආදිය ගැන පමණයි. එයින් එහා -ඉන් පරිබාහිරව- සන්නිවේදන ක්ෂේත්‍රය ගැන වචනයක්වත්, අකුරක්වත් මේකේ සඳහන් වෙලා නැහැ. එතකොට බලශක්ති ක්ෂේත්‍රය ගැන මොකක්ද මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයේ සඳහන් වෙලා තිබෙන්නේ ගරු කථානායකතුමනි? මේ සඳහන් කර තිබෙන දේවල් ඉතාම වැරැදියි ගරු කථානායකතුමනි. පුද්ගලයෙකුට පහර දීමක් හෝ රජයකට පහර දීමක් හෝ නොවෙයි මේ කරන්නේ. මේ රටේ ජාත්‍යන්තර සම්බන්ධතාවලට හානියක් සිදු කිරීමට මේ ප්‍රකාශයෙන් ප්‍රයත්නයක් දරන බව මා කිසිම ද්වේෂයකින් තොරව ගෞරවයෙන් මේ අවස්ථාවේදී සඳහන් කරනවා. ගරු කථානායකතුමනි, බලශක්ති ක්ෂේත්‍රය ගැන නිවේදනයේ මොකක්ද සඳහන් වෙලා තිබෙන්නේ?

"It was also agreed to enhance cooperation in the energy sector…."

මොකක්ද ඒකේ තිබෙන වරද? "to enhance cooperation" ඒකෙන් කියන්නේ සහයෝගයේ පරිමාණය -ක්ෂේත්‍රය- පුළුල් කිරීමට අපි උත්සාහ දරමුය කියලායි. මොකක්ද ඒකේ තිබෙන වරද? ඒ නිසාම තමයි මම කියන්නේ ගරු මන්ත්‍රීතුමාගේ විවේචන හා මේ ලියවිල්ලේ අන්තර්ගත කරුණු අහසයි පොළොවයි වගේ වෙනස්ය කියා.

එතුමාගේ ප්‍රකාශයේ තිබෙනවා තව මහා ලොකු භයානක දේවල් ගරු කථානායකතුමනි. මෙහි සඳහන්ව ඇති විධියට විදේශ කටයුතු අමාත්‍යතුමා මොනවාද කරලා තිබෙන්නේ? "ව්‍යවස්ථාවේ වෙනස්කම් කිරීමටද, රටේ නෛතික ප්‍රතිසංස්කරණ කිරීමටද ඉන්දියාව සමඟ එකඟ වෙලා තිබෙනවා" කියනවා. ඒ කියන්නේ මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න, නීති පද්ධතිය වෙනස් කරන්න මම ගිහිල්ලා ඒකමතිකව එකඟ වුණාලු. මොකක්ද ඇත්ත කථාව? නිවේදනයේ මෙහෙමයි තිබෙන්නේ:

"In this context, the External Affairs Minister of Sri Lanka affirmed his Government's commitment to ensuring expeditious and concrete progress in the ongoing dialogue between the Government of Sri Lanka and representatives of Tamil parties."

ඒ කියන්නේ කවුරුත් දන්නවා- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. කරුණාකරලා මට මේක ඉවර කරන්න දෙන්න. [බාධා කිරීමක්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ තර්ක මේ ගරු සභාවට ඉදිරිපත් කළා. දැන් මට සාවධානව ඇහුම්කන් දෙන්න ඕනෑ. මටත් අයිතියක් තිබෙනවා මේ පිළිබඳ සත්‍ය මේ රටට අනාවරණය කිරීමට. [බාධා කිරීමක්] නැහැ, නැහැ. - [*Interruption.*] Mr. Speaker, I am not giving way. I would like to continue with my statement.

ගරු කථානායකතුමනි, කවුරුත් දන්නවා අපි දමිළ පක්ෂ සමඟ සාකච්ඡා කර ගෙන යන බව. ඒ දමිළ පක්ෂ සමඟ මීළඟ සාකච්ඡා වටය 23 වැනි දා සිදු කෙරෙනවා. TNA පක්ෂය, EPDP පක්ෂය සමඟ ඒ සාකච්ඡා කෙරී ගෙන යනවා. දැන් ඒ සාකච්ඡා කර ගෙන යනවා. එම සාකච්ඡා විධිමත් ලෙස, සීඝ්‍ර ලෙස, කර ගෙන යාම සඳහා දෙපක්ෂයම කළ යුත්තේ "අපේ රජය, අප, ඇප කැප වෙනවා" යි කියලා මේ සාකච්ඡා කර ගෙන යන එකයි. එහෙම නැත්නම් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව කොහොමද වෙනස් කරන්නේ? මොනවාද ඒ සඳහා අවශ්‍ය සංශෝධන? ඒ ගැන වචනයක්වත් මේකේ නැහැ. තිබෙන්නත් බැහැ. කර ගෙන යන සාකච්ඡාවක ප්‍රතිඵලය කුමක්ද කියලා අපි මේ අවස්ථාවේ දී අපේක්ෂා කරන්නේ කොහොමද? අපි අවංක උත්සාහයක් දරනවා, ප්‍රශ්න සාකච්ඡා

[ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා]

මාර්ග තුළින් විසඳීමට. කාගේත් ප්‍රතිපත්තිය ඒකයි. හැබැයි, ඒ සාකච්ඡා අවසන් වෙලා නැහැ. එතකොට කිසිම නිගමනයකට බහින්න බැහැ, අවසාන ප්‍රතිඵලය කුමක් වේද කියලා. අවසාන ප්‍රතිඵලය පිළිබඳ කිසිම නිර්දේශයක්, කිසිම අදහසක් මේකේ අඩංගු වෙලා නැහැ. ගරු කථානායකතුමනි, දැන් මේ ගරු මන්ත්‍රීතුමාගේ සම්පූර්ණ ප්‍රකාශය ගැන අපි පොඩ්ඩක් විශ්ලේෂණාත්මකව විග්‍රහ කළොත් එහි පදනම මේකයි. එතුමා කියනවා, මම ඉන්දියාවට ගියේ යම් කිසි අරමුණක් සඳහාය කියලා. එතුමා කියනවා, ඒ අරමුණ ඉෂ්ට වුණේ නැහැ, එම නිසා මේක සම්පූර්ණයෙන් අසාර්ථකයි කියලා.එතුමා හිතන හැටියට රජයේ අරමුණ මොකක්ද?එතුමා රජයට ආරෝපණය කරන අරමුණ අපි සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා; සහමුලින්ම ප්‍රතික්ෂේප කරනවා. එතුමා හිතන්නේ මෙන්න මේ විදියේ අරමුණක් ගැනයි. එතුමා හිතන්නේ මම ඉන්දියාවට ගියේ, ඉන්දියානු රජය ලවා යමක් කර ගන්නය කියලායි. මොකක්ද කර ගන්න හදන්නේ? ඉන්දියානු රජය ලවා දරුස්මාන් වාර්තාව සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරන්නට; හෙළා දකින්නට; ඒකට දෝෂාරෝපණයක් ඉන්දියාවෙන් ඉදිරිපත් කිරීමට කියලායි. එහෙම අදහසක්, එහෙම අපේක්ෂාවක්, මගේ සිත තුළ හෝ රජයේ රජය තුළ මොහොතකටවත් තිබුණේ නැහැ. මා හමු වුණා, ඉන්දියාවේ ගරු අගමැතිතුමාව, ඉන්දියාවේ මුදල් ඇමතිතුමාව, ඉන්දියාවේ විදේශ ඇමතිතුමාව. හැබැයි, එහි අදහස වුණේ ඒ ගොල්ලන්ගෙන් ප්‍රකාශයක් ලබා ගැනීම නොවෙයි. ඒ ගොල්ලන්ගේ සහයෝගය අපට වුවමනා තැන්වල, වුවමනා අවස්ථාවල ලබා ගැනීම තමයි අපේ අභිලාෂය වුණේ. අපි කවුරුත් දන්නවා, මේ සම්බන්ධයෙන් නොයෙක් තැන්වල යම් යම් සාකච්ඡා කෙරී ගෙන යන බව. නිව්යෝර්ක් එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජිනීවා මානව හිමිකම් මණ්ඩලය මේ ගැන සාකච්ඡා කරනවා. ඒ සාකච්ඡා කෙරී ගෙන යන අවස්ථාවලදී අවශ්‍ය තැන්වල දී කාලෝචිත ලෙස, අපේ රටට ප්‍රයෝජනවත් ලෙස, ඒ අයගේ ස්ථාවරය නිර්මාණය කර ගැනීම තමයි සාමූහික වශයෙන් අපේ රජයේත්, පෞද්ගලික වශයෙන් මගේත් අරමුණ වන්නේ. එහෙම නැත්නම් ඉන්දියාවට ගිහිල්ලා ඉන්දියාවේ අගමැතිතුමාගෙන් "දරුස්මාන් වාර්තාව වැරදියි, ඒකට අපි විරුද්ධයි" කියලා, එහෙම ප්‍රකාශනයක් ලබා ගන්න අපි කිසිසේත් උත්සාහ කළේත් නැහැ. එහෙම උත්සාහ කරනවා නම් ඒක මේ රටේ සුබ සිද්ධියට අදාළ දෙයකුත් නොවෙයි.

අපි ගියා ඉන්දුනීසියාවේ බාලි දූපතට. මෙතුමා ඒ ප්‍රශ්නය අහනකොට මම එතැන සිටියේ. එතැනදී ගරු රවුෆ් හකීම් ඇමතිතුමා, ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා, ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා ඇතුළු අපේ කැබිනට් මණ්ඩලයේ තවත් කිහිප දෙනෙක් සමඟ නොබැඳුණු රටවල් 22ක නියෝජිතයන් හමු වුණා. ගරු කථානායකතුමනි, එක රටකින්වත් අපි ඉල්ලීමක් කළේ නැහැ, දරුස්මාන් වාර්තාව හෙළා දකිමින් ප්‍රකාශනයක් නිකුත් කරන්නය කියලා. අපිට අවශ්‍ය වුණේ වෙන දෙයක්. අපට අවශ්‍ය වුණේ මුහුණට මුහුණලා -face-to-face- ඒ ගොල්ලන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දීමටයි; ඒ ගොල්ලන්ගේ සිත්සතන් තුළ තිබෙන සැක දුරු කිරීමටයි. ඒක ඉතාමත් අගනා අවස්ථාවක්. රටවල් 22ක නියෝජිතයන් හමු වුණා. ඉන්දියානු රජයේ ඉහළම තලයේ දේශපාලන නායකත්වය සමඟ ඒ විදියේ සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබීම ඉතාමත් වටිනා, අගනා අවකාශයක් හැටියට අපි සලකනවා. ඒකයි අපේ අරමුණ. එහෙම නැත්නම් ඒ ගොල්ලන්ගෙන් ප්‍රවෘත්ති පත්‍රවලට ප්‍රකාශනයක් ලබා ගැනීමට නොවෙයි අපිට අවශ්‍ය වුණේ. එහෙම ප්‍රකාශනයක් ලබා ගැනීමට අපි උත්සාහ දරනවා නම් ඒක මේ රටට බෙහෙවින් හානිකර දෙයක්. ඒ මොකද, අපි දරුස්මාන් වාර්තාව පිළිගන්නේ නැහැ. දරුස්මාන් වාර්තාව හා එක්සත් ජාතීන්ගේ සංවිධානය අතර කිසිම සම්බන්ධයක් නැහැ. ඒක පෞද්ගලික වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්තුමා එතුමාට උපදෙස් ලබා ගැනීම සඳහා පත් කරපු කමිටුවක්. එම නිසා ආචාර්ය මන් මෝහන් සිංට -ඉන්දියාවේ අගමැතිතුමාට- මම ගිහිල්ලා කියන්නේ නැහැ, මේක හෙළා දකින්නය කියලා. මම එහෙම කරනවා නම් එයින් සිදු වන්නේ ඒ වාර්තාවට කිසි සේත් අයත් නොවන ගරුත්වයක්, ස්ථානයක්, තේජසක් අපි ව්‍යංගයෙන් ලබා දීමක්. එහෙම දෙයක් අපි කළෙත් නැහැ; කරන්නෙත් නැහැ ගරු කථානායකතුමනි. ඒ නිසා මේ රට හමුවේ හා ලෝකයා හමුවේ මේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට අපට කිසිම අසීරුතාවක් නැහැ.

ගරු කථානායකතුමනි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මගෙන් අහන පළමුවැනි ප්‍රශ්නය තමයි මම ඉන්දියාවට ගියේ ඉන්දියාවේ ආරාධනාවක් අනුවද, නැත්නම් අපට යන්න වුවමනාවක් තිබුණාද කියන එක. මම ඉතා පැහැදිලිව කියනවා අපි ගියේ අපේ වුවමනාවටයි කියන එක. අපට යම් කිසි දෙයක් කරන්න අවශ්‍ය වෙලා තිබුණා. ඒ අවස්ථාව නොමසුරුව ලැබුණා. එතකොට ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම සඳහා තමයි මම ඒ ගමන යාමට තීරණය කළේ. දෙවනුව එතුමා අහනවා අරමුණ කුමක්ද කියලා. අරමුණ මොකක්ද කියලා දැන් මේ ගරු සභාවට මා පහදලා දුන්නා. කිසි සේත්ම එතුමා සඳහන් කරන අරමුණ නොවෙයි. තුන්වන ප්‍රශ්නය වශයෙන් එතුමා මගෙන් අහන ප්‍රශ්නය තමයි ලබා ගත් ප්‍රතිඵලය පිළිබඳ සෑහීමකට පත් වෙන්න පුළුවන්ද කියන එක. මම පැහැදිලිව කියනවා, "ඔව්" කියලා. ඒ මොකද? යම් යම් බටහිර රටවල් දැන් වන කොටත් ඉල්ලා තිබෙනවා, අපේ රටට විරුද්ධව ජාත්‍යන්තර තලයේ විමර්ශනයක් කරන්නය කියලා. ඉන්දියාව කිසි සේත් ඒ ඉල්ලීම කළේ නැහැ ගරු කථානායකතුමනි. ඒකට සහභාගි වුණේ නැහැ. ඒකට ඉන්දියාවේ ශක්තිය කිසි සේත් ඒ ගොල්ලන් එකතු කළේ නැහැ. ඒක මම දකිනවා, අපේ රටට ඉතාමත් වාසිදායක හිතකර දෙයක් හැටියට. ඒ විතරක් නොවෙයි,ගරු කථානායකතුමනි. ඉන්දියාවේ ගරු අගමැතිතුමාට, මුදල් ඇමතිතුමාට, විදේශ කටයුතු ඇමතිතුමාට සහ ඉන්දියාවේ ඉහළ පෙළේ නිලධාරින්ට මම විස්තර සහිතව පෙන්වලා දුන්නා, මේ රටේ ඉතාමත් කෙටි කාලයක් තුළ අපි ලබා ගත් ප්‍රගතිය. ඉන්දියාව පිළිගත්තා. මේ ඒකාබද්ධ ප්‍රකාශනයේ ඒවා මෙන්න මේ විදියට අන්තර්ගත වනවා. I quote:

"….the Minister of External Affairs of Sri Lanka referred to the work of the Lessons Learnt and Reconciliation Commission (LLRC) and set out the steps taken by the Inter-Agency Advisory Committee (IAAC) chaired by the Attorney General in implementing the Interim Recommendations of the LLRC in relation to detention, law and order, administration and language issues and socio-economic and livelihood issues."

මේ සියලුම ක්ෂේත්‍රවල සෑහෙන ප්‍රගතියක් ලබා ගත් බව ඉන්දියානු රජය පිළිගත්තා. ඒක මම දකිනවා; ඕනෑම සාධාරණ පුද්ගලයෙක් දකිනවා, ඒක ලංකාවට ඉතාමත් හිතකර දෙයක් හැටියට.

ගරු මන්ත්‍රීතුමා 4වන ප්‍රශ්නයෙන් මගෙන් අසා තිබෙනවා, "මෙම ඒකාබද්ධ ප්‍රකාශනයට පදනම් කර ගනු ලැබුවේ 2010 ජූනි මස 09වන දා ජනාධිපතිවරයාගේ සහභාගිත්වයෙන් අත්සන් කළ අවබෝධතා ගිවිසුම හා 2011 මාර්තු 28-29 නවදිල්ලියේදී අත්සන් කළ අවබෝධතා ගිවිසුම්ය. ඒවා සභාගත කරන්නේද?" කියලා.

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ඒ ප්‍රශ්නය ගැන මම මවිතයට පත් වෙනවා. ඒවා සභාගත කිරීමේ කිසිම අවශ්‍යතාවක් නැහැ. එතුමා සඳහන් කරන 2010 ජූනි මස 09වන දින දරන ලියවිල්ල හැමෝටම කියවන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. මේක වෙබ් අඩවි තුනක තිබෙනවා. විදේශ කටයුතු අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ, ජනාධිපති කාර්යාලයේ වෙබ් අඩවියේ සහ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ -Department of Government Information- වෙබ් අඩවියේ තිබෙනවා. ගරු

මන්ත්‍රීතුමාට පුළුවන් විනාඩි පහකින් මේ සියල්ලක්ම කියවන්න. මේකේ හංගන්න කිසිම දෙයක් නැහැ. සම්පූර්ණ විනිවිදභාවයක් තිබෙනවා. සම්පූර්ණ විවෘතභාවයක් තිබෙනවා. සකල ලෝකයාට මේක බලා ගන්න පුළුවන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
සභාගත කරන්න.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

සභාගත කරන්න තිබෙන අවශ්‍යතාව මොකක්ද? ඔබතුමාට විනාඩි පහකින් මේක කියවන්න පුළුවන්. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා සඳහන් කළා, අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැන. එතුමා කිව්වා, 1948 ඉඳලා අපේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය මොකක්ද කියන එක. මා දන්නා හැටියට කිසිම අවස්ථාවකදී ලෝකයේ කොහේවත් සභාගත කරන්නැයි කියලා ඉල්ලන්නේ නැහැ, මුළු ලෝකයාටම විනාඩි පහකින් ලබා ගන්න පුළුවන් තොරතුරක්. ඒක පාර්ලිමේන්තුව හාස්‍යයට ලක් කිරීමක්; පාර්ලිමේන්තු සම්ප්‍රදාය විකෘති කිරීමක්. සභාගත කරන්නය කියන්නේ සාමාන්‍ය පුද්ගලයකුට ලබා ගන්න බැරි දෙයක්. ඕනෑම කෙනෙකුට, මේ රටේ ඕනෑම පුරවැසියෙකුට හෝ ලෝකයේ ඕනෑම කෙනෙකුට ක්ෂණිකව ලබා ගන්න පුළුවන් දෙයක් සභාගත කරන්නය කියන එක මේ ගරු සභාවේ සම්ප්‍රදායය හෑල්ලු කිරීමක් කියලා මම පැහැදිලිව ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, 2011 මාර්තු 28 සහ 29 දිනවලට අදාළ ලියවිලිත් සභාගත කරන්න කියලා එතුමා ඉල්ලනවා. ඒවාත් තිබෙනවා. ඒවා තිබෙනවා විදේශ කටයුතු අමාත්‍යාංශ වෙබ් අඩවියේ. ඒකේ කිසිම ගැටලුවක්, රහස්‍යභාවයක්, ප්‍රහේලිකාවක් නැති බව මම ඔබතුමාට ගෞරව පෙරටුව සඳහන් කරනවා.

අවසාන වශයෙන් එතුමා මගෙන් අහනවා, මෙම ප්‍රකාශයේ අඩංගු කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා කාල රාමුවක් සකස් කර තිබේද කියා. කිසිම කාල රාමුවක් නැහැ; කිසිම බල කිරීමක් නැහැ; කිසිම pressure එකක් නැහැ; කිසිම කාල පරිච්ඡේදයක් නැහැ. ඒක සම්පූර්ණ මිත්‍යාවක් බව මම ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව මාගේ අවංක අදහස ප්‍රකාශ කරනවා නම්, ඉතාමත් ආවේගශීලී ලෙස, සත්‍ය ගැන සොයන්නේ නැතිව, මේ ලියවිල්ලේ අඩංගු වචන, වාක්‍ය, වාක්‍යාංශ සලකා බලන්නේ නැතිව මේ කරන වැඩ පිළිවෙළින් පහර වැදෙන්නේ මට හෝ රජයට නොවෙයි, මේ රටේ සුබ සිද්ධියට සහ උන්නතියටයි. මේකේ ඉතාමත් බරපතළ වචන තිබෙනවා. මේකේ ඉන්දියානු පැකේජයක් ගැන සඳහන් වනවා. මේකේ ඉන්දියානු ආධිපත්‍යයක් ගැන සඳහන් වනවා. මා ඉතාම කනගාටු වනවා, ගරු තිස්ස අත්තනායක මැතිතුමා අද ප්‍රවෘත්ති පත්‍ර සාකච්ඡාවකදී ඉන්දියාවේ ආධිපත්‍ය ගැන සඳහන් කිරීම ගැන. ආණ්ඩුවට ගහන්න ඕනෑ නම් වෙනත් විධියකට කරන්න. මේකෙන් පහර වදින්නේ ආණ්ඩුවට නොවෙයි, අපේ රටේ ජාත්‍යන්තර සම්බන්ධතාවලට. මේ රටේ ප්‍රශ්නවලට අපට හුදකලාව මුහුණ දෙන්න බැහැ ගරු කථානායකතුමනි. මේ රටේ තේජස, අනන්‍යතාව සහ ස්වාධිපත්‍ය ආරක්ෂා කිරීමට අවශ්‍ය තැන්වලදී අපි ඉතාම එඩිතරව කටයුතු කරනවා, කිසිම පැකිළීමකින් තොරව. මේ ආක්‍රමණශීලී, ද්වේශසහගත ආකල්පවලට කිසිම හේතුවක් නැතිව, පදනම් විරහිතව අවතීර්ණ වීමෙන් අපේ රටට වෙන්නේ ලොකු අවැඩක්; අවාසියක්. සත්‍යය මේකයි ගරු කථානායකතුමනි. මේ විවේචන සම්පූර්ණයෙන් පදනම් විරහිත, සම්පූර්ණයෙන් සත්‍යයෙන් තොර බව ප්‍රකාශ කරමින් ඔබතුමාට මගේ ස්තුතිය ප්‍රදානය කරමින් මම නිහඬ වනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ පිළිබඳව විවාද නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මීට කලින් මේ පාර්ලිමේන්තුවේ ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා ඒ පිළිබඳව ප්‍රකාශයක් කළා. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ස්ථාවර නියෝග 23(2) යටතේ අහන ප්‍රශ්නයක් ගැන විවාදයක් පැවැත්විය නොහැකියි. ඕනෑ නම් විවාදයක් වෙනම ගන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමා අහපු දේට ගරු ඇමතිතුමා පිළිතුරු දීලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මේ අවස්ථාවේදී ඒ ගැන සාකච්ඡා කරන්න බැහැ. ඒ පිළිබඳව වෙනම විවාදයක් ඉල්ලන්න. විවාදයක් වෙනම ඉල්ලන්න. [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා දීපු පිළිතුර මැයි 25 වන දින හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා දීපු පිළිතුරයි ඒකයි පරස්පරයි. ඒ දෙක පරස්පරයි. දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා එදා පැහැදිලිව කිව්වා,-[බාධා කිරීමක්] මෙවා හැන්සාඩ් වාර්තාවේ තිබෙන කරුණු. 25 වෙනිදා හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. දැන් මොකක්ද ජී.එල්. පීරිස් ඇමතිතුමා කියන්නේ? දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ඉදිරිපත් කළ අදහසත්, ජී.එල්. පීරිස් ඇමතිතුමා ඉදිරිපත් කළ අදහසත් අතර පරස්පරයක් තිබෙනවා. ඒ ගැන විවාදයක් දෙන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
විවාදයක් දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඒකට වෙනම විවාදයක් ඉල්ලන්න. [බාධා කිරීමක්] පක්ෂ නායකවරු රැස් වුණාම විවාදයක් ඉල්ලන්න පුළුවන්. [බාධා කිරීමක්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මේක ගැන නිශ්චිත වශයෙන් විවාදයක් ඉල්ලනවා. මේ කරුණු පරස්පරයි. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විදේශ කටයුතු අමාත්‍යතුමා ප්‍රකාශයක් කළා. ඔබතුමන්ලාගේ එක්සත් ජාතික පක්ෂයේ ලේකම්වරයා අද ප්‍රකාශයක් කළා ඉන්දියාවේ ආධිපත්‍යය ගැන. ඒ වචනය ගැනද විවාදය ඉල්ලන්නේ? මොකක් ගැනද විවාදය ඉල්ලන්නේ?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
විදේශ කටයුතු ඇමතිතුමා කියපු දේවල් ගැන විවාදයක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එතුමා කරපු ප්‍රකාශය ගැන විවාදයක් අවශ්‍ය නැහැ. එතුමා ස්ථාවර නියෝග 23(2) යටතේ ඇසූ ප්‍රශ්නයකට උත්තර දීලා තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ පිළිබඳව දැන් විවාද කරලා වැඩක් නැහැ. පක්ෂ නායකවරුන්ගේ රැස්වීමේදී ඉල්ලන්න. [බාධා කිරීම්]හොඳයි. දැන් ඇති. [බාධා කිරීම්] ඒකට අවස්ථාවක් තිබෙනවා. විවාදයක් ඉල්ලා ගන්න පුළුවන්. මේ දැන් කරපු ප්‍රකාශය පිළිබඳව වාද කරන්න සාකච්ඡා කරන්න අවස්ථාව දෙන්න බැහැ. [බාධා කිරීම්] ඒ සම්බන්ධව තමුන්නාන්සේලා ඉල්ලන විවාදයේදී කථා කරමු. [බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේදී ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා කරපු කථාවත්, ගරු ජී.එල්. පීරිස් අමාත්‍යතුමා කරපු කථාවත් අතර පරස්පරයක් තිබෙනවා. ඒ පිළිබඳව සොයා බලන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේලා පක්ෂ නායකවරු හමු වුණාම ඒ පිළිබඳව කථා කරලා දිනයක් ගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
තව ප්‍රශ්නයක් තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ප්‍රශ්නයත් මෙතැනට අදාළ නැහැ. [බාධා කිරීම්]

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

## ස්වාභිමානී දහම් සවිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
சுவாபிமானி தஹம் சவிய (கூட்டிணைத்தல் சட்டமூலம்
SWABHIMANI DAHAM SAVIYA(INCORPORATION) BILL

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්වාභිමානී දහම් සවිය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜீ. பத்மசிறி)
(The Hon. Y.G. Padmasiri)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.*

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, මම අද උදෑසන ඔබතුමා හමු වෙලා ඔබතුමාට දැනුම් දුන්නා,- [බාධා කිරීමක්] ඉල්ලීමක් කෙරුවේ. අද දවසේ තිබෙන විෂයයන් සම්බන්ධව කථා කරන්න අපට තිබෙන වේලාව පැයකින් අඩු කරලා, ඒ පැය ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවට අදාළව කථා කරන්න ලබා දෙන්න කියලා ඉල්ලීමක් කෙරුවා. එහෙම දෙන්න ඔබතුමාගේ කැමැත්තකුත් තිබුණා. නමුත් අපි කනගාටු වනවා, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමායි, සභානායක නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමායි ඒකට විරුද්ධ වුණු එක ගැන. සභාව කල් තබන අවස්ථාවේ විවාදයෙන් ඉල්ලුම් කරලා තිබෙන්නේ වෙළෙඳ කලාපයේ මැරුම් කාපු, වෙඩි කාපු, දේපොළ විනාශ කරපු ඒ වාගේම රක්ෂාව නැති වෙච්ච අය පිළිබඳව පුළුල් ලෙස සාකච්ඡා කරන්නයි. නමුත් ඒකට විරුද්ධ වුණා. ඇයි ඒ? මට තේරෙන්නේ නැහැ තමුන්නාන්සේලාට මොකුත් බයක් තියෙනවාද කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු පිළිබඳව සම්ප්‍රදායකුත් තිබෙනවා නේ. ඒවාත් අනුගමනය කළ යුතුව තිබෙනවා. හිටි ගමන් අවශ්‍ය දේ කරන්න බැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ. මම ඉල්ලුවේ වැඩිපුර,- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සාකච්ඡා කරලා කරන්න පුළුවන්. සභාව කල් තැබීමේ අවස්ථාවේදී ඒ ගැන කථා කරන්න පුළුවන් නේ. වෙලාව තිබෙනවා කථා කරලා මොනවා හෝ කර ගන්න. [බාධා කිරීමක්] වැඩියෙන් කථා කළොත් ප්‍රශ්න විසඳා ගන්න පුළුවන්. ඒ නිසා මා කැමැතියි. [බාධා කිරීමක්] නිසි වෙලාවට ඒ අවස්ථාවට එමු. [බාධා කිරීමක්] කථා කළොත් හොඳයි.

දැන් අද දින ප්‍රධාන කටයුතුවලට යමු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 8 දක්වා අනුමත කිරීම. පළමුවෙන්ම ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා.

## ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත: නියෝගය
## பதிவு செய்யப்பட்ட பங்குத் தொகுதி மற்றும் பிணையங்கள் கட்டளைச் சட்டம்: கட்டளை
## REGISTERED STOCK AND SECURITIES ORDINANCE : ORDER

[අ. භා. 2.31 ]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> " (420 අධිකාරය) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ 4 වැනි වගන්තියේ 3 වැනි උපවගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් පනවනු ලදුව, 2011 පෙබරවාරි 25 දිනැති අංක 1694/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.05.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය."

ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් අංක 1 සිට 8 දක්වා වූ මුදල් අමාත්‍යාංශයට අදාළ යෝජනා මෙම ගරු සභාවට ඉදිරිපත් කරනවා. අතිගරු ජනාධිපතිතුමා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වශයෙන් පසු ගිය අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා සහ එයට අදාළව රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදන සඳහා මේ ගරු සභාවේ අනුමතිය ලබා ගැනීමටයි මේ යෝජනා කිහිපය ඉදිරිපත් වන්නේ.

2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත යටතේ නියමයකුත් ඉදිරිපත් වනවා. අපේ රටේත් මුදල් හැරුණු විට, ලෝකයේ බොහෝ රටවල මෙන් චෙක්පත්, විනිමය බිල්, පොරොන්දු නෝට්ටු, ගනුදෙනු කළ හැකි විවිධ ලියවිලි, ණයපත් වැනි නවීන තාක්ෂණික උපකරණ භාවිත වනවා. පසු ගිය කාල පරිච්ඡේදය තුළදී ක්‍රෙඩිට් කාඩ් නැත්නම් ණයපත් භාවිතය ලංකාවේ විශාල ලෙස වර්ධනය වුණා. මුදල් විරහිත සමාජයක් ඇති කිරීම වාගේම, මුදල් එහා මෙහා ගෙන යැමත්, ඒ තුළ ඇති වන අනාරක්ෂිත බවත් නිසා පුරාණයේ ඒ වෙනුවට භාවිත කළේ චෙක්පත් පමණයි. පසු කාලයේදී අලුත් තාක්ෂණය නිසා ඇති වූ නව පිබිදීම් යටතේ අනෙක් රටවල වාගේම අපේ රටේත් ණයපත් - ක්‍රෙඩිට් කාඩ්- භාවිතය අද වන විට විශාල ලෙස වර්ධනය වෙලා තිබෙනවා.

මම උදාහරණයක් ලෙස සඳහන් කළොත්, මුළුමනින්ම ක්‍රියාත්මක වන දේශීය කාඩ් පත් සංඛ්‍යාව - the total number of locally active cards - 60,228යි; ගෝලීය වශයෙන් - globally - ක්‍රියාත්මක වන කාඩ් පත් සංඛ්‍යාව 7,32,134යි. ඒ අනුව 2011 මාර්තු මාසය වන විට මුළු රට තුළ ණය පත් 7,92,362ක් භාවිත වෙලා තිබෙනවා. ඉන් අදහස් වන්නේ අපේ රටේ සාමාන්‍යයෙන් credit cards 8,00,000ක් විතර භාවිතයේ පවතින බවයි. දේශීය හා විදේශීය වශයෙන් භාවිත වන කාඩ් පත්වල මුළු වටිනාකම රුපියල් මිලියන 32,054යි. එයින් දේශීය වශයෙන් භාවිත වන්නේ කාඩ් පත් ඉතා කුඩා ප්‍රමාණයක්. එනම් මිලියන 911යි. ජාත්‍යන්තර වශයෙන් භාවිත වන කාඩ් පත් ප්‍රමාණය මිලියන 31,143යි. Credit cards හරහා ඉතා විශාල මුදල් ප්‍රමාණයක් ජාත්‍යන්තර වශයෙන් - internationally - ගනුදෙනු වන කොට ඒ පිළිබඳ විවිධ වංචා, දූෂණ හා අක්‍රමිකතා සිද්ධ වන බව අපි, තමුන්නාන්සේලා කවුරුත් පිළිගන්නා සත්‍යයක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Bandula Gunawardane, you may continue.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මට ප්‍රශ්නයක් තිබෙනවා. මා අහන්න කැමැතියි, මේ පිළිබඳව Consultative Committee එකේ සාකච්ඡා කළාද කියලා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
උපදේශක කාරක සභාවෙන් පස්සේ තමයි මේ ගැසට් පත්‍රයේ නියෝග මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න අවශ්‍ය වන්නේ. [බාධා කිරීමක්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මා කියන්නේ Consultative Committee එකේ මේ පිළිබඳව සාකච්ඡා කළේ නැහැ කියලායි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Regulations සඳහා උපදේශක කාරක සභාවේ සාකච්ඡා කිරීම අවශ්‍ය නැති බවට එකඟතාවකට ඇවිත් තිබෙනවාය කියා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මේවා පාර්ලිමේන්තුවට ගෙනෙන්න ඉස්සෙල්ලා උපදේශක කාරක සභාවට යැවිය යුතුයි කියලායි මා කියන්නේ. වැරැද්දක් කියනවා නොවෙයි. මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරන්න පුළුවන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා නඟන මේ ප්‍රශ්නය පක්ෂ නායක සාකච්ඡාවේදීත් නැඟුවා. ඉන් පස්සේ තමයි අපි එකඟතාවකට ආවේ, මේ රෙගුලාසි සඳහා උපදේශක කාරක සභාවට යැමට අවශ්‍ය නැහැයි කියලා. මමත්, ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාත් මේ ගරු සභාවේ නැති වෙලාවේ තමුන්නාන්සේ ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ කරන එක වැරැදියි. මොකද, බන්දුල ගුණවර්ධන ඇමතිතුමා පක්ෂ නායක කමිටුවේ -පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ- සාමාජිකයකු නොවෙයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මා ඇසුවේ ප්‍රශ්නයක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැහැ. ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මම ඇහුවාට වරදක් නැහැ නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අහන්න. නිකම් මොනවා හෝ අහන එකත් හොඳයි නේ, එහෙම ඇහුවා නම්.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මන්ත්‍රීතුමනි, ඒ ගැන ඇහුවාට ස්තුතියි. වාඩිවන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ණයපත් සම්බන්ධයෙන් ඇති වන වංචාවන් වැළැක්වීම සඳහා; විශේෂයෙන්ම බලය නොලත් පුද්ගලයන් ණයපත් භාවිතා කිරීම, ඒ පිළිබඳව විමර්ශන පැවැත්වීම, ඒ පිළිබඳව නඩු පැවරීම, ඒ හා සම්බන්ධ දඬුවම් ලබා දීමට අදාළ විධිවිධාන ඇතුළත් ගැසට් පත්‍රයක් තමයි නිකුත් කරලා තිබෙන්නේ. මෙහි තිබෙන විශේෂිතම තත්ත්වය තමයි ණයපත් පිළිබඳ වංචාවක් ඇති වූ අවස්ථාවකදී ඒ පිළිබඳව විමර්ශන කරන පොලීසියට මේ අලුත් තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳව ප්‍රායෝගික යථාර්ථවාදී අවබෝධයක් නැති වීම. ඒ නිසා මේ පනතේ 8(1) වගන්තියට සංශෝධනයක් ගෙනැවිත් ඒ සඳහා විවිධ ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ දක්ෂතාවක් තිබෙන විශේෂඥ මණ්ඩලයක් පත් කොට තිබෙනවා. පරිගණක විද්‍යාව, ඉලෙක්ට්‍රොනික් විද්‍යාව, සන්නිවේදන ඉංජිනේරු විද්‍යාව, තොරතුරු පද්ධතිය, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව යන විෂයයන් සඳහා පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධරයන්ගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් මේ වන විට පත් කොට තිබෙනවා. ඒ කමිටුව පත් කිරීම පිළිබඳව ගැසට් නිවේදනය නිකුත් කර තිබෙනවා. ඒ සඳහා වන අනුමැතිය තමයි මේ ගරු සභාවෙන් ලබා ගන්නට බලාපොරොත්තු වන්නේ. අද්‍යතන ලෝකයේ ඇති වෙලා තිබෙන වෙනස්කම්වලට අනුව ජාත්‍යන්තර ගනු දෙනුවල විශාල වැඩි වීමක් වාර්තා වෙලා තිබෙන අවස්ථාවක, යුද්ධය නිම වීමෙන් පසු ගෝලීයකරණයේ ප්‍රතිලාභ වැඩි වැඩියෙන් රටට ලැබෙමින් පවතින අවස්ථාවක ණයපත් සම්බන්ධයෙන් සිද්ධ වන වංචා, දූෂණ, අක්‍රමිකතා මැඩ පැවැත්වීම සඳහා ජාතියේත්, ජාතික ආරක්ෂාවත් සඳහා වැදගත් වන මෙවැනි විධිවිධානයක් යෙදීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයට මේ ගරු සභාවේ ගෞරවය හිමි විය යුතුය කියලා මම විශ්වාස කරනවා.

මීට අමතරව තවත් නියෝග කීපයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ නියෝගවලට අනුව (420 වැනි අධිකාරය වන) ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනතේ 4 වැනි වගන්තියේ විධිවිධාන යටතේ 2007 ජනවාරි මස 04 වැනි දින අංක 1478/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ප්‍රකාර රජය විසින් රුපියල් 56,80,000ක් -රුපියල් මිලියන 5.6ක්-, රුපියල් 24,00,000ක් -රුපියල් මිලියන 2.4ක්- සහ රුපියල් 18,823,586,000ක් වටිනාකමින් යුත් ණය මුදල් ලියා පදිංචි ස්කන්ධ ලෙසට එදා -2007දී- නිකුත් කරනු ලැබුවා. 2007 අපේ රටේ පැවතුණ උග්‍රතම ත්‍රස්තවාදයේ තීරණාත්මක අවස්ථාව නිසා රජයට ඉතා විශාල වශයෙන් මුදල් ප්‍රමාණයක් ණය වශයෙන් ලබා ගන්නට සිද්ධ වුණ බව තමුන්නාන්සේලා කවුරුත් පිළිගන්නවා. මේ යුද්ධය නිම කිරීමේ කාර්යය සඳහා විවිධ තාක්ෂණික උපකරණ ලබා ගන්න, වෙනත් යුද උපකරණ ලබා ගන්න, ඒ අවදිය තුළ ඇති වෙලා තිබුණ ගෝලීය අර්බුදය යටතේ අසාමාන්‍ය තෙල් මිලට ඔරොත්තු දෙන්න, ලෝකයේ ඇති වුණ විවිධ ආර්ථික කඩා වැටීම්වලට මුහුණ දෙන්න විශාල වශයෙන් ණය ලබා ගන්න සිද්ධ වුණා. ණය ලබා ගන්නා විට ණය සඳහා තිබෙන ඉල්ලුම අසාමාන්‍ය ලෙස වැඩි වීමේ ප්‍රතිඵලයක් ලෙස රජය සියයට 19, 18 පොලියට තමයි මේ ණය ලබා ගෙන තිබුණේ. නමුත් රටේ යුද්ධය නිම කරලා සාමය යළි ස්ථාපිත වීමෙන් පස්සේ ජාතික ආර්ථිකයට ඇති වුණු ප්‍රධානතම බලපෑම තමයි පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් බවට පත් වීම. ලෝකයේ ඕනෑම සංවර්ධිත රටක බැංකු ණය පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් වීම ආර්ථිකයක ප්‍රගතිය මැන බලන ප්‍රධාන දර්ශකයක්. මැලේසියාව වාගේ ආසියාතික රටවල් ගත්තත්, සිංගප්පූරුව ගත්තත්, මහජන චීනය වාගේ රටවල් ගත්තත්, එංගලන්තය, ඇමෙරිකාව වාගේ වෙළෙඳ පොළ ආර්ථිකයේ එහා කෙළවරේ සිටින රටවල් ගත්තත් ඒ සෑම රටකම ණය පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක්. තනි ඉලක්කමේ සංඛ්‍යාවක් ණය පොලී අනුපාතය වන කොට රාජ්‍ය මූල්‍යයට විශාල බලපෑමක් ඇති වනවා. රජය කලින් වැඩි පොලියට අරගෙන තිබෙන ණය අඩු පොලී අනුපාත යටතේ නිදහස් කිරීමේ අවස්ථාව ලැබෙනවා. රජය සියයට 18 පොලියට ගත්ත ණය ප්‍රමාණ නිදහස් කිරීමේ දිනය තිබෙන්නේ 2013 දී, 2014 දී. සියයට 19 පොලියට ගත්ත ණය නිදහස් කරන්න තිබෙන්නේ 2017 දී. සියයට 19 බැගින් ගෙවමින් 2017 වන තුරු හිටියොත් ණය පොලී සඳහා විශාල මුදලක් නිකරුණේ අතාර්කික ලෙස භාණ්ඩාගාරයෙන් පිටතට ගලා යනවා. ණය පොලී අනුපාතය මේ වන කොට පහත වැටිලා තිබෙනවා; සියයට 8.5, සියයට 8.7, සියයට 9.5 වශයෙන් තනි ඉලක්කමේ සංඛ්‍යාවක් වෙලා තිබෙනවා.

ස්කන්ධ කලින් නිදහස් කර ගැනීමෙන් ඉතා විශාල මූල්‍ය වාසියක් රජයට අත් පත් කර ගන්නට පුළුවන්කම තිබෙනවා. ඒ හේතුව නිසා වර්තමාන වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වය තුළ පොලී අනුපාතය පහළ යාමේ ප්‍රවණතාවය සැලකිල්ලට ගනිමින් 2011 අය වැය යෝජනා මගින් මෙවැනි දිගු කාලීන ඉහළ පිරිවැය සහිත ණය වෙනුවට අඩු පිරිවැය සහිත දිගු කාලීන මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීමට යෝජනා වුණා. ඒ අනුව 2011 අගෝස්තු මාසයේ 31වැනි දින ලියාපදිංචි ස්කන්ධ කලින් නිදහස් කිරීමේ දිනය

වශයෙන් ප්‍රකාශයට පත් කර තිබෙනවා. ඉන් අදහස් වන්නේ 2017 දී සියයට 19 පොලියට නිදහස් කරන්න තිබෙන ඇතැම් ණය අඩු පොලී අනුපාතය යටතේ මේ අගෝස්තු මාසයේ 11වැනිදා වන කොට ගෙවා නිදහස් කරනවාය කියන එකයි. මේ ණය නිදහස් කිරීමේ ක්‍රියා පිළිවෙත නිසා භාණ්ඩාගාරය පොලී අනුපාතය පහත හෙළීමේ සම්පූර්ණ වාසිය රටට, ජනතාවට අයිති කර ගන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. එය රටට ඉතා සුබවාදී ප්‍රතිඵලයක්. අපි දන්නවා සරල දේශපාලන සටන් පාඨවල කියනවා, මේ ණය පොලී අනුපාතය පහත වැටුණාම තැන්පත්වලට ගෙවන පොලියත් අඩු වෙලා තිබෙනවාය, විශ්‍රාමිකයන්ට ඒ තුළින් අසාධාරණයක් සිදු වනවාය, ඔවුන්ට තැන්පත් කරන මුදලට පොලියක් ලැබෙන්නේ නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නමුත් ඕනෑම භාණ්ඩයක මිල තීරණය වීම කෙරෙහි බලපාන ප්‍රධාන සංරචක හතරක් තිබෙනවා. භූමියට, ස්වාභාවික සම්පත් භාවිතයට ගෙවන බදු කුලී, නිෂ්පාදනය සඳහා යොදා ගන්න ශ්‍රමයට ගෙවන වැටුප්, ප්‍රාග්ධනයට ගෙවන පොලී, ව්‍යවසායකත්වය ලබන ලාභ කියන හතරේ එකතුව මත තමයි භාණ්ඩයක හෝ සේවාවක මිල තීරණය වන්නේ. පොලී අනුපාතය පහත වැටෙනවාය කියන්නේ රටක සමස්ත ආර්ථිකය ලෙස ගත්තොත් ඒ මිල ස්ථාවර කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රධාන නිර්ණායකයක්. මක් නිසාද යත් පොලිය කියන්නේ ඕනෑම ආයතනයක වියදමක්. වියදම ඒ ආයතනයේ ලාභ අලාභ ගිණුමට භර වෙනවා. පොලිය වැඩි වෙන්න වැඩි වෙන්න වියදම වැඩි වනවා. වියදම වැඩි වන කොට ලාභ ප්‍රමාණය අඩු වනවා. අඩු වන ලාභ ප්‍රමාණය වළක්වා ගැනීම සඳහා මිල ඉහළ දැමීමක් තමයි සිදු වන්නේ. ඒ නිසා මිල ස්ථායීකරණය කරන්නට නම් ලෝකයේ ඕනෑම රටක පළමුවැනි කොන්දේසියක් ලෙස පොලී අනුපාතය පහත වැටෙන්නට ඕනෑ. ජනතාවගේ ජීවන වියදමේ අර්බුදය ගැන කථා කරනවා නම්; ජීවත් වීමේ ප්‍රශ්නය ගැන කථා කරනවා නම් ප්‍රශ්නයට විසඳුම ලෙස මේ පිරිවැය කපා හැරීමේ ක්‍රමය ලෙස තමයි පොලී අනුපාතය පහතට එන්න ඕනෑ. දීර්ඝ කාලයක් තිස්සේ ලංකා ඉතිහාසයේ සපුරා ගත නොහැකි වෙච්ච ආර්ථික මූල්‍ය ඉලක්කයක් තමයි පොලී අනුපාතය තනි ඉලක්කමේ සංඛ්‍යාවක් බවට පරිවර්තනය කිරීම.

ඒ අමාරු ඉලක්කය අපේ රටේ මුදල් අමාත්‍යාංශයත්, ශ්‍රී ලංකා මහ බැංකුවත් වඩා කාර්යක්ෂම ලෙස ඉටු කර තිබෙනවා. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය මෙහෙය වීමත්, යුද්ධය නතර වීමත් නිසා දීර්ඝ කාලයක් තිස්සේ රටට අත් පත් කර ගන්නට නොහැකි වුණු ජයග්‍රහණයක් වන පොලී අනුපාතය පහතට හෙළීමේ ප්‍රතිඵලයක් වශයෙන් අධික පිරිවැය සහිත ණය මේ වන විට ගෙවා නිදහස් කරන්නට පුළුවන්කම රජයට ලැබී තිබීම මේ රටට ආදරය කරන සියලු දෙනාගේ සතුටට හේතු වන කරුණක් කියන එක මම සඳහන් කරන්නට කැමැතියි.

ඊළඟට ඉදිරිපත් කර තිබෙන්නේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝගයි. විශේෂයෙන් මෝටර් වාහන ආනයනය සම්බන්ධයෙන් පනවා තිබූ නිෂ්පාදන බදු ගැලපුම් තමයි මෙම ගැසට් නිවේදනය මඟින් ඉදිරිපත් කර තිබෙන්නේ. මේ ගැසට් නිවේදනයට අනුව මෝටර් රථ ආනයනය මේ වන විට සිදු වෙමින් පවතිනවා. තමුන්නාන්සේ දන්නවා, පරිසර හිතකාමී බලපෑමක් ඇති වීම සඳහා දෙමුහුන් විද්‍යුත් කුඩා මෝටර් රථ වැඩි වැඩියෙන් ආනයනය කරන්නට ඉඩ දීමේ අරමුණින් පසු ගිය අය වැය ලේඛනයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් මේ මෝටර් වාහන ආනයනය සඳහා වන බදු ප්‍රතිශතය ඉතා විශාල ලෙස පහත හෙළන ලද බව. ඒ දෙමුහුන් විද්‍යුත් මෝටර් වාහන සඳහා සියයට 38ක් වැනි ඉතාම පහළ බදු අනුපාතයක් නියම කළා. නමුත් එසේ නියම කරන අවස්ථාවේදී සිලින්ඩර ධාරිතාව පිළිබඳව එහි කිසිම සටහනක් කළේ නැහැ. එතැනදී කළේ, දෙමුහුන් විද්‍යුත් වාහන ආනයන කරන විට අය කරන බදු ප්‍රතිශතය සියයට 38ට අඩු කිරීමයි. නමුත් ධාරිතාව නිසි ලෙස සඳහන් නොකිරීම නිසා සිද්ධ වූ ප්‍රතිඵලය තමයි කුඩා දෙමුහුන් විද්‍යුත් වාහන ආනයනය වැඩි වෙනවා වාගේම, ධාරිතාවයෙන් ඉතා විශාල ලෙස වැඩි, පිරිමැසුම්කාරී නොවන වාහනත් වැඩි වැඩියෙන් ලංකාවට ආනයනය කරන්න පටන් ගැනීම. එහි ප්‍රතිඵලයක් ලෙස 2011 මුල් කාර්තුව තුළ පමණක් කුඩා මෝටර් රථ හා ත්‍රිරෝද රථ 30,481ක් ආනයනය කරලා තිබෙනවා. සිලින්ඩර ධාරිතාව 1,500ට වැඩි හා 1,600ට අඩු දෙමුහුන් විද්‍යුත් වාහන 12,763ක් ආනයනය කරලා තිබෙනවා. එතකොට කුඩා මෝටර් රථ හා ත්‍රිරෝද රථ 30,481ක් ආනයනය කරන විට, ධාරිතාව වැඩි වාහන 12,763ක් ආනයනය කරලා තිබෙනවා. මේ තුළින් රජයේ බදු අඩු කිරීමේ අපේක්ෂිත අරමුණ ඉෂ්ට වෙලා නැහැ. මක් නිසාද යත්, ධාරිතාව නිසි ලෙස නියම නොකර බදු යෝජනාව ඉදිරිපත් කිරීම නිසා පරිසර හිතකාමී මෝටර් වාහන කුඩා ඒවා වැඩි වැඩියෙන් ආනයනය කරනවා වෙනුවට ඉහළ ධාරිතාවක් සහිත වාහන වැඩිපුර ගෙන ඒමෙන් බදු ආදායමට අලාභයක් සිද්ධ වෙලා තිබෙනවා, රජයේ මූලික අරමුණුවලට අලාභයක් සිද්ධ වෙලා තිබෙනවා. එම නිසා ඒ තත්ත්වය මුදල් අමාත්‍යාංශය ඉතා විමර්ශනශීලී ලෙස සැලකිල්ලට ගත්තා. ඒ අනුව මෝටර් රථ බදු ගැලපුම් ගැසට් නිවේදනයක් මඟින් වෙනස් කරලා තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, you have one more minute.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

ඒ වෙනස් කිරීම අනුව කුඩා දෙමුහුන් විද්‍යුත් මෝටර් රථ සඳහා සියයට 50 දක්වාත්, සිලින්ඩර ධාරිතාව 2,001 සිට 3,000 දක්වා සියයට 75කුත්, සිලින්ඩර ධාරිතාව 3,000ට වඩා වැඩි වාහන සඳහා සියයට 100කුත් වන ආකාරයෙන් බදු ගැලපුමක් කරලා තිබෙනවා. ඊට අතිරේකව සිලින්ඩර් ධාරිතාව 1,000ට අඩු පෙට්‍රල් වාහනවල බදු ප්‍රතිශතය සියයට 120 දක්වාත්, සිලින්ඩර ධාරිතාව 1,001 සිට 1,600 දක්වා බදු ප්‍රතිශතය සියයට 128 දක්වාත්, පෙට්‍රල් ත්‍රිරෝද රථ සඳහා බදු ප්‍රතිශතය සියයට 50 දක්වාත්, ඩීසල් ත්‍රිරෝද රථ සඳහා බදු ප්‍රතිශතය සියයට 60 දක්වාත් වූ බදු ගැලපුම් පිළිබඳ ගැසට් නිවේදනය සඳහායි ඒ අනුමැතිය ලබා ගන්නේ. මෙය පරිසර හිතකාමී වාහන රට තුළ භාවිතය වැඩි කිරීම සඳහාත්, රජයේ බදු ආදායමට සිද්ධ වන අයහපත් බලපෑම මඟ හැරවීම සඳහාත්, බදු ව්‍යුහය වඩා තාර්කිකකරණය සඳහාත් ඉදිරිපත් කළ යෝජනාවක්. මේ යෝජනා තුන අද ඉදිරිපත් වන අවස්ථාවේදී ඔබතුමාගේ අවසරය මත තව එක් කරුණක් සඳහන් කරන්නට කැමැතියි.

2005 වර්ෂයේ සිට ලංකා ඉතිහාසයේ කිසිම රජයක් මුහුණ නොදුන් ප්‍රධාන අභියෝග තුනක් යටතේ තමයි මුදල් අමාත්‍යාංශය හා භාණ්ඩාගාරය වශයෙන් මේ රට පසු ගිය කාල පරිච්ඡේදය තුළදී ගමන් කරලා තිබෙන්නේ. පළමුවැනි කාරණය තමයි, 2004 අග භාගයේදී ඇති වූ සුනාමි ව්‍යසනය නිසා මනුෂ්‍ය ජීවිත 45,000ක් රටට අහිමි වෙලා දේපොළ, වතු පිටි, ඉඩ කඩම්, යාන වාහන විශාල ප්‍රාග්ධන ස්කන්ධයක් රටට අහිමි වීම. දෙවැනි කාරණය තමයි, අවුරුදු 30ක් පැවැති යුද්ධය අවුරුදු 03ක් වැනි කෙටි කාල පරිච්ඡේදයකින් නිම කිරීම සඳහා, ත්‍රස්තවාදයෙන් රට ගලවා ගැනීම සඳහා මේ රජයට, මේ රටට, රටේ ජනතාවට ඉතා විශාල ණය කන්දරාවක් ලබා ගන්න සිද්ධ වීම. එම කරුණු දෙකම එළෙසින් තිබියදී මනුෂ්‍ය සංහතිය ආරම්භයේ සිට වඩාත්ම ඉහළ ගිය තෙල් මිල වූ බැරලය ඇමරිකානු ඩොලර් 147 දක්වා වැඩි වීම මඟින් ලෝකය තෙලෙන් බැඳෙන අර්බුදයට මුහුණ දෙන්න සිද්ධ වුණා. හතරවැනි කාරණය තමයි, අවුරුදු 30කට පස්සේ ඇති වුණු ලෝකයේ දරුණුතම ආහාර අර්බුදයට මුහුණ දීමෙන් පස්සේ රොකට්ටුවට වඩා වැඩි වේගයකින් ආහාර-පානවල මිල ගණන්

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

ඉහළ යාම. පස්වැනි කාරණය තමයි ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ ලෝකයේ රටවල් කඩා වැටිලා, බැංකුවෙන් බැංකුව වැටිලා ලෝක ආර්ථිකය සෘණ මට්ටමට පත් වන තත්ත්වයක් තිබීම.

එවන් පංච මහා අර්බුදයකට ලංකා ඉතිහාසයේ කාගේ හරි ආණ්ඩුවක් මුහුණ දීලා තිබෙනවා නම්, ඒ මුහුණ දීපු එකම ආණ්ඩුව මහින්ද රාජපක්ෂ ආණ්ඩුව පමණයි. එම පංච මහා අර්බුදය මේ රජය ජය ගත්තා. යකඩ ගැටෙන අමිහිරි ශබ්දය, උණ්ඩයේ අමිහිරි සුවඳ මේ රටේ සංස්කෘතියේ කොටසක් බවට පත් වෙලා තිබුණු තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් වෙලා පසු ගිය වර්ෂ දෙකක කාල පරිච්ඡේදය තුළ මනුෂ්‍යයන් බයෙන් හා සැකයෙන් තොරව පාරේ ගමන් කරන්න පටන් ගත්තා. මිනිස්සුන්ට හෙට දිනය පිළිබඳව බලාපොරොත්තුවක් ඇති වුණා. නමුත් අවාසනාවකට ජනතාවගේ පැත්තට, ජනතාවගේ ශුභ සිද්ධියට ගෙන එන හොඳ යෝජනා පවා ඉතාම වෛර සහගතව, විජාතික චුවමනාව මත හිට ගන්නා සමහර අය විසින් වැරැදි ලෙස අර්ථ දැක්වීමක් සිද්ධ කළා.

මම මේ කථාව කියන්න බලාපොරොත්තු වෙන්නේ විශේෂයෙන් මේ ආර්ථිකයේ මූල්‍ය පිළිබඳ දන්නා කෙනෙක්, තරමක් හෝ ප්‍රාමාණික අවබෝධයක් තිබෙන කෙනෙක් ලෙසයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රජය ඉදිරිපත් කරපු පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් හාම්පුතා සියයට 12ක් සේවක අර්ථසාධක අරමුදලට ගෙවනවා, සේවකයා සියයට අටකින් දායක වනවා. සියයට 20යි අවම දායකත්වය. සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට හාම්පුතා තනියෙන් සියයට තුනක් ගෙවනවා. පුද්ගලික අංශයේ සේවකයින් විශ්‍රාම ගියාම පාරිතෝෂිකය ලැබෙනවා. පුද්ගලික අංශයේ ලක්ෂ 60කට අධික මේ සේවක පිරිසට සෙතක් සලසන්න අතිගරු ජනාධිපතිතුමා රජයේ සහභාගිත්වයත් ඇතුව ත්‍රෛපාර්ශ්වික විශ්‍රාම වැටුප් අරමුදලක් ගෙනාවා. අය වැය යෝජනාවේ ඒ බව සඳහන් කළා. සඳහන් කරලා ඒ අරමුදලට මහ ජනයාගේ බදු මුදලින් රුපියල් බිලියනයක් යෙදුවා. හාම්පුතාගෙන් සියයට දෙකක් වැටුපට අතිරේකව එකතු කරනවා. සේවකයා සියයට දෙකකින් දායක වනවා. එය ත්‍රෛපාර්ශ්වික විශ්‍රාම වැටුප් ක්‍රමයක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් බලන්න හාම්පුතාගෙන්- කිසිම අර්ථසාධකයක් කැපෙන්නේ නැතිව, හාම්පුතාගෙන්- සියයට 12ක්- [බාධා කිරීම්] නැහැ, ඒ වෙලාව මට දීලා තිබෙන්නේ. ඒක මම බලා ගන්නම්. ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාගේ වෙලාවෙන් ඒ ප්‍රමාණය අඩු කරන්න.

හාම්පුතා සියයට 12ක් සේවක අර්ථසාධක අරමුදලට ගෙවනවා, සියයට 3ක් සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට ගෙවනවා. ඒ අනුව හාම්පුතා ඒ සඳහා සියයට 15ක් ගෙවනවා. මේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් ඔහුට තව දෙකක් වැඩිපුර ගෙවන්න වෙනවා. එතකොට සේවකයා වෙනුවෙන් ඔහුට සියයට 17ක් ප්‍රදානය කරන්න වෙන කොට, හාම්පුතාගේ ඒ සියයට 2 වෙනුවෙන් මේ බටහිර විදේශ ආයෝජකයෝ පමණක් ඉන්නා නිදහස් වෙළෙඳ කලාපය ඇතුළෙන් ඔවුන්ගේ ඩොලර්වලට, නෝර්වේ හා බටහිර සල්ලිවලට තමයි පුද්ගලික අංශයට මේ ප්‍රතිලාභය ලබා දීම මේ පිරිස විසින් වැළැක්වූයේ.

කවුද, නිදහස් වෙළෙඳ කලාපයේ ඉන්න හාම්පුත්තු? නිදහස් වෙළෙඳ කලාපයේ ඉන්න සියලුම හාම්පුත්තු මේ රටේ බොහෝ නීතිරීතිවලින් නිදහස්ව රට ඇතුළට ආපු බටහිර විදේශීය ආයෝජකයෝ. ආයෝජකයෝ කල්පනා කළා, මොකක්ද මේ රට කරන්නේ කියලා. "අපි සියයට 12ක් දෙනවා, අර්ථසාධක අරමුදලට; සියයට තුනක් දෙනවා, සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට. දැන් පෞද්ගලික විශ්‍රාම වැටුපක් ගෙවන්න තවත් සියයට 2ක් දුන්නාම අපෙන් යන ප්‍රමාණය, එතැන12යි, 3යි, 15යි. ඒකට තවත් 2ක් එකතු වුණාම 17ක්" කියලා. ඒකට සල්ලිවලට ගන්න පුළුවන් සියලු බලවේග අරන් මේ රටේ ජනතාව වෙත ලැබෙන්න තිබෙන ප්‍රතිලාභය සම්පූර්ණයෙන් නතර කරවීමේ උත්සාහය තමයි ඔවුන් මේ දැරුවේ. එක අතකට මූල්‍ය විග්‍රහයට අනුව මම මෙය කියනවා නම්, මේක ක්‍රියාත්මක වෙලා විශ්‍රාම වැටුප ගෙවන දවසට වැඩිම බරක් එන්න තිබෙන්නේ ආණ්ඩුවටයි. ආරම්භයේදී රුපියල් බිලියනයක් දමන රජයට මේ අරමුදලෙන් විශ්‍රාම වැටුප ගෙවන කොට එන්න එන්නම රජයේ කොටස වැඩි කරන්න වනවා. රජයේ කොටස වැඩි කරන්න වුණාම රාජ්‍ය මූල්‍යයට ඇති වන බර අඩු කර ගන්න තමයි මේ ගොල්ලෝ මේ අනියම් ආකාරයෙන් උදවු කරලා තිබෙන්නේ. එක අතකට ආර්ථික විග්‍රහය අනුව නම් මේ විශ්‍රාම වැටුප නතර කිරීමෙන් මේ අය අනියම් ආකාරයෙන් කරලා තිබෙන්නේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට විශාල මූල්‍ය සහනයක් ලබා ගන්න අවස්ථාව ලබා දීම හා පෞද්ගලික අංශයට ලැබෙන්න තිබෙන ප්‍රතිලාභය සම්පූර්ණයෙන් නතර කිරීමයි. මෙවැනි දේ නොව රට පැත්තේ හිට ගන්න, රටේ ජනතාව පැත්තේ හිට ගන්න, ඩොලර් පැත්තේ හිට ගන්න එපා කියන ආයාචනය කරමින් මගේ වචන කිහිපය මෙයින් සමාප්ත කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ. භා. 2.55 ]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කර තිබෙන නියෝග, යෝජනා හා නියමයන් ගැන කරුණු ඉදිරිපත් කරන්න කලින් මා මිත්‍ර ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියපු කාරණා දෙක තුනක් ගැන පිළිතුරු දෙන්න සිද්ධ වනවා. එතුමා අවසාන වශයෙන් කථා කළ පෞද්ගලික අංශයට දෙනවායි කියපු විශ්‍රාම වැටුප ගැන මගේ කථාව පටන් ගන්න කලින් වචන දෙක තුනක් මේ ගරු සභාවේ කියන්න අවශ්‍යයි.

මේ අර්ථසාධක අරමුදලෙන් වන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ගරු බන්දුල ඇමතිතුමාත්, මමත් පැය ගණන්, දවස් ගණන් කථා කරලා තිබෙනවා. ඒ සේවකයන්ට අවශ්‍ය විධියට ප්‍රතිලාභ දෙන්නේ නැතුව, ආණ්ඩුව ඒ සල්ලි හූරා ගෙන කන හැටි එතුමා අපේ පැත්තේ ඉන්න කොට එතුමාත්, මමත් පැය ගණන්, දවස් ගණන් කථා කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික උපදේශකලා හැටියට කාලයක් හැම අඟහරුවාදාවකම ඔබතුමායි, මමයි තමයි අනෙක් විද්වත් කට්ටියත්- විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරු, මහාචාර්යවරු- එක්ක කේම්බ්‍රිජ් එකේදී හම්බ වෙලා, පැය ගණනක් තිස්සේ මේ ගැන කථා කළේ. ආණ්ඩු පාර්ශ්වය පැත්තට යන්න කලින් ඔබතුමාම තමයි, දැන් ඔය අර්ථ සාධකය පාලනය කරන නිවාඩ් කබ්රාල් උන්නැහේව පත් කළා කියලා, ඒ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරන්න මූලික වුණේත්. දැන් ඒ කට්ටිය ආණ්ඩුව පැත්තට ගිය නිසා ඒ ඔක්කොම අමතක වෙලා තිබෙනවා. ඔය ඔක්කොම අමතක වෙලා තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇමතිතුමා අහගන්න කෝ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මට උත්තර දෙන්න අවස්ථාව දෙන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, මම කියන්නම්. මා ළඟ තිබෙනවා, -[බාධා කිරීමක්] අහගෙන ඉන්න, අහගෙන ඉන්න. හරි, මම කියන්නම්. "Parliamentary Select Committee to probe Nivard Cabraal" කවුද, අත්සන් කළේ? ඔබතුමා. බන්දුල ගුණවර්ධන. [බාධා කිරීම්] ඔය කියන්නේ. කටෙන්ද, කොහෙන්ද ඔය කථා කරන්නේ? "Parliamentary Select Committee to probe Nivard Cabraal" අත්සන් කළේ ඔබතුමා. බන්දුල ගුණවර්ධන, පී. දයාරත්න, ලක්ෂ්මන් සෙනෙවිරත්න, ජොන්ස්ටන් ප්‍රනාන්දු, නියෝමාල් පෙරේරා. ඔක්කොම ඔය පැත්තේ. [බාධා කිරීමක්] හරි වැරදි වෙන්නේ කොහොමද? මේ ලියවිල්ල හරි. මේ මනුස්සයා ගැන ඔබතුමා මටම කොච්චර වැරදි කියලා තිබෙනවාද? මේකේ හර්ෂ ද සිල්වා කියලා නැහැ. මේකේ තිබෙන්නේ බන්දුල ගුණවර්ධන කියලා. [බාධා කිරීම්] හරි. ඉතින් "Parliamentary Select Committee to probe Nivard Cabraal" අත්සන් කරලා, දැන් වයර් ඔක්කොම සම්පූර්ණයෙන්ම මාරු වෙලා.

දැන් ඔක්කොම මාරු වෙලා. දැන් මේ මූල්‍ය මණ්ඩලය සේවා අර්ථසාධක අරමුදල පාලනය කරන ක්‍රමවේදය ගැන මහා ලොකුවට කතා කරනවා. අනේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, ඔබතුමා ලියපු පොත J.R. Jayewardene Centre එකේදී launch කරන කොට ප්‍රධාන දේශකයා කවුද? මම. හරිද? ඒ පොතේ කියපු ඒවාට සියයට සියයක්ම -සම්පූර්ණයෙන්ම- වෙනස් දේවල් තමයි අද මේ ඇමතිතුමා ආණ්ඩුව පැත්තේ ඉඳන් කතා කරන්නේ. පට්ටපල් බොරු. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පොත එළිදක්වන කොට ප්‍රධාන දේශකයා වුණේ මමයි හත් දෙවියනේ! [බාධා කිරීමක්] හරි. දැන් පැත්ත මාරු වෙච්ච ගමන් theory එකයි, පොතයි ඔක්කොම මාරු වෙලා.

එක්සත් ජාතික පක්ෂයේ ඉඳන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගිය ගමන් ආර්ථික විද්‍යාවේ න්‍යාය එහෙම වෙනස් වෙන්නේ නැහැ. එහෙම වෙන්නේ නැහැ. හරි, ඉතින් ඒ ගැන මීට වඩා කියන්න දෙයක් නැහැ. මේක දෙබිඩි පිළිවෙතක්. එක පැත්තක ඉන්න කොට මේ පිළිවෙත වැරදියි. අනික් පැත්තට ගියාම ඒ පිළිවෙත හරි. ඒ නිසා මට ඒ ගැන මීට වඩා දෙයක් කතා කරන්න දෙයක් නැහැ.

අනික් එක මේකයි. ඔබතුමා මෙන්න මෙවැනි විහිළු කතාවක් කිව්වා. ආණ්ඩුවෙන් බිලියනයක් දුන්නාලු. [බාධා කිරීමක්] Tripartite system එකට බිලියනයක් දුන්නාය කියා දැන් කිව්වා. ඔබතුමා කිව්වා. හැන්සාඩ් වාර්තාවේ ඒක තිබෙනවා. ඊට පසුව මෙන්න මේ වාගේ මහා පට්ටපල් බොරුවක් කිව්වා. [බාධා කිරීමක්] අහගෙන ඉන්න. අහගෙන ඉන්න. [බාධා කිරීමක්] මොකක්ද කියපු බොරුව? පසු කාලයකදී මේ විශ්‍රාම වැටුප ගෙවන්න ආණ්ඩුවෙන් දෙන ප්‍රමාණය වැඩි වෙන්න ඕනෑය කිව්වා. පට්ටපල් බොරුවක් නේද ඇමතිතුමනි? පට්ටපල් බොරුවක්.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
[බාධා කිරීමක්]

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Alhaj A.H.M. Azwer.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*
කියන වචනය පාර්ලිමේන්තු සභා ගර්භයේ පාවිච්චි කරන්න සුදුසු නැහැ කියා තිබෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ස්ථාවර නියෝග අනුව මේ සභාවේ, "පට්ටපල් බොරු, බොරු" කියන වචන පාවිච්චි කරන්න බැහැ. ඒ නිසා මේ

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියන වචන හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න ඕනෑ. He is referring to the conduct of an Hon. Minister. I think, he is speaking against the Standing Orders. You must listen. If you are an

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

you cannot listen to me. If you are an economist listen to me. Sir, according to the Standing Orders he must have a good conduct in the House because the school children are also there. He cannot make use of this word. He cannot call another Member or a Minister a "liar" . He cannot, Sir.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Alhaj A.H.M. Azwer, please sit down. That is not a point of Order.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
පට්ටපල් බොරුවක් කිව්වා. දැන් මෙතැනදි කිව්වා පසුව කාලයක ආණ්ඩුවෙන් දෙන -[බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ස්ථාවර නියෝග අනුව-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Please let him speak.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Thank you. පසුව කාලයකදී ආණ්ඩුවෙන් ගෙවන ප්‍රමාණය වැඩි වෙන්න ඕනෑය කිව්වා. මගේ අති මිත්‍ර බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, කිසිම තැනක එවැනි කතාවක් කියා නැහැ. අනික් කාරණය, ආණ්ඩුවෙන් දෙන බිලියනය ණයක් හැටියට තමයි දෙන්නේ. පසු කාලයකදී ඒ ණය ගෙවා ඉවර කරන්නත් ඕනෑ. පොලියත් එක්ක ගෙවන්න ඕනෑ. කිසිම වෙලාවකදී ආණ්ඩුවෙන් තව මේකට සතයක්වත් දමන්නේ නැහැ. පළමුවැනි වතාවට ආණ්ඩුවෙන් සතයක්වත් දැම්මේත් නැහැ. බිලියනයක ණයක් දුන්නා. ඊටපසුව තව සතයක්වත් දමනවාය කියා මේ පනත් කෙටුම්පතේ කිසිම තැනක සඳහන් වෙලා නැහැ. අනික් එක තමයි, මේකට විශ්‍රාම වැටුපක්ය කියා කියන්න බැහැ. ඇයි බැරි? විශ්‍රාම වැටුපක් කියන්නේ විශ්‍රාම ගියායින් පසුව මැරෙන තෙක්ම කරන ගෙවීමක්. මේකේ කොහේද එහෙම එකක් තිබෙන්නේ? මම ගණන් හදා පෙන්වන්නම් බන්දුල ගුණවර්ධන ඇමතිතුමනි, සාමාන්‍ය වශයෙන් අවුරුදු තුන හමාරකට, හතරකට වඩා කිසි කෙනෙකුට මේ pension එක ගෙවන්න බැහැ කියන එක. ගෙවන්න ක්‍රමයක් නැහැ. හැබැයි, මේකේ ඊට වඩා මහා ලොකු බැරෑරුම් දෙයක් තිබෙනවා. මොකක්ද දන්නවාද? මීට කලින් ගෙනාපු කිසිම පනතක - [බාධා කිරීමක්]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Bandula Gunawardane.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා පදනම් විරහිතව පෞද්ගලිකව- [බාධා කිරීම්] මගේ නම කියා කියනවා නම් මටත් උත්තර දෙන්න අවස්ථාව තිබෙන්නට ඕනෑ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
මටත් අහන්න ඉඩ දෙන්න. ශබ්ද කරනකොට කොහොමද මම අහන්නේ?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
පෞද්ගලිකව පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයකුගේ නම සඳහන් කර කථා කරනවා නම් ඒ මන්ත්‍රීවරයාට උත්තර දෙන්නට අයිතිය ඇතිව කථා කරන්න ඕනෑ. [බාධා කිරීම්] එම නිසා මගේ නම කියා කථා කරන කොට උත්තර දෙන්නට මට අයිතියක් නැත්නම් මගේ නම නැතිව අනෙක් කථා ටික කියා ගෙන යන්නට ඕනෑ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
If there is anything said against the Standing Orders, that will be expunged. Hon. (Dr.) Harsha De Silva, speak on the subject please.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
I am speaking on the subject, Hon. Deputy Chairman of Committees. He is the one who spoke about the EPBF Bill. If I mentioned his name, he has all the right to reply but not during my time. He has no right to call me

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්] එහෙම කථා කරන එක ඊට වඩා ගොඩක් වැරදියි. ලජ්ජයි. නමුත් මම පෙන්වන්නම් කොහොමද කියා, මේ ආණ්ඩුව -[බාධා කිරීම්] පස්සේ කිව්වා, "හරි, අවුරුදු තුනකට වඩා අප දෙන්නම්" කියා. අපේ කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමා එදා TV Debate එකකට ඇවිත් කිව්වා, "නැහැ. නැහැ. කැබිනට් එකේ අප තීරණයක් ගත්තා. මැරෙනකම් pension එක ගෙවනවා" කියා. කොහොමද දෙයියනේ මැරෙනකම් pension එක ගෙවන්නෙ සියයට දෙකක් කපා ගෙන? කොහොම ද ගෙවන්නේ? මම පෙන්වන්නම්. මේකේ තිබෙනවා, මීට කලින් විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධකය හෝ ETF එක හෝ gratuity එක පිළිබඳව තිබෙන පනත්වලට කිසිම විධියකින් අදාළ නැති දෙයක්. මේකේ තියෙනවා, "කපා ගැනීම් සියයට දෙකට නොඅඩු මුදලක්" කියා. කොහෙද යන්නේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා? [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
යන්න එපා. ඇයි යන්නේ? යන්න එපා. ලජ්ජයි. [බාධා කිරීම්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔන්න ආර්ථික විග්‍රහය. ආර්ථික විග්‍රහය ගියා. මේකේ තිබෙනවා, "සියයට දෙකට වඩා නොඅඩු මුදලක්" කියා. සියයට දෙකට වඩා නොඅඩු මුදලක් කියන්නේ සියයට 3 වන්නටත් පුළුවන්. සියයට 4 වන්නටත් පුළුවන්. සියයට 5 වන්නටත් පුළුවන්. පස්සේ කාලයක සියයට 100 වන්නටත් පුළුවන්. ඒක මේ පනතේ ඉදිරිපත් කර තිබෙන්නේ සියයට 2ක් කපනවාය කියා නොවෙයි. "සියයට දෙකට නොඅඩු මුදලක්" කියායි. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Dinesh Gunawardena.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Sir, the Hon. Member continues to speak on a subject which is not relevant to the Debate today. We have listened enough. If he wants a debate on this subject it can be given later. But I would request the Chair to give an Order on this. Otherwise, every Member will be speaking on all other events irrespective of the subject of the Debate.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

I respect the Chief Government Whip.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

You have taken eight minutes on this issue. We have listened to you for eight minutes. Now, get back to the subject of the Debate.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Thank you, Sir. The only reason why I had to speak on this matter was, I was replying the Hon. Minister. The Hon. Minister is the one who started discussing the EPBF Bill. So, if you think that I have said enough, that is fine. We can talk about it at another time. But I think I was able to point out to the Hon. Members here that all what he said is not accurate. There are a number of issues that we can debate at some point of time. Then the second thing is එතුමා කිව්වා, 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත ගැන. මේක ඉතාම හොඳ පනතක් කියා එක්සත් ජාතික පක්ෂය හැටියට අපට හඳුන්වන්නට පුළුවන්. මේ කරන්න යන දෙය ඉතාමත්ම කාලෝචිත දෙයක්. මේ දවස්වල ක්‍රෙඩිට් කාඩ් හොරකම් ගැන අප හැම දාම පත්තරවල දකිනවා විතරයි. එම නිසා මේක නවත්වන්න expert panel එකක් පත් කිරීම පිළිබඳව කර තිබෙන්නේ හොඳ දෙයක්ය කියා අප ආණ්ඩුවට කියනවා.

මම තව එකක් කියන්න ඕනෑ. මේකේ තිබෙනවා මේ Expert Panel එකේ පත් කරන කට්ටිය අතරේ "ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය" කියලා එකක්. එහෙම නැත්නම් "Sri Lanka Computer Emergency Response Team" කියලා එකක් මේ Expert Panel එකේ තිබෙනවා. ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයට අපේ කෘතඥතාව පළ කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා. මේ ළඟදි හරි ෂෝක් වැඩක් වුණා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ facebook එක තිබෙනවා නේ. අපි කවුරුත් දන්නවා මේ Facebook එක ගැන. Facebook එකේ නොයෙකුත් හොරකම්, ව්‍යාපාර සිද්ධ වෙනවා. තමන් කියලා වෙන කට්ටියක් facebook එකේ ඉදිරිපත් වෙනවා. මේ ළඟදි දවසක් මගේ පින්තූරය දමලා වෙන කවුද කෙනෙක් profile එකක් හදලා තිබුණා. එහෙම හදලා ඒකේ මම ගැන නොයෙකුත් අනවශ්‍ය දේවල් ප්‍රචාරය කරලා තිබුණා. [බාධා කිරීමක්] ඔව්. කෝටි ගණන් requests ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අන්තිමට මට සිද්ධ වුණා, මේ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයට කථා කරන්න. එතුමන්ලා පැය ගණනකින් මේ ප්‍රශ්නය පිළිබඳව සොයා බලා වහාම ඒ පිළිබඳව ක්‍රියාමාර්ගයක් අරගෙන ඒ මම හැටියට පෙනී හිටපු පුද්ගලයාව අල්ලා ගත්තා. එහෙම තමයි මේ වැඩ සිද්ධ වෙන්න ඕනෑ. ඉතින් ඒ ගැන මම ඒ කට්ටියට මේ වෙලාවේ ස්තුති කරනවා.

තුන්වැනි යෝජනාව වන ලියා පදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ තිබෙන නියෝගය පිළිබඳව කථා කරන්නත් තිබෙනවා. ඒක ඉතා වැදගත් දෙයක්. මොකද, බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කිව්වා මේ පොලී අනුපාත තනි ඉලක්කමට ගේන්න පුළුවන් නම් ඒක ඉතා හොඳ දෙයක් කියලා. අවුරුදු ගණනක් තිස්සේ මේ දේ මේ රටට කර ගන්න බැරි වුණා කියලාත් එතුමා කිව්වා. අද වෙන කොට පොලී අනුපාත තනි ඉලක්කමට ඇවිල්ලා තිබෙනවා. ඒක හොඳ දෙයක් කියලා මම පිළිගන්නවා. නමුත් මම මේක පෙන්වන්න කැමැතියි. මම ළඟ තිබෙනවා 2010 මහ බැංකු වාර්තාව. 1994 දී, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ජනාධිපතිනිය වෙච්ච දවසේ ඉඳලා තිබ්බ්ච පොලී අනුපාත ඒකේ තිබෙනවා. 1994 දී සියයට 19යි. 1995 දී සියයට 18යි. 1996 දී සියයට 17යි. ඔන්න ඔය විධියට තිබෙනවා. ඊළඟට 2000 දී සියයට 17යි. පළමුවෙනි පාරට අවුරුදු ගණනාවකට පස්සේ තනි ඉලක්කමට පොලී අනුපාතය බැස්සේ කවදාද? 2002 දී 9.8යි. 2003 දී 7.3යි. 2004 දී 7.5යි. ඉතින් මම හිතන්නේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා පිළිගත්තා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ ඒ ආර්ථික කළමනාකරණය හරියට සිද්ධ වුණා කියලා. මොකද ඒ යුද්ධය තිබෙන කාලයේ. දැන් යුද්ධය නැහැ. ඒ කාලයේ යුද්ධය තිබුණා. යුද්ධය තිබුණු කාලයේත් ආර්ථික සංවර්ධනයේ සංකේතයක් හැටියට පොලී අනුපාතය තනි ඉලක්කමකට ගේන්න අපිට හැකියාවක් තිබුණා. දැන් බලන්න මේ ලියා පදිංචි ස්කන්ධ සුරැකුම්පත් ආඥාපනතින් කරන්න ලැහැස්ති වන්නේ මොකක්ද කියලා. රුපියල් බිලියන 18,000ක් අරගෙන තිබෙනවා සියයට දහඅටේ, සියයට දහඅටයි දශම හයේ, සියයට දහනවයේ, පොලියට. මේක කල් පිරෙන්න මාස හයකට කලින් මේ අවුරුද්දේ අගෝස්තු මාසයේ 30 වැනි දාට මේ ණය ගෙවලා ඉවරයක් කරන්න හදනවා. "ගෙවා නිදහස් වීමට කටයුතු කරනවා" කියලා තමයි මේකේ තිබෙන්නේ. දැන් මේක පොඩ්ඩක් ගැඹුරින් බලමු. 2007 දී තමයි මේ ණය අරගෙන තිබෙන්නේ. අපි කවුරුත් පිළිගන්නවා වැඩි පොලියට ණය අරගෙන තිබෙනවා නම් ඒක ගෙවලා නිදහස් කරලා අඩු පොලියට ගන්න පුළුවන් නම් එතැන ඒ කරන්නේ හොඳ දෙයක් කියලා. ඒක ආර්ථික කළමනාකරණයේ හරි දෙයක්. දැන් 2007 දී තවත් බැංකුවකින් තවත් ණයක් ගත්තා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද ඒ ණය? HSBC ණය. 2007 ඔක්තෝබර් මාසයේ තමයි මේ ණය ගත්තේ. මේක ඩොලර් මිලියන 500යි. හරිද? ඒ කියන්නේ රුපියල් මිලියන 55,000කට වඩා වැඩියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ණය ගත්තේ කීයේ පොලියටද?

ඇමෙරිකන් ඩොලර්වලින් සියයට 8.25ක පොලියට තමයි ණය ගත්තේ. මේක අවුරුදු පහකදී ගෙවන්න ඕනෑ. [බාධා කිරීමක්] ඔව්, ඒ කියන්නේ ඇමෙරිකන් ඩොලර්වලින් සියයට 8යි. එක වර ගෙවිය යුතුයි. බලන්න, මේ ණය සේවාකරණයත් එක්ක අද තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා. මම මේක පොඩ්ඩක් විග්‍රහ කරන්න සූදානම් වෙනවා. ඊට කලින් මට පෙන්වන්න අවශ්‍යයි ශ්‍රී ලංකා මහ බැංකුවේ 2010 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවේ 163වන පිටුවේ තිබෙන 6.8 සංඛ්‍යා සටහන. එහි තිබෙනවා අධික පොලියට ගත්ත ණය ගැන. අපට පස්සේ කථා කරන්න පුළුවන් චීනයෙන් ගන්නා ණය ගැන. මේ විවාදයට ඒ කාරණය ගෙනෙන්න මම කැමැති නැහැ. රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් මේ සංඛ්‍යා සටහනේ තිබෙනවා. 2007 ණය සේවාකරණ ගෙවීම් රුපියල් මිලියන 500,514යි. 2010 වෙන කොට ඒක වැඩි වෙලා තිබෙනවා රුපියල් මිලියන 820,448 දක්වා. 2012 වෙන කොට අර මම කියපු HSBC ණයත් ගෙවන්න තිබෙනවා. ඒ HSBC ණය රුපියල් මිලියන 65,000ක් වෙනවා. ඇමෙරිකන් ඩොලර් පොලී අනුපාත යටතේ සියයට 8.25 වැනි අතිවිශාල පොලියකට තමයි මේ ණය අර ගෙන තිබෙන්නේ. ඊට අමතරව හෙජින් ණයත්

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

ගෙවන්න තිබෙනවා. මම හරියටම දන්නේ නැහැ ඒ ගණන කීයද කියලා. නමුත් සාකච්ඡා වෙලා තිබෙන ප්‍රමාණය තමයි රුපියල් මිලියන 80,000ක් කියන එක. දැන් බලන්න මේකත් එක්ක විදේශ ණය සේවාකරණය කීයද කියලා. මේවා ඩොලර් ණය නේ. 2010 විදේශ ණය සේවාකරණයට වඩා සියයට සියයක වර්ධනයක් 2012 වන කොට තිබෙනවා. ඒ කියන්නේ, 2012 දී මේ ණය ගෙවන්න ලෑස්ති වෙන කොට 2010 දී ගෙව්වාට වඩා දෙගුණයක් ගෙවන්න සිද්ධ වෙනවා කියන එකයි.

අප ඒකත් එක්කම බලන්න ඕනෑ දෙයක් තිබෙනවා. තව එක සංඛ්‍යා සටහනක් පෙන්වන්න මම සූදානම් වෙනවා. ඒ තමයි රාජ්‍ය ණය දර්ශකය කියන එක. එහි තිබෙනවා අපනයනයට සාපේක්ෂව මුළු විදේශ ණය. ඒ කියන්නේ, අප අපනයනය කරලා යම්කිසි ඩොලර් ප්‍රමාණයක් සොයා ගන්නවා, ඒ සොයා ගන්නා ඩොලර් ප්‍රමාණයෙන් යම්කිසි ණය ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවා. එහෙම නේ අපට ඩොලර් හම්බ වෙන්නේ. ඊට අමතරව පිට රට වැඩ කරන අය -දුක් විඳලා, මැරුම් කාලා, ගුටි කාලා මැද පෙරදිග ඉඳලා සල්ලි හම්බ කරන අය- සල්ලි එවනවා. අපි ඒවාත් පාවිච්චි කරනවා මේ ණය ගෙවන්න. දැන් බලන්න, රජයේ ආදායමට සාපේක්ෂව මුළු ණය සේවාකරණ ගෙවීම් කීයද කියලා. 2007 දී සියයට 88.6යි. මේ ණය සේවාකරණය කරන්න රජයේ ආදායමට සාපේක්ෂව සියයට 88.6ක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. 2008 දී ඒක වැඩි වෙලා තිබෙනවා සියයට 90.5 දක්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2010 වෙන කොට රජයේ ආදායමට සාපේක්ෂව මුළු ණය සේවාකරණය සියයට සියය ඉක්මවලා ගිහින් තිබෙන බව මහ බැංකුවේ 2010 වාර්ෂික වාර්තාවේ 163වෙනි පිටුවේ තිබෙනවා. බලන්න, මෙතැන දැඩි ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ගීතාංජන ගුණවර්ධන ඇමතිතුමා රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයකට උත්තර දෙමින් කිව්වා පරිප්පුවලට ගහන බද්ද ගැන. එතුමා කිව්වා සැමන් ටින් එකට රුපියල් 85ක් බදු ගහනවා කියලා. ඊට පස්සේ කිව්වා කඩලවලට, මුං ඇටවලට, කිරි පිටිවලට ගහන බදු ගැන. මේ සියලුම බදු එකතු කළත් මේ ණය ගෙවන්න ඒ සියලු බදු මදි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අවුරුද්දෙන් ගෙවන්නේ නැහැ නේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අවුරුද්දෙන් ගෙවන්නේ නැති බව දන්නවා. මම කියන්නේ අවුරුද්දකට ගෙවන්න තිබෙන ප්‍රමාණය. අවුරුද්දකට ගෙවන්න තිබෙන ප්‍රමාණයයි ගරු මන්ත්‍රීතුමනි මා කියන්නේ. එතැන අතිශය භයංකාර ප්‍රශ්නයක් තිබෙනවා කියලා මා කියන්න ඕනෑ නැහැ. කාටත් ඒක තේරෙනවා. මා අහන්නේ මෙන්න මේකයි. කාගෙන් ගත්ත ණයද මේ කලින් ගෙවලා ඉවර කරලා දමන්න හදන්නේ? අද ඉදිරිපත් කරලා තිබෙනවා නේ රෙගුලාසියක්, බිලියන 18ක් ගෙවන්න ඕනෑ කියලා. ඒ කාගෙන් ගත්ත ණයද? විදේශිකයන්ගෙන් ගත්ත ණයද? අර්ථසාධක අරමුදල සහිත දේශීය ආයෝජකයන්ගෙන් ගත්ත ණයද? කාගේද? මෙතැනදී මම කියනවා මේවා විදේශිකයන්ගෙන් ගත්ත ණය නොවෙයි කියලා. විදේශිකයන්ගෙන් ගත්ත ණය කලින් ගෙවලා ඉවරයක් කරලා දමන්න කිසිම ඕනෑකමක් නැහැ.

අද කීයද ඇමෙරිකන් ඩොලර්වලින් ණය ගන්න කොට පොලිය? සියයට 8.25ක පොලියට ගත්ත ණයවල පොලිය අද කීයද? සියයට 7ද? සියයට 6ද? සියයට 5ද? සියයට 4ද? සියයට 3ද? සියයට 2ද? ඊටත් වඩා අඩුද? දැන් සියයට බිංදුවයි දශම ගණන්වල පොලියකට ඇමෙරිකන් ඩොලර්වලින් ණය ගන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම ගන්න පුළුවන් නම් ඇයි මේ දේශීය ආයෝජකයන්ගෙන් ගත්ත ණය විතරක් ගෙවා දමන්නේ? ඇයි මේ විදේශීය ආයෝජකයන්ගෙන් ගත්ත ණය ගෙවන්නේ නැත්තේ? ඇයි මේ පොලී මුදලාලිලාගෙන් ගත්ත ණය ගෙවා ඉවර කරන්නේ නැත්තේ කියලා අහන්න සිද්ධ වෙනවා. ඇයි HSBC එකේ ණය ගෙවන්නේ නැත්තේ? දැන් බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කිව්වා, "මේක කළ යුතු දෙයක්" කියලා. මම පිළිගත්තා. එහෙම නම් මම පෙරළා අහන්නේ, "ඇයි මේ දෙපිට කාට්ටු කථා? ඇයි මේ තොප්පි දෙකක් දෙදෙනෙකුට?" කියලා. දේශීය ආයෝජකයන්ගේ ණය කලින් ගෙවා ඉවර කරනවා නම්, ඇයි පොලී මුදලාලිලාගේ ණය ගෙවන්නේ නැත්තේ? සිංහලෙන් බටහිරට බනිනවා. කුමන්ත්‍රණකාරයෝ කියලා කියනවා. හැබැයි, ඉංග්‍රීසියෙන් ආවඩනවා. ඒ කට්ටියට full treatment දෙනවා. මට සමා වෙන්න. එහෙම කියන්න සිද්ධ වෙනවා. එහෙම දෙයක් තමයි මේ ආර්ථික කළමනාකරණයේ අපිට නම් පෙනෙන්නේ.

ඇමෙරිකන් ඩොලර් මිලියන 800ක ණයක් ගත්තා. ලංකාව එක වරකට ගත්ත ලොකුම ණය ප්‍රමාණය. කාගෙන්ද ගත්තේ? රුපියල්වලට හරවලා ටෙම්පල්ටන් කියන මූල්‍ය ආයතනයෙන් ගත්තේ. ඒ ගැන අපි දිගින් දිගටම කථා කළා. පොලී අනුපාතය වෙනස් කිරීමේ meeting එකක් මහ බැංකුවේ තිබුණා ඊට ටික දවසකට කලින්. නමුත් පොලී අනුපාතය අඩු කළේ නැහැ. අඩු කරන්නේ නැතුව, ටෙම්පල්ටන් ආයතනයෙන් ඩොලර් මිලියන 800ක ණයක් ගත්තාට පස්සේ සුමාන දෙකක් යන්න කලින් පොලී අනුපාතය අඩු කළා. කීයේ පොලී අනුපාතයටද මේ ණය ගත්තේ? සියයට 15 පොලී අනුපාතයටද ගත්තේ? සියයට 16ටද ගත්තේ? කීයටද ගත්තේ? ඇයි ඒවා ගෙවන්නේ නැත්තේ? [බාධා කිරීමක්] ඇයි ඒවා ගෙවන්නේ නැත්තේ? ඒවා ගෙවන්නේ නැත්තේ, ඒවා විදේශීය ණය මුදලාලිලාගෙන් ගත්තු නිසාද? ඇයි ඒවා ගෙවන්නේ නැත්තේ? මේක සාධාරණ ප්‍රශ්නයක්. සියයට 18 පොලියට ගත්තු ණය දැන් ගෙවන්න පුළුවන් නම්, ඇයි මේ සුද්දන්ගෙන් ගත්තු ණය ගෙවන්නේ නැත්තේ? මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. දෙබිඩි පිළිවෙතක් තිබෙනවා. අද එක පැත්තකින් කියනවා, "සුද්දන්ට කරනවා, ලංකාවේ මිනිසුන්ට කරන්නේ නැහැ" කියලා. "නැහැ, නැහැ එහෙම දෙයක් නැහැ" කියලා අනෙක් පැත්තෙන් කියනවා. [බාධා කිරීම්]

අද ජී.එල්. පීරිස් ඇමතිතුමා කථා කළා කෝච්චි පාරක් ගැන. [බාධා කිරීමක්] ඔව්. මම කෝච්චි පාරක් උදාහරණයකට අරගෙන කියන්නම් මේ ආර්ථික කළමනාකරණයේ දෙබිඩි පිළිවෙත මොකක්ද කියලා. [බාධා කිරීම්] ඕමන්තයේ රේල් පාර හැදුවා. නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පත්තරේ දැක්ක විධියට ඕමන්ත රේල් පාරේ කිලෝමීටර් 10ක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් හදලා තිබෙනවා බොහොම ලස්සනට. කීයක් වියදම් වුණාද? කිලෝමීටරයකට වියදම් වෙලා තිබෙනවා රුපියල් මිලියන 45ක්. රුපියල් මිලියන 45යි වියදම් වෙලා තිබෙන්නේ. කිලෝමීටර් 10යි දුන්නේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට. ඉතුරු ඒවා කාටද දෙන්නේ? ඉතුරු ඒවා දෙන්නේ විදේශ කොම්පැනියකට. ඒ විදේශ කොම්පැනියට දෙන්නේ කිලෝමීටරය රුපියල් මිලියන 220ට වැඩියෙන්. රුපියල් මිලියන 45ට ලංකාවේ අයට හදන්න පුළුවන් නම්,- [බාධා කිරීමක්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කාටද දෙන්නේ?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මේක Indian කොම්පැනියක්. මේ විදේශ කොම්පැනියට දෙනවා කිලෝමීටරයක් රුපියල් මිලියන 220ට එහා මුදලකට. අපි මෙතැන රත්තරන් පාරවල් ගැන කථා කළා. ටික කාලයකට කලින් අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහලා ඒ පිළිබඳව උත්තර දුන්නා. දැන් අපට ආරංචි වෙලා තිබෙන හැටියට, - [බාධා කිරීම්]

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! There is a point of Order being raised.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

මොකක්ද කොම්පැනි එකේ නම?

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ගරු සභාව නොමඟ යවනවා; රටත් නොමඟ යවන්න උත්සාහ කරනවා. එතුමා දුම්රිය මාර්ග ගැන මේ ගරු සභාවේ කිව්වේ පට්ටපල් අසත්‍යයක් නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මෙතුමා-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

That is not a point of Order.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

එතුමාගේ වෙලාවේදී එතුමාට කියන්න දෙන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Member, you may continue.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Point of Order එකක් මෙතැන නැහැ. [බාධා කිරීම්] මම අහනවා, මේ Indian කොම්පැනියට කීය ගණනේද දෙන්නේ කියලා? කිලෝමීටරය මිලියන 220 ගණනේ කාටද දෙන්නේ? [බාධා කිරීම්] ඊ ළඟට මාතර-බෙලිඅත්ත දුම්රිය පාර කාටද දෙන්නේ? මාතර-බෙලිඅත්ත දුම්රිය මාර්ගය හදන්න ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට ඉඩ දෙනවාද, නැද්ද? ඒක කාටද දෙන්නේ? ඒක දෙන්නේ ඉන්දියාවටද, චීනයටද, ඇමෙරිකාවටද, රුසියාවටද කියලා අපි අහනවා. [බාධා කිරීම්] ඔය ක්‍රමවේදය නිසා තමයි අපට හම්බ වෙලා- [බාධා කිරීමක්] ඔන්න! කෑ ගැහිල්ල. පේනවා නේ. [බාධා කිරීමක්] මිනිසුන්ට ඡන්ද කාලයේදී මොකක්ද කිව්වේ? [බාධා කිරීමක්] දේශීය ආර්ථිකයක් ගොඩනඟනවා කියලායි කිව්වේ. [බාධා කිරීමක්] ඡන්ද කාලයේ කිව්වේ දේශීය ආර්ථිකයක් ගොඩනඟනවා කියලායි. දේශීය ආර්ථිකයක් ගොඩනඟන්න අවස්ථාවක් තිබෙද්දී ගොඩනඟන්නේ මොකක්ද? චීන ආර්ථිකයද, ඉන්දියන් ආර්ථිකයද, රුසියන් ආර්ථිකයද, ලිබියා ආර්ථිකයද, ඉරාන ආර්ථිකයද? මොන ආර්ථිකයද ගොඩනඟන්න හදන්නේ? [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

ඉඩ දෙන්න එපා, ඉඩ දෙන්න එපා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ඉඩ දෙන්නේ නැහැ, ඉඩ දෙන්නේ නැහැ. සාධකත් එක්ක තමයි මම මේ ඉදිරිපත් කරන්නේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා ( ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )

Sir, I rise to a point of Order.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මම උදාහරණයක් හැටියට කිව්වේ ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන ජනතාවටත්, ශ්‍රී ලංකාවේ සේවකයන්ටත් ආණ්ඩුව සලකන විධියත්, විදේශීය රාජ්‍යවලින් එන විදේශීය කොම්පැනිවලට ආණ්ඩුව සලකන විධියත් ගැනයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! There is a point of Order being raised by the Hon. Mahindananda Aluthgamage. What is your point of Order?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මගේ මිත්‍ර හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා විදේශීය ණය පොලී ගැන කථා කළා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න. මට කියන්න ඉඩ දෙන්න කෝ. මම point එකට තමයි එන්න යන්නේ. Point එකට එන්න කලින් point එකේ මුල කියන්න එපා යැ. [බාධා කිරීම්] Point එකේ මුල කියල නේ අගට එන්නේ. [බාධා කිරීම්] Point එකේ මුල කියන්න ඉඩ දෙන්න. අගට ආවේ නැහැ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න කෝ. අපි දෙන්න යාළුවෝ. ඒක ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීම්] මන්ත්‍රීතුමා, මගේ මිත්‍රයා, ඔච්චර ආවේගශීලී වන්න එපා. මේක මැතිවරණ වේදිකාවක් නොවෙයි. තමුන්නාන්සේ කියපු සේරම අසත්‍යයි මගේ මිත්‍ර මන්ත්‍රීතුමා. තමුන්නාන්සේ මේ සභාව නොමඟ යවන්න එපා. සමහර දේවල්වලදී මේ සභාව නොමඟ යවනවා. ඒ නිසා කරුණාකර සභාව නොමඟ යවන්න එපා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. (Dr.) Harsha De Silva, you may continue.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

බොහොම ස්තුතියි. මා මිත්‍ර මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ඒ කියපු දේ මම කිසිසේත්ම භාර ගන්නේ නැහැ. නමුත් මම කියා ගෙන යන්නම් පටන් ගත්තු දේ. ඔය ක්‍රමවේදය නිසා තමයි ලංකාවට ලැබිලා තිබෙන මේ ස්වර්ණමය අවස්ථාවෙන් ප්‍රයෝජනයක් ගන්න බැරි වෙලා තිබෙන්නේ. That is the problem. His Excellency the President had said that he wants to win the economic war. To win the economic war, we have to build the local economy. To build the local economy, we have to get the participation of the local economic actors - local industries, small and medium industries and local companies. But, in this case, they are only giving the opportunity to the foreigners, not to the locals. In that case, we are not going to win the economic war. Unfortunately, these people do not seem to understand that.

දැන් බලන්න, රටක් සංවර්ධනය කරන්න අවශ්‍යම ප්‍රධාන දෙයක් තමයි ආයෝජන. අපි සෘජු විදේශ ආයෝජන ගැන කාලයක් තිස්සේ කථා කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, අපි දන්නවා සියයට දහයක ආර්ථික වේගයක් පවත්වා ගෙන යන්න නම් දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 40කට එහා ආයෝජනයක් කරන්න අවශ්‍ය වෙනවාය කියා. නමුත් ඒක කරන්න බැහැ. මැද පෙරදිග සේවය කරන අයගෙන් එන සල්ලි ටිකත් එකතු කළාට පස්සේ ලංකාවේ ඉතිරි කිරීම් දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 23ක්, 24ක් වාගේ ප්‍රමාණයකුයි තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතකොට සියයට 17ක විතර අඩුවක් තිබෙනවා. මේ අඩුව පුරවන්න ගොඩක් රටවල් පාවිච්චි කරන ක්‍රමවේදයක් තමයි විදේශ සෘජු ආයෝජන ලබා ගන්න එක. ආසියානු කලාපයේ දියුණු වෙමින් පවතින වියට්නාමය වාගේ රටවල් ගත්තොත් ඇමෙරිකානු ඩොලර් මිලියන 10ක්, 11ක් පමණ වර්ෂයකට විදේශීය ආයෝජන අර ගෙන එනවා. දැන් ලංකාවේ මොකද වෙලා තිබෙන්නේ? ලංකාවේ වෙලා තිබෙන්නේ, 2008 වර්ෂයේ යම් කිසි විදේශ ආයෝජන ප්‍රමාණයක් තිබුණද 2009 වර්ෂයේදී ඊට වඩා අඩු වෙලා තිබීමයි. හරි. අපට ඒක පිළිගන්න පුළුවන්. මොකද, යුද්ධයත් එක්ක තිබ්බ කලබැගෑනිය නිසා. නමුත් යුද්ධය ඉවර වෙලා, අවම වශයෙන් 2010 වර්ෂයේදී ඊට පෙර වර්ෂයේ ප්‍රමාණයවත් තිබිලා නැහැ. ඊටත් වඩා අඩු වෙලා. මම දන්නේ නැහැ කවුරු මේවා කියනවද කියලා. ඒ පුද්ගලයාට මේක බලපානවා. කෙසේ හෝ ඇමෙරිකානු ඩොලර් මිලියන 550කට වඩා විදේශ සෘජු ආයෝජන ලංකාවට ගලා ගෙන ඇවිල්ලා නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Member, you have one more minute.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මම ඉවර කරන්නම්. I will triangulate this. මේකට හේතුව මම කියන්නම්. දේශීය සහ විදේශීය ආයෝජකයන්ට -ඒ කියන්නේ ණයකාරයන්ට නොවෙයි.- තිබෙන ඉඩප්‍රස්තාව අඩු වෙමින් පවතිනවා. ඒ අඩු වෙන ඉඩප්‍රස්තාව මකා ගන්න ආණ්ඩුව විදේශීය ණය ගන්නවා. ණය ගන්න එක වරදක් කියලා නොවෙයි මම කියන්නේ. ආර්ථික සංවර්ධනය ළඟා කර ගන්න අද ලෝකයේ ණය ගන්නවාට වඩා හොඳ උපක්‍රම පේන්න තිබෙනවා. සාධාරණ පොලීවලට ණය ගන්නවා නම් ණය ගත්තට ප්‍රශ්නයක් නැහැ. අපට පෙනෙන්න තිබෙන දෙබිඩි පිළිවෙත මොකක්ද? ලංකාවේ ආයෝජකයන්ගෙන් ගත්ත EPF එකෙන් සියයට 18කට ගත්ත ණය ටික ගෙවලා දානවා. ඒ කල් පිරෙන්න කලිනුයි. නමුත් විදේශීය පොලී මුදලාලිගෙන් ගත්ත ණය එකක්වත් ගෙවලා දාන්න මේ කට්ටිය සූදානම් නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

I will wind up. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කථාව අවසන් කරන්නයි හදන්නේ. මේ ක්‍රමවේදය මෙතැනින් වෙනස් වුණේ නැත්නම් මේ ආර්ථික යුද්ධයේ ජය ගැනීම මිරිඟුවක් බවට පත් වනවා. ආර්ථික යුද්ධය ජය ගන්න අවශ්‍ය නම්, අප කරන්න තිබෙන්නේ මේ දේශීය ආර්ථිකය තව දුරටත් ගොඩනගන්නට ක්‍රියා කරන එකයි. ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවට මොළය පහළ වේවා යි කියා මා ප්‍රාර්ථනය කරමින් මෙතැනින් නවතිනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3.29 ]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේ දී පට්ටපල් බොරු කියනවා ඇහුණා. ඒවා පට්ටපල් බොරු. කෙස් පැලෙන තර්ක ඉදිරිපත් කරලා, ගල් පැලෙන බොරු කිව්වා. එච්එස්බීසී ආයතනයෙන් මේ රජය 2007 අවුරුද්දේ ණය මුදලක් අරගෙන නැහැ. ගත්තා කියනවා නම් නම් ඒ බව ඔප්පු කරන්න කියලා මා එතුමාට කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රට නොමඟ යවන්නට ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, එච්එස්බීසී ආයතනයෙන් ණය මුදලක් අරගෙන තිබෙනවාය කියලා. එහෙම ණය මුදලක් අරගෙන නැහැ. ඉතින් අපි එක දෙයක් කියන්නට ඕනෑ. එදා 2007 වසරේදී අතිගරු ජනාධිපතිතුමාට මේ රටේ ත්‍රස්තවාදයට මුහුණ දීම සඳහා යුද්ධ කරන්න සිදු වුණා. මොකද, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ නායකතුමා, රනිල් වික්‍රමසිංහ මහත්මයා නෝර්වේ රටත් එක්ක එකතු වෙලා ප්‍රභාකරන්ට ලියා දීපු ඔප්පුව නිසා. ගිවිසුම දකින්නේත් නැතිව, ප්‍රභාකරන් එන්නෙත් නැතිව, මේ රට පාවා දෙමින් අත්සන් කරලා දීපු එම ගිවිසුමෙන් මේ රටේ ද්‍රවිඩ ජනතාව ඇතුළු සියලුම ජනතාව නිදහස් කර ගන්නට අතිගරු ජනාධිපතිතුමාට යුද්ධ කරන්නට සිදු වුණා. එදා එහෙම කරපු මෙතුමන්ලා එච්එස්බීසී බැංකුව ඉදිරියට ගිහිල්ලා ණය දෙන්න එපා කියලා ලෝකයට කිව්වා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. "ණය දෙන්න එපා, අපේ ආණ්ඩුව ආවොත් ණය ගෙවන්නේ නැහැ" කියලා මෙතුමන්ලා එදා කිව්වා. අද අපි කියනවා, එහෙම ආණ්ඩුවක් පත් කර ගන්න එක ගැන එදා ජනතාව තේරුම් ගත් නිසා තමයි පසුගිය කාලයේ එතුමන්ලාට අඩු තරමේ ප්‍රාදේශීය සභා ඡන්දයක්වත් දිනා ගන්න බැරි වුණේ කියලා.

අපේ ජනාධිපතිතුමා ණය ලබා ගත්තා. ඒ ණය අරගෙන තමුනාන්සේලා කළා වාගේ නොවෙයි කටයුතු කළේ. තමුන්නාන්සේලා ප්‍රීමා ණය ගිවිසුම් ඇති කර ගෙන තිබෙනවා.

මොනවාටද? කන්න විතරයි. පිටි විතරයි. ඒ ගිවිසුමෙන් වෙන ලැබෙන දෙයක් නැහැ. ඉතිරි වුණු දෙයක් නැහැ. චීනයෙන් ණය ගත්තා තමයි, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි. අද ගිහිල්ලා බලන්න, දකුණේ වරායක් තිබෙනවා. තමුන්නාන්සේලා ගල් තිබෙනවා කියලා කිව්වා. ගල් නැහැ. අපේ අතිගරු ජනාධිපතිතුමා අද දකුණට වරායක් ඉදි කරලා තිබෙනවා. ඒ ගැන තමුන්නාන්සේලාට සන්තෝෂ වන්න බැරි ඇයි? ජේ.ආර්.ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා ප්‍රීමා ගිවිසුම ඇති කරලා, ත්‍රිකුණාමලයේ අපට ඉතිරි වුණේ මොකක්ද? අපට වරායක් ඉතිරි වුණාද? නැහැ. අපි නිකම් පිටි කෑවා විතරයි. පිටි රොඩු ටික අපට දුන්නා. ගිවිසුම ඒ මිනිස්සු අරගෙන ගියා. නමුත් මහින්ද චින්තනය අනුව එහෙම නොවෙයි. චීනයෙන් ණය ලබා ගෙන අද එහි වරායක් ඇති කරලා තිබෙනවා. අද අපිට දකුණේ වරායක් තිබෙනවා. තමුන්නාන්සේලා ජනතාව නොමඟ යවන්නට කිව්වා, ගල් තියෙනවා, අරවා මේවා කියලා. නමුත් නැවක් ආවා. ඉතින් මෙහෙමයි. ගමේ සිල්ලර කඩයක් දැම්මාම වුණත් මිනිස්සු එන්න ටිකක් කල් යනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අල්ලපු කඩේ දිහා බලනවා, ඒ මුදලාලි තරහා වෙයිද කියලා බලනවා. ඉතින් ඒ විධියට තමයි. වරායක් හදපු ගමන් හෝ ගාලා කඩා ගෙන මේ බස් හෝල්ට් එකකට බස් එනවා වාගේ නැව් එන්නේ නැහැ. මේ ප්‍රාග්ධන සම්පත ඇති කර ගෙන, ඒක ගෙවන්න ක්‍රම වේදයක් හැටියට තමයි ණය අරගෙන තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, අපි ගුවන් තොටු පොළකුත් ඉදි කරනවා. තමුන්නාන්සේලා මේ ප්‍රාග්ධන සම්පත් රටට ගෙනාවේ නැහැ. තමුන්නාන්සේලා කෙස් පැලෙන තර්ක ඉදිරිපත් කරමින් කෑගැහුවා විතරයි. එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට චීනයෙන් ආධාර විධියට ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ලැබුණා. ඒවා හොඳ නැද්ද? මේවා හොඳ දේවල්. ඒ නිසා ණය ගන්න ඕනෑ. ණය ගන්නේ නැතිව රටක් කරන්න බැහැ. මොකක්ද හේතුව? මේ රටේ මොකක්ද වෙනත් ආදායම් මාර්ගය? පෙන්ෂන් ටිකයි, රජයේ සේවක වැටුප් ටිකයි ගෙවපුවාම අපේ අය වැයෙන් ලැබෙන මුදල් ටික මදි. ඒ නිසා අනිවාර්යෙන්ම ණය ගන්නට සිදු වනවා. ණය අරගෙන, මේ රටේ ආර්ථිකයට දායක වන දෙයක් අපේ රටේ ඇති කරලා තිබෙනවා. ඒක ජනතාව දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යන්න කිව්වා ජනතාවට, ඒ හදන වරාය බලන්න. ජනතාව ගිහිල්ලා බැලුවා. පොදි කකා ගිහිල්ලා ඒක බැලුවා. ඇස් දෙකෙන් බැලුවා. බලලා ඇවිත් තමයි ඡන්දය දුන්නේ. මගේ අරණායක ආසනයේ ඡන්ද ප්‍රතිශතය සියයට 68.8යි. හොර ඡන්ද දැම්මා කියලා, ඒ වාගේ මොනවත් කියන්න බැහැ. මැතිවරණ පොතේ, පොලිස් පොතේ කිසිම පැමිණිල්ලක් නැහැ. එවැනි සාමකාමී මැතිවරණයක් තිබුණේ. නමුත් මෙතුමන්ලාට ඕනෑ වෙලා තිබුණේ ජනතාවට බොරු කියලා මේ රට වෙනත් පැත්තකට යවන්නයි. ජනතා විමුක්ති පෙරමුණට අපි කියනවා, එදා එතුමන්ලා මේ රටේ ජනතාව නොමඟ යවපු බව. මේ අය මිනියක් කර තියා ගෙන උස්සා ගෙන යන්නේ මොකද? විශ්‍රාම වැටුප මේ රටේ ජනතාවට ලැබෙන හොඳ දෙයක්. ජනාධිපතිතුමා ඒක හොරෙන් ගෙනෙන්න ගියේ නැහැ. එතුමාට ඕනෑකමක් තිබුණා. එතුමා පාර්ලිමේන්තුවට පසුගිය අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් මොකක්ද කිව්වේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටට වැඩිම සම්පතක් ගෙන දෙන ජනතාව තමයි විදේශ විනිමය ගෙන එන විදේශ රැකියා කරන කට්ටිය. අපේ අතිගරු ජනාධිපතිතුමාට අරමුණක් තිබෙනවා, මේ රට ආරක්ෂා කරන්න, තමන්ගේ පවුල් දමලා ගිහිල්ලා පිට රට ඉන්න මිනිසුන්ගේ අනාගතය ආරක්ෂා කරන්න ඕනෑ කියලා. එතුමා හොර ගිවිසුම් ගැහුවේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2011 අය වැය ලේඛනයේ මෙසේ සඳහන් කර තිබෙනවා:

"මිලියන තුනක පමණ ලාංකිකයන් විදේශ රැකියාවල නියුක්තව සිටිනවා. ඔවුන්ගෙන් ලැබෙන ප්‍රේෂණ මේ වසරේ දී ඇමරිකානු ඩොලර් බිලියන 4ක් පමණ වෙතැයි බලාපොරොත්තු වෙනවා. එහෙත්, ජීවිතවල සැඳෑ කාලයේ දී ඔවුන්ට අවශ්‍ය වන සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් තවමත් සකස් වී නැහැ."

ඒක සකස් කරන්නේ කොහොමද? එතුමා හොරෙන් ගෙනෙනවාය කිව්වේ නැහැ; නිකම් දෙනවාය කියලා කිව්වේ නැහැ. විදේශ රැකියාවේ නියුක්ත එක් කෙනා අවම වශයෙන් වසරකට රුපියල් 12,000ක් මෙම අරමුදලට බැර කරන්න ඕනෑය කියලා කිව්වා. එතකොට රජය පැත්තෙන් මොකක්ද කිව්වේ? මෙම විදේශ සේවයේ ඉපයීම් අගය කිරීමක් හැටියට, තමන්ගේ දරු පවුල් මේ රටේ දමා පිට රට ගිහින්, තමන්ගේ රටට මේ ප්‍රේෂණ මුදල එවන අයට දායකත්වයක් දෙන්න, ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කරන්න අපේ නායකතුමා, අපේ ජනාධිපතිතුමා මොකක්ද කියන්නේ? 2011 අය වැය කථාවේ 18වන පිටුවේ එතුමා මෙහෙම කියනවා:

"මෙම විදේශ සේවා නියුක්තිකයන්ගෙන් රටට ලැබුණු වටිනා දායකත්වය සහ විදේශ විනිමය ඉපයීම් අගය කිරීමක් හැටියට රුපියල් මිලියන 1,000 ක් මේ අරමුදලේ මූලික ප්‍රාග්ධනය වශයෙන් 2011 දී ලබා දීමට ද මම යෝජනා කරනවා."

ඇයි මෙහෙම යෝජනා කරන්නේ? මේ යෝජනාව හොඳ නැද්ද? ජේවීපී එක ගිහිල්ලා මේකට පිකටින් කරන්නේ ඇයි? [බාධා කිරීමක්] මිනිසුන් මරා ගන්නේ ඇයි? පෙන්ෂන් එකටත් ගහපු ආණ්ඩුවක් තමයි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව. තමුන්නාන්සේලාට එක දෙයක් කියනවා. ඔය සියයට දෙක ගැන තමුන්නාන්සේට සැකයක් තිබෙනවා. තමුන්නාන්සේලාට සැකයක් තිබෙනවා.

1948 තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පත් වුණාට, දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ ආණ්ඩුවෙන් තමයි සේවක අර්ථසාධක අරමුදල් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා එය නීත්‍යානුකූල කළේ. ඒ කාලයේ තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවකට ඒක කරන්න තිබුණා නේ. අපට මේ රටේ ඉතිහාසයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ හොඳ පනත් ගෙනැවිත් තිබෙන්නේ, හොඳ වැඩක් කර තිබෙන්නේ, මේ රටට පවතින දෙයක් කරලා තිබෙන්නේ මේ ආණ්ඩුව තුළිනුයි.

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියන්නේ "මේක වැඩක් නැහැ, හොර ගිවිසුම් ගහලා තිබෙනවා"ය කියලායි. [බාධා කිරීමක්] ණය ගන්න ඕනෑ. රුපියල් 100ක් ණය ගත්තා නම් ඒකෙන් රුපියල් 1,00,000ක් උපයනවා. ඒ ගත්ත ණයවලින් වැඩ කරලා තිබෙනවා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉහළ කොත්මලේ විදුලි ව්‍යාපෘතිය ගැන බලන්න. කරු ජයසූරිය මන්ත්‍රීතුමා එදා විදුලිබල සහ බලශක්ති ඇමතිතුමා වශයෙන් සිටියා. නමුත් කරන්න පුළුවන් වුණාද? එතුමාට කරන්න බැරි වුණා. නමුත් අපේ ජනාධිපතිතුමා ඉහළ කොත්මලේ විදුලි ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙනවා. දැන් හෙට, අනිද්දාට අපි ඒක විවෘත කරනවා. එතකොට මොකක්ද වන්නේ? මේ රටට විදුලිය උත්පාදන වනවා. පසු ගිය කාලයේ ජනාධිපතිතුමා කිව්වා, රජය කිව්වා, "ගිහින් ඒක බලන්න" කියලා. මේ මන්ත්‍රීතුමන්ලා නොගියාට මිනිස්සු පෝලිමේ ගියා, ඒක බලන්න. මිනිස්සු ඒක ඇස් දෙකෙන් දැක්කා. ණය ගන්නවා, මේ රට උකස් කරනවාය කියා මේ ගොල්ලෝ ඔළුවෙන් හිට ගෙන කිව්වත් ජනතාව විශ්වාස කරන්නේ නැහැ. ගත්ත ණයවලින් මේ රටේ ඉදි වෙලා තිබෙන්නේ මොකක්ද කියන එක ජනතාව දන්නවා. ජනතාව පෝලිම් ගැහිලා ගිහින් ඒක බලා තිබෙනවා. තමුන්නාන්සේලා ඔළුවෙන් හිට ගෙන කිව්වාට වැඩක් නැහැ. ඒකයි තමුන්නාන්සේලාට ඡන්දය දෙන්නේ නැත්තේ. ඒකයි ප්‍රාදේශීය සභා මැතිවරණ දිනන්න බැරි. ඒක පැහැදිලිව කියනවා. එතුමන්ලා ගොඩක් දේවල් කිව්වා. මැතිවරණ කල් දමනවාය කිව්වා. Test match එක තිබෙන්නේ වෙන කොහේවත් කියලා කිව්වා. පොල් ගෙඩිය රුපියල් 65යි කියලා කිව්වා. මිරිස් කරල රුපියල් 5යි

[ගරු ලලිත් දිසානායක මහතා]

කියලා කිව්වා. නමුත් ජනතාව ඇහුම් කන් දුන්නේ නැහැ. මොකද? මේ රටේ ජනතාව දන්නවා, මේ රජය වැඩ කරන රජයක් කියලා. අවුරුදු 33ක් තිස්සේ තිබුණු යුද්ධය නැති කරලා මේ රටට සාමය ගෙනාවේ ජනාධිපතිතුමා බව දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. බදු සම්බන්ධයෙන් ගත්තාම, එදා යුද්ධය තිබුණු වෙලාවේ මෝටර් කාර් සම්බන්ධයෙන් හා අනිකුත් වාහන සම්බන්ධයෙන් බදු වැඩි කළා. නමුත් පසුව රජය ආර්ථිකය සකස් වන විට බදු අඩු කළා. බද්දක් පනවා ඒකෙන් බලාපොරොත්තු වන්නේ රටේ සංවර්ධනයේ අවශ්‍යතාවන් ඉටු වන ආකාරයට මේ කටයුතු සිද්ධ කිරීමයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බදු අඩු කිරීම තුළ විශේෂයෙන්ම සිලින්ඩර ධාරිතාව 2,000ට වැඩි වාහනවල ආනයනය ගත්තාම අප්‍රේල් මාසය වන විට වාහන 3,992ක් ආනයනය කරලා තිබෙනවා. ඒවායේ සිලින්ඩර ධාරිතාව 2,000ට වැඩියි. ඉහළ එන්ජින් ධාරිතාවක් තිබෙන වාහන තමයි වැඩිපුර ගෙන්වා තිබෙන්නේ. සිලින්ඩර ධාරිතාව 2,000ට වැඩියි කියන්නේ අධිසුඛෝපභෝගී වාහන. ඒ සඳහා බදු ප්‍රමාණය සියයට 75 දක්වා වැඩි කරලා තිබෙනවා. සාමාන්‍ය මනුෂ්‍යයා ගෙන්වන වාහනයටත් බදු වැඩි කරලාය කියන පින්තූරය තමයි එක්සත් ජාතික පක්ෂය පෙන්වන්න හදන්නේ. මා පැහැදිලිව කියනවා, එහෙම දෙයක් නොවෙයි; රජය බදු අඩු කිරීම නිසා සිලින්ඩර ධාරිතාව 2,000ට වැඩි වාහන 3,992ක් ගෙන්වා තිබෙන කොට, එයින් නිසි ප්‍රයෝජන නොගැනීම නිසා තමයි ඒ බදු මුදල වැඩි කරන්න කටයුතු කරලා තිබෙන්නේ කියලා. මේ රජය කටයුතු කරන්නේ මේ රටේ ජනතාවගේ අවශ්‍යතාව අනුවයි. අසත්‍ය ප්‍රකාශ කරලා මේ රටේ ජනතාව කිසිම ආකාරයකට වෙනත් පැත්තකට යොමු කරන්න බැහැයි කියලා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමනි, එදා මේ රටේ මිනිසුන් නොමැරූ ආකාරයටයි අද බොහෝ අය කථා කරන්නේ. අපි දැක්කා ජනතා විමුක්ති පෙරමුණ පසු ගිය කාලයේ පෝස්ටර් ගහගෙන, පින්තූරයක් ගහගෙන මැරිච්ච අය ගැන කථා කරනවා. මම කියන්න කැමැතියි හෙට අනිද්දාට අපේ ගරු වයි.ජී. පද්මසිරි මන්ත්‍රීතුමාගේ සහෝදරයාගේ උපන් දිනය එන බව. එතුමා සබරගමුව පළාත් සභාවේ හිටපු මන්ත්‍රීතුමා. එතුමා ඝාතනය කළා. එතකොට නෝනාට බබා හම්බ වෙන්නයි හිටියේ. හෙට අනිද්දා දිනෙක එතුමාගේ උපන් දිනය එනවා. අපි සමරනවා ඒක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සබරගමුව පළාත් සභාවේ හිටපු මන්ත්‍රී ලෙස්ලි යටන්වල මහත්මයාගේ ජීවිතය උදුරා ගත්තේ ජනතා විමුක්ති පෙරමුණ. නෝනා දණ ගහලා කිව්වා මරන්න එපා කියලා. නමුත් එතුමාව ඝාතනය කළා. එතුමාගේ ළමයාට දැන් අවුරුදු 18කට වැඩියි. ඒ වාගේ ජීවිත කීයක් බිලි ගත්තාද? මිනිස්සුන්ගේ ජීවිත නොමඟට යොමු කරලා, නොතේරෙන සමහර කම්කරු කොටස් වෙනත් පැත්තකට යොමු කරලා ජීවිත බිලි දෙන අරගල තමයි ඒ ගොල්ලන් ඉතිහාසයේ කරලා තිබෙන්නේ. අපේ ආණ්ඩුව තුළ මිනී මරලා නැහැ. එහෙම සිද්ධි වෙලා නැහැ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා ජනතා විමුක්ති පෙරමුණට පුළුවන් නම් උත්තර දෙන්නය කියලා. තමන් එක පෝස්ටරයක් ගහන කොට අනෙක් පැත්ත හැරිලා බලන්න එදා තමන්ගේ දර්ශනය මොකක්ද කියලා. පළාත් සභාවෙන් ඡන්දය ඉල්ලුවා කියලායි එදා ලෙස්ලි යටන්වල මහත්මයාව මැරුවේ. නෝනාට බබා හම්බ වෙන්නයි හිටියේ. නෝනා ඇවිල්ලා කිව්වා "මරන්න එපා" කියලා. දොර ඇරලා එළියට ඇදලා අරගෙනයි මැරුවේ. මොකක්ද හේතුව? මේ රටේ පළාත් සභාවට ඡන්දය ඉල්ලපු නිසායි. හැබැයි අද වෙළෙඳ කලාපයේ පෝස්ටර් ගහන්න යනවා වෘත්තීය අරගලය තුළ පුද්ගලයකු මැරුවා කියලා. අද පොලිස්පති ඉල්ලා අස් වෙලා තිබෙනවා. එදා එහෙම නොවෙයි. යූඑන්පී ආණ්ඩු කාලයේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුව දෙනවා පොලිස් පරීක්ෂකතුමා වැරදි කරලා තිබෙනවා කියලා. පසුවදාට ජේ.ආර්. ජයවර්ධන මහත්මයා promotion එක දෙනවා. එහෙම කරපු එක්සත් ජාතික පක්ෂය අද මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවට විරුද්ධව මේ විධියට කටයුතු කරනවා. පොලිස්පති ඉල්ලා අස් වෙලා තිබෙනවා. නමුත් ඒ අය මේ විධියට කටයුතු කරන්න යනවා. මේක ජනතාව තේරුම් ගන්නවා. මේ අය කොච්චර කෑ ගැහුවත් මේ අය පිටුපස ඉන්න බිල්ලා කවුද කියලා ජනතාව දන්නවා. මේ අයගේ හිත ඇතුළේ තිබෙන්නේ මොකක්ද කියලා දන්නවා. බොක්කේ දඩ මස් කියලා දන්නවා. ජනතාව දන්නවා ඒ ගොල්ලන් මේ රටේ එදා කොයි ආකාරයෙන් ද වැඩ කරලා තිබෙන්නේ කියලා. එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පිට රට ගියා තමයි. ඒ ගියේ මේ රටේ හැටදහසක් තරුණයෝ මරණ කොටයි. මේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලා වාගේ සුද්දොත් එක්ක එංගලන්තයට ගිහිල්ලා අපේ රට බේරා ගත්ත නායකයන්ට විරුද්ධව පිකටින් කරන්න නොවෙයි එදා ජනාධිපතිතුමා ගියේ. මේ රටේ තරුණයෝ හැටදහසක් ඝාතනය වන කොට ඒක කියන්න තමයි ගියේ. අපි ඒක නැහැ කියලා කියන්නේ නැහැ. ඒක වෙනස් දෙයක්. ප්‍රභාකරන් ඇතුළු ත්‍රස්තවාදය තුළ උතුරේ මිනිසුන් ටික ප්‍රාණ ඇපකරුවන් හැටියට තියා ගෙන හිටපු ලොකු ත්‍රස්තවාදයකුයි මේ රටේ තිබුණේ. දැන් ඒ ත්‍රස්තවාදය නවත්වලා, නැති කරලා දාලා මේ රටේ නිදහසක් ඇති වෙලා තිබෙනවා. 2007 HSBC එකෙන් ණය ගත්තේ නැහැ. නමුත් ණය අරගෙන හරි මේ යුද්ධය හරියට කරලා, ඒවා තමන්ගේ සුඛ විහරණයට යොදා ගන්නේ නැතිව මේ රටට නායකත්වයක් දීපු නිසා තමයි අපට අද නිදහසේ ඉන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හැම දේටම වඩා ප්‍රථමයෙන් වටින දේ වන්නේ ජීවිතය සහ ජීවත් වීමේ නිදහසයි. ඒ ජීවත් වීමේ නිදහස ඇති කරපු රජයක් තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය කියන්නේ. එහෙම නම් ඒක වෙනස් කරන්න, ඒක වෙන පැත්තකට හරවන්න, වෙනත් පැත්තකට යවන්න තමන්ගේ අතේ ලේ ගෑවුණු පක්ෂයකට, මැයි පෙළපාළියකදී සෝමපාල සහෝදරයා වාගේ අය ඝාතනය කරපු පක්ෂයකට බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මොකද, ඒ සෙවණැලි තිබෙනවා. ඒ ගොල්ලන්ගේ අත්වල ඒ ලේ තිබෙනවා. ඒ නිසා ඒකට නැවත සුදු හුණු ගාන්න බැහැ. මේ රටේ නිදහස වෙනුවෙන්, මේ රටේ තරුණ ජීවිත ආරක්ෂා කිරීම වෙනුවෙන් අපි පා ගමන් ගිහිල්ලා එදා ප්‍රජාතන්ත්‍රවාදයට ශක්තියක් ලබා දුන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වයෙනුයි. එතුමා අතින් මේ රටට වැරදි දෙයක් සිදු වෙලා නැහැ. මේ විශ්‍රාම වැටුප් සම්බන්ධ පනත් කෙටුම්පත වුණත් මේ රටේ අහිංසක වැඩ කරන ජනතාව වෙනුවෙන් ගෙනාපු දෙයක්. එය සාකච්ඡා කරලා විසඳා ගන්න තිබියදී, එය වෙනත් පැත්තකට යොමු කරලා ඒ තුළින් තමන්ගේ පටු දේශපාලන අදහස් සාක්ෂාත් කර ගන්න තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය කටයුතු කළේ. නමුත් එහි ප්‍රතිඵලය මොකක්ද කියලා දැන් ජනතාව දන්නවා. ඒ නිසා මේවාට ඒ අයට වග කියන්න වෙච්චිය කියන එක අපි ඉතා පැහැදිලිව කියනවා. මේ බදු පනත් කෙටුම්පත් ගෙනැවිත් තිබෙන්නේ මේ රටේ ජනතාව වෙනුවෙන්ය කියන එකත් මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 3. 43]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම මෝටර් රථ ආනයන පාලනයට අදාළවත් ඒ වාගේම නිෂ්පාදන බදු සම්බන්ධයෙනුත්, මුදල් අමාත්‍යාංශයට අදාළවත් ඉදිරිපත් කරලා තිබෙන නියමයන් කිහිපයක් පිළිබඳව අදහස් දක්වන අවස්ථාවේදී අපට පෙනෙනවා තවමත් ආණ්ඩු පක්ෂයේ බොහෝ මන්ත්‍රීතුමන්ලා අපි පුංචි කාලයේ ඉගෙන ගත්ත "කඩන්න බැරි මිදි තිත්තයි" කියන කථාව කියමින් දුකට ගයන ගීත ගයමින් ඉන්න ආකාරය. මොකද, පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් පනත්

කෙටුම්පතට අදාළව ආණ්ඩුවේ පරාජය වහ ගන්න. නරියා මිදි කඩන්න ගිහිල්ලා උඩ පැනලා පැනලා, හති වැටිලා බැරි වුණාම මිදි තිත්තයි කියලා හැරිලා ගියා. හැබැයි ආණ්ඩුව එහෙම හැරිලා යන පාටක් පේන්නේ නැහැ. උඩ පැන පැන තවත් බලන්නේ කොහොම හරි මේක අපි කඩන්න හැදුවේ සාධාරණ ක්‍රමයකටයි කියලා තහවුරු කරන්නයි. නමුත් මේ මුළු රටේ ජනතාව දන්නවා, වෙන ඕනෑම ආකාරයකින් ආවත් මේ රටේ ජනතාවට සෙතක් කරනවා වෙනුවට අයහපතක් කරන්න ගෙනෙන ප්‍රෝඩාකාරී, වංචාකාරී අණපනත් මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයට වඩා මහජන බලය ඉදිරියේ පරාජය කරන්න පුළුවන්ය කියන එක. ඒ මහජන බලයේ ස්වභාවය, වැඩ කරන ජනතාවගේ ස්වභාවය, ජනබලයේ ස්වභාවය ආණ්ඩුව තේරුම් ගත්තොත් හොඳයි කියන එක අපි අවධාරණය කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද කථා කරන මාතෘකාව ගැන අදහස් දැක්වුවොත් විශේෂයෙන්ම පසු ගිය කාලය පුරා ආණ්ඩුව මේ මෝටර් රථ බදු සංශෝධනයන් කළේ දේශපාලන තීන්දු හැටියට බව කියන්නට ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ විවාද කරනවාට වඩා, කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කරනවාට වඩා බොහෝ වෙලාවට ඒක සිද්ධ වුණේ දේශපාලන තීන්දු හැටියටයි. අපට මතකයි අය වැය ඉදිරිපත් වන වෙලාවේදී, අය වැය ඉදිරිපත් කරන්නටත් කලින් පාර්ලිමේන්තුවේදී එක වර සියයට 400ක, සියයට 500ක ප්‍රතිශතයන් අනුව මෝටර් වාහන බදු අඩු වුණාය කියා මහ දැවැන්ත දේශපාලන ප්‍රචාරයක් ගෙන ගිය බව. හැබැයි ඒ වෙලාවේදීම රට ඇතුළේ සංවාදයකුත් තිබුණා, මේ ආණ්ඩුව දෙමුහුන් විද්‍යුත් - hybrid - electric වර්ගයේ මෝටර් රථ සඳහා එක වර බදු අඩු කරන්නේ කවුරු හරි වාහන තොගයක් ගෙනල්ලාද දන්නේ නැහැ කියලා. එවැනි යාළු මිත්‍රකම්වලටත් බදු අඩු වන කාලයක් මේක. ඉතින් ඒ වෙලාවේ ඒ ගැන ලොකු සංවාදයකුත් තිබුණා. අපට මතකයි, සමහර මාධ්‍ය වාර්තා කළා, දේශපාලන හිතවත්කම්, ඥාති මිත්‍රකම් අනුව වරායට වාහන ඇවිල්ලා ඒවා මුදා ගත්තාය කියා. ඒ කෙසේ වෙතත් ආණ්ඩුව එදා මේකෙන් දේශපාලන වාසිය ගන්න කිව්වේ, නැති බැරි අයට, පුංචි අයට අපි දැන් අවස්ථාව ලබා දී තිබෙනවාය; ඉතා අඩු මිලකට මේ වාහන ගන්න පුළුවන්ය කියායි. ඒක හොඳයි. නමුත් අද මොකද කියන්නේ? එදා නොදැකපු අර්බුදය දකින්න අද ආණ්ඩුවට සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි ආණ්ඩුව දැන් ඒක සාධාරණීකරණය කරන්න යන්නේ වෙන විදියකටයි.

අපි කවුරුත් දන්නවා hybrid - electric වර්ගයේ මෝටර් රථ පරිසර හිතකාමීයි කියන එක. ඒ වාගේම අඩු ඉන්ධන ප්‍රමාණයකින් ධාවනය කරන්නත් පුළුවන්. පරිසර හිතකාමී ක්‍රමයකට තමයි ඒවා හදා තිබෙන්නේ. ඉතින් ඒක ප්‍රවර්ධනය කරන්න ඕනෑ. ඒ වෙලාවේ දේශපාලන සටන් පාඨයක් හැටියට මේක ගෙනැල්ලා ගත්තු වාසිය වාගේම දැන් ආණ්ඩුව ගණන් හදලා බලනවා ඒකෙන් බදු ප්‍රමාණය වැඩි කර ගන්න. ඇත්ත කාරණය ඒකයි. හැබැයි එදා ඒක දැක්කේ නැහැ. එදා දැක්කේ වෙන දේශපාලන වාසියක්. අද මේකෙන් බදු ආදායම වැඩි කර ගන්න හදනවා. ඒ බදු ආදායම වැඩි කර ගැනීම වෙනුවෙන් දැන් විවිධ අර්ථ කථනයන්, විවිධ තර්කනයන් ගොඩ නඟමින් ඉන්නවා. මේකේ ධාරිතාවය දැක්වුවේ නැහැ කියනවා. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කතා කරමින් කිව්වා, ඒ වෙලාවේ සිලින්ඩර ධාරිතාවය ගැන කිසිදු අවධානයක් යොමු කළේ නැහැ කියා. ඒ කියන්නේ මේ මෝටර් වාහන ගෙන්වන වෙලාවේදී ඒකේ බදු අඩු කරද්දී, ඒ අදාළ ගැසට් නිවේදනයේ මොන ප්‍රමාණයේ මෝටර් රථවලටද, මොන සිලින්ඩර් ධාරිතාවය සහිත වාහනවලටද මේ බද්ද අඩු කරන්නේ කියා අවධාරණය කරලා සඳහන් කළේ නැහැ කියන එකයි. එහෙම සඳහන් නොකළේ අපිද? එහෙම සඳහන් නොකළේ විපක්ෂයද? ඒ වැරැද්ද කළේ ජනතා විමුක්ති පෙරමුණද? නැහැ. ආණ්ඩුව. ආණ්ඩුව තමයි ඒ වෙලාවේ ඒ වැරැද්ද කළේ. ඒ වෙලාවේ ඒ වැරැද්ද නොකර හිටියා නම් මේ අර්බුදය එන්නේ නැහැ. ඒ වෙලාවේ ඒ වැරැද්ද සිද්ධ වෙච්ච එක ගැන කවුරුවත් කියන්නේ නැහැ නේ. මම කියන්නේ මේකයි. දේශපාලන වාසි ගන්න, දේශපාලන සටන් පාඨ හැටියට, පත්තරේ සිරස්තලය දමා ගන්න, ඒ මොහොතේ පැවැත්මට ලොකු ප්‍රවෘත්තියක් හදා ගන්න ඔබතුමන්ලා ගන්නා තීන්දු තීරණවලින් වාහන තදබදය ඇති වෙනවා, රටේ අර්බුද ඇති වෙනවා. මොකද, වාහන වැඩි වන තරමට රටේ මාර්ග පද්ධතිය පළල් වන්නේ නැහැ. ඊළඟට රිය අනතුරු වැඩි වෙනවා. රිය අනතුරු වෙනුවෙන් වෙනම කමිටු දමන්න වෙනවා. ඒක ව්‍යසනයක් බවට පත් වෙනවා. ලොකු අර්බුදයක්. මොකද, අද අපට ඇත්තටම පෙනෙන දෙයක් තිබෙනවා. මිනිස්සුන්ට වාහන අවශ්‍යයි තමයි. හැබැයි වාහන අවශ්‍යතාවට ගැළපෙන ආකාරයට මාර්ග පද්ධතිය පළල් වන්නේ නැහැ. ඒ නිසා වාහනයක් අරගෙන පාරට යන මනුෂ්‍යයා යන්නේ ඔළුවේ කැක්කුමක් අරගෙනයි. මොකද, උදේ පාරට වාහනය දාගත්තාට පස්සේ වාහනය පරිස්සම් කර ගෙන office එකට යන එක තමයි ලොකුම අභියෝගය. රටේ හදන නීතිවලට ගැළපෙන විධියට මාර්ග පද්ධතිය හැදිලා නැහැ. නාගරික තද බදය වෙනස් වෙලා නැහැ. ඒ අර්බුදවලට උත්තර හොයලා නැහැ. මේවා හැම දෙයක්ම සිද්ධ කරන්නේ -මම බොහොම අවංකව කියන්නේ- දේශපාලන තීන්දු තීරණ හැටියටයි.

රටේ වාහන අවශ්‍යතාව, වාහන අවශ්‍යතාවට අනුව ජනගහනය ව්‍යාප්ත වීම, නාගරීකරණය, පරිසරයට වන බලපෑම කියන කාරණා සලකන්නට ඕනෑ. අදත් මම කියන්නේ ඒකයි. අදත් මේ තීරණය ගන්නේ ඇත්තටම පරිසර හිතකාමීත්වය ගැන හිතලාවත්, වාහන තදබදය ගැන හිතලාවත්, රටේ නාගරික අර්බුදය ගැන හිතලාවත්, එහෙම නැත්නම් මේ ඇති වන ක්‍රියාවලිය ගැන හිතලාවත් නොවෙයි. මේක පැහැදිලිව-[බාධා කිරීමක්] මාතලේ පැත්තේද සලකා බැලුවේ? ඔබතුමා මොනවාද දන්නේ? මේක එහෙම නොවෙයි. මේ කාර්තුවේ බදු එන්නේ කොහොමද කියලා ගණන් හදලා බැලුවා. මේ කාර්තුවේ බදු ආදායම එන්නේ කොහොමද කියලා ජයසුන්දර මහත්තයා calculation එක දැම්මා. ජයසුන්දර මහත්තයා කිව්වා දැන් මේ බද්ද ගහන්න කියලා. එදා කිව්වා අඩු කරන්න කියලා. මෙදා කිව්වා බදු ගහන්න කියලා. සල්ලි ඕනෑ වුණා, බද්ද ගැහුවා. ඔබතුමන්ලා මේකට guard එක දානවා නේ. ඒක වෙනම එකක්. ඒක රාජකාරිය. නමුත් ඇත්ත දේ ඒක. මම කියන්නේ ඒකයි. මේවා දේශපාලන තීන්දු තීරණ, ගනුදෙනු. මුදල් මත හිතලා දේශපාලන තීන්දු තීරණ ගන්න එපා. කොච්චර එපා කිව්වත් ගන්නවා තමයි. විශ්‍රාම වැටුප් පනතෙන් ඇන ගත්තෙත් ඒක නේ. විශ්‍රාම වැටුප් පනත ගෙනාවෙත් වෙන මොකක්වත් නිසා නොවෙයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කිව්වා ඊළඟ ණය වාරිකය නිදහස් කරන්න ඕනෑ නම් රට ඇතුළේ තිබෙන අරමුදල් පාවිච්චි කරන්න කියලා; රට ඇතුළේ තිබෙන පෞද්ගලික අරමුදල් පාවිච්චි කරන්න කියලා. එහෙම පාවිච්චි කරන්න වැඩිපුරම තිබෙන්නේ පාරිතෝෂික අරමුදල්; EPF සහ ETF. ඒවායේ සල්ලි තිබෙනවා. ඒක ගන්න ගැටයක් ගැහුවා. ගැටේ ඇල වුණා. එහෙමයි දැන් වෙලා තිබෙන්නේ. එදා ඒ ගහපු ගැටේ දැන් ඇල වෙලා තිබෙන්නේ. දැන් ඒක ආයිත් මුට්ටු කරන්න බැහැ. මොකද ඒ දේශපාලන තීන්දු තීරණ. ඒක කවුරු හෝ ඇමති කෙනෙක් මත දැම්මාට හරි යන්නේ නැහැ. ලොකුගේ ඇමතිතුමාගේ පිට හරි, පොලිස්පතිතුමාගේ පිට හරි ගහලා හරි යන්නේ නැහැ. දැන් පොලිස්පතිතුමා පිට ගැහුවාට වැඩක් නැහැ. ලොකුගේ ඇමතිතුමා පිට ගැහුවාට වැඩක් නැහැ. මොකද, මේවා දේශපාලන තීන්දු තීරණ. මම හිතන්නේ මේ ආණ්ඩු පක්ෂයේ ඉන්න ගරු ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා කවුරුත් පිළිගන්නවා ඇති, මේවා පිටු පස්සේ රාජ්‍ය බලය අසීමිත ලෙස හොබවන නිලධාරින් ඉන්නවා කියලා. සමහර විට මන්ත්‍රීවරු අසරණයි. සමහර විට ඇමතිවරු අසරණයි. මොකද, ඇමතිවරුන්ට වඩා උඩින් ඉන්නවා නිලධාරින්. නිලධාරින් දේශපාලන තීරණ ගන්නවා. ඒ අය බලන්නේ ගිණුම් වශයෙන් විතරයි. ඒ අය බලන්නේ ආදායම අඩු වැඩි කරන්නේ කොහොමද, balance කරන්නේ කොහොමද කියලායි. එහෙම බලලා බදු ගහනවා. ඒක මහ පාරට ගියාම ආර්ථිකයට බලපානවා. ජනතාවගේ ජීවිතවලට බලපානවා.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

අපි දන්නවා ඔබතුමන්ලා බදු අඩු කළ වෙලාවේ ලංකාවේ වාහන ඉල්ලුම් කරන අයගේ විශාල ලැයිස්තුවක් හැදුණා. ඒ ලැයිස්තුව තවම පිරිලා නැහැ. ලංකාවට වාහන ගෙන්වන ආයතනවලින් order කරපු වාහන; L/C open කරපුවා; පැය 24න් L/C open කරපුවා තිබෙනවා. මේවා තවම පුරවා ගන්න බැරි මට්ටමේ අර්බුදයක් තිබෙනවා. ඒකේදී පාරවල්වලට වෙන්නේ මොකක්ද කියලා කල්පනා කරන්නේ නැහැ. රටේ ඇති වන තත්ත්වය මොකක්ද කියන එකට උත්තර හොයලා නැහැ. විශේෂයෙන්ම මම කියන්නේ ඔබතුමන්ලා මේක දේශපාලන තීරණයක් හැටියට නොගෙන hybrid - electric වර්ගයේ වාහන - පරිසර හිතකාමී වාහන- ප්‍රවර්ධනයට කටයුතු කරනවා මිසක, ඒක බදු ආදායම වැඩි කර ගැනීමේ උපක්‍රමයක් හැටියට පාවිච්චි කරන්න එපා කියලායි.

ඊළඟට ඔබතුමන්ලා ස්කන්ධ සහ සුරැකුම් නිදහස් කිරීම සම්බන්ධයෙන් තවත් යෝජනාවක් ගෙනාවා. ඒ කියන්නේ ලියාපදිංචි ස්කන්ධ නිදහස් කරන්න 2017 ඔක්තෝබර් 01 වෙනි දාට යෙදී තිබුණු කාලය 2011 අගෝස්තු 30 දක්වා ආපස්සට අරන් තිබෙනවා. ඇත්තටම මේවා ණය නොවෙයි, පොලී. මේ ඔබතුමන්ලා ඉතා පැහැදිලිව කියයි මේ ස්කන්ධ කලින් නිදහස් කළාම 2017 ගෙවන්න තිබෙන පොලිය 2011 දී ගෙවන්න පුළුවන් වෙන නිසා 2017 වැඩි පොලියක් ගෙවන්න තියෙන අවස්ථාව නැති වෙනවා කියලා දැන් බන්දුල ගුණවර්ධන ඇමතිතුමාම කිව්වා, - එකක් කියනකොට තව එකක් ඔප්පු වෙනවා. ඒකයි මේ වෙන්නේ. එතුමා අද උදේ කිව්වා- 2017 සියයට 19ක් විතර ගෙවන්න තියෙන ණය පොලී මේකෙන් බේරා ගන්න පුළුවන් කියලා. ඒ කියන්නේ ඔබතුමන්ලාම පිළිගන්නවා, මේ ආණ්ඩුව 2017 දක්වා අපේ රට ණය කරලා තියෙනවා කියලා. 2017 වෙනකන් ණය කරලා තියෙන්නේ, වැඩි පොලියට. අන්න පොලියට ණය ගන්න ගියාම -HSBC එක සොයා ගෙන යනකොට වෙන රටවල් සොයා ගෙන යනකොට- ඕක අමතක වෙනවා. 2017 වෙනකන් ජනවරමකුත් නැහැ. හැබැයි 2017 වෙනකන් ණය අරගෙන තිබෙනවා. ඒ ගත්ත ණයට පොලිය ගෙවනවා. දැන් ඔබතුමන්ලා කියන්නේ මොකක්ද? දැන් පොලී අනුපාත අඩු වෙලා තිබෙන හින්දා මේක අපට වාසියක් වෙනවා කියලායි. [බාධා කිරීමක්] නැහැ, මේකේ ඇත්ත කාරණය ඒක නොවෙයි නේ. රෝහණ දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා, මේකේ ඇත්ත කාරණය මේකයි. ඔබතුමන්ලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පොඩි signal එකක් පෙන්වනවා, අපේ ණය ගෙවීමේ හැකියාව හොඳයි කියලා. "අපට දැන් ණය පොලිය වැඩිපුර ගෙවන්න පුළුවන්කම තිබෙනවා. අපි දැන් 2017 නිදහස් කරන්න තියෙන ඒවා 2011 නිදහස් කරන්න සූදානම්." කියලා. ඒක කියන්නේ ඇත්තට නොවෙයි. ඒක එහෙම තියෙනවා නම් මෙහේ බඩු මිල අඩු කරන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒක එහෙම තියෙනවා නම් මෙහේ දුප්පත්කම අඩු වෙන්න ඕනෑ. එහෙම ආර්ථිකය සුබිත මුදිත වෙලා නම් මෙහේ බඩගින්න අඩු වෙන්න ඕනෑ; මෙහේ බස් ගාස්තු අඩු වෙන්න ඕනෑ. මොකද, ඒ ආර්ථික වර්ධනය ලැබෙන්නේ මේ රටේ ජනතාවට නම් -[බාධා කිරීමක්] ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පෙන්වනවා, "අපට වැඩි පුර තව වාරිකයක් ගෙවපන්." කියලා; "අපට තව වැඩි වාරිකයක් අනුමත කරලා දෙන්න. මොකද, අපි දැන් ණය ගෙවීමේ හැකියාවෙන් ඉහළ මට්ටමකට ඇවිත් ඉන්නවා." කියලා. මම කියන්නේ මේ වැඩේ කරන්නේ ඒක උපක්‍රමයක් හැටියට පෙන්වන්න නම්, ඒකට කමක් නැහැ. මේක උපක්‍රමයක් හැටියට මූල්‍ය අරමුදලට පෙන්වන්න හදනවා නම්, "අපේ දැන් ණය ගෙවීමේ තත්ත්වය හොඳ වෙලා ඒ බවට සහතිකයක් හැටියට පෙන්වන්න ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් නිදහස් කිරීමේ කාල සීමාව අපි අඩු කර ගෙන තිබෙනවා." කියලා, ඒකෙන් එක ණය වාරිකයක් අනුමත කර ගන්න පුළුවන් වෙයි. හැබැයි, ප්‍රශ්නය තියෙන්නේ එහෙම අඩු කර ගන්නකොට රටේ පාසල් වැසී යන ප්‍රමාණය වැඩි වෙමින් තිබෙන එකයි. මේ 2010 මහ බැංකු වාර්තාවේම කියනවා, 2009-10 අතර කාලය තුළ පමණක් පාසල් 456ක් වැහිලා කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හේතුව මොකක්ද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගුරුවරු නැහැ. ඩෙස්ක්, පුටු, බංකු නැහැ. Tap එක නැහැ. පොත් නැහැ. Chalk කැල්ල නැහැ. කළු ලෑල්ල නැහැ. ළමයි එන්නේ නැහැ. ඉස්කෝල වැහෙනවා. ඉතින් ඕකවත් දන්නේ නැද්ද? මම කියන්නේ මේකයි. අපි බරපතළ ආර්ථික අර්බුදයක ඉන්නේ. මේ රටට අකැමැත්තෙන් කියනවා නොවෙයි. ඒක ඇත්ත. ඒ ඇත්ත අර්බුදය දැකලා තමයි අපි උත්තර සොයන්න ඕනෑ. දැන් 2010 මහ බැංකු වාර්තාවෙන්ම; ඔබතුමන්ලාගේම මහ බැංකු වාර්තාවෙන්ම කියනවා, 2009-10 අතර විතරක් රුපියල් මිලියන 4,29,823ක් ණය අරගෙන තිබෙනවා කියලා. අපේ රටේ මුළු ණය බර. ඒකෙන් විදේශ ණය පංගුව රුපියල් මිලියන 2,64,120ක්. රුපියල් මිලියන 2,64,120ක් ණය අරගෙන තිබෙනවා. ඒ ණය වෙනුවෙන් අපි ගත්ත පොලිය -ඒ කියන්නේ ණය ගෙවන්න මේ අවුරුද්දේ විතරක් අපි ගෙවලා තිබෙන පොලී ප්‍රමාණය- දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 6.3යි. හැබැයි අපි අධ්‍යාපනයට වෙන් කරන්නේ සියයට 1.86යි. අපි සෞඛ්‍යයට වෙන් කරන්නේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 2යි. අධ්‍යාපනයටයි සෞඛ්‍යයටයි වඩා වැඩියෙන්, ගත්ත ණයට පොලිය විතරක් ගෙවන රටක් මේක. එක අවුරුද්දකට ගත්ත ණයට පොලිය විතරක් අපි ගෙවනවා, අපේ මුළු රටේ අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට දළ දේශීය නිෂ්පාදනයෙන් වෙන් කරන ප්‍රමාණයට වඩා වැඩියෙන්. ඒක තමයි ඇත්ත තත්ත්වය. අපේ අධ්‍යාපනය කඩා වැටෙන කොට සෞඛ්‍ය සේවය කඩා වැටෙන කොට ප්‍රවාහනය කඩා වැටෙනකොට අපේ නිෂ්පාදන ක්‍රියාවලිය දිරිමත් වෙන්නේ නැතිකොට අපේ ආර්ථිකය කඩා ගෙන වැටෙනකොට අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට සහතිකයක් පෙන්වන්න අපි උපක්‍රමයක් හැටියට දේශපාලන උපක්‍රමයක් හැටියට කියනවා නම් 2017 ඔක්තෝබර් මාසයේ නිදහස් කරන්න තියෙන ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් අපි අගෝස්තු මාසයේ නිදහස් කරනවාය කියලා, ඒකෙන් එක ණය වාරිකයක් අනුමත කර ගන්න පුළුවන් වෙයි; ණය වාරිකයක් සම්මත කර ගන්න පුළුවන් වෙයි. [බාධා කිරීමක්] මට පොඩි වෙලාවයි තියෙන්නේ. [බාධා කිරීමක්] ඔබතුමාගේ වෙලාවෙන් ගන්න.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
ඇයි, ඔබතුමන්ලා කියන දේ ජනතාව පිළිගන්නේ නැත්තේ?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා හිතනවාද, ඔබතුමා කියන දේ ජනතාව පිළිගෙන ඉන්නවා කියා. දැන් මුළු ජනතාවම ඔබතුමන්ලා කියන දේ පිළි අරගෙනද ඉන්නේ? ඔබතුමා හිතනවාද ඔබතුමන්ලා කියන දේ ජනතාව පිළිගෙන ඉන්නවා කියා. [බාධා කිරීමක්] එහෙම නම් ඔබතුමන්ලාත් පිළිගන්නකෝ. "අපේ විශ්‍රාම වැටුප හොරා කන්න එපා" කියා අර ඇමතිවරු ඉදිරියේදී වෙළෙඳ කලාපයේ සහෝදරියෝ ලස්සනට කිව්වේ. අන්න ජනතාවගේ මතය. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Member, you have only one more minute.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා අවසන් කරනවා. පොදුවේ කියන්න තිබෙන්නේ මේකයි. මේ ආණ්ඩුවට පවතින්න තිබෙන්නේ දේශපාලන උපක්‍රමවලින් විතරයි. දූකට ගයන ගී ගයමින් ඉන්න හැම දාම පුළුවන්. දැන් අපේ ජී.එල්. පීරිස් ඇමතිතුමා අද උදේ මේ පාර්ලිමේන්තුවේදී කියනවා, "මා ඉන්දියාවට ගියා. ඉන්දියාවට ගියේ මගේම වුවමනාවට. අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා කියන වුවමනාවට නොවෙයි. මගේම වුවමනාවට මා ඉන්දියාවට ගියේ. ගිහිල්ලා කන්කසන්තුරේ ගිවිසුම් අත්සන් කළාම මොකක්ද තිබෙන වරද? මේ ආර්ථික ගිවිසුම් අත්සන් කළාම තිබෙන වරද මොකක්ද?"කියලා. ඇත්තටම ජී.එල්. පීරිස් ඇමතිතුමා සාධාරණයි. එතුමාට ඒක තේරෙන්නේ නැහැ. එතුමාට තේරෙන කොටසක් තිබෙනවා. අපි දන්නවා. එතුමා පොත පතේ දැනුම ලබා ගත් කෙනෙක්. අතිශය උගත් විද්වත් මහාචාර්යතුමාගේ විෂය දැනුමට අපි ගරු කරනවා. එතුමාගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දැනුමට අපි ගරු කරනවා. ඒ ගැන විවාදයක් නැහැ. හැබැයි, ඉන්දියාවට ගිහින් ආර්ථික ගිවිසුම් අත්සන් කරලා අපේ රටත් එක්ක එකඟතාවන් ඇති කර ගත්තාම සිද්ධ වන්නේ මොකක්ද කියා එතුමා දන්නේ නැහැ. එතුමා බොහොම සද්භාවයෙන් කියනවා, මා ගියා; මා අත්සන් කළා - බොහොම ලස්සන වචන- මා ආවා කියා. [බාධා කිරීමක්] එතුමා වැරැද්දක් කිව්වාය කියා මට නම් තේරෙන්නේ නැහැ. මොකද, එතුමාට තේරෙන තරමින් ඒ ටික එතුමා කිව්වා. නමුත් දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා එහෙම නොවෙයි. එතුමා දේශපාලන දැක්මක් තිබෙන කෙනෙක්. ඒ දේශපාලන දැක්මෙන් එතුමා කිව්වා, මෙහෙම ගිහින් මේකයි වන්නේ කියා. [බාධා කිරීම්] දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා පිලිප් ගුණවර්ධන මහත්මයාගේ කාලයේ ඉඳන් ලබපු දේශපාලන අවබෝධය සමඟ කියනවා. ජී.එල්. පීරිස් ඇමතිතුමා වෙනත් අවබෝධයකින් කියනවා. ජී.එල්. පීරිස් මහත්මයා මේ මහ පොළොව හතර මායිමේ තිබෙන අවබෝධයක් අනුව නොවෙයි ඒ දේ කිව්වේ. ඕක තමයි වෙනස. නමුත් ඇත්ත දේ මොකක්ද? අපි කවුරුත් දන්නවා, ලෝකය කලාපීය වශයෙන් බෙදිලා තිබෙන අර්බුදයක් නිසා අපේ අසල්වාසී ඉන්දියාව ලංකාවට විතරක් නොවෙයි අප්‍රිකානු රටවලට පවා තමන්ගේ ව්‍යාප්ත වීමේ සීමාවන් පළල් කර තිබෙනවා කියලා. ඒක වෙනම සාකච්ඡාවක්. ඒ සාකච්ඡාව දක්වා ඔබතුමන්ලා ජී.එල්. පීරිස් මහාචාර්යතුමාගේ මනස පළල් කරන්න; ඒ විෂය පථය පළල් කරන්න. මොකද, විදේශ කටයුතු කිව්වාම ලොකු වැඩක් නේ. අපි දන්නවා, මහ පොළොවට බැස්සේම නැතුව ගුවනේ විතරක් හිටිය විදේශ කටයුතු ඇමතිවරු අපේ රටේ සිටි බව. අන්තිමේදී ඡන්දෙනුත් පැරදිලා වාෂ්ප වෙලාම ගියා. එහෙම විදේශ කටයුතු ඇමතිතුමන්ලා අපිට හිටියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉදිරිපත් කර තිබෙන බදු පනත් සම්බන්ධ නියෝගවලින් කෙටිකාලීන දේශපාලන වාසි වෙනුවට අනාගතයේදී රටට ඇති වන අවාසි පිළිබඳව වැඩිපුර අවධානයට යොමු කරන්නය කියා රජයට අවධාරණය කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 4.02 ]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ මිත්‍රයාගේ කථාවෙන් පසු වචන කිහිපයක් කථා කිරීමට ලැබීම ගැන සන්තෝෂයි. එතුමා hybrid cars ගැන බොහොම උනන්දුවෙන් කථා කළා. [බාධා කිරීම්] කුරුළු හදවතක් තිබෙන කෙනෙකුට - [බාධා කිරීම්] පොඩි වචන හිර වීමක් වුණා. ඒ hybrid carsවල තිබෙන ප්‍රශ්නය ඇත්තටම කියනවා නම් මේකට flat rate එකක් දමා දුන්නා. සියයට 35ක flat rate එකක් දමා දුන්නා. Flat rate එක දැමීමේ ප්‍රයෝජනයක් වෙයි කියා. නමුත් අධි සුඛෝපභෝගී වාහන - 3000 cc, 4000 cc වාගේ වාහන- ගෙන්වන්න පටන් ගත්තා. විශේෂයෙන් Toyota Crown එකක් ගත්තොත් ලක්ෂ 240ක් විතර වනවා. ඒ වාගේ වාහන ගෙන්වූවාම පුංචි අයට එලයක් ලැබෙන්නේ නැහැ. ඇති හැකි, ගෙවන්න පුළුවන් අයත් මේ බද්දෙන් නිදහස් වනවා. මේකට සීමාවල් පනවන්න රජයක් වශයෙන් කල්පනා කිරීම හොඳයි. උදාහරණයක් වශයෙන් මේ flat rate එක සියයට 35ක් දැම්මාට මොකක්ද වෙලා තිබෙන්නේ? මා කියන්නම්. 1600ccට අඩුවෙන් තිබෙන වාහනවලට සියයට 12ක වැඩි වීමක්. 1600cc ඉඳලා 2000cc දක්වා දෙමුහුන් වාහනවලට සියයට 37ක වැඩි වීමක්. එතැනින් ඉහළ ඒවාට සියයට 42ක වැඩි වීමක්. සංසන්දනාත්මකව බලද්දී ලොකු වැඩි වීමකුත් නොවෙයි. ඒ නිසා දැන් ඔබතුමන්ලා ගෙනෙන තර්කය යථාර්ථවාදී නැහැ. මම ඒක පැහැදිලි කරලා දෙන්න ඕනෑ. Hybrid cars ගෙන්වන්න පටන් ගත්තාම, විශාල වශයෙන් ගෙන්වන්න පටන් ගත්තේ අධිසුඛෝපභෝගී වාහන. එම නිසා නිතර නිතර බදු පනවනවා වාගේම බදු සංශෝධනත් ඇති කිරීම තමයි රජයක ප්‍රතිපත්තිය වන්නේ. ඒ අනුව එම සංශෝධනය ඉතාම හොඳ විධියට කර තිබෙන බව මම කියන්න කැමැතියි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මුදල් සම්බන්ධයෙන් කථා කළා. එතුමා මොනවාද කිව්වේ? එතුමා කිව්වා, අපි නැවත වරක් විශාල මුදලක් ලබා ගන්නට බදු සංශෝධනයක් කර තිබෙනවා, ඉතා කඩිනමින් ඒ මුදල් ගන්න පුළුවන් විධියට මේ බදු සංශෝධනය කරලා තිබෙනවා කියලා. රජය විසින් රුපියල් 18,823,586,000ක ණය මුදලක් නිකුත් කර තිබෙනවා. එකී මුදල් නිදහස් කිරීමේ දිනය 2017 ඔක්තෝබර් මස 01 වැනි දිනය ලෙස නම් කර තිබෙනවා. එසේ නිකුත් කර තිබෙන ලියා පදිංචි ස්කන්ධ වර්තමාන වෙළෙඳ පොළ ක්‍රියාකාරිත්වය තුළ මුළු ඉතුරුම් කිරීමේ වාසිය ලබා ගැනීම සඳහා 2011 අගෝස්තු මාසයේ 30 වන දින ගෙවා නිදහස් කිරීමේ දිනය වශයෙන් ප්‍රකාශ කර තිබෙනවා. ඒ කාලයේ ගත්තේ සියයට 18, 16 පොලියට. දැන් හොඳ අවස්ථාවක් දීලා තිබෙනවා මේවා නිදහස් කර ගන්න. නැත්නම් ඒක balance වන්නේ නැහැ නේ. මේක එක digit එකකට ගේන්න ඕනෑ කියලා අද ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ප්‍රකාශ කළා මට මතකයි. මොකද, ලෝකයේ අනෙක් රටවල් එක්ක සංසන්දනාත්මකව බලද්දී අපට පෙනෙනවා, ව්‍යාපාර කරන අයට උදව් කරන්න නම් ණය පොලී අනුපාතය අඩු කරන්න ඕනෑය කියන එක. ඒ කාලයේ රජය විසින් වැඩි පොලියට ණය ගත්තේ ඇයි? ගත්තේ, යුද්ධය නිම කරන්න. තමුන්නාන්සේලාගේ කාලයේත් -එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේත්- ණයට ගත්තා. එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ණය ගත්තා විතරක් නොවෙයි, ජේවීපී එක අපිත් එක්ක කැබිනට් එකේ හිටපු කාලයේත් ණය අර ගෙන තිබෙනවා. ණය අර ගෙන කළේ මොනවාද කියලා ඒ ගොල්ලන් දන්නවා. ඒ ගොල්ලන් කිව්වේ මොනවා නැතත් මේ යුද්ධය ඉවර කරන්න කියලායි. ඒ නිසා, ජනාධිපතිතුමා මේ මුදල් කන්න ගත්තේ නැහැ; අඳින්න ගත්තේ නැහැ. යුද්ධයට අවශ්‍ය දේවල් සපයා ගැනීමට ණය ගත්තා. අපේ රටේ තිබුණ ත්‍රස්තවාදී යුද්ධය ඒ ගොල්ලන්ට ජයග්‍රහණය කරන්න පුළුවන් කියලා එල්ටීටීඊ එක පිළිගෙන තිබුණ බව තමුන්නාන්සේලා දන්නවා. යුද්ධයට ආයුධ ණයට දෙනවාට වඩා සල්ලිවලට දෙන්න තමයි රටවල් කැමැත්ත දක්වන්නේ. මොකද, ඒකෙන් ආයෝජනයක් නැති නිසා. ඒවාට යම්කිසි විපතක් වුණොත් ඒක recover කර ගන්න තිබෙන අවස්ථාව අහිමි වෙන නිසා ඒ රටවලට තමයි ලොකුම අවදානම තිබෙන්නේ. එම නිසා අපට අවශ්‍ය දේ ගන්න අපි සල්ලි පාවිච්චි කරලා තිබෙනවා. ඒකෙන් පස්සේ වෙලා තිබෙන්නේ මොකක්ද? අද ඇහට දැනෙන

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

වෙනසක් සිදු වෙලා තිබෙනවා. අද මේ වෙනසේ ප්‍රතිඵලය කුමක්ද? වෙනසේ ප්‍රතිඵලය තමයි, දැන් සාමය ඇති වෙලා ආර්ථික වර්ධන වේගය දිගින් දිගටම වැඩි වෙලා තිබෙන එක. ඒ සාමය නිසා මේ රටේ ආර්ථික වර්ධනය ඇති කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

දැන් තමුන්නාන්සේලා විශ්‍රාම වැටුප් ගැන කථා කරනවා. විශේෂයෙන්ම මම මතක් කරන්නට ඕනෑ ඉන්දියාව, පාකිස්තානය, බංග්ලාදේශය, මාලදිවයින වැනි රටවල වසරකට අවුරුදු 60ට වැඩි ජනගහණය කෝටියකට වැඩියෙන් එකතු වන බව. අපේ රටේ අවුරුදු 60 වැඩි ජනගහණය සියයට 11ක් ඉන්නවා. 2025 වන විට ඒ ප්‍රමාණය සියයට 25ක් වෙයි කියලා උපකල්පනයක් තිබෙනවා. ඉතින් මේ අයට විශ්‍රාම වැටුපක් අවශ්‍ය නැද්ද? ජීවිතයේ සැඳෑ කාලය ගෙවද්දී කුමක් හෝ කරන්නට ඕනෑ. ඒ අය පැත්තකට දමන්නද? වැඩ කරලා, වැඩ කරලා අවසාන කාලයේ බෙහෙත් ටික ගන්න වාගේම සමාජ සුබ සාධන කටයුතු කර ගන්න විශ්‍රාම වැටුපක් අවශ්‍යයි. අවුරුදු 80ට වැඩි ජනගහණය 2,10,000කට වැඩි සංඛ්‍යාවක් ඉන්නවා. ඒ අවුරුදු 80ට වැඩි ජනගහනයෙන් සියයට 60කට -සියයට 40කට අවශ්‍යතාවක් නැහැ- ආරම්භක දීමනාවක් වශයෙන් රුපියල් 500ක විශ්‍රාම වැටුපක් දෙන්න කියලා ගිය සතියේ මම කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. රජය ඒක පිළිගත්තා. දැන් තමුන්නන්සේලා මේ පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුපට විරුද්ධව සටන් කරනවා. නමුත් අපේ මේ ආණ්ඩුව අවුරුදු 80ට වැඩි අයට විශ්‍රාම වැටුපක් දෙන්න කැබිනට් පත්‍රිකාවක් සම්මත කර ගෙන, ලබන Budget එකට ඒක දෙන්න තීන්දු කර ගත්තා.[බාධා කිරීමක්] ඒකට මොකද කියන්නේ? ඒකට කථා කරන්නේ නැහැ. අවුරුදු පහෙන් විශ්‍රාම වැටුප ගන්නවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. අවුරුදු පහෙන් විශ්‍රාම වැටුප හම්බ වෙනවා නේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට. තමුන්නාන්සේලාටත් හම්බ වෙනවා නේ. එහෙම හම්බ වෙන කට්ටිය තමයි පෞද්ගලික අංශය විශ්‍රාම වැටුප් ගන්නවාට විරුද්ධ. මෙන්න මේ ගැනත් හිතන්න. ඒ ගැන කථා නොකරමින් තමයි මේ විධියට කථා කරන්නේ. ඔන්න ඔබලාගේ දේශපාලනය! තාවකාලික වින්දනය. [බාධා කිරීමක්] මොනවාද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔච්චර හොඳ නම් ඇයි අකුළා ගන්නේ? සංශෝධන ගෙනෙන්න.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
සංශෝධන ඔය පැත්තෙන්ම ගෙනෙන්න කෝ. [බාධා කිරීම්] සංශෝධන ඔය පැත්තෙන්ම ගෙනෙන්න කෝ. තමුන්නාන්සේලාම ගිහිල්ලා ඒ විශ්‍රාම වැටුපටත් විරුද්ධයි ගන්න එපා කියලා කටුනායක කම්හල්වල ඉන්න සේවකයන් එළියට දාන්න කෝ. මොන බොරු කථාද? අපි එකක් කියන්න ඕනෑ තමුන්නාන්සේලාට. විදේශ රටවල ඉන්න අය වැඩ කරලා වැඩ කරලා මෙහාට ආවාම ඒ අයටත් විශ්‍රාම වැටුපක් දෙන්න ඕනෑය කියලා මහින්ද චින්තනයේ තිබෙනවා. ඒ සඳහා අවශ්‍යතාවක් තිබෙනවා. ඒ අවශ්‍යතාවේ ආරම්භක පියවරක් වශයෙන් තමයි මේ කටයුතු කළේ. [බාධා කිරීම්] ඊයේ පිළිගත්තු එක ගැන මොනවාද කියන්නේ?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
විදේශ රටවල ඉන්න අයට ලැබෙනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
හරි, මම තමුන්නාන්සේගෙන් ප්‍රශ්නයක් අහන්නම්. මේ විශ්‍රාම වැටුපට කවුද මුදල් ගෙවන්නේ? මේ විශ්‍රාම වැටුපට දායක වන්නේ කවුද? අපේ රටේ අපනයනයෙන් සියයට 51ක් යන්නේ යුරෝපා රටවලට. ඩොලර් සඳහා ඒවා යන්නේ. අපනයනයෙන් සියයට 51ක් යන්නේ යුරෝපා රටවල්වලට. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් තමයි ඇඟලුම් කර්මාන්තශාලා පටන් ගත්තේ. ඒ සේවකයෝ අවුරුදු 50 වන තුරු වැඩ කළා නම් මේ වෙද්දී විශ්‍රාම වැටුපක් ලැබෙනවා. ඉස්සර අපි තේ, රබර්, පොල් අපනයනය කළා. අද මොනවාද වෙලා තිබෙන්නේ? අද ඇඟලුම් කර්මාන්තයත් මේ රටට විදේශ විනිමය ලබා ගන්න ලොකු පිටුවහලක් වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. ඉතින් මේ අය කෙරෙහි සානුකම්පිකව බලලා විශ්‍රාම වැටුපක් යෝජනා කළා. ඒ සඳහා මුදල් ටික ගෙවන්නේ ඒ හාම්පුත්තු. ඒ හාම්පුතුන්ගෙන් කීයක් හරි ලැබෙනවාට අපේ කට්ටිය කැමැති නැද්ද? කැමැති නැද්ද? කැමැතිද නැද්ද කියලා මම අහන්නේ. කැමැති වෙන්න ඕනෑ. ඒකට රජය මැදිහත් වන එකට කැමැති නැද්ද? කැමැති වෙන්න ඕනෑ. [බාධා කිරීම්] මොකක්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
රජය හොරකම් කරන එකට අකැමතියි.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මොකක්ද රජය හොරකම් කරන්නේ? විශ්‍රාම වැටුප් හොරකම් කරනවාද? නැහැ නේ. එකක් මතක තියා ගන්න. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ තමුන්නාන්සේලා මහවැලිය පටන් ගත්තා. අද මහවැලිය හොඳයි කියනවා. අපි මේ වරායවල වැඩ පටන් අරගෙන, නොරච්චෝලේ ගල් අඟුරු බලාගාරය පටන් අරගෙන, මේ රට සංවර්ධනයෙන් ඉස්සරහට ගෙනෙන්න පාරවල් ටික හදා ගෙන යනවා. ඒ සඳහා මුදල් ගන්නේ කොහෙන්ද? ඒ මුදල් ණයට අරගෙන මේ කාලයේ ආයෝජනය කෙරුවොත් අනාගතයේදී ප්‍රයෝජනවත් වෙන්න පුළුවන්. තමුන්නාන්සේලා මහවැලිය හදන කාලයේ සිමෙන්ති කොට්ටය කීයද? රුපියල් හතයි ශත පනහයි. අද කීයද? රුපියල් 775යි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අද පඩිය කීයද?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
පඩිය පැත්තකට දාන්න කෝ. අනාගතය ගැන හිතලා තමයි රටක වැඩ කරන්න ඕනෑ. අද ජීවත් වෙලා, අද වැඩ කරලා මේ රටේ ප්‍රශ්න විසඳන්න බැහැ. රජයක් වුණාම අනාගතයක් ගැන හිතලා කල්පනා කරන්න ඕනෑ. ඒ නිසා අනාගතය ගැන හිතලා තමයි අතිගරු ජනාධිපතිතුමා මේ වැඩ පිළිවෙළ හැදුවේ. මොකද, අපේ ජීවිත අපේක්ෂාව වැඩි නිසා.

අපි නොමිලේ පාසල් පොත් ටික දෙනවා. ඒ වාගේම අධ්‍යාපනය නොමිලේ. සෞඛ්‍යයත් නොමිලේ. හැම දෙයක්ම නොමිලේ ලබා දෙනවා. එම නිසා ජීවිත අපේක්ෂාව වැඩියි. ජීවිත අපේක්ෂාව වැඩි නිසා 2050 වෙද්දී මේ රටේ ජනතාවගෙන් සියයට 50ක් වැඩිහිටි ජනතාව බවට පත් වනවා. වැඩිහිටි ජනතාව ජීවිතයේ සැඳෑ සමයේ විශ්‍රාම වැටුපක් ලබා ගැනීම සාධාරණද

අසාධාරණද කියලා කල්පනා කරලා බලන්න ඕනෑ. ඔවුන් නොමඟ අරින්න එපා. තමුන්නාන්සේලා ඔවුන් නොමඟ ඇරීමක් කරලා තිබෙන්නේ. අමාරුවෙන් හරි කරන්න ඕනෑ වැඩ පිළිවෙළක් තමයි මේක. නමුත් ආණ්ඩුව මොකද කළේ? ජනාධිපතිතුමා පැහැදිලි ලෙස කිව්වා ජනතාව මේකට විරුද්ධ නම් අපි නම්‍යශීලී ප්‍රතිපත්තියක් තුළ ඉඳ ගෙන ඒක අයින් කරමු කියලා. හැබැයි කවදා හරි ජනතාවගේ උද්ඝෝෂණයක් ආපු දවසට තමුන්නාන්සේලාට පාරට බහින්න හම්බ වෙන්නේ නැහැයි කියන එක මම මතක් කරන්න ඕනෑ. අපි මේ ගැන ජනතාව දැනුවත් කරනවා. ඒ දැනුවත් වීමෙන් පස්සේ ජනතාවගෙන් ඒ ඉල්ලීම ආපු දවසට තමුන්නාන්සේලාට ඕක පාරා වළල්ලක් වන බව මම මේ අවස්ථාවේදී මේ සභාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. පාරාවළල්ලක් වනවා. අනිවාර්යයෙන්ම පාරාවළල්ලක් වනවා. නැත්නම් මේ රටේ වැඩ කරන ජනතාවට තිබෙන සෙත කුමක්ද? අපිත් private sector එකේ වැඩ කරන අය. අපටත් සමාගම් තිබෙනවා. අපටත් ඒ සඳහා මුදල් ගෙවන්න වනවා. නමුත් අපි මේක සතුටින් භාර ගත්තා. ඇයි සතුටින් භාර ගත්තේ? සතුටින් භාර ගත්තේ, විශ්‍රාම ගියාට පස්සේ මේ අයට අනාගතයක් නැහැයි කියලා අපි දන්න නිසා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැත්නම් ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මොකක්ද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
භාර ගත්තේ නැත්නම් ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
දැන් තමුන්නාන්සේට වෙලා තිබෙන දේ පෙනෙනවා නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මොකක්ද ?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
තමුන්නාන්සේට අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද නායකයාද නැහැ නේ? අද මොකක්ද වෙලා තිබෙන්නේ? කොයි පැත්තේද? රනිල්ගේ පැත්තද, අරයාගේ පැත්තද? පැත්තක් නැහැ, දැන්. දෙපැත්තටම වෙලා ඉන්නවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපි විපක්ෂයේ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
දැන් සද්ද නොකර ඉන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කකුල් දෙක දෙපැත්තේ තියා ගෙන ඉන්නවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
"Long John" කියන්නේ ඕක තමයි. නැහැ, කමක් නැහැ. ඒ පැත්ත අපි අමතක කරලා දාමු.

මේ පිළිබඳව තමුන්නාන්සේලා බොරු නිර්වචන ගෙනෙන්න එපා. විශේෂයෙන්ම තමුන්නාන්සේලා ජනතාව කුලප්පු කරලා කරපු වැඩේ ඉතාමත්ම නින්දනීය වැඩක් විදියටයි අපි දකින්නේ. දැන් ඒ පවුල තේරුම් අරගෙන තිබෙනවා නේ. මොකක්ද තේරුම් අරන් තිබෙන්නේ? "අපිව විකුණන්න එපා" කියලා ඒ පවුලෙන්ම ආවා, උද්ඝෝෂණය. දහස් ගණනක් ඉද්දී, කථා කරද්දී, ඒ පවුලේ අයට කෙළින් හිටලා කියන්න පුළුවන් වුණා, "අපිව විකුණන්න විතරක් කිසිම කෙනෙකුට අපි දෙන්නේ නැහැ" යි කියලා. කිසිම කෙනෙකුට විකුණන්න දෙන්නේ නැහැයි කිව්වා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
පවුල කියපුවා කියන්න හදන්නේ.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
පවුල කියපු ඒවා තමුන්නාන්සේලාට ලියා ගන්න පුළුවන්. කිසිම කෙනෙකුට විකුණන්න දෙන්නේ නැහැයි කිව්වා. ඒ පවුල මම ඔබතුමාට ඉස්සෙල්ලා දන්නවා. ඒ පවුලේ අය මම පෞද්ගලිකව දන්නවා. ඒ පවුලේ එක් කෙනෙක් මගේ කොම්පැනියේ වැඩ කරලාත් තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේ මොනවාද කියන්නේ? පවුල ගැන තමුන්නාන්සේට දැනීමක් නැහැ. තමුන්නාන්සේ දන්නවා ඇත්තේ වෙන පැතිවල පවුල් ගැන. එම නිසා මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, මේ රටේ මේ වාගේ උද්ඝෝෂණ ඇති කරලා, මේ වාගේ වැඩ පිළිවෙළවල් ඇති කරලා මේ රට විනාශ කරන්න එපාය කියන එක.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Minister, please wind up now.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මට තව විනාඩි දෙකක් දෙන්න බැරිද?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
විනාඩියක් දෙන්නම්.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
විනාඩියක් දෙන්න.

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

තවත් වැදගත් පනත් කීපයක් සම්බන්ධයෙන් නියෝග ගෙනත් තිබෙනවා. මද්‍යසාරවලට බදු ගණන් වැඩි කරලා තිබෙනවා. ඒක හොඳද, නරකද? වයින් ලීටරයකට අය කළ රුපියල් 668ක් වූ බද්ද රුපියල් 718 කරලා තිබෙනවා. ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු ලීටරයක් සඳහා රුපියල් 713ක් වූ සුරා බද්ද රුපියල් 863 කරලා තිබෙනවා. මෙරට සෑදූ විදේශීය ස්ප්‍රීතු ලීටරයක් වෙනුවෙන් රුපියල් 953ක් වූ බද්ද, රුපියල් 1,003 කරලා තිබෙනවා.

ඊ ළඟට ධාන්‍ය මත්පැන් ලේබලයේ සඳහන් නිරපේක්ෂක සැර සියයට පහකට අඩු වන්නේ නම් ලීටරයකට අය කරනු ලබන සුරා බද්ද වූ රුපියල් 80 එහෙමම තියා තිබෙනවා. ධාන්‍ය මත්පැන් ලේබලයේ සඳහන් නිරපේක්ෂක සැර සියයට 5ක් සහ ඊට වැඩි වන්නේ නම් ලීටරයකට අය කරන බද්ද රුපියල් 96 එහෙමම තියා තිබෙනවා. ඉතින් ජනාධිපතිතුමා මේ සියල්ලක්ම කරන ගමන් "මතට තිත" වැඩ පිළිවෙළත් ගෙනියනවා නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මතට තිත නැහැ. මතට කොමා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
එහෙම නම්, මතට කොමාද? "මතට තිත" වැඩ පිළිවෙළත් එතුමා ගෙනියනවා නේ. හොඳ දේවල් ගැන කථා කරන්නේ නැහැ, තමුන්නාන්සේලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැදගත් සංශෝධන රැසක් අද ගෙනැත් තිබෙනවා. අපි කියන්න කැමැතියි, විශේෂයෙන්ම මේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යෑමට පෞද්ගලික අංශයේ දායකත්වය අපට අවශ්‍ය වෙලා තිබෙන බව. පෞද්ගලික අංශයට විශාල පහසුකම් සලසලා තිබෙනවා. කිරි නිෂ්පාදනයට අවශ්‍ය භාණ්ඩ ගෙන්වීමේදී ඒ සඳහා අය කළ බදු සම්පූර්ණයෙන්ම අයින් කරලා තිබෙනවා, මේ සංශෝධනවලින්. කවුරුත් ඒ ගැන කථා කළේ නැහැ. එය සම්පූර්ණයෙන්ම අයින් කරලා තිබෙනවා. මේ ගැනත් සලකා බලා මේ සම්බන්ධයෙන් විරුද්ධ වන්නේ නැතුව දැන්වත් මේ රටේ අර්බුද ඇති කරන්නේ නැතුව, බැන් කී මූන්ගේ කනට මී පැණි වක්කරන්නේ නැතුව වැඩ කරන්න කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 4.17]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශයට සම්බන්ධ යෝජනා කිහිපයක් විවාදයට ගැනෙන මේ අවස්ථාවේදී වචන කීපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම ඉතාමත් සතුටු වනවා. ඒ වාගේම මම ඉතාමත් කනගාටු වනවා, අපේ රටේ වගකිව යුතු විපක්ෂයේ - විරුද්ධ පාර්ශ්වයේ- ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකේ නියෝජිතයන් වන, ආර්ථිකය පිළිබඳව වාද විවාදවලට ඉදිරිපත් වන අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේත්, ඒ වාගේම අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේත් කථා පිළිබඳව. එතුමන්ලාගේ කථාවලින්, අපේ රටේ ඉදිරි සංවර්ධන ක්‍රියාවලිය සම්බන්ධයෙන් රජයක් විධියට අපට විපක්ෂයෙන් කුමන ආකාරයක දායකත්වයක් ලබා ගන්න පුළුවන්ද කියන එක පිළිබඳව අපට ඉතාමත් හොඳින් කරුණු අවබෝධ වුණා. අදාළ මාතෘකාවට අනුව කථා කරන්නේ නැතිව වෙනත් වෙනත් මාතෘකා පිළිබඳව කථා කරමින්, ඒ වාගේම ඒ කරුණුත් විකෘති කරමින් කථා කිරීම පිළිබඳව අපි ඉතාමත් කනගාටු වනවා. විශේෂයෙන්ම අපේ රටේ ඉතිහාසයේ විවිධ මතවාදයන් ඉදිරිපත් වුණු අවස්ථාවන් තිබුණා. ඒ අනුව ඉතිහාසයේ පසු ගිය දශක කීපය තුළ අපේ රට දියුණු කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති අවශ්‍යයි කියන එක පිළිබඳව මතවාදයන් තිබුණා. ජාතික ප්‍රතිපත්තියකින් තොරව රටක් දියුණු කරන්න බැහැයි කියන තීරණය පිළිබඳව මේ රටේ විවිධ පාර්ශ්ව කථා බහට ලක් කරපු යුගයක් තිබුණා. අද මේ රටේ සැබෑ ජාතික ප්‍රතිපත්තියක්, සැබෑ ජාතික වැඩ පිළිවෙළක් තිබෙන බව අපි ඉතාමත් සතුටින් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ තමයි අපේ රටේ "මහින්ද චින්තන" වැඩසටහන; වැඩ පිළිවෙළ; ප්‍රතිපත්තිය. මේ සඳහා පිළිගත් දේශපාලන පක්ෂ ගණනාවක් සම්බන්ධ වුණා. ඒ වාගේම අපේ ආණ්ඩුව අද දේශපාලන පක්ෂ ගණනාවකින් සමන්විත වුණු, සංයුක්ත වුණු ආණ්ඩුවක් නිසා සැබෑ ජාතික ප්‍රතිපත්තියක්, ජාතික වැඩ පිළිවෙළක් අපේ රටට තිබෙන බව ඉතාමත් වග කීමකින් යුතුව අපි සඳහන් කළ යුතුව තිබෙනවා. ඒ වාගේම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවල අයත් අද මේ ආණ්ඩුව තුළ ඉන්නවා. ඒ දේශපාලන පක්ෂවල කොටසක් විපක්ෂයේත් ඉන්නවා. එම නිසා මේ රටේ ප්‍රථම වතාවට සැබෑ ජාතික ප්‍රතිපත්තියක් අපේ රටට ඇති වුණු යුගයක් විධියටයි මේ යුගය මා පෞද්ගලිකව දකින්නේ.

පසු ගිය සෑම අය වැය විවාදයකදීම, සෑම අවස්ථාවකදීම එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ මේ අද කියන කරුණු කිව්වා. ණයබර අපට උහුලා ගන්න බැහැ කියලා කිව්වා. උද්ධමනය විශාල වශයෙන් වැඩි වෙයි කිව්වා. බඩගින්න වැඩි වෙයි කිව්වා. විරැකියාව වැඩි වෙයි කිව්වා. කර්මාන්තශාලා වැහෙයි කියලා කිව්වා. මේ ආකාරයෙන් සෘණාත්මක සිතුම් පැතුම් සියල්ලක්ම පසු ගිය කාල සීමාව තුළදී එක්සත් ජාතික පක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත් ඉදිරිපත් කළා. ඒ ආකාරයෙන්ම තමයි අදත්. ණය පිළිබඳව විශාල බියක් ඇති කර ගනිමින්, ඒ වාගේම මේ සෑම දෙයක් පිළිබඳවම සෘණාත්මකව හිතලා සැබෑ ලෙසම රට තුළ සිදු වන දේවල් පිළිබඳව සහ ජනතාවගේ සිතුම් පැතුම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් අද විපක්ෂයේ දේශපාලන පක්ෂ නියෝජිතයින්ට නැති බව අපි ඉතාමත් පැහැදිලිව ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. එක අතකින් ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. එම නිසා කරුණාකරලා මේ පිළිබඳව අවධානය යොමු කරලා සැබෑ ලෙස මේ රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා ධනාත්මකව ඔබගේ දායකත්වය ලබා දෙන්න කියන ඉල්ලීමයි අපි මේ අවස්ථාවේදී ඔබ සියලු දෙනාගෙන්ම කරනු ලබන්නේ. ඒ වාගේම අද මේ ඉදිරිපත් කරන ලද රෙගුලාසි සංශෝධන පිළිබඳව විවිධ මත කිව්වා. බද්දක් පැනවුවාට පස්සේ ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන නීතියක් වෙන්නේ නැහැ. සමහර බදු මාස දෙකක් තිබේවි, මාස තුනක් තිබේවි. සමහර බදු අවුරුද්දක් තිබේවි, අවුරුදු දෙක, තුනක් තිබේවි. එතකොට ඒ පිළිබඳව තීන්දු-තීරණ ගන්නේ ආණ්ඩුවයි; රජයයි.

දෙමුහුන් වාහන පිළිබඳව මීට අවුරුද්දකට පමණ පෙර ඉදිරිපත් කළ එකට නැවත සංශෝධන ගෙන එන්නේ ඇයි කියලා සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඇහුවා. ඒක කාලෝචිත අවශ්‍යතාවක්. ඒ වාගේම මෙවැනි බදු රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී හුදෙක්ම ප්‍රමාණාත්මකව පමණක් නොවෙයි බලන්නේ. විපක්ෂයේ ඔබ බලන්නේ ප්‍රමාණාත්මකව විතරයි. "සුඛෝපභෝගී වාහනවල බද්ද විශාල ලෙස අඩු කළා, ත්‍රිරෝද රථවලට ඇයි ඒ සහනය දෙන්නේ නැත්තේ" කියලා පසු ගිය කාලයේ ඇහුවා. ඒක

තමයි පසු ගිය කාලයේ කිව්වේ. නමුත් සැබෑ ප්‍රශ්නයක් තිබෙනවා. අද ත්‍රිරෝද රථ ලක්ෂ 4ක් තිබෙනවා. එතකොට ඒ ලක්ෂ 4ක් වූ ස්වයං රැකියා කරන අයගේ ආර්ථිකය පිළිබඳව අපි සිතිය යුතුයි. රජයක් විධියට අපි ඒ සඳහා බැඳිලා ඉන්නවා. අපි වැඩි වැඩියෙන් ත්‍රිරෝද රථ ගෙනැල්ලා ඒ ගණන ලක්ෂ හය හතක් කළොත් ඒ වැඩි වන ලක්ෂ 2ත් ඉවරයි, දැනට සිටින ලක්ෂ 4ත් ඉවරයි. එහෙම ළඟ බලා තීන්දු තීරණ ගන්නා රජයක් නොවෙයි අපි. වැඩිපුර සල්ලි තිබෙන අයට සහන දෙන්නේ ඇයි කියලා පසු ගිය කාලයේ ඇහුවා. සල්ලි වැඩිපුර තිබෙන අයට සහනය දීලා බදු ආදායම වැඩි කර ගත්තා. ඒකෙන් සංවර්ධනයක් කළා. ඒකයි අපේ රජයේ ප්‍රතිපත්තිය, මහින්ද චින්තන ප්‍රතිපත්තිය. ඒ නිසා මේ අවුරුද්දේ ඉදිරිපත් කරන බදු ප්‍රතිපත්තිය ඊ ළඟ අවුරුද්දේ වෙනස් වෙන්න පුළුවන්. වෙනස් විය යුතුයි. මේක නීතියක් නොවෙයි. ඒ වාගේම බදු පැනවීමේදී ආර්ථික වශයෙන් එකතු කරන මුදල විතරක් නොවෙයි අපට බලපාන්නේ. ඉදිරි අනාගතය පිළිබඳව, පරිසරය පිළිබඳව, අනිවාර්යයෙන්ම ඒ සෑම අංශයක් පිළිබඳවම සිතා බලා තමයි බදු ප්‍රතිපත්ති අපේ රට තුළ ක්‍රියාත්මක කරන්නේ. දෙමුහුං වාහන සම්බන්ධයෙන් සියයට 38ක බදු සහනයක් ලබා දුන්නා. පසු ගිය අවුරුදු කිහිපය තුළ බැලීමේදී වැඩි ධාරිතාවක් තිබෙන වාහන විශාල ප්‍රමාණයක් මේ රටට ගෙන ආවා. ඒ විධියට අපි ලබා දුන් බදු සහනය තුළින් වැඩි ධාරිතාවක් සහිත වාහන ගෙන ආවාට පස්සේ වැඩි ඉන්දන පරිභෝජනයක් සිදු වෙනවා. ඒ වාගේම පරිසර හිතකාමී පැත්ත ගැන බැලුවත් අඩු ධාරිතාවක් තිබෙන වාහනවලට වඩා වැඩි ධාරිතාවක් තිබෙන වාහනවලින් පරිසර හිතකාමී බව තවදුරටත් අපට අවාසි සහගත තත්ත්වයකටයි සිද්ධ වෙන්නේ. එම නිසා වැඩි ධාරිතාවක් තිබෙන වාහන ආනයනය කිරීම අධෛර්යවත් කිරීම සඳහා සහ අඩු ධාරිතාවක් තිබෙන වාහන සිත් ගන්නා සුළු ආකාරයෙන් දිරි ගැන්වීම සඳහා තමයි මේ නව සංශෝධනය ක්‍රියාත්මක කළේ. එම නිසා අපි මේ තීන්දු තීරණ ගන්නා අවස්ථාවේදී ඉතාමත් වග කීමකින් යුතුව, වගකිව යුතු රජයක් විධියට අපි බොහොම පැහැදිලිව ඒ තීන්දු තීරණ අරගෙන තිබෙනවා. ඒ වාගේම අද රථ වාහන සංඛ්‍යාව පිළිබඳව ගත්තොත්, 2007 දී මුළු ජනගහනයෙන් සියයට 8ක් විතර තමයි පාරිභෝජන වාහන තිබුණේ. අද ඒක සියයට 12ක් පමණ දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒක ප්‍රශ්නයක්. අපේ රට වාගේ ජන ඝනත්වය අඩු රටක ශීඝ්‍ර ලෙස වාහන වැඩි වුණාම අනිවාර්යයෙන්ම අපට සමාජ ප්‍රශ්නවලටත් විවිධ ආකාරයෙන් මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඔබට මතක ඇති 2007 වර්ෂයේදී කොළඹ නගරයේ one-way traffic system එක අපි introduce කළා. විපක්ෂය පළමුවැනි සතියේම ඒකට බැන්නා. ඒ වාහන තදබදය තිබුණු වෙලාවේ මේ one-way system එක "හොඳ නැහැ, වැරැදියි" කියලා ඒ අයගෙන් voice-cut අරගෙන පෙන්වනවා ඒ දවස්වල අපි විවිධ මාධ්‍යවල දැක්කා. අපි ඒකට ඇහුම්කන් දුන්නේ නැහැ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩි දෙකක කාලයක් දෙන්න.

එම නිසා අද ඒක ඉතාමත් සාර්ථක වැඩ පිළිවෙළක්. ඒ වාගේම වාහනවල දුම් පරීක්ෂා කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. අද ඒක සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. මම මේ පිළිබඳව විතරක් කියන්නම්. බෝ වන රෝගවලින් තමයි අපේ රටේ ඉතිහාසයේ වැඩිම පිරිසක් මිය ගියේ.

අද මුළු ලෝකයේම ඒක වෙනස් වෙලා තිබෙනවා. හෘදයාබාධ, පිළිකා සහ ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝග නිසායි අද වැඩියෙන් මිය යාම් සහ රෝහල්ගත වීම් සිද්ධ වන්නේ. එම නිසා කොළඹ නගරයේ 2007 අවුරුද්දේ පාරිසරික වශයෙන් කරන ලද සමීක්ෂණ අනුව -මේ වාර්තාවේ තිබෙන විද්‍යාත්මක වචන අනුව- එක ඝන මීටරයකට ක්ෂුද්‍ර අංශු මයික්‍රොග්‍රෑම් 80ක් තිබිලා තිබෙනවා, පරිසර හිතකාමී නැති ඒවා. එතකොට රථ වාහන සැලැස්ම සහ දුම් පරීක්ෂා කිරීම යනාදී මේ කටයුතු නිසා අද පරිසර අමාත්‍යාංශය විසින් නිකුත් කරන වාර්තාවේ ඒක 60 දක්වා අඩු වෙලා තිබෙනවා. අප පාර්ලිමේන්තුව තුළින් මේ ගෙනෙන රෙගුලාසි හා නීතිරීති නිසා මේ විධියේ යහපත් ප්‍රතිඵල ඇති වෙලා තිබෙනවා. අද කියනවා මේ දුම් පරීක්ෂා කිරීම තුළින් ජනතාවට බරක් පැටවෙනවා කියලා. විපක්ෂය කියන්නේ ඒකයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Now please wind up. Your time is over.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
එම නිසා මේ සෑම කටයුත්තක් පිළිබඳවම අපි කෙටිකාලීනව බලලා නොවෙයි තීන්දු තීරණ ගන්නේ. මේ රටේ වග කිව යුතු රජයක් විධියට මේ රටේ අනාගතය පිළිබඳව සහ මේ සෑම අංශයක් පිළිබඳවම බලලා තමයි මේ තීන්දු තීරණ ගන්නේ කියන එක ඉතාමත් වග කීමකින් යුතුව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you very much. The next speaker is the Hon. Ravi Karunanayake.

Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Presiding Member, whether I am fortunate or unfortunate, every time I speak, you are in the Chair.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

It is very fortunate.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I hope I will be able to have a more compassionate approach.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

You will have abundant good luck.

[අ. භා. 4.30]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාව පාවිච්චි කර ගන්නවා රටේ ආර්ථිකය ගැන වචන ස්වල්පයක් කථා කරන්න. මීට පෙර කථා කරපු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමා ආර්ථිකය මේ වාගේ තත්ත්වයක පවතිද්දී කොහොමද අමාරු තීන්දු ගන්නේ කියන එක පෙන්වලා දුන්නා. නමුත් එතරම් අමාරු තත්ත්වයක් නොවෙයි, අද මේ තිබෙන ආර්ථික වාතාවරණය තුළ මීට වැඩිය ප්‍රායෝගික, බය නැති, රට වෙනුවෙන් ගන්න තිබෙන තීන්දු ගන්න තිබෙනවා. මේක තමයි තිබෙන ප්‍රශ්නය. අද ආර්ථිකයේ පෙනෙන විධියට ඉතාමත් අමාරු තත්ත්වයක් තමයි තිබෙන්නේ. නමුත් ඊට වැඩිය හුඟක් බැරෑරුම් තත්ත්වයක් අද රටේ ආර්ථිකයේ ගොඩ නඟ්ගවලා තිබෙනවා කියන එක මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි.

දැන් මම කොටස් වෙළෙඳ පොළ සම්බන්ධයෙන් කථා කරන්නම්. අද මෙතැනදී නියෝග තුනක් ගැන කථා කරනවා. ඊට පස්සේ මුදල් පනත යටතේ නියෝගය සම්බන්ධයෙන්, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝගය සම්බන්ධයෙන්, රේගු ආඥාපනත යටතේ යෝජනාව සම්බන්ධයෙන් ආදී නොයෙක් ඒවා කථා කරනවා. ඉතින් මම හුදකලාවේ මේ එකක් සම්බන්ධයෙන් කථා කරන්නේ නැතිව සමස්තයක් වශයෙන් රටේ ආර්ථිකය ගැන කථා කිරීමට තමයි මම මේ අවස්ථාව උපයෝගි කර ගන්නේ. ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමා ත්‍රිරෝද රථ ගැන කථා කළා; ඒවායින් කරන සේවය ගැන කිව්වා. දැන් මේවා එක්සත් ජාතික පක්ෂයත්- [බාධා කිරීමක්] ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමනි, කනගාටුයි. ඔබතුමා කිව්වා මොනවාද කරන්නේ කියලා. මේ ත්‍රිරෝද රථ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ ගෙනාපු දේවල්. ජංගම දුරකථන, මේවා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ ගෙනාපු ඒවා. ඒ වාගේම රූපවාහිනී, BPO. එක්සත් ජාතික පක්ෂය 1977 දී සංවෘත ආර්ථිකය විවෘත කිරීමෙන් මේවා මේ රටට හඳුන්වා දීලා මොනවාද කළේ කියන එකයි බලන්න ඕනෑ. දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආර්ථිකයේ මීට වඩා ලොකු පෙරළියක් ඇති කරන්න ඕනෑ. අද ලෝකය 1977 ඉඳන් අද වෙන කොට අවුරුදු 35ක් විතර ගිහින් තිබෙනවා. මීට වැඩිය ලොකු පෙරළියක් ඇති කරන්න අවශ්‍යයි. අපි එදා හිටපු ගල් යුගයේ ඉඳගෙන ආර්ථිකය ඉදිරියට ගෙන යන්න බැහැ. අද ඊට වැඩිය ලොකු වෙනසක්, පෙරළියක් ඇති වෙලා තිබෙන අවස්ථාවක මීට වැඩිය ඉදිරියෙන් කටයුතු කරන්න අවශ්‍යයි. මේ සම්බන්ධයෙන් තමයි අද රටේ කථා කරන්නේ. අද BPO කියන්න පුළුවන්. සේවා අංශයෙන් දියුණු වෙලා තිබෙනවා. මේවා තමයි අපි ඉදිරියට අරගෙන යන්න අවශ්‍ය වන්නේ. මේ ශක්තිය රටේ අභිවෘද්ධියට පාවිච්චි කරන්න අවශ්‍යයි. අද ප්‍රාන්ත එකතු වෙලා රටවල් එක්ක තරග කරන අවස්ථාව ඇවිල්ලායි තිබෙන්නේ. නමුත් මේ සම්බන්ධයෙන් ලංකාව හුදකලාව ගමන් කරන්නේ.

We are an island of prosperity in an ocean of poverty. But, the reality is the other way round. We are in an ocean of prosperity in an island of poverty. That is the difference. The Hon. Vasudeva Nanayakkara, I am sure you are itching to say something in rebutting to that. But, the reality is that. ඒක තමයි ඇත්ත තත්ත්වය. අපේ මේ පුංචි ලංකාවේ අපි කොච්චර හොඳද, අරකද, මේක වනවාද කියලා නොවෙයි බලන්න ඕනෑ. අපේ රටේ සමස්ත ජනතාවගේ ආර්ථික අභිවෘද්ධිය සඳහා කොහොමද වැඩ කටයුතු කරන්නේ? ඒක පුද්ගල ආදායම 2,300යි, 2,400යි කියලා කථා කළාට හරි යනවාද? අද පොලිසියේ ඉන්න අභිංසක constable කෙනෙකුටවත් රුපියල් 17,000ක් හම්බ වන්නේ නැති අවස්ථාවක ඒක පුද්ගල ආදායම රුපියල් 24,000ක් හම්බ වනවා කියන එක මොන විහිළු කථාවක්ද?

දැන් පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් කියන්නේ මොකක්ද? වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, මේකට උත්තර දෙන්න හොඳම එක්කෙනා ඔබතුමා තමයි. සමාජවාදී ඇමතිතුමා අද මොනවාද කියන්නේ? නිදහස් වෙළෙඳ කලාපයේ රොෂෙන් චානකව මරලා. මේ ගැන වචනයක් කථා කරන කොට ඒකට එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු සමස්ත විපක්ෂයට බැනලා හරියනවාද? ජනාධිපතිතුමා ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ කිව්වා පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුපක් සම්බන්ධයෙන්. මේකේ සමස්ත අදහස වශයෙන් පෙන්වලා තිබෙන්නේ, විශ්‍රාම වැටුපට ආණ්ඩුවෙන් සල්ලි දාලා, ආණ්ඩුවෙන් තමයි මේක ගෙන යන්නේ කියලා. ඇත්ත තත්ත්වය මොකක්ද? වාසුදේව නානායක්කාර සමාජවාදී ඇමතිතුමනි, ඔබතුමාගෙන් මම මේ ප්‍රශ්නය අහන්නේ. මොකද, මම මිත්‍රශීලීව දන්නවා ඔබතුමා දරන දේශපාලන මතය. තමාගේ වම් සාක්කුවේ තිබෙන සල්ලි ටික අරගෙන දකුණු සාක්කුවට දමන්න තමාට ආණ්ඩුවක් ඕනෑද? මහන්සි වෙලා ලබා ගෙන, සියයට 2ක් හාම්පුතාගෙන් ලබා ගෙන, සේවක අර්ථසාධක අරමුදලේ, සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලේ තිබෙන සල්ලි අවුරුදු ගණනාවක් පාවිච්චි කරන්නේ නැති ඒවා හොරකම් කර ගෙන, ආණ්ඩුව ඊට පස්සේ බොරුවට සල්ලි දැම්මාය කියලා පෙන්නා ගෙන මේ අවුරුදු 10කට පස්සේ කරන විජ්ජාවද විශ්‍රාම වැටුපක් කියන්නේ? ලජ්ජා නැද්ද? මේක සේවක අර්ථසාධක අරමුදල වෙන්න පුළුවන්, සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල වෙන්න පුළුවන්; gratuity එක වෙන්න පුළුවන්; golden handshake එකේ අවුරුදු ගණනාවක් තිබුණු සල්ලි වෙන්න පුළුවන් මේවා තමයි එක්සත් ජාතික පක්ෂය ලබලා දුන්නේ. දැන් ඒකට සම කරන්න ගිහිල්ලා අන්තිමට විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවෙන් එළියට ගන්න වෙලා තිබෙනවා. ඒකයි තත්ත්වය. බොරුවට තව ටික කලක් ගිහිල්ලා මේකට අරහෙට කථා කළා; මෙහෙට කථා කළා කියලා ගෙනැල්ලා හරි යන්නේ නැහැ. විශ්‍රාම වැටුපක් කියන්නේ ආණ්ඩුවෙන් සල්ලි ලබා දෙන දෙයක්. ඒකට කවුරුවත් විරෝධතා දක්වන්නේ නැහැ. නමුත් අපේම EPF, ETF අරගෙන වම් සාක්කුවේ තිබෙන දේ දකුණු සාක්කුවට දමන්න ආණ්ඩුවක් ඕනෑ නැහැ. අපි සියලු දෙනාම EPF, ETF ගන්න පුද්ගලයන්. මෙන්න මේ විජ්ජාව නිසායි අද රොෂෙන් චානක නැති වෙලා තිබෙන්නේ. අද එක්සත් ජාතික පක්ෂයට, ජනතා විමුක්ති පෙරමුණට බැණලා මේකෙන් ගැලවෙන්න පුළුවන්ද? එදා බලන්න මරණය දවසේ මොනවාද කළේ? පොර පිටියක් බවට මාරු වුණා. ඒ පල්ලිය ඇතුළේ වුණු දේවල් බලන්න. ඒවා ගැන මම කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. අඩු ගණනේ ඒ මරණයෙන් පාඩමක් ඉගෙන ගන්න ඕනෑ. මේ අමානුෂික ආණ්ඩුව මෙහෙමද මේ විශ්‍රාම වැටුප්

ගෙනෙන්න හදන්නේ? මේක කාගෙවත් අවශ්‍යතාවක් නොවෙයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අවශ්‍යතාව. 2009 මැයි මාසයේ ඔබ සියලු දෙනාම ගිහිල්ලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් සල්ලි ඕනෑය කිව්වා. ඒ අවස්ථාවේදී රංජිත් සියඹලාපිටිය ඇමතිතුමාත්, අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාත් ලියුම් ලියුවා. ඒ ලියපු ලියුම්වල අඩංගු කරුණු මොනවාද? ඒවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි අනුව ලියපු ලියුම්. ඊට පස්සේ 2010 ජූලි මාසයේ 09 වනදා සරත් අමුණුගම ඇමතිතුමාත්, අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමාත් කියනවා, "අපි මෙන්න මේවා කරනවා" කියලා. ඒ කරන එකේ එක කොටසක් තමයි Employees' Pension Benefits Fund එක ඇති කරන එක. සේවක අර්ථසාධක අරමුදලෙත්, සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලෙත් - EPF, ETF - ඒ සල්ලි පාවිච්චි කරන එක ගැන අපේ එදා හිටපු කම්කරු ඇමතිවරු බොහොම ආරක්ෂා සහිතව ඒ පනත් ඇති කරලා වැඩ කරන ජනතාවගේ -ඔබගේත්, මගේත්- දායකත්වයට ආරක්ෂාවක් ලබා දුන්නා. එවැනි ආරක්ෂාවක් ලබා දුන්නු නිසා අද එතරම් සල්ලි එහෙට මෙහෙට පාවිච්චි කරන්න බැහැ. It is a captive source; a captive fund. But, you can use it with certain parameters. දැන් ආණ්ඩුවට ප්‍රශ්නයක් තිබෙන නිසා ඒ ගොල්ලන්ට ඕනෑ *carte blanche* එකක් විධියට මේක පාවිච්චි කරන්න. 2012 දී බිලියන 1,250ක් ගෙවන්න තිබෙනවා ණය වශයෙන්. මේක කොහොමද ගෙවන්නේ? අපට සාමාන්‍යයෙන් අදායම ලැබෙන්නේ බිලියන 1,050යි. මේ පොලී සහ ප්‍රාග්ධන වියදම්වලටම 1,250ක් 2012 දී ගෙවන්න ඕනෑ. ඉතින් කොහොමද මුදල් හොයන්න අවශ්‍ය වන්නේ? සේවක අර්ථසාධක අරමුදලේ වට්ටෝරුව අනුව ඔන්න තිබෙනවා අවස්ථාවක්. සේවක අර්ථසාධක අරමුදලේ, භාරකාර අරමුදලේ තිබෙන මුදල් ප්‍රමාණය pension එකට මාරු කරන්න හැකියාව ගන්න පුළුවන් නම් මෙන්න මේ සල්ලි පාවිච්චි කරන්න පුළුවන් ඒ ණය ටික ගෙවන්න. මේක නේ ඇත්ත අර්ථය.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

සේවක අර්ථසාධක අරමුදලෙන් pension එකට මාරු කරන්න පුළුවන් නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගන්න බැහැ නේ. ඒක පාවිච්චි කරන්න පුළුවන් වන්නේ වැඩ කරන ජනතාවගේ අභිවෘද්ධියට. Pensions Fund එකක් ආවාම එක රටේ savingsවලට එකතු වනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

පාවිච්චි කරන්න ගන්නේ pension එකට- [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමා නොදන්නවා නම්, වැදගත් මහ ඇමතිවරයෙක් වශයෙන් කටයුතු කරපු, අද ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් වශයෙන් කටයුතු කරන -ජ්‍යෙෂ්ඨ තනතුරු ලබන අය නොවෙයි, වැඩ කරන්න පුළුවන් ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් වශයෙන් කටයුතු කරන- රෙජිනෝල්ඩ් කුරේ ඇමතිතුමාගෙන් අහන්න. මොකද, ඒ සල්ලි පාවිච්චි කරන්න පුළුවන් වැඩ කරන ජනතාවගේ අභිවෘද්ධියට. මේක දැන් කරන්න බැහැ. එදා හිටපු කම්කරු ඇමතිවරුන්ව අපි අගය කරන්න ඕනෑ. [බාධා කිරීමක්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Pensions Fund එක කුමකටද යොදා ගන්න අවශ්‍ය? මොකක්ද නීතිය?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මොකක්ද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

Pensions Fund එක- [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

The Pension Fund is a pooled fund that can be used by the Government for just normal expenditure in any way.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

How is that? Where is that provision?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

If you do not know-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

No, show me the provision.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I do not need to teach you.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

You cannot make a bare statement -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I am making a very direct accusation on the Government as a person knowing what is there.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

You cannot do that unless you show under which provision it comes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

A common Consolidated Fund can be used for anything. [*Interruption.*] Hon. Minister, I had respect for you. You go to the Ministry of Finance and Planning and learn your ABCs without shouting. I am not here to teach you the ABCs of finance. I am basically saying that a Consolidated Fund can be used for anything. A Pensions Fund gets into a Consolidated Fund unlike the EPF which is a specific fund. That is the difference. You do not understand that. You are trying to shift from a specific fund to a general fund. That was there in the letter to the IMF dated 9th July, 2010 signed by the Hon. (Dr.) Sarath Amunugama and Mr. Ajith Nivad Cabral.

අපට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පටි තද කර ගන්නටය කියනවා. නමුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලොක්කෝ පටි ලිහිල් කරලා ලෝකයේ පිස්සු කෙළිනවා. මේක ද අපට අවශ්‍ය වන්නේ? අපට පටි තද කර ගන්නටය කියනවා. [බාධා කිරීමක්] විහිළු කරලා; ජේනවා නේ නිව්යෝර්ක් තරු පහේ හෝටල්වල පිස්සු කළේ. මෙන්න මේ වාගේ අය තමයි ඔබේ ආණ්ඩුව එළවලා, ඊට පස්සේ පාවාඩ දාලා, හෝදලා, නටලා ආයෙත් මේ රටට ගෙන්වා ගත්තේ. එදා එළවන කොට කිව්වේ එක්සත් ජාතික පක්ෂයේ ඉන්නේ මේ වට්ටෝරු දෙන අය පිළිගත් අයය කියා. ගෙනාවාට පස්සේ මොනවා ද කියන්නේ? ඉතින් ඇමතිවරු මේවා කියන කොට බොහොම කැමති නැහැ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වට්ටෝරුවෙන් ඇති වුණු ප්‍රතිවිපාක මොනවාද? නිදහස් වෙළෙඳ කලාපවල තව තුන් දෙනෙක් හැංගිලා ද, නැති වෙලා ද, මැරිලා ද කියන ප්‍රශ්නය තිබෙනවා. සීදූවේ තව මළ කඳක් ලැබිලා තිබෙනවා. කොහෙන්ද, කින්දමන්ද කියා දන්නේ නැහැ. අපට මේවා අවුස්සන්නට අවශ්‍ය නම් අවුස්සන්නට තිබුණා. නමුත් අප වැදගත් විපක්ෂයක් වශයෙන් ඒ වාගේ දේවල් කරන්නට අවශ්‍යතාවක් නැහැ. ඔබේ ආණ්ඩුව ඒ දේවල් බොහොම හොඳට කර ගෙන යනවා. එම නිසා, එක්සත් ජාතික පක්ෂයට බැණලා, සමස්ත විපක්ෂයට බැණලා තමාගේ තිබෙන ප්‍රශ්න ටික යටපත් කර ගන්නට එපා. ඔන්න කියනවා වැරැද්දක් කළාය කියා පොලිස්පතිතුමා ඉල්ලා අස් වනවාය කියා. බොහොම හොඳයි. දිනුවාම ජනාධිපති ළඟට යන එක, මේවාගේ ප්‍රශ්නයක් ඇති වුණාම පොලිස්පති ළඟට යන්නේ ඇයි? දිනුවාම ඔන්න ජනාධිපති, ආරක්ෂක ලේකම්, ඇමතිවරු. හැබැයි ප්‍රශ්නයක් ඇති වුණාම ඒක පොලිස්පතිතුමාගෙන් නවතිනවා. මෙන්න මේ වාගේ බොරුව නේද මේ ආණ්ඩුව ගෙන යන්නට හදන්නේ? එතුමා තානාපතිවරයකු වශයෙන් තව සුමාන දෙක තුනකින් යනවා. කොහොමත් penison අරගෙන යන්නට හිටපු පුද්ගලයා. දැන් ආණ්ඩුව ඔහුව ඒ තැනට දානවා. ඒක වටිනවා ද? එහෙම නම් මිහින්එයාර් එක, මාර්ග සංවර්ධන අධිකාරිය වැනි ආයතනවල තිබෙන දූෂණ බැලුවාම ඇමතිවරු ඉල්ලා අස් වන්නට ඕනෑ නේ. අරක බොහොම හොඳයි. ආදර්ශයක් වශයෙන් අප මෙහෙම කළාය කියන අය දැන් මොනවා ද කියන්නේ? ගරුතර ස්වාමීන් වහන්සේත් ඉන්න මේ ආණ්ඩුවේ මේවා ගැන නිශ්ශබ්දව ඉන්නේ ඇයි ස්වාමීන් වහන්ස? මේවා අප මතක් කළාම අප දේශ ද්‍රෝහියෝ. ඕවා කරන අය දේශ ප්‍රේමියෝ. මේක ද අපට අවශ්‍ය වන්නේ? මා ස්වාමීන් වහන්සේ ගැන මතක් කළේ ගරුතර ස්වාමීන් වහන්සේ මෙතැන සිටිය නිසා මතක් කිරීමක් අවශ්‍ය නිසා. නිහඬව ඉන්නේ නැතිව ඒවා පෙන්වා දෙන එකේ වටිනාකමක් තිබෙන නිසායි මා මේ අවස්ථාවේදී මතක් කරන්නේ. කරුණාකර මින් පසුව හැම වැරැද්දකටම ඒ ඇමතිතුමා හෝ ඒ විෂය භාර තැනැත්තා ඉල්ලා අස්වනවා නම් හොඳ පූර්වාදර්ශයක්. නමුත් මේ එකකට විතරක් මේක කරලා ඊට පසුව ඒක අමතක වනවා නම් පාප කර්මයක්. මේක තමයි වෙන්නේ. [බාධා කිරීමක්] ඒක හය වෙන්න එපා. [බාධා කිරීමක්] ඕවා පක්ෂ ඇතුළේ තිබෙන ප්‍රශ්න. ඔබතුමන්ලාගේ ප්‍රශ්න අප හෙළිදරවු කළොත්? ඕකේ රාජපක්ෂලා එක පැත්තක, අගමැති තව පැත්තක, මෛත්‍රීපාල සිරිසේන ඇමතිතුමා තව පැත්තක, චන්ද්‍රිකා කුමාරතුංග ළඟ හිටපු ඔබතුමා දැන් වෙනින් පැත්තක. ඒවා ගැන ඇඟිලි ගහන්න එපා. ඒක භයානකකාරී තත්ත්වයක්. එම නිසා මා මතක් කරනවා කිසිම ප්‍රශ්නයක් නැහැ කියා. ඒවා එක්කත් අප වැඩ කරනවා. ඊට වඩා හොඳට අප නීති මාර්ගයෙන් පිළිතුරු පස්සෙත් ලබා ගන්නවා. හැබැයි කාටවත් පිස්සු කෙළින්න අපේ පක්ෂය ඉඩ දෙන්නේ නැහැයි කියන එක මා මෙහිදී වග කීමකින් කියන්න කැමතියි. තනතුරු එක්ක හඬා ගෙන යන ගමනක් අපට අවශ්‍ය වන්නේ නැහැ. [බාධා කිරීමක්] අපට අවශ්‍ය වන්නේ ජනතාවත් සමඟ මේ අමානුෂික ආණ්ඩුවට පහර එල්ල කිරීම මිස, ඒක රැක ගෙන තුරුළේ නට නටා ඉන්න ගමනක් නොවෙයි. [බාධා කිරීමක්] නැහැ. ඒ ටික ඔය පැත්තේ ඉන්නේ. අපේ පැත්තේ ඉන්නේ අප බොහොම ගරු කරන මන්ත්‍රීවරු. [බාධා කිරීමක්] මත වෙනස් වන්නට පුළුවන්. අනේ! ඔබතුමන්ලා ඕතැන උඩ පැන්නාට එදා "Yes, Madam" , "No, Madam" කිව්ව අය දැන් Madam බලන්න යන්නේත් නැහැ. දැන් අපට තමයි බලන්න තිබෙන්නේ. ඒ වාගේ නොවෙයි රේජිනෝල්ඩ් කුරේලා. ඔන්න මිනිස්සු. එදා හිටියා; අදත් ඉන්නවා, භය නැතිව. හැබැයි තනතුරු නැහැ. අප ගරු කරන සී.බී. දිසානායක මැතිතුමා කිව්වා මේ රටේ සිටින ලොකුම හොරු ටික Sri Lanka Cricket එකේ ඉන්නවාය කියලා. ඔන්න සුමාන දෙකකින් අවංක ඇමතිවරයා ඇරියා. හොරු ටික තවම එතැන. දැන් මොනවා ද කියන්නේ? [බාධා කිරීමක්] ඔබතුමාගේ තියෙන ඇමතිකමත් නැති කරන්නට නොවෙයි මා බැලුවේ. ඔබතුමාට ගරු කරන්නයි මා කිව්වේ. ඔබතුමා කළේ ඇත්ත ප්‍රකාශයක්. අපිත් ඒක කියනවා. අද මොනවාද සිද්ධ වෙලා තිබෙන්නේ?

**ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)

මම ඒ ගැන තර්ක විතර්ක කරන්නේ නැහැ, මා සී.බී. දිසානායක නොවන නිසා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඇමතිතුමනි, මම දන්නවා ඔබතුමා අවංකව ඒ වාගේ කැප කිරීමකින් කටයුතු කරන පුද්ගලයකු, ඇමතිවරයකු බව. විපක්ෂයේ අපි කුහක දේශපාලනයක් කරන්නේ නැහැ. හොඳ දේට හොඳයි කියනවා. අප මෙතැන නැඟිට්ටේ මේ රටේ ආර්ථිකය පාට කරලා කථා කරන්න නොවෙයි. මේක කොළ පාට, නිල් පාට, රතු පාට ආර්ථිකයක් නොවෙයි. මේ අපේ ආර්ථිකය. ඔබතුමන්ලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අපටයි ඒක හදන්න සිද්ධ වෙන්නේ. චන්ද්‍රිකා කුමාරතුංග සෘණ ආර්ථිකයක් හදලා, ආර්ථිකය බිමට වට්ටලා 2001 දී අපට දුන්නාම මාස හයෙන් මේ රටේ ආර්ථිකය හැදුවේ අපි. අපි දැන් හිතනවා ඇයි එහෙම හැදුවේ කියලා. මොකද, ආර්ථිකය එහෙම හදන්නේ නැතිව හිටියා නම් අද අපයි බලයේ සිටින්නේ. අප රට වෙනුවෙන් අන්න ඒ විධියට තමයි කටයුතු කරන්නේ. ඒ නිසා අප මේ අවස්ථාවේදී කියන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කරන දේවල් එක්ක- අද පඩි වැඩි කරන්නේ නැත්තේ ඇයි? මේ අලුත් ආණ්ඩුව පත් වුණාට පස්සේ-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පඩි වැඩි කළා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඇමති වෙන්න ඉස්සර වෙලා බෝඩ් එකක් අල්ලා ගෙන හිටියා "පඩි වැඩි කරව්" කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගිය ආණ්ඩුව කාලයේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ, ඔබතුමාට ඕනෑ නම් මම ඒ පත්තරය ගෙනැල්ලා දෙන්නම්. පඩි වැඩි කරන්න ඕනෑ කියලා ඔබතුමා බෝඩ් අල්ලා ගෙන හිටියා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්, ඉතින්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ අතරේ තමයි ඔන්න ඇමතිකමක් ලැබුණේ. දැන් සද්ද නැහැ. ඇමති මණ්ඩලයේ ඉඳගෙන කෑ ගහන්න, "කෝ ඒ 2,500?" කියලා. එදා රුපියල් 100ක් වැඩි කරන්න ඕනෑ කියලා එක්සත් ජාතික පක්ෂයට කෑ ගහලා කියපු ඇමති අද 2,500 අමතක කරන්නේ ඇයි?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අමතක කරන්න හේතු තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔන්න ඉතින්, ඕක තමයි කියන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ හේතු මතක් කරන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඇමතිකමේ ඉන්න කොට ඒවා අමතක කරනවා. ඔබතුමා ඔතැනට ගෙනාපු ඒ අහිංසක ජනතාව අමතක කරන්න එපා කියන එක තමයි මූලික-[බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පුටුවට ආසයි නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, තමාගේ පුටුවට ආදරෙයි. ජනතාවට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කමක් නැහැ කියන එකයි-[බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විපක්ෂයේ ඉන්න කොට ජනතාවට ආදරෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විපක්ෂයේ ඉන්න කොට එහෙම කියනවා; ආණ්ඩු පක්ෂයට ගියාම තව විධියකට කියනවා; අපේ එහෙම වෙනසක් නැහැ. හොඳ දෙයක් නම් අපි ඒකට හොඳයි කියනවා; නරක නම් නරකයි කියනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මොන බොරුද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තෙල් මිල අඩු කරන්න ඔබතුමායි මමයි උසාවි ගියා. අඩු කළාද? දැන් මොනවාද කියන්නේ? තෙල් මිල 69 තිබුණාට කමක් නැහැ. 125ට දීලා කළු කඩ ව්‍යාපාරය වාගේ වැඩ කළාට කමක් නැහැ. ඔබතුමායි අපයි දෙගොල්ලන්ම එකටයි ගියේ එකම නඩුවට.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Standard Chartered Bank හොරකම පෙන්වන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් ගන්න කෝ. ඇයි? මොනවාද කරන්නේ? ඔබතුමා Standard Chartered Bank එකට රතු කාපට් දාලා ඒ අය නළවනවා. අනෙක් අයට ප්‍රශ්න ඇති කරනවා. මේ විශ්‍රාම වැටුප ගැන කවුරුත් ඇහුවේ නැහැ. නමුත් පඩි වැඩි කිරීමක් ගැන ඇහුවා නේ? අපි සරත් ෆොන්සේකා මහත්මයා අපේ පොදු අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් කළා. අපි කිව්වා, -එක්සත් ජාතික පක්ෂය වශයෙන් අපි, පොදු අපේක්ෂකයා වශයෙන් එතුමා කිව්වා- "අපි රුපියල් 10,000ක් දෙනවා" කියලා. ඔබතුමන්ලා හිනා වුණා අපට. අපි කිව්වා, "මෙන්න මෙහෙම තමයි බිලියන 134 හෙවත් කෝටි 13,400 ලබා දෙන්නේ" කියා. එහෙම දෙන්න බැහැ කියලා ජනාධිපතිතුමා මොනවාද කිව්වේ? "අනේ, අපේ නායක ස්වාමීන් වහන්ස, මේ අය කරන බොරුව මට කරන්න බැහැ. මම 2010 ජනවාරි මාසයේ ඉඳන් රුපියල් 2,500ක් දෙනවා" කියලායි කිව්වේ. එහෙම කිව්වා නේද? තිබුණු ශත පහත් ගත්තා නේද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
තිබුණු එක ගත්තාය කියන්නේ මොකක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon.  Ravi Karunanayake)
එදා රුපියල් 100 වටිනාකම අද රුපියල් 10යි කියලා ඔබතුමා පාර්ලිමේන්තුවේදී උත්තර දීලා තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ක්‍රය ශක්තිය අඩු වුණා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon.  Ravi Karunanayake)
ක්‍රය ශක්තිය අඩු වුණා. ඒක තමයි ඉතින්. රුපියල් 2,500 දෙන්නේ නැතිව කොහොමද ජීවත් වෙන්නේ? එදා රුපියල් 100 වටිනාකම අද අඩු වෙලා තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අමාරුයි. අප කවුරුත් අමාරුවෙන් ඉන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon.  Ravi Karunanayake)
ඇමතිවරුන් වශයෙන් ඔබතුමන්ලාට රුපියල් ලක්ෂයක් වැඩි කර ගන්නවා. ඒ අහිංසක වැඩ කරන අයට පඩි වැඩි කරලා නැහැ. [බාධා කිරීමක්] ඇමතිවරුන්ගේ පඩිය වැඩි කරලා නැද්ද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon.  Ravi Karunanayake)
වැඩි කළා නම් අහිංසක ජනතාවගේ රුපියල් 2,500 වැඩි කරන්න බැරි වන්නේ ඇයි?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
වැඩි කරන්න ඕනෑ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon.  Ravi Karunanayake)
ලජ්ජා නැතිව තමන්ටම බෙදා ගන්නා දේශපාලනඥයන් නොවෙයිද ඔබතුමන්ලා? මම කියන්නේ වාසුදේව නානායක්කාර ඇමතිතුමාට විතරක් නොවෙයි. මුළු කැබිනට් එකටම; හැටහුටහමාරක් ඉන්න ඇමති මණ්ඩලයට. ඒක තනිවම ඔබතුමා බාර ගන්න එපා. මා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඔබතුමා ළඟ ඉඳ ගත්ත ඒ ස්වරූපයෙන් තමයි මමත් වුට්ටක් ආවේග ශීලිව කථා කරන්නේ. මතක තියා ගන්න, මෙන්න මේ විධියට තමන්ට බෙදා ගෙන ජනතාව අමතක කරන මේ යුගයට වැඩි කල් යන්න ඉස්සර වෙලා තිත තියනවා කියන එක මම මේ අවස්ථාවේදී වග කීමකින් කියන්න කැමැතියි. දැන් බලන්න, එක පැත්තකින් ඔබතුමන්ලා කියනවා, රක්ෂා ඇති කරනවා කියලා. වරායේ 14,000ක් ඉන්නවා. හම්බන්තොට වරායක් ඉදි කරනවා. ඡන්දයට ඉස්සර වෙලා අයදුම් පත් ලක්ෂයක විතර ප්‍රමාණයක් ලැබුණා. දැන් VRS එකක් දමනවා කොළඹ වරායට 3,500ක් අහක් කරන්න කියලා. කාට කරන විජ්ජාවද මේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මොන විජ්ජාවක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon.  Ravi Karunanayake)
ඇයි, ඔබතුමන්ලා මෙතැනින් 3,500ක් අහක් කරනවා. අරහෙන් පන්සියයක් ගන්න හදනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඉතින්, ඒක තමන්ගේ කැමැත්ත නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon.  Ravi Karunanayake)
මොකක්ද කැමැත්ත?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
"ස්වේච්ඡාවෙන්" කියන්නේ ඒක නේ. VRS කියන එක දන්නේ නැද්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon.  Ravi Karunanayake)
ඔබතුමන්ලා 3,500ක් අහක් කරලා 500ක් අර ගෙන කොහොම කරන්නද? ඡන්දයට ඉස්සර වෙලා ලක්ෂයක අයදුම් පත්‍ර හැම තැනම අර ගෙන ගියා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
VRS ගණන් ගන්න එපා ඕකට.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon.  Ravi Karunanayake)
වරායවල් තිබෙනවා හැම කොනකම. අද හම්බන්තොට වරායට එක බෝට්ටුවක් වත් ඇවිල්ලා තිබෙනවාද? නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එක බෝට්ටුවක් ඇවිල්ලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon.  Ravi Karunanayake)
ආ, ඔව්. එක බෝට්ටුවක් ඇවිල්ලා තිබෙනවා. ඒකත් ආවේ මෙන්න මේ වාගේ එකක් තිබෙනවා කියලා පෙන්වන්නයි. ඒ, හරින් ප්‍රනාන්දු අභියෝග කරපු නිසා. ඊට පස්සේ-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බෝට්ටු දෙකක් ආවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බෝට්ටු දෙකක් ආවා ලු. දිය බරියෝ ගණනාවක් යනවා ලු. ඉතින් ඒවා නොවෙයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
බෝට්ටු නොවෙයි නැව් එන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පොලී වශයෙන් විතරක් මිලියන පන්දාහක් අවුරුද්දකට ගෙවනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
( மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැව් ළඟට ඇවිල්ලා යනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අවුරුද්දකට මිලියන පන්දහසක් පොලී වශයෙන් ගෙවනවා. මිලියන පන්දාහක් ගෙව්වට කොහෙන්ද ඒ ආදායම උපයන්න පුළුවන් වන්නේ? කොළඹ වරායෙන්ද? අද කොළඹ වරායේ අලාභය මිලියන අට දාහයි. දැන් මේක නැහැය කියන්නේ කවුද? මම මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් අහලා තිබෙනවා. දෙපාර්තමේන්තු, සංස්ථා කොම්පැනි ඔක්කෝම ආයතන 264ක් තිබෙනවා. ඒකෙන් 168ක් අලාභයට යන කොම්පැනියි. අලාභයට යන කොම්පැනිවලට තමයි ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ නායකත්වය දීලා තිබෙන්නේ. ඉතින් මොකක්ද මේ වෙලා තිබෙන්නේ? අර්ථිකය හදනවාද, නැති කරනවාද? ඒ වාගේම තමයි ලංකා විදුලි බල මණ්ඩලය. ලංකා විදුලි බල මණ්ඩලය VRS එකක් දාලා තිබෙනවා. සේවකයෝ පහළොස්දාහක් ඉන්නවාලු. ඒක හත්දාහට අඩු කරන්න ඕනෑ ලු. මොනවාද මේ කථා කරන්නේ. සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කියනවා එතුමාට අලාභය මිලියන 38,800යි ලු. විදුලි බල ඇමති කියනවා, "මගේ පාලනය යටතේ විදුලිබල මණ්ඩලය ලාභය මිලියන 1,200කට වෙනස් කර තිබෙනවා" කියලා. දෙක අඩු කළාම අලාභය මිලියන 37,600යි. කොයි දෙයියන්ටද කියන්නේ? ඒ වාගේම තමයි BOI එක. මෙන්න මා ළඟ තිබෙනවා 70 දෙනෙකුට VRS එක ඉදිරිපත් කරපු ලිපිය. අප්‍රේල් මාසයේ 22වැනි දා ලියුමක් යවමින් කියනවා, "කියන්න අපි VRS එකක් දෙනවාය" කියලා. ඊට සුමානෙකට පස්සේ කියනවා, "මේකට අපට කැබිනට් අනුමැතිය අවශ්‍යයි" කියලා. අද වෙන තුරුත් කැබිනට් අනුමැතිය දීලා නැහැ. මේ අය ගෙදර පඩි නැතුවයි ඉන්නේ. ඒ ලැබුණු ලිපිය සමස්ත ජනතාවට පෙන්වලා දෙන්න ඕනෑ නිසා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම **සභාගත*** කරනවා.

---------------------------------

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

මෙතැන කැබිනට් ඇමතිවරු ඉන්නවා. කරුණාකරලා මේවා පෙන්වලා දෙන්න. BOI එකෙන් කරන මෙන්න මේ වාගේ දේවල් නිසා තමයි ගිය අවුරුද්දට වැඩිය අඩු ආයෝජන ප්‍රමාණයක් මේ අවුරුද්දේ ඇවිල්ලා තිබෙන්නේ. මට SMS එකක් ආවා, මිලියන 836ක ආයෝජන අත්සන් කරලා තිබෙනවාය කියලා. නමුත් සැබෑ මට්ටමින් කොපමණ මුදලක් ඇවිල්ලා තිබෙනවාද? මිලියන 132යි. මෙන්න මෙහෙම තමයි ඇමතිවරු ගණන් එක්ක විජ්ජා කරලා අන්තිමට බොරුවක් කරන්නේ. ඇඟලුම් කර්මාන්තයට සම්බන්ධ "ජැෆ්" ආයතනය කියලා තිබෙනවා මේ ආණ්ඩුව කියලා තිබෙන සංඛ්‍යා ලේඛන ඒ අය පිළිගන්නේ නැහැය කියා. ආණ්ඩුවේ මහ බැංකුව කියනවා සියයට 60ක වර්ධනයක් තිබෙනවාය කියලා. "ජැෆ්" ආයතනය කියලා තිබෙනවා ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ වර්ධනය සියයට 23කින් අඩු වෙලා තිබෙනවාය කියලා. ඉතින් කවුරු කියන එකද පිළිගන්න අවශ්‍ය වන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ මම කාරුණිකව කියන්නේ මේ ඇමතිවරුන් අපට සැබෑ තත්ත්වය -ඇත්ත- කියන්න අවශ්‍යයි කියන එකයි. දැන් බලන්න සරත් ෆොන්සේකා අද හිර ගෙදර ඉන්නවා. කරපු වැරැද්ද මොකක්ද? ඥාතියෙක් සමඟ ව්‍යාපාරයක් කරලා 2,35,000ක ප්‍රශ්නයක් තිබුණාය කියන එකයි. අනෙක් පැත්තේ කේ.පී.-

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
ඔබතුමා ඔය කථා කරන දේ අද දින කරන විවාදයට තිබෙන සම්බන්ධය මොකක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකක්ද මහත්තයෝ? හැබැයි එතුමාත් එක්ක තර්ක කරන්න බැහැ. එතුමා විතරයි, මුළු පාර්ලිමේන්තුවෙන්ම මොළය සම්බන්ධව certificate එකක් අරගෙන තිබෙන එකම මන්ත්‍රීවරයා. ඒක ලැබිලා තිබෙන නිසා එතුමාත් එක්ක මට තර්ක, විතර්ක කරන්න බැහැ.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා හතර සැරයක්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එකක් ගැන කිව්වා. මම අහගෙන හිටියේ. එතකොට මගේ වරප්‍රසාද කඩ වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමාට certificate එක තිබෙන නිසා මට එතුමාත් එක්ක තර්ක, විතර්ක කරන්න බැහැ. මොකද, එතුමාට විතරයි ඒ certificate එක තිබෙන්නේ. අපට ඒක නැහැ. එතුමත් දැන් අපේ පැත්තට කථා කරන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, all are wise men here.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් ඔබතුමාත් මගේ පැත්තට කථා කරන්නේ. බොහොම සතුටුයි. ඔහොම තමයි වයස්ගත වෙන කොට පෙරළි ඇති වෙන්නේ. ආණ්ඩු පෙරළෙන්න ළං වෙන කොටත් ඔය වාගේ ස්වරූප ඇති වෙනවා.

ඊළඟට, එලියන්ත වයිට්. ඔන්න! තවත් පට්ටපල් හොරෙක් කියලා අපි කියන්න ඕනෑ නැහැ. ඒක උපුල් තරංග කියනවා. අද උපුල් තරංගට මොනවාද වෙලා තිබෙන්නේ? ඔහුට එංගලන්ත සංචාරයට යන්න බැහැ. උපුල් තරංග කියනවා, මම එලියන්ත වයිට්ගෙන් බෙහෙත් ගත්තා. කවුද ගන්න කිව්වේ? ජනාධිපති අරමුදලෙන්. වෛද්‍ය ගීතාංජන මෙන්ඩිස් දැන් ඒක ඔප්පු කරලා තිබෙනවා. ආණ්ඩුව කියලා තිබෙනවා quack doctorsලා ඒවා ගැන පස්සෙන් දුව දුව යනවාය කියලා. ඇයි මෙයා පස්සේ යන්නේ නැත්තේ? මේ දොස්තර ජනාධිපති අරමුදලෙන් මිලියන 300කට වැඩිය පාවිච්චි කරලා තිබෙනවා. අද උපුල් තරංගට එංගලන්ත සංචාරයට යන්න බැරි වෙලා තිබෙන්නේ එතුමන්ගෙන් ගත්ත බෙහෙත් නිසා කියලා වෛද්‍ය ගීතාංජන මෙන්ඩිස් කියනවා. ඇයි නිහඬව සිටින්නේ? ඇයි ඔය ඇමතිවරුන්ට කථා කරන්න බැරි වෙන්නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මොකක්ද සම්බන්ධය?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකක්ද සම්බන්ධය? අපේ සල්ලි. [බාධා කිරීම්] උපුල් තරංග කියන්නේ ඔබතුමාගේ-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හොරකම් කරලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එලියන්ත වයිට් කියන්නේ කවුද? ජනාධිපති අරමුදලේ සල්ලි ලබා ගන්න පුද්ගලයා. උපුල් තරංග කියන්නේ අපේ ක්‍රිකට් වීරයෙක්. අද උපුල් තරංගට එංගලන්ත සංචාරයට යන්න බැරි හොර දොස්තරගෙන් බෙහෙත් ගත්ත නිසායි. ගුලි අරන්. කොට උඩ. කවුද ගෙවන්නේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කාගෙන් හරි බෙහෙත් ගත්තොත් මට-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, මම කියන්නේ quack doctorsලා. ඔබතුමන්ලාට ක්‍රිකට් ගැන කැක්කුමක් නැහැ. නමුත් අපට තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්, ඔබතුමා විපක්ෂයේ සිටිනකොට බෝඩ් ලැලි අල්ලා ගෙන ශබ්ද කරනවා. මේ අපේ ජාතික වීරයෝ ටික. ඉතින් ඒ නිසා එයා එංගලන්තේ ගිහිල්ලා නැහැ. ඇයි මේ වාගේ වැඩ කරන්නේ? ඉතින් ඒ නිසා,- [බාධා කිරීමක්] වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, ඔබතුමා ඇමතිකම ගත්තාට පස්සේ සම්බන්ධකම් ඔක්කොම නැහැ. පඩි වැඩි වෙනකොට සම්බන්ධකමක් නැහැ; උපුල් තරංග වුණාම සම්බන්ධකමක් නැහැ. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Hon. Member, I am also very much concerned about cricket, but let us play the game with a straight bat and come back to the subject.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The Hon. Presiding Member is telling me to play the cricket with a straight bat and I will do so.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
And, come back to the subject.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I want the crooked doctors to be brought to book. That is the issue.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
My worry is whether this is coming under the Regulations that we are discussing. Why do you not move another Motion? I would advise you to do so.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
According to Article 148, Parliament has control over all finances. But, you have monies that are being used by these quack doctors. They are using our money which we should control. Upul Tharanga is one of our star batsmen. He could not go to England because of one of these quack doctors. Parliament allocates money to these quack doctors and ruins our cricket. So, these are the issues that I want to bring to your notice.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
The country's image -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes, it is a question of the country's image.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Who paid for his medical expenses?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, we are informed that it has been paid from the President's Fund. I mean, this lavish display of funds, are they not our money? That is what we are concerned about.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

No, no. Payment by the President's Fund is one thing and medication is a separate thing.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Yes, certainly. That is why I say that you should go after these quack doctors. The Government did a good job. The Hon. Maithripala Sirisena must be congratulated for taking that decision. You should go after these quack doctors. Though there is Executive patronage, that does not mean that you have to protect that person. What I am basically saying is that it is the image of the cricketers, the image of our country that is affected. It has gone all over the world that there is a cricketer charged on doping**.** So, that is a hell of a charge. Do you not think so? Anyway, I just thought that I should mention this.

දැන් ආරක්ෂාව සම්බන්ධයෙන් අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කරලා තිබෙනවා. මේ වාගේ පොලු, ගල් තියා ගෙන ඉන්නද, ඒ වාගේ වැඩ කරන්නද පත් කරලා තිබෙන්නේ? ඒ වාගේම ඒ නම් පාවිච්චි කරලා ගංජා, හෙරොයින් ගෙන යන්නද පත් කරලා තිබෙන්නේ? මා මේවා මතක් කරන්නේ මෙකයි. අද මේවා කියන්න කට්ටිය බයයි. ඒ වාගේ හුළං ගහපු සැන්ඩෝලාට බයයි. අපි මේවා කියන්නේ ඒවා පිරිසිදු කරන්න අවශ්‍ය නිසායි. ඒ වාගේ තුන් හතර දෙනෙක් ඉන්නවා. අපි මේවා කිව්වේ නැත්නම් මිනිස්සු අපටයි ගල් ගහන්න පටන් ගන්නේ. ඉතින් මේවා කියන්න අපට ආත්ම ශක්තියක් තිබෙන්න අවශ්‍යයි. පොලීසියත් -ආණ්ඩුවත්- බොහොම ඕනෑ කමින් මේ සම්බන්ධව කටයුතු කරන බව මට ආරංචි වුණා. මා ඒ ගොල්ලන්ට සුබාශිංසනය කරනවා, ඒ වාගේ භය නැතිව කටයුතු කිරීම ගැන. නමුත් හොරු ටිකට ඍකවරණයත් දෙනවා. මේවා තමයි අපි ආරක්ෂක ලේකම්ගෙන් අහන්නේ. කරුණාකරලා මේවා සුද්ධ කරන්න. ඒ ගොල්ලන්ගේ vehicle numbers දීලා තිබෙනවා. අල්ලපු අවස්ථාවේ රොෂාන් කියන කුඩු හාදයා කියලා තිබෙනවා මන්ත්‍රීවරුන්ගේ නම්. මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කරන්න බැරි නිසායි මම කියන්නේ නැත්තේ. නමුත් අවශ්‍ය නම් අපි ඒවා ඔක්කොම හෙළිදරවු කරනවා. පිටතදී හෙළිදරවු කරලා තිබෙනවා. Privilege matters මත අපි ඒවා ගැන ගරු සභාවේ කථා කරන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, I think you will have to conclude your innings.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

You are trying to make me out-hit the wicket.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

I can give you five minutes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

There you are! Mr. Presiding Member, you can see the solidarity in our party.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Are you giving him extra five runs?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Five minutes.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Okay, you are giving him extra five runs.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

So, all I can basically say is, ensure that these things are done.

දැන් කරුණාකරලා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න. මා මේවා මතක් කළේ, අද එක පැත්තකින් රටේ ආර්ථිකය සවි ශක්තිමත් කර ගෙන යන්න හදන අවස්ථාවකදී ඒ සියලුම සල්ලි ප්‍රමාණය රටේ අභිවෘද්ධිය සඳහා අපට අවශ්‍ය නිසායි. HSBC ණය සම්බන්ධයෙන්, pension සම්බන්ධයෙන් තමයි අපි මෙච්චර ශබ්ද කරන්න පටන් ගත්තේ. අපි ආණ්ඩුවට කියනවා, ඔබතුමන්ලාට කොන්දක් තිබෙනවා නම් HSBC ණය මුදල ගෙවන්න එපා කියලා. අපි, එක්සත් ජාතික පක්ෂය, මේ ණය ගන්නකොට කිව්වා ගෙවන්න එපා කියලා. 2012 වර්ෂයේදී බිලියන 1,252ක් ගෙවන්න තිබෙනවා. මේ එක සෘජු වියදමකට මෙතරම් මුදල් ප්‍රමාණයක් ගෙවලා මේ රටේ ණය බර වැඩි කරන්න එපා. ඔබතුමන්ලා මේවා සම්බන්ධයෙන් කටයුතු කරන්න. බටහිර කුමන්ත්‍රණ ගැන කියමින් බොරු කථා කර කර ඉන්න එක නොවෙයි අපට අවශ්‍ය වන්නේ. රට ඉදිරියට ගෙන යන්න නම් පුංචි ලංකාව ලෝකයත් එක්ක එකතු වෙලා ඉදිරියට ගමන් කරන්න අවශ්‍යයි.

මා ඔබතුමන්ලාට විවෘත අභියෝගයක් කරනවා. මහින්ද සමරසිංහ ඇමතිතුමාත්, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාත් ජිනීවාවලට ගියා. එතුමන්ලා දැන ගන්න ඇති ජාත්‍යන්තරය කොතරම් දුරට ලංකාව දිහා වපර ඇසින් බලනවාද කියලා. ඒ අය ඔබතුමන්ලාව දැනුවත් කරලා ඇති, මේ යන ගමන මෙහෙම ගියොත් ලංකාව අන්තිමට හුදකලා වන බවට; උතුරු කොරියාවක්, කියුබාවක් වාගේ වෙයි කියලා. ඉතින් අපි එදා කිව්ව දේවල් අද වෙනසක් වෙලා තිබෙනවාද? අද විදේශ ඇමති ඉන්දියාවට ගිහිල්ලා මොනවාද කියන්නේ? එදා රට වික්කාය කියලා කියපු අය අද ඊට තුන් ගුණයකට වැඩි දේවල් ගැන කථා කරලා තිබෙනවා. මට වේලාව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙන

[ගරු රවි කරුණානායක මහතා]

නිසා මේ Joint Declaration එක **සභාගත*** කරනවා, හැන්සාඩ් වාර්තාවේ මුද්‍රණය කරන්න.

අද විදේශ ඇමති ඒකෙන් කොටසක් අරගෙන අවශ්‍ය කරුණු ඉදිරිපත් කළා. එහෙනම් අපි අනෙක් ඒවාත් හෙළිදරවු කරන්නම්, මොනවාද ඒකේ තිබෙන්නේ කියලා. කන්කසන්තුරේ වරාය ගැන කථා කළේ නැද්ද? Palali Airport එක ගැන කථා කළේ නැද්ද? ඒ පැත්තේ තිබෙන ආයෝජන වීනයට දෙන්න හොඳ නැහැ කියලා කථා කළේ නැද්ද? අපට ප්‍රශ්නයක් නැහැ. අපේ ආණ්ඩුව ඉන්දියාවත් එක්ක බොහොම සුහදව කටයුතු කරපු ආණ්ඩුවක්. ඔබතුමන්ලා තමයි, "ඕනෑ නැහැ, ඒ ගොල්ලන් අවශ්‍ය නැහැ, එහෙන් නැත්නම් මෙහෙන් ගෙනෙන්න පුළුවන්" කියලා අද අනා ගෙන තිබෙන්නේ. මේ පුංචි ලංකාව ඉන්දියාවත් සමඟ බොහොම කිට්ටු සම්බන්ධකමකින් ඉදිරියට ගමන් කරන්න අවශ්‍යයි. දෙමළ පක්ෂ ගියාම එකක් කියන, ස්වාමීන් වහන්සේලා ගියාම තව එකක් කියන, සුද්දන් ආපුවාම තවත් එකක් කියන ආණ්ඩුවක් නොවෙයි එක්සත් ජාතික පක්ෂයට තිබුණේ. අපි භය නැතිව රටට හොඳ දේ මොකක්ද කියන එක තෝරා ගෙන එදා කළා. කරුණා අම්මාන් අද මේ ගරු සභාවේ නියෝජ්‍ය ඇමතිවරයකු වශයෙන් ඉන්නේ එදා තිබුණු සාම ගිවිසුම නිසායි. එතුමා ඒක කියාවි. නමුත් ඔබතුමන්ලා අපට මොනවාද කිව්වේ? රට වික්කාය කිව්වා. අපි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ස්තුති කරනවා.

වඩමාරච්චියේදී එල්ටීටීඊය දෙකට, තුනට නවලා පරාජය කරන්න තිබුණු අවස්ථාව නැති වුණේ මොකද කියන එක එතුමා කියලා දුන්නා. වඩමාරච්චියේ එල්ටීටීඊය නැති වෙලා තිබුණාය කිව්වා. කවුද කිව්වේ? ඒක මගේ දේශපාලන ගුරු ලලිත් ඇතුලත්මුදලි සහ එක්සත් ජාතික පක්ෂය කරපු වැඩ පිළිවෙළක්. ඒක නැවතුණේ ඇයි? ඉන්දියානු හමුදාව ඒ පැත්තට යැවීම නිසා යුද්ධය දිනන්න පුළුවන්කම තිබුණු අවස්ථාව නැති වුණා. ඒක ගෝඨාභය රාජපක්ෂ කිව්වා. එක්සත් ජාතික පක්ෂයත් ත්‍රස්තවාදය නැති කරන්න කොතරම් කැප වුණාද කියන එක ගෝඨාභය රාජපක්ෂත් අපට පෙන්වා දුන්නා. අපි ඒක අගය කරනවා. අපි කවදාවත් කුහක වන්නේ නැහැ. ඒ අවස්ථාවේදී අපි ආණ්ඩුවට සම්පූර්ණ සහයෝගය දුන්නා, නොයෙක් කථාන්දර කිව්වාට.

මේ රටේ ජාතික ආර්ථිකයත් හදන්න අවශ්‍යයි. සෙල්ලම් කරලා, විහිළු කථා කියලා ඒ තුළින් ආර්ථිකය හදන්න බැහැ. සරම උස්සලා ලෝකයට බැන්නාම ආයෝජකයෝ මේ රටට ඇවිත් වැඩ කරනවාද? නැහැ, සහෝදර, සහෝදරියනි. රොෂෙන් චානකගේ ඝාතනය ගැන අපි හිතන්න ඕනෑ. පොලීසිය ගිහින් ඒ වෙළෙඳ කලාපයේ ඉන්න විදේශිකයන්ට ගහලා, ස්මාර්ට් ෂර්ට් ආයතනයට ගහලා, ටොරොයිඩ් ආයතනයට -

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச் சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! There is a point of Order being raised by the Hon. Chandrasiri Gajadeera.

---

***ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.**
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
එතුමා දැන් පාර්ලිමේන්තුවේ කථා කරනවාය කියන එක එතුමාට මතක නැහැ. ප්‍රසිද්ධ රැස්වීමක කථාවක් දැන් එතුමා කරන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, පොලීසිය ගිහින් ටොරොයිඩ් ආයතනයටයි, ස්මාර්ට් ෂර්ට් ආයතනයටයි ගහනවා ලෝකයම දැකලා තිබෙනවා. අපි කියන්නේ, ඒ වාගේ අවස්ථාවලදී සමස්තයක් වශයෙන් අපි ඔක්කොම එකතු වෙලා මේ රට ආරක්ෂා කරන්න අවශ්‍යයි කියලායි. [බාධා කිරීමක්] අනේ! ඔව්. නොකියන නිසා තමයි අද ඔය වාගේ ප්‍රශ්න තිබෙන්නේ. අහන්න, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාගෙන්. අහන්න, මහින්ද සමරසිංහ ඇමතිතුමාගෙන්. ආණ්ඩුව කරන ක්‍රියාවලින්, තමන්ට කර ගන්නා හානිය ආණ්ඩුවෙන්ම ඔප්පු වෙලා ඉවරයි. අපි විපක්ෂයෙන් මේවා කිව්වාට, මේවා වහ කියලා හිතන්න එපා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් කරන ක්‍රියා පිළිබඳව ඊට වඩා ප්‍රශ්නයක් තමයි තිබෙන්නේ. අපට අවශ්‍ය මේ රටේ සමස්ත ආර්ථිකය හදන්නයි. අපට අවශ්‍ය වන්නේ, ඒක පුද්ගල ආදායම දෙ දෙනකුට, තුන් දෙනකුට, සිය දෙනකුට බලපාන විධියට ආර්ථිකයක් හදන්න නොවෙයි. සමස්තයක් වශයෙන් රටේ සියලු දෙනාටම එක හා සමානව බලපාන විධියට ආර්ථිකයක් හදන්නයි.

රේගු ආඥාපනත යටතේ යෝජනාව සම්බන්ධයෙන් අද කථා කරනවා. Luxury vehiclesවලට මොනවාද කරන්නේ? යාර 25ක්, යාර 30ක් දිග කාර් ගෙන්වන්න පුළුවන්, සියයට 5 බද්දකට. නමුත් මරුටි එකක් ගෙන්වන්න පුළුවන්, සියයට 20 බද්දකටයි. කවුද, මේ ගැන කථා කරන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have to wind up now.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, just give me two more minutes.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I granted you five extra minutes. If I give you more time, your Colleagues would lose their time.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක සුඛෝපභෝගී ආණ්ඩුවක ගමන් කරන වාහනයක්. මේ ආණ්ඩුව එවැනි වාහන 30ක් ගෙනැවිත් තිබෙනවා. ඒ ගැන මොනවාද කළේ? බැරි වෙලාවත් අහිංසක කෙනෙක් කියන්නේ නැතුව ගෙනාවා නම් රේගුවේදී අත් අඩංගුවට ගන්නවා. මේ අය මොනවාද කරලා තිබෙන්නේ? මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් අපට කියන්න පුළුවන් එකම දේ තමයි, කරුණාකරලා පිරිසිදුව පාලනය කරන්න කියන එක. අද මහ බැංකුව කොටස් වෙළෙඳ පොළ, අර්ථසාධක අරමුදල පාලනය කරනවා. සියයට දෙකේ, සියයට තුනේ minority interest යටතේ කොතරම් කොම්පැනි අරගෙන තිබෙනවාද? ගත්තාට පස්සේ සුමාන තුනකින් ඒවා

විකුණනවා. විකුණන්න ඉස්සෙල්ලා ඥාති සම්බන්ධකම් තිබෙන අය ඔවුන්ගේ ආයෝජන කොතරම් කොම්පැනිවලට විකුණනවාද? අපි මේ ඔක්කොම හෙළිදරවු කරන්නම්, නියමිත වෙලාවට.

දැන් බලන්න, දූෂණයට විරුද්ධව අර ස්වාමි යම් විධියේ විරුද්ධතා රැලියක් පවත්වන කොට පොලීසියෙන් ඒක නැවැත්වූවේ ඇයි කියලා, සුමානයකින් කරුණු දෙන්න කියලා ඉන්දියාවේ සුප්‍රීම් උසාවියෙන් කියනවා. මෙහේ උසාවි එහෙම සොයනවාද? මෙන්න මේවා තමයි ප්‍රජාතන්ත්‍රවාදය. මේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න තමයි අපි මේ කථා කරන්නේ. මාධ්‍ය නිදහස නැති කිරීම වන්න පුළුවන්, රජයේ ත්‍රස්තවාදය වන්න පුළුවන්, මේ ඔක්කොම නැති කරන්න ඕනෑ. එතකොට තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානය අප රටට ඇඟිලි ගහන එක නවත් වන්නේ. අපි මේවා නවත්වන්න ඕනෑ. අපට කියන්න ඉස්සෙල්ලා අපි වැඩේ කරන්න ඕනෑ.

මහින්ද සමරසිංහ ඇමතිතුමාගෙන් අපි අහනවා, "Channel 4" ආයතනය උසාවි ගෙන ගියාද කියලා. ඒ වාගේ රටක මේ වාගේ ප්‍රශ්නයක් තිබෙන කොට අවුරුදු දෙකකට ඉස්සෙල්ලා කිව්වා, "Channel 4" එක විකාශනය - telecast- කළාම අපි නීතිපති දෙපාර්තමේන්තුවට කියනවා, ඒ අයට ගිහින් World Court එකේ නඩු පවරන්නය කියා" කියලා. අද නඩු පවරා තිබෙනවාද? ඇයි, නඩු පවරා නැත්තේ? ඔබතුමන්ලා භය නම් අපට දෙන්න. අපි විපක්ෂයෙන් යන්නම්, රට වෙනුවෙන්. බොරුවට ඇවිල්ලා, ශබ්ද කරලා මෙන්න මේක ආරක්ෂා කරනවාය කියලා වැඩක් නැහැ. රටේ මේ වාගේ ප්‍රශ්නයක් තිබෙනවා. අපි එකට වැඩ කරමු. නමුත් නිදහස් දවසේ එක්සත් ජාතික පක්ෂයට ගැහුවා. එම නිසා තමයි කුඩු රොෂාන් හැංගිලා ඉන්නේ. ඔන්න ඔය නිසා තමයි අපි මතක් කළේ. එක පැත්තකින් ආණ්ඩුවත් එක්ක අපි එකඟයි. වැඩ කරනවා නේ. අනික් පැත්තෙන් නිදහස් දවසේ අපට ගහන්න කියන ඒ සංකල්පය ගෙන යන්න බැහැ. රටේ ආර්ථිකය හදමු.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, you have to wind up now. I am sorry, I cannot give you more time.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, give me one more minute.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
No, no, I cannot give you more time. One by one, you have taken three more minutes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලෝකයත් එක්ක අපි එකට ගමන් කරමු. නමුත් ආර්ථිකයත් එක්ක සෙල්ලම් කරන්න ඉඩ දෙන්නේ නැහැ. තමන්ට මේ ආර්ථිකය ගෙන යන්න බැරි නම් කරුණාකර අපට භාර දෙන්න.

2001 දී වැටිලා තිබුණු ආර්ථිකය හැදුවා වාගේ නැවතත් මේ රටේ ආර්ථිකය හදන්න එක්සත් ජාතික පක්ෂය හැටියට අපි සූදානමින් සිටින බව ප්‍රකාශ කරමින්, මට වෙන් කර තිබෙන කාලය අවසන් වී ඇති නිසා මා නිශ්ශබ්ද වනවා.

[අ. භා. 5.05]

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට භාජනය කෙරෙන මුදල් අණපනත් නියෝග, යෝජනා සහ නියමයන් සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්නට මට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් ලෝකය දිනෙන් දින අවුරුද්දෙන් අවුරුද්ද ඉදිරියට ගමන් කරන කොට ලෝකයට තාක්ෂණය බොහොම වේගයෙන් ගලා ගෙන එනවා. මේ වෙලාව ආසියාවේ අසිරිමත් දේශය ගොඩ නඟන්න අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා කටයුතු කරන වෙලාවක්. එතුමා මේ අසිරිමත් දේශය ගොඩ නඟනවාය කිව්වේ වචනවලට වටිනාකමක් නොදෙන්න නොවෙයි. 1982 රූපවාහිනිය - TV එක - ලංකාවට ආවා. ඊට පස්සේ mobile phone එක ආවා. යුරෝපීයෙකු වශයෙන් මේ රටේ ජීවත් වුණු ආතර් සී ක්ලාක් මැතිතුමා මීට අවුරුදු 50කට ඉස්සෙල්ලා, මේ රටේ ඉඳ ගෙන - මේ දිවයිනේ ඉඳ ගෙන- ලෝකය ගැන අනාවැකියක් සේ ප්‍රකාශ කරනකොට එහි ගෞරවය ලබා ගන්න අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය අද කටයුතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ජනතාව ලක්ෂ 200ක් විතර ඉන්නවා. මේ ලක්ෂ 200ට ගණන් හදලා බලන කොට, අද මේ රටේ තිබෙන hand phones සංඛ්‍යාව -mobile connections සංඛ්‍යාව- මිලියන 15.7 ක් - ලක්ෂ 157 ක් - පමණ වෙනවා. ඒ වාගේම මිලියන 5.3ක් -ලක්ෂ 53ක් - land phones තිබෙනවා. ඒවා "කුරුකුරුලස්" වෙන්න පුළුවන්; CDMA වෙන්න පුළුවන්. අද අපේ රටේ ජනතාව SMS, MMS ගනුදෙනු කරනවා. මා හිතන්නේ අද මේ රටේ ජනතාවටත් වඩා මේ රටේ දුරකථන සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. ඒවා land phones වෙන්න පුළුවන්, hand phones වෙන්න පුළුවන්. 3G තාක්ෂණය පමණක් නොවෙයි 4G තාක්ෂණයත් අද මේ රටට ඇවිල්ලා තිබෙනවා. ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයත් දියුණු කරලා දැන් මේ රටට එන තාක්ෂණය, නැණසල අධ්‍යාපන ක්‍රමය, ගමට පරිගණකය ගෙන යනකොට, ඒ වාගේම අපේ දුම්රිය අපේ රටේම හදනකොට, ප්‍රංශය හදපු M9 software එක - මෘදුකාංග - අපේ රටේ නිෂ්පාදනය කරන කොට අද එක්සත් ජාතික පක්ෂය ඒකේ අයිතිකාරයෝ බවට පත් වෙන්න තමයි -රවි කරුණානායක මන්ත්‍රීතුමා ඒකේ අයිතිකාරයා බවට පත් වෙන්න තමයි- කටයුතු කරන්නේ; කථා කරන්නේ. ඒ තාක්ෂණය මේ රටට ගෙනාවේ අපි. තොරතුරු තාක්ෂණය - IT - Information Technology එක; තොරතුරු සන්නිවේදන තාක්ෂණය - ICT - Information and Communication Technology එක දිහා බැලුවාම මේ ආසියානු කලාපය තුළ අද අපි බොහොම ඉස්සරහින් ඉන්න බව පෙනෙනවා. ඒකේ ගෞරවය ලැබෙන්නේ එක්සත් ජාතික පක්ෂයට නොවෙයි. පක්ෂයක් වශයෙන් ඔවුන් විවෘත ආර්ථිකය මේ රටට ගෙනැල්ලා එන හැම කුණු කන්දලක්ම බදා ගත්තා. ඒ වාගේ නැතුව අපි යම්කිසි පිළිවෙළකට මේ රටේ ආධ්‍යාත්මික ගුණ වගාවන් ඇතිව අපේ ආර්ථිකය සෝදා පාලුවකට ලක් වෙන්නේ නැතුව අපේ ආර්ථිකය ගෙන යන්න අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා කටයුතු කර තිබෙනවා. විශේෂයෙන් අපි පැහැදිලිව කියන්න ඕනෑ, අද මේ රට අලුත් දිසානතියකට ගමන් කරන මොහොතක්. මේ රටේ කාලකණ්ණි මිලේච්ඡ ත්‍රස්තවාදය පරාජය කරලා අලුත් ගමනක් යන මොහොතක්. අපේ රටේ උතුර, දකුණ, නැඟෙනහිර, මධ්‍යම, බස්නාහිර, ඌව සහ වයඹ යන මේ හැම පළාතකම ඉන්න ජනතාවට එක හා සමාන

[ගරු රෝහණ දිසානායක මහතා]

පහසුකම් ලබා දීලා යටිතල පහසුකම් වැඩිදියුණු කරලා ගමේ මාර්ගය සංවර්ධනය කරලා ගමේ ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා අලුත් ගමනක් යන මොහොතක්. අද එදාට වඩා ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වෙමින් පවතිනවා. පාසල් යන දරුවන්ට හොඳ පාසලක් ලබා දෙන්න අලුත් අධ්‍යාපන ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරන්න ඒ වාගේම අලුතින් පාසල් දහසේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන ශිෂ්‍ය සංඛ්‍යාව අවුරුද්දෙන් අවුරුද්ද වැඩි කරන්න කටයුතු කර තිබෙනවා. ඒ වාගේම පහේ ශිෂ්‍යත්වයෙන් සමත් වන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කරන්න කටයුතු කර තිබෙනවා. අද අපේ රට අලුත් තාක්ෂණයත් එක්ක බොහොම වේගයෙන් ඉදිරියට ගමන් කරනවා. එහෙම වේගයෙන් ගමන් කරන කොට අපි අපේ තියෙන ආධ්‍යාත්මික ගුණ වගාවන්, ආචාර ධර්ම ලෝකයට විකුණන්නේ නැහැ. ඒවාත් ආරක්ෂා කර ගෙන තමයි අපි මේ ගමන ඉදිරියට යන්නේ. හැබැයි එක්සත් ජාතික පක්ෂයට ඒ ගැන කියන්න සදාචාරාත්මක අයිතියක් නැහැ. ගේන්න පුළුවන් කුණු ගොඩවල් හැම එකක්ම මේ රටට ගෙනැල්ලා ඔළු විකෘති කරලා මේ රට විනාශ කරන්න කටයුතු කරපු දේශපාලන පක්ෂයක් තමයි එක්සත් ජාතික පක්ෂය. රවි කරුණානායක මන්ත්‍රීතුමා අපේ ආර්ථිකය ගැන කියනවා. අපේ ආර්ථිකය ගැන කියන්න එතුමාට අයිතියක් තිබෙනවාද? සතොස පැය 24ම ඇරලා එතැනට මේ රටේ මත්පැන් ටික ගෙනියලා ඒ සතොස බංකොලොත් කරපු අය අද මොනවාද කියන්නේ? කටේ නරිවාදම් රෙද්ද පල්ලෙන් වැටෙනවා වගේ කථා කියනවා.

ඒ අය අද බලාපොරොත්තු වෙලා ඉන්නේ මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්න ඕනෑ එළුවා පස්සේ ගිය නරියාට වෙච්ච දේ. එළුවා පස්සේ නරියා ගියා වාගේයි දැන් මේ ගොල්ලන් කටයුතු කරගෙන යන්නේ. කොතැනක හරි උද්ඝෝෂණයක් තිබෙනවා නම්, picketing එකක් තිබෙනවා නම් එක්සත් ජාතික පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මහත්මයාටයි, රවි කරුණානායක මහත්මයාලාටයි ඊට වඩා සතුටක් නැහැ. අද තමන්ගේ පක්ෂයේ තිබෙන අවුල් වියවුල් ටික, එකට ගැට ගැසී තිබෙන නූල් බෝලය නිවැරදිව ලිහා ගන්න බැරි දේශපාලන පක්ෂයක් එක්සත් ජාතික පක්ෂය කියන්නේ. ඔවුන් අද රටේ ආර්ථිකය ගැන කථා කරනවා. මා අහ ගෙන හිටියා හර්ෂ ද සිල්වා මහත්මයාගේ ආර්ථික විග්‍රහයන් ගැන. එතුමා ආර්ථික උපදේශකවරයෙක්. මා හිතන විධියට පසු ගිය කාලයේ -2001- "Regaining Sri Lanka" වැඩසටහන ක්‍රියාත්මක කරන කොට එතුමා හිටියේ නැහැ. කොළ පාට සමාජයක් කරා එක්සත් ජාතික පක්ෂය මේ රට විකුණන්න හදන කොට, මා නියෝජනය කරන මාතලේ දිස්ත්‍රික්කයේ සීගිරිය වාගේ ඓතිහාසික උරුමයන් විකුණන්න හදන කොට, මා හිතුවේ නැහැ හර්ෂ ද සිල්වා මහත්මයා ඒ වාගේ උපදෙස් දුන්නා කියලා එක්සත් ජාතික පක්ෂයට. ඉතින් හර්ෂ ද සිල්වා මහත්මයා වැනි උපදේශකයකු යටතේ එක්සත් ජාතික පක්ෂය ඔවුන්ගේ සිහින ආණ්ඩුවේ ගමනක් යන කොට කොහොම තියේවිද කියලා අපට හිතෙනවා. එක්සත් ජාතික පක්ෂය කොහොම ගමනක් යාවිද කියලා අපට හිතෙනවා. මේ වාගේ අය මේ අයට උපදේශකකම් දෙනවා නම් එවැනි දේශපාලන පක්ෂයක් ගැන අපට කථා කරලා වැඩක් නැහැ. "යකඩ ගෝනියේ ගුල්ලෝ ගහලා නම් හාල් ගෝනිය නොබලාම විසි කරපන්" කිව්වාලු. ඒ වාගේ තමයි එක්සත් ජාතික පක්ෂය. ඒ නිසා අද ඉතාම වැදගත් නියෝග කිහිපයක්-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේගේ කථාව අවසන් කරන්න කාලය ඇවිත් තිබෙනවා.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි පහළොවක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

දැන් ඒක අඩු කරලා තිබෙනවා.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව මිනිත්තු දෙකක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

හොඳයි.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත් වැදගත් නියෝග, නියමයන් කිහිපයක් සහ යෝජනාවක් මේ වෙලාවේ ඉදිරිපත් කර තිබෙනවා, හයිබ්‍රිඩ් වාහන ගැන. දෙමුහුන් - විද්‍යුත් මෝටර් රථ ගැන මා මේ වෙලාවේ වචනයක් කථා කරන්න ඕනෑ. විශේෂයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රට සිටින්නේ environment-friendly transport system එකක්, ඒ කියන්නේ පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් සංවර්ධනය කරන්න යන අවස්ථාවක. පසු ගිය කාලයේ අපි හයිබ්‍රිඩ් වාහන ගෙනාවා. විශේෂයෙන් මා ගාව තිබෙනවා ඒ විස්තර ටික. නව රේගු සංකේතාංක පදනම් කර ගනිමින් කරන ලද බදු සංශෝධන මඟින් සියලුම දෙමුහුන්-විද්‍යුත් මෝටර් රථ සඳහා පැවැති මුළු බදු ප්‍රතිශතය සියයට 38ක් වූ ප්‍රමාණය, සිලින්ඩර ධාරිතාව 2000ට අඩු දෙමුහුන්-විද්‍යුත් මෝටර් රථ සඳහා මුළු බදු ප්‍රතිශතය සියයට 50ක් වශයෙන්ද, සිලින්ඩර ධාරිතාව 2001 සහ 3000 දක්වා වූ මෝටර් රථ සඳහා සියයට 75ක් වශයෙන්ද, සිලින්ඩර ධාරිතාව 3000ට වැඩි මෝටර් රථ සඳහා බදු ප්‍රතිශතය සියයට 100ක් වශයෙන්ද බදු ගැළපීම් සිදු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙකෙන් බලාපොරොත්තු වන්නේ මොකක්ද? විශේෂයෙන් මේ ක්‍රමවේදය ගෙනාවාට පස්සේ සුඛෝපභෝගී වාහන ඒ කියන්නේ, සිලින්ඩර ධාරිතාව 3000ට වැඩි වාහන තමයි විශාල ප්‍රමාණයක් මේ රටේ විකුණන්න පසු ගිය කාලයේදී කටයුතු කළේ. ඒ වාගේම රටට ආනයනය කරලා තිබෙන්නේ ඒ වාහන.

මෙකෙදී අපි කථා කළා නාගරිකකරණය ගැන; ඒ වාගේම මේ රටේ මාර්ග පද්ධතිය ගැන. අතිගරු ජනාධිපතිතුමා ප්‍රධාන රජය තීන්දු කරලා තිබෙනවා මුළු රටේම මාර්ග පද්ධතිය වහාම සංවර්ධනය කරන්න. අද අධිවේගී මාර්ග හැදෙනවා. පළමුවැනි ශ්‍රේණියේ මාර්ග, දෙවැනි ශ්‍රේණියේ මාර්ග හැදෙනවා. අද පුත්තලමට ගියත්, අනුරාධපුරයට ගියත්, යාපනයට ගියත්, මඩකලපුවට ගියත්, මා ජීවත් වන මාතලේට ආවත්, ගම්පහට ආවත් අද ඒ ප්‍රදේශවල හැම මාර්ගයක්ම හැදෙනවා. හැබැයි මේ මාර්ග හැදෙනවා කියලා මේකට සමතුලිත නොවී මේ වාහන මේ රටට ගෙන්වන්න බැහැ. මේ රටේ ජනගහනයට අනුව ජනගහනයේ සාපේක්ෂතාව අනුව දිස්ත්‍රික්කවල මාර්ග පදනම් කර ගෙන මේ වාහන ගෙන්විය යුතු වෙනවා. අපි පරිසරය ආරක්ෂා

කරන්න ඕනෑ. පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ඇති කරන්න ඕනෑ. තව අවුරුද්දකින් ඒ මාර්ගවල කෝච්චි ධාවනය කරන්න පුළුවන් වෙන කොට එදාට දුම්රිය කට්ටල ගේන්න වෙනවා. යාපනයට, කිලෝ මීටර් 196ක් දුරට කෝච්චි පාර හැදෙන කොට පලෙයිවලට ගිහිල්ලා, කන්කසන්තුරේට ගිහිල්ලා එන්න පුළුවන්. අද දුම්රිය මඟින් මඟී ප්‍රවාහනය කෙරෙන්නේ සියයට 6යි. අපි බලාපොරොත්තු වනවා ඒක සියයට 15ක් කරන්න. ශ්‍රී ලංගම බස් රථවලින් අද සියයට 22යි ජනතාව ගෙන යන්නේ. අපි බලාපොරොත්තු වනවා ඒක සියයට 35 දක්වා වැඩි කරන්න. අන්න එතකොට මේ රටේ වාහන සංඛ්‍යාව වැඩි වෙනවා.

විශේෂයෙන් වැදගත් කාරණාවක් කියන්න මට අවසර දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වාහන ලියාපදිංචි වීම ගැන කල්පනා කළොත් 2002 වර්ෂයේදී වාහන ලියාපදිංචිය 1,892,367යි; 2003 වර්ෂයේදී 2,073,869යි; 2004 වර්ෂයේදී 2,297,711යි; 2005 වර්ෂයේදී 2,527,380යි; 2006 වර්ෂයේදී 2,827,902යි; 2007 වර්ෂයේදී 3,125,794යි; 2008 වර්ෂයේදී 3,390,993යි; 2009 වර්ෂයේදී 3,595,068යි. අද වෙන කොට වාහන 3,960,000ක් පමණ තිබෙනවා. මේ රටේ ජනගහනය ලක්ෂ 200යි. ඒ ලක්ෂ 200න් හැම පස් දෙනෙකුගෙන් එක්කෙනෙකුටම මෝටර් සයිකලයක්, මෝටර් වාහනයක්, ට්‍රැක්ටරයක් හෝ කාර් එකක් ආදී වශයෙන් තිබෙනවා. එහෙනම් මේ රට දියුණු වෙලා නැද්ද? මේ රට බොහොම වේගයෙන් සංවර්ධනය වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වෙන කොට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දවසකට වාහන 836ක්, 1,030ක් පමණ ලියාපදිංචි වෙනවා. මේ ආදී වශයෙන් පසු ගිය කාලයේදී හැම මාසයකම මේ වාගේ වාහන සංඛ්‍යාවක් ලියාපදිංචි වෙමින් තිබෙනවා. ඉතින් රට වේගයෙන් ඉදිරියට ගමන් ගන්නවා. ජනතාවගේ අවශ්‍යතාවන් ඉටු වෙනවා.

අද එළවලු මිල ගැන කථා කෙරුණා; භාණ්ඩ මිල ගැන කථා කෙරුණා. අද එළවලු කිලෝ එකක මිල අඩු වෙලා තිබෙනවා. අද යාපනයේ තිබෙන අල, ලූනු ටික මහ දඹුල්ලේ ඒ day and night market එකට එනවා; නොනිදන නගරයට එනවා. පොහොර මිටිය රුපියල් 1,200යි. හැම වගාවකටම අද ආයෝජනය වනවා. තේ වතු ටිකේ තේ නිෂ්පාදනය වෙනවා. පොල් නිෂ්පාදනය වෙනවා. ආර්ථිකයේ අලුත් යුගයක් ඇති කරන්න බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ "දිවි නැඟුම" වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක වනවා. අද එක්සත් ජාතික පක්ෂයට මේවා බලා ගෙන ඉන්න බැහැ. මොවුන්ට දර්ශනයක් තිබෙන්න ඕනෑ. අද අතිගරු ජනාධිපතිතුමාගේ රජයට - අපට- දර්ශනයක් තිබෙනවා. ඒ දර්ශනය තමයි "මහින්ද චින්තන ඉදිරි දැක්ම". අන්න ඒ ඉදිරි දැක්මත් එක්ක අප යනකොට මැතිවරණ ගණනාවක් පැරදුණු එක්සත් ජාතික පක්ෂය ආයේ මැතිවරණයකට ඇවිල්ලා කවදාවත් වැඩක් නැහැ කියලා හෙට අනිද්දා වෙන කොට දන්නවා. අද එක්සත් ජාතික පක්ෂය සෝදා පාළුවට ලක් වෙලා ඉවරයි. ජනතා විමුක්ති පෙරමුණ නාය ගිහිල්ලා, පුපුරලා ඉවරයි. ඔවුන්ගේ නියෝජිත තත්ත්වයන් ගමෙන් ගම ප්‍රාදේශීය සභාවේදී වඩාත්ම ඔප්පු වුණා. අද ඔවුන් ජනතාව ඉස්සරහට ගිහිල්ලා අසත්‍ය ප්‍රකාශ කරලා, මේ වාගේ picketing ඇති කරනවා. අද රොෂෙන්ගේ මරණයට වග කියන්න ඕනෑ ජනතා විමුක්ති පෙරමුණ සහ එක්සත් ජාතික පක්ෂයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි ඇත්ත. ඒ කථාව වහගන්න අද ඔවුන් ආණ්ඩුවට විරුද්ධව නොයෙක් කුමන්ත්‍රණ කථා කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එපමණක් නොවෙයි, අපි මේ රට ඉදිරියට යන ගමන දිහා බැලුවාම මේ වාගේ විපක්ෂ නායකයෙක් ඉන්න රටක්, මේ වාගේ විපක්ෂයේ දේශපාලන පක්ෂ තිබෙන රටක්-[බාධා කිරීමක්] අද ලෝකය වටේ ගිහිල්ලා කේළාම් කියලා මේ ආණ්ඩුවට විරුද්ධව කරන කුමන්ත්‍රණ දිහා බැලුවාම ඔවුන් වගකියන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු රෝහණ දිසානායක මහතා**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)
මේ වාගේ විපක්ෂ නායකයින් ලෝකයේ කොහේවත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වාගේ දේශපාලන පක්ෂ ලෝකයේ කොහේවත් නැහැ. ස්විට්සර්ලන්තය, එංගලන්තය, ඇමෙරිකාව වැනි රටවල් දිහා බැලුවාම ඔවුන් අද රක්ෂණයත් එක්කයි - insurance එකත් එක්කයි- ඉදිරියට යන්නේ. හැබැයි මේ රටේ පෞද්ගලික අංශයට විශ්‍රාම වැටුපක් ඇති කරන්න යනකොට අද මේ අය විරුද්ධ වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒබ්‍රහම් ලින්කන් කළු ජාතිකයන්ට නිදහස දෙන්න යනකොට එදා කළු ජාතිකයෝ ඒබ්‍රහම් ලින්කන්ට විරුද්ධව පෙළපාළි ගියා. අද ඒ වාගේ දෙයක් තමයි ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ. මේ 65 ලක්ෂයක පෞද්ගලික අංශයේ ජනතාව ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු පස්සේ, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු පස්සේ පන්නලා ඒ අයට දඬුවම් දෙන යුගය හෙට අනිද්දා ඇති වනවා කියන එකත් ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

[අ. භා. 5.18 ]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් මාතෘකාවක් පිළිබඳව සාකච්ඡා වෙන මොහොතේ ඔබතුමා මුලසුනේ ඉන්නා වෙලාවේ කථා කරන්න ලැබෙන එක බොහොම සතුටක්. ඒ කාරණය ගැන විශේෂයෙන්ම කියන්නට අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ මෙම ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන රෙගුලාසි අතරින් ණය පත් - credit card - පිළිබඳව ගෙන එන ලද රෙගුලාසි ඉතාම කාලීන වැදගත් රෙගුලාසියක් බව අපි පිළිගන්නවා. නමුත් මේ රටේ අනාගත ආර්ථිකය රඳා පවතින, ඒ වාගේම ජනතාවගේ ජීවිතය පහසු කරන ධනවත් අයට පමණක් නොව, පහළ මධ්‍යම පාන්තිකයන්ට වාගේම සුළු ආදායම් ලබන තැනැත්තන්ට පවා විශේෂ ආර්ථිකමය පහසුකම් සලසන credit card පිළිබඳව අපේ රටේ තිබෙන අයථා වංචනික ස්වභාවය සහිත ක්‍රියාදාමයන් පිළිබඳව මෙම ගෞරවණීය පාර්ලිමේන්තුවේ අවධානය යොමු විය යුතුව තිබෙනවා. Credit card පිළිබඳව මේ රටේ ක්‍රියාත්මක වන රජයේ සහ පෞද්ගලික අංශයේ විවිධ වාණිජ බැංකු විවිධ හේතු දක්වමින් විවිධ ප්‍රතිශතයන්ගෙන් විවිධාකාර ගාස්තු අය කරනවා. එම සේවය සැපයීම සඳහාම එක් බැංකුවක් අය කරන ගාස්තු සහ තවත් බැංකුවක් අය කරන ගාස්තු අතර විශාල වෙනස්කම් තිබෙනවා. මේ තත්ත්වය තුළ ගනුදෙනුකරුවන් සූරා කෑමකට ලක් වන බවයි මගේ අදහස. ඒ නිසා මේ රටේ ක්‍රෙඩිට් කාඩ් පත් භාවිතය දියුණු කිරීම දිරි ගන්වන ගමන්ම එම ක්‍රෙඩිට් කාඩ් පත් සඳහා අය කරන ගාස්තු පිළිබඳව යම් ආකාරයක පාලනයක්, මැදිහත් වීමක් රජය විසින් කළ යුතුයි කියන එක අවධාරණය කරන්න කැමැතියි.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මෝටර් රථ පිළිබඳව එනම්, දෙමුහුන්, එහෙම නැත්නම් hybrid මෝටර් රථ සඳහා අය කරන බද්ද පිළිබඳව අද සාකච්ඡාවට ලක් වුණා. පසු ගිය අය වැය යෝජනා මඟින් පරිසර හිතකාමී මෝටර් රථ උදෙසා අය කරනු ලැබූ බද්ද අඩු කිරීම අනාගතය බලා කරනු ලැබූ බුද්ධිමත් පියවරක්. රටේ ජනතාව ආණ්ඩුවේ එම මූලාමය ප්‍රතිපත්තියට ඉතාම යහපත් ප්‍රතිචාරයක් දැක්වූවා. ඉන්ධන මිල ඉතාම ඉහළ යන කාලයේ, ඒ වාගේම ජාත්‍යන්තර වෙළෙඳ පොළේත් ඉන්ධන මිල පහළට ඒමට තිබෙන හැකියාව ඉතාමත් අවම තත්ත්වයක් තිබෙන කාලයේ මේ රටේ පහළ ආර්ථික තත්ත්වයක් ඇති සහ මධ්‍යම පාන්තික ජනතාව අඩු වියදම් සහිත වාහනවලට යොමු වුණා. ඒ විධියට ආණ්ඩුව ලබා දුන් බදු සහනය මත ජනතාව තමන්ගේ තෝරා ගැනීම කරද්දී "කල දුටු කළ වළ ඉහ ගනු" කියන ප්‍රතිපත්තිය යටතේ hybrid වාහන සඳහා වූ බදු මුදල බලාපොරොත්තු නොවුණු ආකාරයට වැඩි කරන්න ආණ්ඩුව කල්පනා කළා. අද ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාගේ තර්කය වුණේ, එම කාලය තුළ වැඩි ධාරිතාවක් සහිත වාහන 12,000ක් ගෙන්වනු ලැබුවා, ඒ නිසා බලාපොරොත්තු වූ අරමුණ ඉටු නොවීම නිසා බදු මුදල් වැඩි කරන්න ආණ්ඩුවට සිදු වුණා කියන එකයි. ඇත්ත වශයෙන්ම වැඩි ධාරිතාවක් සහිත වාහන වුවත් ඒවා hybrid වාහන නිසා ඒවාට වැය වන ඉන්ධන ප්‍රමාණය අඩුයි. ඒ වාගේම භාවිත කරන්නාට පහසුවක් ලැබෙනවා. ආණ්ඩුව අපේක්ෂා කළ මූලික ප්‍රතිපත්තියට හානියක් නැහැ. අනෙක් අතට එම කාලය තුළ ආනයනය කළ වාහන ප්‍රමාණයෙන් සියයට 25ක් පමණ අවම ප්‍රමාණයක් තමයි ඉහළ ධාරිතා සහිත hybrid වාහන ප්‍රමාණය. එහෙම නම් බදු ප්‍රමාණය වැඩි කිරීමට ගෙන එන තර්කයට කිසිම පදනමක් නැහැ. අනෙක් අතට සියයට 38 ඉඳලා සියයට 50 දක්වා වැඩි කරන්න හේතුවකුත් නැහැ. එහෙම නම් පහළ මට්ටම වූ සියයට 38 එලෙසම තියන්න තිබුණා. නමුත් ආණ්ඩුව ජනතාවගේ මුදල් කෙලෙස හෝ සූරා කෑම ගැන දක්වන උපක්‍රමික වැඩ පිළිවෙළ තුළ ක්‍රියා කරමින් ජනතාවගේ උනන්දුව දැකලා බලාපොරොත්තු නොවූ විධියට බදු මුදල් වැඩි කිරීම තුළින් ඒ වන විට වාහන ඇණවුම් කර තිබුණු අය අපහසුතාවට පත් වුණා පමණක් නොවෙයි, ආණ්ඩුවේ මුල් ප්‍රතිපත්තිය පසු පසට යාමක් සිදු වෙලා තිබෙනවා.

මේ රටේ මූල්‍ය පාලනය පිළිබඳ ප්‍රතිපත්තිය අනුව විශ්‍රාම වැටුප පිළිබඳව ඉදිරිපත් කළ පනත් කෙටුම්පත ආණ්ඩුවට හකුළා ගන්න සිදු වීම ආණ්ඩුව පැත්තෙන් හොඳයි, ජනතාවගේ පැත්තෙන් පාඩුයි කියලා ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා සඳහන් කළා. බන්දුල ගුණවර්ධන මැතිතුමාත් කැබිනට් අමාත්‍යවරයෙක් වන මේ ආණ්ඩුවේ සිටියදී පාර්ලිමේන්තුවේදී මෙහෙම ප්‍රකාශයක් කරන කොට අමාත්‍ය මණ්ඩලයේ තිබෙන සාමූහික වගකීම ගැන අපට සැකයක් ඇති වෙනවා. ඒවා අමාත්‍ය මණ්ඩලය තුළ සාකච්ඡාවට ලක් කරන වෙලාවේ අධිරාජ්‍යවාදී වුවමනාවන් මත මේ දේවල් සිද්ධ වනවාය කියන බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ න්‍යාය, අමාත්‍ය මණ්ඩලය තුළ පැහැදිලි කරලා එම කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් වීම වළක්වන්න එතුමාට පුළුවන්කම තිබුණා.

එතුමා එහෙම කළේ නැහැ. දැන් ඔරුව පෙරළුණාට පස්සේ පෙරළුණු පිට හොඳයි කියනවා. ඒ පෙරළිච්ච එක හොඳයි කියන්න, ඒක හරි ෂෝක් කියලා කියන්න, ඒක හරි මරු කියලා කියන්නත් අපූරු, ලස්සන තර්ක ගොඩ නඟනවා. හැබැයි මේ ඉදිරිපත් කරලා තිබෙන විශ්‍රාම වැටුප් සම්බන්ධ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ කම්කරු ඇමතිවරයා නොවෙයි. අද ආණ්ඩුවට හිතවාදී මාධ්‍ය, ආණ්ඩුවට හිතවාදී කාටූන් ශිල්පීන් මේක ගාමිණී ලොකුගේ ඇමතිතුමාට වෙච්ච ඇබැද්දියක් විධියට කාටූන් අඳිනවා. නමුත් ඇත්ත තත්ත්වය මේ ගරු පාර්ලිමේන්තුවට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ මුදල් ඇමතිතුමා වෙනුවට ගරු ඇගමැති දි.මු. ජයරත්න මැතිතුමායි. කම්කරු ඇමති ගාමිණී ලොකුගේ මැතිතුමා නොවෙයි. මේ සාකච්ඡාව කම්කරු ඇමතිතුමා සමඟ, වෘත්තීය සමිති සමඟ, සේවා යෝජක පක්ෂය සමඟ කළ දෙයක් නොවෙයි. මහ බැංකුවේ අධිපති නිවාඩ් කබ්රාල් මැතිතුමා සහ එතුමා වටේ ඉන්න අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ ණය උගුලට අහු වෙලා ඉන්න, අන්තර් ජාතික අරමුදලේ උපක්‍රම තුළ, බටහිර උපක්‍රම තුළ හිර වෙලා ඉන්න පිරිස විසින් සකස් කරලා දුන්නු, කිසිම විමසීමක් නැතිව, අමාත්‍ය මණ්ඩලය වචනයක්වත් සොයන්නේ බලන්නේ නැතිව, සාකච්ඡාවක් නොකර ඉදිරිපත් කළ පනත් කෙටුම්පත තමයි අද අනෙක් පැත්ත පෙරළිලා තිබෙන්නේ. ඒක ප්‍රතික්ෂේප වෙච්ච එක, ඉල්ලා අස් කර ගන්න වෙච්ච එක හරිම හොඳයි කියලා කියන කොට හරි පුදුම හිතෙනවා. අනෙක් අතට එතුමා විසින් ඉදිරිපත් කළ තර්කවලට පිළිතුරු දෙන කොට ඒක බලා ගෙන ඉන්න බැරිව මේ සභාව දාලා යන කොට මේ රටේ පාර්ලිමේන්තුව ගැන තිබෙන ගෞරවය ගැන අපට හැඟීමක් ඇති වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ මේ රටේ මූල්‍ය පාලනය පිළිබඳව මේ උත්තරීතර පාර්ලිමේන්තුවට තිබෙන වගකීම අනුවයි. මූල්‍ය පාලනය පිළිබඳව වගකීම තිබෙන එකම ආයතනය පාර්ලිමේන්තුව පමණයි. නමුත් මේ රටේ මූල්‍ය පාලනය පිළිබඳව තිබෙන විවිධාකාර ගැටලු, විවිධාකාර ප්‍රශ්න හෙළිදරවු වන අවස්ථා අද තිබෙනවා.

අද මේ ගරු සභාවේදී හෙළිදරවු වුණා හොර දොස්තර කෙනෙක් ගැන. එලියන්ත වයිට්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

විකල්ප වෛද්‍ය උපදේශකතුමාලු. අනේ අපේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

රවට්ටලා. එතුමා රැවටුණු එක අපි දන්නේ නැහැ, අන්දලා. අපේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අන්දන්න පුළුවන් වෙච්ච -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Hon. Member, please do not refer to His Excellency the President in that manner. I think you should withdraw that. I order that to be expunged. Leave the President alone and speak.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අපේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

රැවටීමකට ලක් වීමට තත්ත්වයක් මතු කරන්න හේතු වෙච්ච එලියන්ත වයිට් කියන හොර දොස්තර ගැන පරීක්ෂා කරන්න

යුතුකමක් මේ පාර්ලිමේන්තුවට තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වෙන දෙයක් නිසා නොවෙයි.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! There is a point of Order being raised.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අන්දවලායි කියන කාරණයේදී මම විරුද්ධ වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔව්. ඒ නියෝගය මම දුන්නා.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
මොකද,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අන්දවන්න මෙතුමාගේ පක්ෂයේ ජේ.ආර්. ගේ මුත්තා ආවත් බැහැ. රනිල්ගේ-

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එලියන්ත වයිට්ට පුළුවන්.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
එලියන්ත වයිට් ගැන මට ප්‍රශ්නයක් නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, I think your time is over because your time was taken by the Hon. Ravi Karunanayake. So, please wind up now.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් එක දෙයක් ගැන කියන්න කැමැතියි. රජයේ මුදල් -ජනාධිපති අරමුදලේ වුණත්, වෙනත් මුදලක් වුණත්- සුදුසුකම් නැති හොර දොස්තර කෙනෙක් විසින් රජයේ ආයතනයක් -රජයේ පරිපාලන ව්‍යුහය- රැවටීමකට ලක් කර ලබා ගෙන තිබෙනවා නම් ඒ පිළිබඳව පරීක්ෂණ කරන්න, ඒ පිළිබඳව පොලීසියට පැමිණිලි කරන්න, ඒ පිළිබඳව රහස් පොලීසියට පැමිණිලි කරන්න, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කරන්න, රැවටීමක් කරලා තිබෙනවා නම් ඒ තැනැත්තාගේ තත්ත්වය මොකක් වුණත් ඒ පිළිබඳව සොයා බලා දඬුවම් කරන්න යුතුකමක් අපේ රාජ්‍ය ව්‍යුහයට තිබෙනවා කියන කාරණය මම මතක් කරන්න කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. බොහොම ස්තුතියි. මීළඟට ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මන්ත්‍රීතුමා.

[අ. භා. 5.30]

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ මුදල් අමාත්‍යාංශය මඟින් පනවන ලද වැදගත් නියෝග කිහිපයක් ගැනයි විවාද වන්නේ. විශේෂයෙන්ම රජයක් විධියට, පාර්ලිමේන්තුවක් විධියට අපට වග කීමක් තිබෙනවා රටේ සාමාන්‍ය ජනතාවගේ මූල්‍යමය අයිතිය තහවුරු කරන්න. විශේෂයෙන් credit cards භාවිතයේදී පසු ගිය කාල සීමාව පුරාම විවිධ වංචා දූෂණ සිද්ධ වුණා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන ගරු වී.කේ. ඉන්දික මන්ත්‍රීතුමාගේ credit card එකෙන් අප්‍රේල් මාසයේදී වංචා සහගත ලෙස මුදල් ගත්තා. එහෙම කටයුතු කරන අවස්ථාවකදී ඒවාට රැකවරණය ලබා දෙන්න මුදල් අමාත්‍යාංශය පියවර ගැනීම සම්බන්ධව අපේ ගෞරවය සහ ස්තුතිය පුද කරන්න ඕනෑ.

වාහන ගෙන්වීමේදී අය කරන බදු සම්බන්ධව අද මේ සභාවේ සාකච්ඡා කළා. අය වැය ඉදිරිපත් කළාට පසු සංශෝධන මොකුත් ගෙනෙන්න බැරි විධියට තමයි විපක්ෂය කථා කරන්නේ. මහ භාණ්ඩාගාරයෙන් පාලනය වන මුදල් අමාත්‍යාංශය මඟින් පවතින තත්ත්වයන් තුළ ආනයන සහ අපනයන බදු පැනවීම හෝ බදු ලිහිල් කිරීම රජයේ වග කීමක්. මේ ගැන කථා කරනකොට ගොඩක් වෙලාවට විපක්ෂය ඒ වග කීමෙන් බැහැර වෙලා ඉන්නේ. ඒ සම්බන්ධව මා කරුණු කියනවා. පසු ගිය වසරේ අප්‍රේල් මාසයේ 08වන දා එක්සත් ජනතා නිදහස් සන්ධානය ජයග්‍රහණය කරලා 143 දෙනෙක් මේ පාර්ලිමේන්තුවට පත් වෙලා ආවා. ටික දවසයි ගියේ, එක්සත් ජාතික පක්ෂයෙන් ද්‍රවිඩ සන්ධානයෙන් මුස්ලිම් කොන්ග්‍රසයෙන් කට්ටිය ඇවිල්ලා අපිට 160ක් වුණා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ බුලත් කොළයෙන් දිනලා ආවාට පසු විපක්ෂයෙන් තරග කර දිනපු 17 දෙනෙක් අපේ පැත්තේ ඇවිල්ලා වාඩි වුණා. එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දීපු ජනතාවගෙන් තේරී පත් වුණු 17 දෙනෙක් තමයි තීන්දු කළේ, විපක්ෂ නායක ධුරය දරන රනිල් වික්‍රමසිංහ මහත්මයා විපක්ෂයේ හිටියොත් අපට අනාගතයක් නැහැ කියලා. සුබ අනාගතයක් සඳහා එතුමන්ලා රට වෙනුවෙන් සහාය දෙන්න තමයි දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපිත් එක්ක එක් වුණේ. ඒක අමතක කරන්න එපා. හැබැයි, මේවා ඡන්දදායකයෝ ගන්නා තීන්දු නොවෙයි. ඡන්දදායකයෝ ගැන කම්හල් සේවකයෝ ගැන කථා කරනකොට පාර්ලිමේන්තුවට ආපු ආණ්ඩු පක්ෂයේ වාඩි වන විපක්ෂයේ මන්ත්‍රීවරු මෝඩයෝද? නූගත්තුද? දේශපාලන පරපුරක් නැතුවද? මා ඉතාම ගෞරවයෙන් කියනවා, අපිට තුනෙන් දෙකක හයිය දුන් එක්සත් ජාතික පක්ෂයට පින් සිදු වන්න කියා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා සදාකාලිකව අපේ විපක්ෂ නායක වේවා කියන ප්‍රාර්ථනය අපි කරනවා.

[ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා]

අද දවසේ මුදල් පනත්වලින් බැහැරව ගිහින් විශේෂ කාරණා කිහිපයක් ගැන සාකච්ඡා වුණා. මේකෙදි පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප ප්‍රධාන වුණා. පෞද්ගලික අංශයට විශ්‍රාම වැටුප එපා කියා මුළු රටේ උද්ඝෝෂණ තිබුණේ නැහැ. දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ කොග්ගල නිදහස් වෙළෙඳ කලාපයේ ෆැක්ටරි 25ක් තිබෙනවා. ඒවායේ සේවකයන් 11,000ක් සිටිනවා. පුළුවන් නම් එයින් දහ දෙනෙක් උද්ඝෝෂණයට බස්සන්න. එහෙම එන්නේ නැහැ. නමුත් ඒ මිනිස්සු විශ්‍රාම වැටුප ඉල්ලනවා. මම ගාලු දිස්ත්‍රික්කයෙන් මනාප 125,000ක් අරගෙන ආ මන්ත්‍රීවරයෙක් විධියට මේ ගරු සභාවට යෝජනා කරනවා, විශ්‍රාම වැටුප පෞද්ගලික අංශයට ඕනෑය කියා. මේ ගැන මුළු දකුණ පුරා ආයතනයෙන් ආයතනයට ගිහින් ඒ සේවකයන්ගෙන් විශ්‍රාම වැටුප ඕනෑය කියන ලියවිල්ල මේ සභාවට ගෙනැල්ලා දෙන්නම්. හැබැයි, එහි ප්‍රශ්න තිබෙනවා. ජනාධිපතිතුමා විශ්‍රාම වැටුප යෝජනා කරලා මේ සභාවට ඉදිරිපත් කරනකොට භාණ්ඩාගාරයේ හෝ මුදල් අමාත්‍යාංශයේ හෝ wire short කරන අය මැද ඉන්නවා.

මම ඉතා ගෞරවයෙන් මේ ගරු සභාවට කියනවා, අපි එක්සත් ජාතික පක්ෂයට ඇඟිල්ල දිගු කරනවා වාගේම, ජේවීපී එකට ඇඟිල්ල දිගු කරනවා වාගේම නිදහස්ව ආශ්චර්යවත් ගමනක් යන මේ ආණ්ඩුව ආපස්සට අදින්න කවුරු හරි ඇතුළේ ඉන්නවා නම් අපි ඒ අයටත් විරුද්ධයි කියන එක. ඒක මම විශ්වාසයෙන් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාලවලට තේරී ඇති ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන්නට කලින් නායකත්ව පුහුණුව ලබා දෙන්න ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් තීන්දු කරලා තිබෙන වැඩ පිළිවෙළ විපක්ෂය ලොකු ආයුධයක් විධියට අර ගෙන හැම තැනකම විවේචනය කරනවා. හැබැයි, මම විශ්වාසයෙන් යුතුව කියනවා ඔය නායකත්ව පුහුණුව රනිල් වික්‍රමසිංහ මහත්තයාටයි, මේ විපක්ෂයටයි ලබා දුන්නොත් මීට වඩා නිවැරදි විපක්ෂයක් අපට ගොඩ නඟා ගන්න පුළුවන් කියලා. කැමැතිද? ලැහැස්ති කරලා දෙන්නම්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පෞරුෂත්ව වර්ධනය.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage
පෞරුෂත්ව වර්ධනය. කෙලින් සැලියුට් ගහන්න,- [බාධා කිරීමක්] අපි අලිමංකඩ දිනන කොට පාමංකඩ කිව්ව රවි කරුණානායක මහත්තයා- [බාධා කිරීමක්] සම්පූර්ණ ඇත්ත. අපි කිලිනොච්චිය දිනන කොට මැදවච්චිය කියපු රවි කරුණානායක මන්ත්‍රීතුමා මෙතැන තුන් සැරයක් කියනවා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එපා කියලා. හැබැයි, ඒක මට ඉවත් කරන්න ඕනෑ. ඒක මට අදාළ නැහැ. සහතිකයක් තිබෙනවා නේ.

ඊයේ පෙරේදා විපක්ෂයේ වුවමනාව මත මහ සඟරුවන නොවන අය චීවරධාරින් විධියට ජනාධිපති මන්දිරය ඉස්සරහට ආවා. අපි දහම් පාසල් ගිහිල්ලා තිබෙනවා. හැම පොහොයටම පන්සලට යනවා. හැම දන් සීට්ටුවටම අපි ඉන්නවා. අපි හාමුදුරුවෝ හඳුනනවා. අපේ ආණ්ඩු පක්ෂයේ ගරු පූජ්‍ය එල්ලාවල මේධානන්ද හාමුදුරුවෝ මේ සභාවේ ඉන්නවා. 2600 සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් තවත් අවුරුදු 2600ක් බුදු දහම තුළින් මේ රට ගුණවත් කරන්න, යහපත් කරන්න අතිගරු ජනාධිපතිතුමා සහ රජය, නායක හාමුදුරුවන්ගේ ඉඳලා අපේ මහා සංඝරත්නය මහා විශාල කැපවීමක් කරනවා. අපේ හාමුදුරුවෝ නැඟිටින කොට උදේ 6.00ට දානය ගේනවා. ඇයි, වැඩට යන්න කලින් දානය දීලා යන්න. ඊට පස්සේ දහවල් දානයට වඩින්න ඕනෑ. දහවල් දානයට වැඩම කළ හාමුදුරුවෝ පන්සලට වඩින කොටම මළ ගෙදර අවමඟුල් උත්සවයට එක්ක ගෙන යන්න ඇවිල්ලා ඉන්නවා. අවමඟුල් ගෙදර ඉඳලා පන්සලට වඩින කොටම බෝධි පූජාවට කට්ටිය ඇවිල්ලා ඉන්නවා. බෝධි පූජාව ඉවර කරන කොටම රෑ පිරිතට එක්ක ගෙන යන්න ඇවිල්ලා ඉන්නවා. අති ගෞරවණීය නායක හාමුදුරුවන් වහන්සේලා මුළුමහත් ශ්‍රී ලංකාව තුළ ඉටු කරන අභිමානවත් සේවයට අපි නමස්කාර පූර්වකව ගරු කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒක අමතක කරන්න හොඳ නැහැ. හැබැයි, ගල් කියුබ් එකක් තිබුණා නම් එදා එතැනට ආපු හාදයෝ ටිකගේ ප්‍රශ්නය බේරන්න තිබුණා. ගල් ගහන්නේ නැහැ. ගල් කියුබ් එකකින් ප්‍රශ්නය බේරන්න පුළුවන්. ඒක කරන්නේ කොහොමද කියලා මම පස්සේ එළියේදී කියන්නම්. ඒ වෙලාවේ ගල් තිබුණේ නැහැ. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බුද්ධාගමේ හාමුදුරු කෙනකුට දානයක් දුන්නාම වේලාව අවේලාව හෝ දීපු දේ ගැන හිතන්න බැහැ, භාර ගන්න යුතුකමක් තිබෙනවා. බුදුහාමුදුරුවොත් එහෙම කළා. දානය දුන්නේ කවුද කියලා අහන්නේ නැහැ. දානය දුන්නා නම් වළඳන්න අයිතියක් තිබෙනවා. ඒක තමයි තත්ත්වය. ගිලන්පසක් දුන්නාම ගිලන්පස එපාය කියපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ටිකක්.

2010 අප්‍රේල් 08වැනිදා පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණයෙන් අපි දැවැන්ත ජයග්‍රහණයක් කරලායි ආවේ. ඊට පස්සේ අපට යූඑන්පී එකෙන් සහ ජේවීපී එකෙන් මන්ත්‍රීවරු එකතු වුණා. අන්තිම පළාත් පාලන මැතිවරණය පැවැත්වුවේ දැනට මාසයකට කලින්. ඒකත් අපි දිනුවා. ජේවීපී එක හිතා ගෙන ඉන්නේ හෙට අනිද්දා මැතිවරණයක් තිබෙනවා කියලා, ආණ්ඩු පෙරළන්න. තව අවුරුදු පහකින් තමයි මැතිවරණය තියන්නේ. අපි විශ්වාසයෙන් කියනවා, -දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කළා වාගේම- ඊ ළඟ අවුරුදු හය නොවෙයි, ඊට පස්සේ එන අවුරුදු දොළහේත් මේ රටේ ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමායි කියලා. ඒක අමතක කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ජය වේවා! ජය වේවා!!

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
එතැනිනුත් ඉවර කරන්නේ නැහැ, නාමල් මන්ත්‍රීතුමා ඉන්නවා පිටු පස්සෙන්. [බාධා කිරීම්] මොකද භයද? අපේ ගම්වලින් අපොස උසස් පෙළ සමත් වෙලා විශ්වවිද්‍යාලවලට යන ශිෂ්‍යයන්ව දණ ගස්සලා, අත පය තුවාල කරලා, ඇඳුම් ගලවලා, නවක වදය දීලා මහා විශාල විපත්තියක් කරලා තිබුණා. නමුත් අද විශ්වවිද්‍යාලවලට තේරුණ ඒ තරුණයා හෝ තරුණිය විශ්වවිද්‍යාලයට යන්න කලින් නායකත්ව පුහුණුව ලබා ගෙන,

කායික සහ මානසික යෝග්‍යතාවක් ලබා ගෙන විශ්වවිද්‍යාලයට යන කොට, ඔය ජේවීපී එක ගෙන යන තක්කඩි ව්‍යාපාරය, ජේවීපී එකේ කුමන්ත්‍රණකාරී ව්‍යාපාරය විශ්වවිද්‍යාලය ඇතුළේ ගෙන යන්න බැහැ. බුද්ධිමත් මනසකින්, නිරවුල් මනසකින්, තීන්දු ගන්න පුළුවන් ශක්තියකින් මේ සිසුන් විශ්වවිද්‍යාලවලට යන නිසා ඒක කරන්න බැහැ. අන්න ඒකටයි ඔය භය වෙලා තිබෙන්නේ. ඒකට තමයි භය වෙලා තිබෙන්නේ. නවක වදය තුළින් මනස වට්ටලා, භය කරලා, ඒ ගොල්ලන්ගේ දේශපාලන වුවමනාව ඉෂ්ට කර ගන්නයි හැදුවේ.

අමාත්‍යවරයකු හැටියට මේ සභාව නියෝජනය කරනවා, අපේ විමල් වීරවංශ මැතිතුමා. ජනතා විමුක්ති පෙරමුණේ හිටපු ප්‍රචාරක ලේකම්වරයා විමල් වීරවංශ මැතිතුමායි. ඒ සහෝදරයා අද ඇයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ළඟට ඇවිල්ලා ඉන්නේ? ජේවීපී එකේ ජනාධිපති අපේක්ෂකයා වුණේ කවුද? ජේවීපී එකේ ජනාධිපති අපේක්ෂකයා වුණේ නන්දන ගුණතිලක. අද එතුමා අපේ නගරාධිපති.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පානදුරේ.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
පානදුරේ තමයි. ඇයි එතුමා ඒ පක්ෂය දාලා ආවේ? ජේවීපී එකත් එක්ක ගිහින් ආණ්ඩුවක් හදලා නායකයා වන්න හිටිය මනුස්සයා අන්න අපේ ජනාධිපතිතුමාගේ පැත්තට ඇවිත් නගරාධිපති කෙනෙක් වෙලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත වෙලාව අවසානයි.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
යම් යම් අඩුපාඩු තුළින්, -සංවර්ධනයේ අඩුවකින් වන්න පුළුවන්, වෙන යම් මානසික ගැටලුවක් නිසා වන්න පුළුවන්- ගම තුළ සිර වෙච්ච තරුණයා හෝ තරුණිය මුළා කරපු යුගය ඉවරයි. දකුණේ මිනිසකු හැටියට, රටේ මිනිසුන්ට ආදරය කරන දේශපාලනයකු හැටියට මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලු දෙනාගෙන් මම ඉල්ලා සිටිනවා, මේ කාලකණ්ණි විනාශය කරන්න දෙන්න එපා කියලා. රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, මේ ගරු සභාවේ නිතරම කියනවා කියලා, "බටහිර කුමන්ත්‍රණ" ගැන. බටහිර කුමන්ත්‍රණයක් නැද්ද? බටහිර කුමන්ත්‍රණයක් තිබෙනවා. බටහිර කුමන්ත්‍රණයේ හවුල්කරුවෝ කවුද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[සෝෂා කිරීම්] ඇද්ද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! අවසන් කරන්න.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
මේ රට ගොඩ නඟන වැඩ පිළිවෙළට-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එතැනින් අවසන් කරන්න.

**ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා**
(மாண்புமிகு நிஷாந்த முதுஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)
-යහපත් අණ පනත් ගෙනෙනවා. දෙයියන්ගේ නාමයෙන්, මේ අවුරුදු පහ ඉවර වුණාම අපි බෙදිලා ඡන්දය ඉල්ලමු. එතෙක් මේ රටේ ගෙන යන සාර්ථක, යහපත් වැඩ පිළිවෙළ ගෙන යන්න ඉඩ දෙන්න කියලා මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ලබන වතාවේ 160 දෙනෙක් නොවෙයි, 180 දෙනෙක් අපිත් එක්ක වාඩි වනවා. 180ක්! බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි. ගරු එච්.ආර්. මිත්‍රපාල ඇමතිතුමා.

[අ. භා. 5.44 ]

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
Mr. Presiding Member, what is the time allocation for me?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
It is 10 minutes.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
I was given 15 minutes.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ නියෝග, යෝජනා හා නියමයන් ඉදිරිපත් කරන අවස්ථාවේදී විශේෂයෙන් මට පශු සම්පත් අංශය පිළිබඳව වචන කීපයක් කියන්න අවශ්‍යයි.

මම විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. ලංකාවේ කිරි කර්මාන්තය දියුණු කරන්න අතිගරු ජනාධිපතිතුමා පසු ගිය අය වැය ලේඛනයෙන් මේ රටේ කිරි ගොවීන්ට පොරොන්දුවක් දුන්නා, කිරි ලීටරයක මිල වැඩි කර දෙන බවට. රුපියල් 50 දක්වා වැඩි කරන්න පොරොන්දු වුණා. මම සන්තෝෂයෙන් කියනවා, දැන් මේ රටේ කිරි ලීටරයක මිල රුපියල් 50යි. කිරි කර්මාන්තය දියුණු කරන්න අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට එදා මේ පාර්ලිමේන්තුවේ අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් දුන්න ඒ පොරොන්දුව මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් අද ඉෂ්ට කරලා තිබෙනවා කියලා මේ අවස්ථාවේදී කියන්නේ ඉතාම සතුටින්. ඒ

[ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා]

වාගේම අද තවත් අඩියක් ඉස්සරහට තබමින්, කිරි පට්ටි සඳහා අවශ්‍යා යන්ත්‍ර සූත්‍ර, අමතර කොටස්, කිරි දොවන යන්ත්‍ර කියන මේවා සියල්ලම වරාය හා ගුවන් තොටුපොළ බද්දෙන් නිදහස් කරන්න එතුමා කටයුතු කර තිබෙනවා. ඒ නිසා හොඳ දවසක් අපට ඇවිල්ලා තිබෙනවා කිරි කර්මාන්තය දියුණු කරන්න. එක පැත්තකින් මේ රටේ ආදායම් උත්පාදනයට, අනික් පැත්තෙන් විදේශ විනිමය ඉතිරි කර ගන්නට අපට මේ කර්මාන්තය තුළින් හොඳ අවස්ථාවක් ලැබෙනවා. ඔබතුමාත් දන්නවා, මේ රටේ කිරි කර්මාන්තය දියුණු කරන්න, කිරි නිෂ්පාදනය දියුණු කරන්න අපි අද සියයට 8ක පොලියට ණය නිකුත් කරනවා කියලා. ඒ නිසා අවශ්‍යා තරම් මුදලක් සියයට 8 පොලියට ණයට ගන්න පුළුවන්. බොහොම අඩු පොලියක් ඒක.

අපි ගිය අවුරුද්දේ කිරි පිටි ආනයනය කරන්න රුපියල් කෝටි තුන්දාහක් -මිලියන තිස්දාහක්- විදේශ විනිමය හැටියට වියදම් කරලා තිබෙනවා. අපට මේ මුදල නවත්වා ගන්න පුළුවන්. ඩොලර් එකට වන බලපෑම්, ඩොලර් එකට තිබෙන ඉල්ලුම ඉහළ යෑම, ඩොලර් එක මිලදී ගැනීමේ ශක්තිය දුර්වල වීම වළක්වා ගන්න පුළුවන් එක ක්‍රමයක් තමයි මේ රටේ කිරි නිෂ්පාදනය වර්ධනය කර ගැනීම. ඒ තුළින් ඉතිරි කර ගන්න පුළුවන් මුදල් ප්‍රමාණය රුපියල් මිලියන තිස්දාහයි. රැකියා අංශයෙන් ගත්තාම පනස්දාහකට, ලක්ෂයකට රක්ෂාවල් සපයා දෙන්න පුළුවන් මේ අංශය දියුණු කර ගැනීම තුළින්. කිරි නිෂ්පාදනය කරන උදවියට මේ සහන ලබා දීලා පෞද්ගලික අංශය වර්ධනය කරන්නත් අපි බලාපොරොත්තු වනවා. අද මේ රටේ කිරි කර්මාන්තයේ යෙදිලා ඉන්න ප්‍රමාණය බැලුවාම, හයලක්ෂ හැත්තෑදාහක විතර පිරිසක් මේ කර්මාන්තයේ යෙදිලා ඉන්නවා. ඒ අයගෙන් ලැබෙන ශක්තිය තුළින් තමයි මේ රටේ දියර කිරි භාවිතය ප්‍රචලිත වෙලා තිබෙන්නේ. අපේ වෛද්‍ය පර්යේෂණ ආයතනය කියන විධියට දවසකට පුද්ගලයෙකුට කිරි මිලිලීටර් සියයක් බොන්න අවශ්‍යායි. අපි කියන්නේ මේකයි. ශරීර ශක්තිය, නීරෝගීකම සඳහා මේ රටේ දරුවන්ට කිරි මිලිලීටර් සියයක් බොන්න පුරුදු කරන එකත් අපේ යුතුකමක් සහ වග කීමක් වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට විශාල මුදලක් රජයෙන් දැන් වෙන් කර දෙනවා පාසල් දරුවන්ට කිරි ලබා දෙන්න. මම දන්නේ නැහැ, ඒක කොච්චර දුරට සාර්ථකව ක්‍රියාත්මක කරනවාද කියලා. සමහර ප්‍රදේශවල කිරි ගන්නේ නැති බවක් දැන ගන්න තියෙනවා. ඒ නිසා මෙන්න මේ ආර්ථික වාතාවරණය -

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමා, ඔබතුමන්ලා යෝජනාවක් ගෙනාවා ඔටු කිරි දෙන්න. දැන් ඔටු කිරි ව්‍යාපෘතිය ගැන තත්ත්වය මොකක්ද?

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ඔව්. අපි යෝජනා කළා ලංකාවට ගෙනෙන්න කියලා. දැන් සංවිධාන රාශියක් විරුද්ධ වෙලා තියෙනවා අපි මසට ගෙනෙනවා කියලා. ඉතින් මේ වැරදි අදහස් දීම තුළින් මේ රටේ අලුත් දෙයක් කරන්න තිබෙන ඉඩකඩවලට බාධා ඇති වෙලා තිබෙනවා. නමුත් අපි කල්පනා කරනවා ඉදිරි කාලය තුළ ඒ ගැන ඒ අය දැනුවත් කරලා මේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙනි යන්න. ඒක තමයි ඒ ගැන මට දෙන්න තිබෙන උත්තරය.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

සතෙකුට කොපමණ මුදලක් යනවාද?

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

එක සතෙක් ලක්ෂ දහයක් විතර වනවා. පාකිස්තානයෙන් තමයි ටිකක්වත් අඩුවට ගන්න පුළුවන්. මම දන්නේ නැහැ. මසට ගන්න අය මේ සත්තු මසට ගන්න ඉඩ තියෙනවා. මේ පිළිබඳව මට ස්ථිර වශයෙන් යමක් කියන්න බැහැ. නමුත් අපි කල්පනා කළේ මේ රටේ ජෛව විවිධත්වය -biodiversity- ගැන. අපේ ආණ්ඩුව මේ යෝජනා ගෙනෙන කොට තමයි හුඟ දෙනෙකුගේ හිතට අමාරු වෙන්නේ. නමුත් වෙන කවුරු හරි ගෙනාවා නම්? කොච්චර සත්තු මේ රටට ගෙනැල්ලා තිබෙනවාද? විදේශ රටවල සත්තු කොච්චර ඉන්නවාද? කොච්චර පැළ වර්ග තිබෙනවාද මේ රටේ? එහෙම අලුත් දෙයක් කරන්න හදන කොටත් ඒකටත් බාධා රාශියක් තිබෙනවා. විවිධ ස්වේච්ඡා සංවිධාන මේකට බාධා කරනවා. මම,-[බාධා කිරීමක්] නැහැ, නැහැ, ගෙනෙන්න පුළුවන්. කිරි නිෂ්පාදනය වැඩි කර තිබෙනවා. අපට තව බොහොම සුළු ප්‍රමාණයයි අවශ්‍යා. අපි මේ රටේ ජාතික අවශ්‍යාතාවෙන් සියයට තිහක් නිෂ්පාදනය කරනවා. සියයට 15යි තිබුණේ. දැන් සියයට 15කින් වැඩි වෙලා තිබෙනවා. 2010 අපේ රටේ ජනගහනය කෝටි දෙකයි; මිලියන 20යි. 2015 වන කොට මිලියන 21ක් දක්වා ජනගහනය වැඩි වනවා. අපට ලීටර් මිලියන 754ක් තමයි අවශ්‍යා වන්නේ. අපි අද ලීටර් මිලියන 250ක් 300ක් අතර ප්‍රමාණයක් නිෂ්පාදනය කරනවා. ඉදිරි අවුරුදු පහ තුළ මේ රට කිරිවලින් ස්වයංපෝෂිත කරන්න තමයි මහින්ද චින්තනයේ ඉදිරි දැක්ම තුළ අපි කටයුතු කරගෙන යන්නේ. මේ ආර්ථික වර්ධනය දිහා බැලුවාම සමහර විට එක්සත් ජාතික පක්ෂය කලබල වනවා. පෞද්ගලික විශ්‍රාම වැටුප ගැනත් දැන් කලබල වෙලා තිබෙන්නේ ඒකයි. රජයට ලැබෙන ඒ මුදල ආයෝජනය කරන එක ගැන බියක් තිබෙනවා. බලන්න, සේවක අර්ථසාධක අරමුදල ප්‍රථම වතාවට පෞද්ගලික අංශයට ලබා දුන්නේ ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමායි. ඒ ඉතිහාසය අමතක කරලා අද වැරදි පින්තූරයක් පෙන්වන්න යනවා. නවලෝක රෝහල හදන්න තමුන්නාන්සේලා එදා සේවක අර්ථසාධක අරමුදලින් මුදල් දුන්නේ නැද්ද? ඇයි මේවා හංගලා කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ විරුද්ධ පක්ෂය කියන එක හැම දාම මොන දේ කළත් විරුද්ධයි. මම උදාහරණයක් කියන්නම්. බණ්ඩාරනායක මැතිතුමාගේ ආණ්ඩුව 1958 දී මේ පාර්ලිමේන්තුවට සේවක අර්ථසාධක අරමුදල් පනත ඉදිරිපත් කරන කොට, එදාත් එක්සත් ජාතික පක්ෂය ඒකට විරුද්ධව ඡන්දය පාවිච්චි කළා. අද සේවක අර්ථසාධක අරමුදල ගැන කිඹුල් කඳුළු හෙළනවා. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ ඇතුළුව පිලිප් ගුණවර්ධන මැතිතුමන්ලා, බණ්ඩාරනායක මැතිතුමන්ලා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පියතුමන්ලා එකතු වෙලා මේ රටේ ඇති කරපු පරිවර්තනයක් ඒක.

අපි මේ අර්ථසාධක අරමුදල උදුරා ගෙන යන්න කල්පනා කරන්නේ නැහැ. මේක අපි මේ රටට දායාද කරපු දෙයක්. මේ රටේ වැඩ කරන පන්තියට, අවුරුදු 55න් විශ්‍රාම යන සේවකයාට තමන්ගේ ජීවිත කාලය තුළ ඉතිරි කර ගත්තු මුදල බුක්ති විඳින්න ඉඩ කඩ සලස්වන එක අපේ යුතුකමක්. උදාහරණයක් හැටියට මට කියන්න පුළුවන්, ජල සම්පත් මණ්ඩලයේ සේවය කරපු කම්කරුවෙක් මේ ඊයේ පෙරේදා අවුරුදු 55න් විශ්‍රාම ගියා. අර්ථසාධක අරමුදල ගත්තා. දුවගේ විවාහ කටයුත්ත කළා, ගෙදර අනික් කටයුතු කළා, අතේ සතයක්වත් නැහැ. ඔහු මට කිව්වා, මාසෙකට රුපියල් 5000ක් ලැබුණත් ඇති කම්කරු රස්සාවක් හෝ මුරකරු රස්සාවක් සොයා දෙන්නය කියා. මිනිස්සු ඒ තත්ත්වයට වැටෙනවා. මොකද, සියලු දෙනාටම එක විධියට අර්ථසාධක අරමුදල කළමනාකරණය කර ගන්න බැහැ. ඒ නිසා විශ්‍රාම ගිහින් අසරණ තත්ත්වයට පත් වුණු බොහෝ පිරිසක් අද මේ සමාජයේ ඉන්නවා. ඒ නිසා අද විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීම ගැන ඉල්ලීමක් තිබෙනවා. ඒ නිසා තමයි පෞද්ගලික අංශයේ සේවය

කරන අයටත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කරන්න අපි උත්සාහ කළේ. ජනතා විමුක්ති පෙරමුණේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විශ්‍රාම වැටුප ගන්නේ නැද්ද? විශ්‍රාම වැටුප ගන්නවා. ඉතින් අද ඇයි මේකට විරුද්ධ වෙන්නේ? දාඩිය මහන්සියෙන් වැඩ කරපු කෙනෙක් අවුරුදු 55න්, 60න් විශ්‍රාම ගියාම රුපියල් හාර පන්දාහක් ලැබුණත් ඇතිය කියන මතයේ තමයි අද කම්කරු පන්තියේ සමහර ජනතාව ඉන්නේ. අද මම සතුටින් කියන්න ඕනෑ, ඊයේ වෙනකොට අපේ ආණ්ඩුව වෘත්තිය සමිති හරහා ගිවිසුමක් අත්සන් කළ බව. ඊට අනුව අද වතු කම්කරුවෙකුගේ දෛනික වැටුප රුපියල් 380 දක්වා වැඩි කළා. ඒ අනුව මේ රටේ වතු කම්කරුවෙකුට සම්පූර්ණ දීමනා සහිත දෛනික වැටුප රුපියල් 515ක් ලැබෙන තත්ත්වයට අද මේ රටේ හාම්පුත්තු සමඟ අපි ඒ ගිවිසුම අත්සන් කර තිබෙනවාය කියන එක මම ඉතා සතුටින් මතක් කරන්න ඕනෑ. මම විශේෂයෙන්ම ගරු ආරුමුගන් තොණ්ඩමන් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, කම්කරු පන්තිය වෙනුවෙන් ඒ ගිවිසුම අත්සන් කළේ ගරු ආරුමුගන් තොණ්ඩමන් ඇමතිතුමායි.

අද කම්කරු පන්තිය ගැන කතා කරන උදවියට ඒවා කරන්න පුළුවන්කමක් නැහැ. එවැනි ඉල්ලීමක්වත් නැහැ. වෘත්තිය සමිති සමඟ එකතු වෙලා ඒ අයගේ වෘත්තිය අයිතිවාසිකම් වෙනුවෙන් නොවෙයි කතා කරන්නේ. ඔවුන්ගේ මඩිය තර කර ගන්න ඔවුන්ගේ දේශපාලන ව්‍යාපාරය ගෙන යන එක ගැන තමයි අද කතා කරන්නේ. ඒ තුළින් අද අර්බුදකාරී තත්ත්වයක් ඇති කරන්න උත්සාහ කරනවා. මේ රටේ ජනතාව පැහැදිලිව දැක්කා, ඇඟලුම් කම්හල්වලින් එළියට බස්සපු සේවකයන් අතරේ කවුද හිටියේ කියන එක. ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරින් තමයි ගල් ගැහුවේ. පැහැදිලිවම අද ඒ ගැන සාක්ෂි ලැබී තිබෙනවා. ඒ නිසා අද මේකෙන් ගැළවෙන්න බැහැ. ඔවුන් එදා මේ රටේ මිනී මැරුවා. එදා තේ ෆැක්ටරි ගිනි තියපු, ඉන්දියාවෙන් ගෙන්වූ "ටාටා" බස් පුච්චපු ජනතා විමුක්ති පෙරමුණට මේ රටේ ආර්ථිකය ගැන කතා කරන්න තිබෙන්නේ කුමන අයිතියක්ද?

කම්කරු පන්තිය ගැන එදත් වැඩ කළේ, කාර්මික ආරාවුල් පනත - Industrial Disputes Act එක- හඳුන්වා දුන්නේ එදා 1956 දී බණ්ඩාරනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හදපු ආණ්ඩුවයි. අර්ථසාධක අරමුදල් ක්‍රමය ඇති කළේ ඒ ආණ්ඩුවයි. වතුවල කම්කරුවන්ට නිවාස හදන්න පර්චස් 7 බැගින් වෙන් කරලා දෙන්න වැඩ කළේ මේ ආණ්ඩුවයි. ඒ නිසා මේ සත්‍යය ජනතාවගෙන් වසන් කරන්න පුළුවන්කමක් නැහැ. ශ්‍රී ලංකාව කියන්නේ 1931 දී සර්වජන ඡන්ද බලය ලැබුණු රටක්. අද වන විට අවුරුදු 80ක් ගිහිල්ලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේක කියන්න ඕනෑ. අවුරුදු 80ක සර්වජන ඡන්ද බලය තුළින් මේ රටේ ජනතාව ආණ්ඩු හදපු රටක්, ආණ්ඩු මාරු කරපු රටක්, ආණ්ඩු වෙනස් කරපු රටක් මේක. ඒ නිසා කිසි දවසක මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය වෙනස් කරන්න මේ රටේ ජනතාව මැරවරයන්ට ඉඩ තියන්නේ නැහැ කියන එක මතක් කරමින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු සුජීව සේනසිංහ මහතා. ඔබතුමාට තිබෙන්නේ විනාඩි 10ක් පමණයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
විනාඩි 25ක් තිබුණා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි 10ක් පමණයි තිබෙන්නේ.

[අ. භා. 5.54 ]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මූල්‍යකරණය සම්බන්ධයෙන් අද මේ සභාවේ විවිධ අදහස් ඉදිරිපත් වුණා. විශේෂයෙන්ම ආර්ථිකය සම්බන්ධයෙන් අමාත්‍යවරුන් කිහිප දෙනෙක් අදහස් ඉදිරිපත් කළා. එහිදී අද රටේ ආර්ථිකය ඉතා සාර්ථකව ඉදිරියට යන ආකාරය ගැන විග්‍රහ කිරීමට තැත් කිරීමක් තමයි අපට දක්නට ලැබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් විරුද්ධ පක්ෂය වශයෙන් අපි දරන ප්‍රතිපත්තිය, ඒ වාගේම විරුද්ධත්වය සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ අමාත්‍යවරු අදහස් ප්‍රකාශ කරන අවස්ථාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් අපිත් අවුරුදු පහකට පසුව විශ්‍රාම වැටුපක් ලබන බව එතුමන්ලා සඳහන් කළා. අපි ඒක පිළිගන්නවා. පාර්ලිමේන්තුවේ සේවකයෝ, මන්ත්‍රීවරු යම්කිසි විශ්‍රාම වැටුපකට හිමිකම් ලබනවා. හැබැයි යම්කිසි ආකාරයකින් අපේ විශ්‍රාම වැටුප ලබා දෙන කොට සියයට දෙකක්, සියයට තුනක්, සියයට පහක් කියලා අවුරුදු ගණන ගණන් බලා, අවුරුදු 60න් පසුව අපට ඒ විශ්‍රාම වැටුප ලබා දුන්නා නම් අපට මේ අමාත්‍යවරුන්ගේ විරුද්ධත්වයත් ඉතා ලස්සණට බලා ගන්න පුළුවන්කම තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගහලා, බැණලා, වෙඩි තියලා, මරලා තමයි මේ අරුම පුදුම විශ්‍රාමය අපේ ජනතාවට දෙන්න මේ ආණ්ඩුව තැත් කරන්නේ. ආණ්ඩුවෙන් යම් කිසි මුදලක් මේ විශ්‍රාම වැටුපට වෙන් කරලා, ඒ විශ්‍රාම වැටුප අවුරුදු 55න් විශ්‍රාම යන කොට පෞද්ගලික අංශයට ලබා දෙනවා නම් පෞද්ගලික අංශයේ මේ සේවකයන්ට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔවුන්ට පාරට බහින්න හේතුවක් නැහැ. හැබැයි මොකක්ද දැන් කරන්නේ? අර හොඳට තිබුණු අර්ථ සාධක මුදල් - EPF- ETF මේ සියලු දේවල් එක ගොන්නකට එකතු කරලා කොහොම හරි යම් කිසි ආකාරයකට මේ බංකොලොත් වෙන ආර්ථිකය ගොඩ ගන්න කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මුදල් බලාපොරොත්තුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අවශ්‍ය වන ආකාරයෙන් මේක සකස් කර ගන්න ආණ්ඩුව හදනවා. මේක එක්සත් ජාතික පක්ෂයෙන් කළා නම්, "ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට රට පාවා දෙන, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බස්වලට ඇහුම්කන් දීලා ආර්ථිකය බංකොලොත් කරන පක්ෂය" වශයෙන් හඳුන්වා දෙන්න ඔබතුමන්ලා තැත් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අයර්ලන්තයත් මේ තත්ත්වයට මුහුණ දුන් රටක්. අයර්ලන්තය ආර්ථික අතින් විශාල අපහසුතාවකට පත් වෙලා තිබෙන රටක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මැදිහත් වෙලා ඒ රටටත් මේ වාගේම කොන්දේසි අද ඉදිරිපත් කර තිබෙනවා. මගේ ළඟ ඒ කොන්දේසිය තිබෙනවා, අයර්ලන්ත ආණ්ඩුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අත්සන් කරපු කොන්දේසිය සම්බන්ධයෙන් මාධ්‍යයට නිදහස් කරපු ඒ පණිවුඩය. මේ ආකාරයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ රටේත් බිඳ වැටෙන ආර්ථිකයක් තිබෙන්නේ. මා හිතන්නේ ලෝකයේ බංකොලොත් ආර්ථිකය සහිත රටවල් පහක් තිබෙනවා නම් ඒ පහෙන් එකක් තමයි අයර්ලන්තය. මෙන්න ඒ කොන්දේසිය:

"An amount of Euro 17.5 billion will be covered by an Irish contribution through the Treasury cash buffer and investments of the National Pension Reserve Fund."

මේක තමයි අපටත් හඳුන්වලා දෙන්න හදන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක මේ ආණ්ඩුව ගනුදෙනු කරනවා නම් සියයට දෙකට, සියයට දෙකයි දශම පහට විශාල ණය මුදලක් ගන්න පුළුවන් නම් අපේ විරුද්ධත්වයක් නැහැ. හැබැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගයෙන් අපිට අඩුම ගණනේ සියයට හතරේ පොලියට ණයක් අරගෙන මේ සංවර්ධනය සඳහා

[ගරු සුජීව සේනසිංහ මහතා]

යොදන්න පුළුවන් කියලා මේ ආණ්ඩුව පෙන්වලා තිබෙනවාද? ඒ වාගේම ඇමතිතුමනි, ඉතා පුදුම සහගතයි, මා හිතන්නේ සමහර අමාත්‍යවරු ප්‍රශ්න කළා, ජනතාවගේ යම් කිසි ආකාරයක අර්ථ සාධක මුදල හෝ මේ ලැබෙන මුදල්වලින් රට සංවර්ධනය කරන්නේ නැත්නම් මේ පාරවල්, ඒ වාගේම වරායවල් හදන්නේ කොහොමද කියලා. අපි කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික අංශයේ වැටුප් ලබන පුද්ගලයන්ගේ අවම වැටුප රුපියල් 7,000යි. ආණ්ඩුවේ නම් ඒක 11,900 සිට 17,000 දක්වා වෙනවා. හැබැයි පෞද්ගලික අංශයේ අය අද අවම වැටුප වශයෙන් රුපියල් 7,000 ඉඳලා 9,000 වාගේ ඉතා සුළු ප්‍රමාණයක් තමයි ගන්නේ. [බාධා කිරීමක්] ඒ කට්ටියගෙන් ගන්නේ නැහැ නේ, ඔබතුමන්ලා? ඒ කට්ටියගෙන් විතරක් ගත්තා නම් අපි විරුද්ධ වන්නේ නැහැ.

ඔබතුමන්ලා ඇත්තටම ජනතාවට ආදරය කරන පක්ෂයක් නම්, සමාජවාදය අගය කරන පක්ෂයක් නම්, ධනවාදය ගරහන පක්ෂයක් නම් මේ ආකාරයෙන් ධනවත් පිරිසගෙන් පමණක් මේ මුදල අය කර ගන්න යම් කිසි ක්‍රමයක් ඉදිරිපත් කරන්න තිබුණා. එහෙම නැහැ. එක්සත් ජාතික පක්ෂයට දොස් කියනවා; එක්සත් ජාතික පක්ෂයේ විවෘත ආර්ථිකයට, අපේ ආර්ථික ප්‍රතිපත්තිවලට ගරහනවා. හැබැයි අන්තිමටම අවුරුදු 15ක්, අවුරුදු 20ක් ආණ්ඩු කරපු මේ ආණ්ඩුවටත්, මේ ආණ්ඩුවේ නායකයන්ටත් සිදු වෙලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති ඉදිරියට අරගෙන යාම පමණයි. එහෙම නැතිව ඒකට විකල්පයක් අපට ඇහිලා තිබෙනවා. ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති ඉදිරිපත් කරනවා; විකල්ප ලිබරල් ආර්ථිකයක් ඉදිරිපත් කරනවා කියලා, රජයේ අංශ ශක්තිමත් කරමින් මේ ආර්ථිකය ඉදිරිපත් කරනවා කියලා. හැබැයි අද වෙනකම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය අංශය ශක්තිමත් කරලා ඒ ආකාරයෙන් මුදල් උපයා ගෙන රට දියුණු කරන ක්‍රමයක් මේ ආණ්ඩුව අපට තවම පෙන්වලා නැහැ. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව මොකක්ද කරන්න හදන්නේ? අර අහිංසක ජනතාවට ඔච්චරම ආදරයක් තිබෙනවා නම් මේ කම්කරු ජනතාව වෙනුවෙන් එතුමන්ලා ඒ වෙන් කරන මුදල, ඒකේ සේවකයාට ඒ සේව්‍යයා -සේවා දායකයා සහ ඔහු සේවයට යොදවන ඒ ආයතනය- යම් කිසි මුදලක් තැන්පත් කරනවා නම් ඒ සියලු මුදල් ඒ විශ්‍රාම වැටුපට එකතු කරන්න මේ ආණ්ඩුවට හැකියාව තිබෙනවා. හැබැයි අද ඒක නොවෙයි සිදු වන්නේ.

ගරු ඇමතිතුමනි, හරියාකාරව මේක අධ්‍යයනය කළොත් තේරෙනවා මේකෙන් මුදල් ලැබෙන්නේ අවුරුදු 60කට පස්සේ කියලා. අවුරුදු 40 දී මුදල් ගෙවන්න පටන් ගත්තා නම් අවුරුදු 20ක් යනකම් -අවුරුදු 55න් විශ්‍රාම ගියත්- තමන්ට කිසිම ආකාරයකින් මුදලක් ලැබෙන්නේ නැහැ. ඒ ලැබුණත්, අවුරුදු 65න් විශ්‍රාම ගියා නම් අවුරුදු 3යි, 4යි ඒ විශ්‍රාම වැටුප. ඒක විශ්‍රාම වැටුපෙන් සියයට 20ක් වෙන්න පුළුවන්; සියයට 30ක් වෙන්න පුළුවන්. එතකොට ඉතුරු සියයට 70ට මොකද වෙන්නේ? ඒ සියයට 70 පාවිච්චි කරනවා මේ රටේ බංකොලොත් ආර්ථිකයට. ඔබතුමන්ලා හම්බන්තොට වරායා ගැන කථා කළා. ඇමතිතුමා කියනවා, "කඩයක් ඇරියත් කාලයක් යනවා ලු ඒ කඩෙන් බඩු ගන්න කවුරු හෝ එන්න." නැව්වලට හම්බන්තොට වරායට එන්න ඔය කියන ආකාරයේ අමාරුවක් තිබෙනවා නම් අපි කියන්නේ මේකයි. අපට නැව් 10ක් ගෙනැල්ලා පෙන්වන්න මේ මාස හය ඇතුළත. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්නේ රාජ්‍ය ප්‍රතිපත්තියක් නැහැ; හරි ප්‍රතිපත්තියක් නැහැ, ජාතික ප්‍රතිපත්තියක් නැහැ කියලා. Hybrid වාහන ගැන කථා කරනවා. මොකක්ද මේ ආණ්ඩුවෙන් ඉදිරිපත් කරන්නේ? බංකොලොත් බූලත් කඩයක් කළමනාකරණය කරන ආකාරයටයි මේ ආණ්ඩුව රට කළමනාකරණය කරන්නේ. ජනාධිපතිතුමා ඉන්නවා; ඇමතිවරු විශාල පිරිසක් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම රටක ජාතික ප්‍රතිපත්තියක් සකස් කරන කොට මාස 6න්, මාස 7න් සිදු වන ප්‍රතිඵල අනුව ඒවා සංශෝධනය කිරීමක් සිදු කෙරෙන්නේ නැහැ. දියුණු රටවල නීති සම්පාදනය කරපුවාම ඒ නීති අවුරුදු 10, අවුරුදු 15, අවුරුදු 20 වාගේ දිගු කාලයක් තිබෙනවා. ඇයි ඔබතුමන්ලා දැක්කේ නැද්ද hybrid වාහන ගෙන්නුවාම මේ ආකාරයේ ප්‍රශ්න පැන නැගෙයි කියලා. ඔබතුමන්ලා අවුරුදු පහේ බබ්බු නොවෙයි. Hybrid වාහන, ඉතා අධිවේගී, ඒ වාගේම සුඛෝපභෝගී වාහන මේ ලෝකේ නිෂ්පාදනය වෙනවාය කියන එක ඔබතුමන්ලා දැන ගන්න ඕනෑ. කවුරු හරි Prius එකක් හෝ වෙනත් වාහනයක් ගෙනාවාට පස්සේ තමයි ඔබතුමන්ලා දකින්නේ මේ ලෝකයේ තවත් හොඳ hybrid වාහන නිපදවා තිබෙනවා කියලා. ඊට පස්සේ ආපහු සංශෝධනයක් ගෙනෙනවා,පන්තියකවත් සංශෝධනය නොවන නීති මාලාවක් වාගේ.

දැන් අමාත්‍යතුමා සඳහන් කළා, විශේෂයෙන් මේ hybrid වාහනවලට අණ පනත් පැනවූවාම hybrid වාහන ගෙන්වන එක නවතිනවාය කියලා. එතකොට පරිසරය සම්බන්ධයෙන් ඔබතුමන්ලා බලාපොරොත්තු වන දේ මොකක්ද? ඒ hybrid වාහන ගෙන්වීම නිසා පරිසර විනාශය සියයට 60කට අඩු වෙලා තිබෙනවාය කියලා කිව්වා. ඉතින් පරිසර විනාශය තව දුරටත් අඩු කර ගන්න පුළුවන් නම්, මුළු රටේම hybrid වාහන ලියාපදිංචි කිරීම තුළින් අපට සියයට 10කට මේ පරිසර ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් නම් ඒකේ තිබෙන අඩු පාඩුව මොකක්ද? ඔබතුමන්ලාට ඒ අඩු පාඩුව තේරෙන්නේ නැහැ. වාහන ආනයනය කරන විශාල පිරිසකට මේ රටේ මාස දෙකේ නීති, අණපනත්වලට සූදානම් වෙන්න සිද්ධ වෙනවා. හරියාකාරව තේරුම් කරන්න බැහැ, තමන්ගේ ව්‍යාපාරය ගැන හරියාකාරව සැලසුම් කරන්න බැහැ. මොකද, ආණ්ඩුවට හිතුණු ගමන්ම, අමාත්‍යවරයාට හිතුණු ගමන්ම නැත්නම් ඉහළින් අණක් ආපු පමණින් මේ නීති, අණපනත් වෙනස් කරනවා. අපි කියන්නේ, අමාත්‍යතුමනි හොඳට හිතන්න; කමිටුවක් පත් කරන්න; වාහන සම්බන්ධයෙන් දන්න කට්ටිය ගෙන්වන්න; ගෙන්වලා අහන්න ඉදිරි අනාගතයේදී -තව අවුරුදු 5කින්, 10කින්- මොනවාගේ hybrid වාහනද නිපදවෙන්නේ; මොනවාගේ බලයක්ද මේවාට තිබෙන්නේ; මොනවාගේ ධාරිතාවක්ද තිබෙන්නේ; කීයටද ගෙන්වන්න පුළුවන්; මේ hybrid වාහන මඟින් කොයි ආකාරයෙන්ද පරිසරය ආරක්ෂා කර ගන්න පුළුවන් කියලා. මේ සම්බන්ධයෙන් අධ්‍යයනක් කරන්න. ඔබතුමන්ලා එළි වුණ ගමන්ම ඇඳේ මොන පැත්තෙන්ද නැඟිට්ටේ කියා බලලා නීති, අණපනත් වෙනස් කරන්න එපා. මීට වැඩිය ඔබතුමන්ලාට පහසුවෙන් පුළුවන් නීති, අණ පනත් වෙනස් කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යාපාරවල යෙදෙන පිරිසට ජාතික ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් කිසිම ආකාරයක අවබෝධයක් නැති නිසා තමන්ගේ ව්‍යාපාරය කර ගන්න බැහැ. අපට රටේ ඉදිරි අනාගතය සැලසුම් කර ගන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප ගැන කථා කළා. මම දන්නවා විශාල පිරිසක් ආණ්ඩුව බලාපොරොත්තු නොවුණු ආකාරයෙන් ජනාධිපතිතුමාට විරුද්ධව, ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිවලට විරුද්ධව-[බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නොයෙකුත් ක්‍රම පාවිච්චි කරලා තුනෙන් දෙකක බලයක් ගත්තාට -මේවා ඡන්දවලින් ලැබුණු තුනෙන් දෙකක බලයක් නොවෙයි.- අපි ව්‍යවස්ථාවෙන් කිසිම ආකාරයකින් බලයක් පවරලා නැහැ ස්ථාන මාරු කරලා, පක්ෂ මරු කරලා ආණ්ඩුවලට තුනෙන් දෙකක බලයන් හදන්න. එහෙම කරලා තිබෙනවා නම් ඒ තුනෙන් දෙකේ බලයටත් හොඳ පාඩමක් උගන්වන්න අපේ ජනතා බලවේගය නැඟී සිටියා. මේක ආරම්භය පමණයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා.

[අ. භා. 6.05]

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය නැවත නැවතත් ජනතා අනුමැතියෙන් ක්‍රමානුකූලව වැඩි බලයක් ලබා ගෙන තිබෙනවා. ඒ මේ රජයේ ප්‍රතිපත්තිවල සාර්ථකභාවය ඔප්පු කරන නිසායි. මට කියන්න තිබෙන්නේ "The thing itself speaks" නැත්නම් *'Res ipsa loquitur'* කියලා. ඒ නිසා මේ ගැන තටම, තටම කථා කරන්න දෙයක් ඒ තරම් නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කවුරුත් දන්නවා කොහොමද තත්ත්වය කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කියන්නේ, ආණ්ඩුව එන්න එන්නම බලවත් වෙලා තිබෙනවා, ඡන්දවලින් බලවත් වෙලා තිබෙනවා කියලායි. [බාධා කිරීම්] මන්ත්‍රීවරුන්ගෙන් බලවත් වෙලා තිබෙනවා. එක්සත් ජතික පක්ෂයත් එක්ක සල්ලිවලින් තරග කිරීමේදී නම් අපි පරදිනවා. මොකද, එක්සත් ජාතික පක්ෂය බටහිර ගැත්තන්ගේ පක්ෂයක්. ඒ නිසා බටහිරෙන් දැන් තීන්දු කරලා තිබෙනවා මේ ආණ්ඩුව කොහොම හරි පෙරළන්න ඕනෑ කියලා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එතකොට රුසියාව බටහිර රටක් නොවෙයි ද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නැහැ. එය බටහිර නොවෙයි. එය නැඟෙනහිර ලෝකයේ. රුසියාවේ බටහිර කොටසක් තිබෙනවා. ඒකෙන් ඒක බටහිර රාජ්‍යයක් වන්නේ නැහැ. එයට අයිති වන්නේ විශේෂ භූමිය තත්ත්වයක්. ඒ ගැන කථා කරන්නට ගිහින් අපරාදේ කාලය නාස්ති කරන්නට ඕනෑ නැහැ. මට කියන්නට වුවමනා කරන්නේ මෙයයි. බටහිර ගැත්තන්ගේ පක්ෂයක් හැටියට අනිවාර්යයෙන්ම බටහිර ලෝකයෙන් කෝටි ගණන් මුදල් ලැබෙනවා. එම නිසා ඒ තරගයෙදි නම් අප පරදිනවා. නමුත් මේ රටේ මහජන ඡන්දයේදී අප දිනනවා. ඒ වාගේම මේ රටේ විචාර බුද්ධිය ඇති මන්ත්‍රීවරු කොයි පැත්තට එනවා ද කියන එක අනුව අපේ බලය ක්‍රමයෙන් වැඩි වෙනවා. විචාර බුද්ධිය අනෙක් අයටත් ඇති. නමුත් ඒ ගොල්ලන්ට බැරි අමාරු කිහිපයකුත්ඇති. අපේ පැත්තට එන්නටය කියා ආරාධනය කරනවා නොවෙයි. ඇත්තටම තමුන්නාන්සේලාට අද යම් බලාපොරොත්තු ඉටු කර ගන්නට පුළුවන් වේවි, බටහිර ලෝකයේ මේ ගෙන යන්නාවූ විශාල බලපෑම තුළ මේ ආණ්ඩුව පෙරළේවි කියා. එතකොට අප තමයි බලය ගන්න ඉන්නේ කියා, ඒ තරම් ලෙහෙසියෙන් හිතා ගෙන ඉන්න එපා. ඔය හවුල තුළ ත්‍රස්තවාදීන් නැත්නම් මිනීමරුවන් කොච්චර ඉන්නවා ද කියා තමුන්නාන්සේලා දැනගත යුතුයි. ඒ අය දැන්මම සැලසුම් කර ගෙන තිබෙනවා, එකට එකතු වෙලා බලය ගන්න හැකි වුණොත් කොහොමද තමුන්නාන්සේලාව අවසන් කර, ඒ අය මේ ඇති වෙච්ච නව බලයේ අයිතිය තමන්ට පවරා ගන්නේ කියා. ඒ ගැන විස්තර තමුන්නාන්සේලාම සොයා ගන්න.

ඊළඟට මට කියන්නට තිබෙන්නේ මේ කාරණයයි. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට මේ විවෘත පාර්ලිමේන්තුවේ මේ තරම් සාහසික බොරු කියන්නට පුළුවන් නම්, එතුමාට කියන්නට බැරි මොකක් ද කියා මා දන්නේ නැහැ. එතුමා කථා කරන්නේ ඉතාමත් හිතවත් ලෙස, මේ ආණ්ඩුව ගෙනයන හැටි පෙන්වන්න, මේකට උපදේශකයා හැටියට ක්‍රියාත්මක වන්න. නමුත් එතුමා කෙළින්ම කිව්වා, මේ විශ්‍රාම අරමුදල Consolidated Fund එකට අයිති වෙනවාය කියා. මා ඇහුවා, "එහෙම කොහේද කියා තිබෙන්නේ "කියා. "ඒක ඔබතුමාගේ කට්ටියගෙන් අසා බලා ගන්නය "කිව්වා. Consolidated Fund එකටයි මේ fund එකටයි කිසිම සම්බන්ධයක් නැහැ. අර ගෙන බලන්න. ඒ මුල් කෙටුම්පතේ වෙනස් කළ යුතු තැන් ගණනාවක් තිබෙනවා. ඒ වෙනස්කම් වෙනුවෙන් වෘත්තීය සමිති නියෝජිතයකු හැටියට මාත් යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. නමුත් Consolidated Fund එකට ඒක අයිතිය කියා කොහේවත් කියා නැහැ. ඒක අර්ථසාධක අරමුදල වාගේ වෙනම fund එකකින් වෙනම නීතියකින් තමයි පවත්වාගෙන යන්නේත්, ක්‍රියාත්මක වන්නේත්. [බාධා කිරීමක්] කවුද? අහන්න ප්‍රශ්නය.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ ගැන සාකච්ඡා කරන වෙලාවේ ඔබතුමාගේ ඥානය, වෘත්තීය සමිති අත් දැකීම් හරහා ඔය අඩු පාඩුකම් දැක්කේ නැද්ද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අප ඒක කියවා අපේ තිබෙන්නාවූ වෙනස් මත ඉදිරිපත් කළා. අපි කවුරුත් හිටියේ ඉතා උනන්දුවකින් මැයි දිනයට පෙර මේක ජනතාවට ප්‍රකාශයට පත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ පළමුවන වර කියවීමට. පළමුවන වර කියෙව්වාය කියා ඒ ගැන සාකච්ඡාව අවසන් වන්නේ නැහැ. ඊට පස්සේ අපට පුළුවන් ඒක උපදේශක කාරක සභාවට දාලා සාකච්ඡා කරන්න. රටේ සාකච්ඡා කරන්නට පුළුවන්. ඒ අනුව අපට වෙනස්කම් ඇති කර ගන්න පුළුවන්. අපට ඒ වෙලාවේ තිබුණු හදිසිය තමයි මේක මේ මැයි දිනයේදී ප්‍රකාශයට පත් කිරීම. ඒකයි කාරණාව. දැන් ඊට පස්සේ අපේ යෝජනා දුන්නා, මෙන්න මේවා වෙනස් කරන්නය කියා. ඒ අනුව වෙනස්කම් කර ගෙන යනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
දැන් මේ පනත ඉල්ලා අස්කර ගන්නවා ද? එහෙම නැත්නම් ආයෙත් ගෙනනවා ද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේ පනත ඉල්ලා අස් කර ගන්නේ නැහැ.[බාධා කිරීම්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඉල්ලා අස්කර ගන්නේ නැහැ! ඒකයි, මා ඇහුවේ. [බාධා කිරීම්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේ පනත ඉල්ලා අස් කර ගන්නේ නැහැ. මේ පනත සංශෝධිත පනතක් හැටියට ගෙනෙනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගේනවා?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගෙනෙනවා. මේ පනත සංශෝධිත පනතක් හැටියට ගෙනෙනවා. සංශෝධනයන් ඇතුළත්ව. [බාධා කිරීම්] මේ මගේ අදහස රාජ්‍යයේ මතය ගැන. එක එක්කෙනාට එක එක මත තිබෙන්නට පුළුවන්. නමුත් මගේ මතය මේකයි. [බාධා කිරීම්] ඔව්. රජයේ අරමුණ පිළිබඳව මගේ මතය.

ඊළඟට මේ විශ්‍රාම වැටුප් අරමුදල ගත්තාම ඇත්තටම උන්මත්තකයන්ට පමණක් කියන්නට පුළුවන් දේවල් තමයි මේ ගැන විවේචනය කරන අය කියන්නේ. ඔක්කොම අනාගත අංජනම් කථා. මේක විසින් අර්ථසාධක අරමුදල ගිල ගනු ලබනවාලු. කොහොමද ඒක කියන්නේ? මොකක්ද ඒකට පදනම් වෙන සාධකය? මම ඒ ගැන ඇහුවා එදා සාකච්ඡාවේදී. එතකොට මට කිව්වා, සේවකයාගේ පැත්තෙන් අර්ථසාධකයෙන් සියයට දෙකකට නොවැඩි මුදලක් ගන්නා බවත්, හාම්පුතාගේ පැත්තෙන් සියයට දෙකකට නොවැඩි හෝ සමාන වටිනාකමක් අය කර ගන්නා බවත් කියා තිබෙනවාය, ඒ අනුව සියයට දෙකට වැඩිය ගන්නවාය කියලා හිතා ගන්න පුළුවන්ය කියලා. සියයට දෙකට වැඩිය ගන්නවා නම් මේ පනත සංශෝධනය කරන්න එපායැ. ඒක ආපසු මේ පාර්ලිමේන්තුවට එන්න එපායැ. ඒකයි මා කිව්වේ උන්මත්තකයන්ට පමණක් කියන්න පුළුවන් අංජනම් කථා කිය කියා තමයි ඇවිදින්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මෙතැන තිබුණා එක ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය මේකයි. අවුරුදු පහක් සේවය කරලා ගෙදර යන අයට ලැබෙන විපාක ගැන මොකවත් එහි කියැවිලා තිබුණේ නැහැ. එහි කියැවිලා තිබුණේ නැහැ ඒ ගෙවන මුදල් දායකත්වය ආපසු ගන්න පුළුවන්ද, ඒකට පොලියක් හම්බ වෙනවාද, එහෙම නැත්නම් ඒ අයගේ තවත් තැනක සේවය ඒකට එකතු කළ හැකිද ආදි කරුණු. මේවා ඔක්කෝම එක්තරා විධියකට හිස් තැන් හැටියටයි තිබුණේ. මෙන්න මේවා පාවිච්චි කරලා තමයි අර උසි ගැන්වීම කළේ. අර දුප්පත් කොල්ලන් කෙල්ලන් ටික එන්නේ අවුරුදු පහක් වැඩ කරලා යන්න. විශේෂයෙන්ම කෙල්ලෝ. ඒ අය අතරේ මේ ගැන මහා භීතියක් ඇති කරන්න යෙදුණා. මේ වාගේ භීතිකා ඇති කරන්න ජේවීපී එකට පුළුවන් බව මා දන්නේ අද ඊයේ නොවෙයි. 1971 ඒ අයගේ නැඟිටීමට මොකක්ද යොදා ගත්තු කාරණාව? ඒ ගොල්ලෝ කිව්වා, "ලංකාව ඇමෙරිකානු ආක්‍රමණයකට ලක් වෙන්න යනවා. අන්න අර බෙන්තොට බඳින - දැන් ඒක හෝටලය බව කවුරුත් දන්නවා- හෝටලය තමයි ඇමෙරිකන් කඳවුර. 1970 පරාජය වුණත් යූඑන්පී එක බලය තියා ගන්නවා. ඇමෙරිකන් හමුදාව එනවා. ඒ නිසා අපි දැන්මම ලෑස්ති වෙන්න ඕනෑ ආයුධ සන්නද්ධ අරගලයට." කියා. අන්න එහෙමයි ජේවීපී එක එදා කිව්වේ. ඔය වගේ අංජනම් කථා කියලා, භූත කථා කියලා මේ මිනිසුන් මේ රටේ කරපු අපරාධය මහා වංශයේ ලියලත් මෙතෙකැයි කියලා ඉවර කරන්න බැහැ. ඒ තරම් අපරාධයක් මේ මිනිසුන් කරලා තිබෙන්නේ මේ රටට.

ඒ අය pension අරමුදලට විරුද්ධව ගෙන යන මේ භීතිකාවට යම් යම් හිතලු, යම් යම් අනුමානයන්, යම් යම් හිස්තැන්වලින් ඇති කර තිබෙන්නා වූ එක්තරා විචිකිච්ඡාවන් තමයි පදනම් කර ගෙන තිබෙන්නේ. අප මේවා ඔක්කෝම පුරවලා, හදලා තමයි සංශෝධිත පනත් කෙටුම්පත ගෙනෙන්න ඕනෑ. දැන් මා කියන්න යන්නේ මේකයි. මේ විශ්‍රාම අරමුදලෙන් ඇත්තටම තමන්ගේ අර්ථසාධක අරමුදල නැති වෙනවා, ETF එක නැති වෙනවා, පාරිතෝෂිකය නැති වෙනවා, ඔක්කෝම නැති වෙනවා, උඹලාට ගෙවන ප්‍රමාණයත් හැම දාම ගෙවන්න බැහැ, අරමුදලේ මුදල් තිබෙන කල් විතරයි ගෙවන්න පුළුවන් කියලා තර්ක කරනවා. මේ තර්ක ඔක්කෝම ගොඩ නඟලා තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණේ අතේ රෝල් මැෂිම. මේවා එක්සත් ජාතික පක්ෂයත් මේ විධියටම අනුමත කිරීම හරිම ඛේදජනකයි. මොකද, එක්සත් ජාතික පක්ෂය ඊට වඩා වෙනස් විධියේ පක්ෂයක්. මේ වාගේ කථා ගොඩ නඟලා සම්පූර්ණ බොරු බේගල් අත ඇරලා දානවා. ඔන්න ඉන්නවා ජනතා විමුක්ති පෙරමුණේ වර්ගයේ එක් කෙනෙක් ඔය පැත්තේ. ඒ තමයි රවි කරුණානායක. මෙතැන අමු කෙබරයක් කෙළලා නේ ගියේ. එයාද පත් කළේ සංවිධායකයා හැටියට? තමුන්නාන්සේලාට දෙයියන්ගේම පිහිටයි!

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මන්ත්‍රීවරුන් ගැන සඳහන් කරනවා. ඒ ටික ඉවත් කර ගන්න ඕනෑ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳයි. මා කියන්නේ මේකයි. තමුන්නාන්සේට දෙයියන්ගේම පිහිටයි! ඊළඟට මා කියන්න යන්නේ ඒ මරණය සිදු කළේ කවුද කියන එක ගැනයි. [බාධා කිරීම්] මෙතැන කථා කරපු එක මන්ත්‍රීවරයෙක්-

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අන්න හරි. ඒ ගැන කථා කරමු. කවුද මැරුවේ?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එක මන්ත්‍රීවරයෙක් කථා කරමින් ඇහුවා, මිනී මරලා, බැටන් පොලුවලින් ගහලා, ඔළු පළලා, වෙඩි තියලා මේ ආදරවන්ත විශ්‍රාම මුදල දෙන්න යන්නේ ඇයි කියලා. මේ ආණ්ඩුව උද්ඝෝෂණ කීයකට වෙඩි තැබුවාද 1975 ඉඳලා? නැහැ. මේ ආණ්ඩුව 1975 ඉඳලා කවදාවත් උද්ඝෝෂණවලට වෙඩි තියලා නැහැ. අධි ආරක්ෂක කලාපවලට ඇතුළු වෙන්න එන කොට කඳුළු ගෑස් ගහලා තිබෙනවා; බැටන් ප්‍රහාර දීලා තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
2001 දී මට වෙඩි තැබුවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දෙදහස්?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
2001 දී.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
2001 දී? මා මේ කථා කරන්නේ 2005 ගැන.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
2001 ජූනි 19.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
2005 ඉඳලා කියලායි මා කිව්වේ. [බාධා කිරීමක්] මා කිව්වේ 2005 ඉඳලා කියලා නේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එන්නේ 2005 නොවැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මම කිව්වේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව කාලයේ සිද්ධියක් ගැන.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ කථා මට වලංගු නැහැ නේ. එතකොට මමත් හිටියේ විපක්ෂයේ නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමාට මොකවත් වලංගු නැහැ නේ. ඔබතුමාගේ- [බාධා කිරීමක්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේ, තමුන්නාන්සේ හොල්මන් කථා කථා කරන්න එපා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
හොල්මන් නොවෙයි. ඔබතුමා ආණ්ඩුව ගැන කථා කරන කොට-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
තමුන්නාන්සේ-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම කථා කරන්නේ හලෝ, මේ ආණ්ඩුව ගැන.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඉතින් හලෝ අපත් කථා කරන්නේ ඒක තමයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
තමුන්නාන්සේ කථා කරන්නේ චන්ද්‍රිකාගේ ආණ්ඩුව ගැනයි. තමුසේ චන්ද්‍රිකා ඔළුවේ තියා ගන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ, මේ කාලය ගැනයි අපිත් කථා කරන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ කාලයේ මම හිටියේ විපක්ෂයේ හලෝ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරුසරු ඇතුව කථා කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මොන ගරුසරුද

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Let us carry on with the debate.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
වෙන මොකක්ද කියන්නේ? මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අනාගතය දන්නෙත් නැහැ. ඉතිහාසය දන්නෙත් නැහැ. [බාධා කිරීම්] මොන කාලකණ්ණියෙක්ද මන්දා. [බාධා කිරීම්] අපරාදේ අපේ කාලය නාස්ති කරන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒ භාෂාවෙන් කථා කරන්න දන්නා නම් හරි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
භාෂාව කථා කරන්නේ භාෂාව ගැළපෙන මිනිහාට. මම අනෙක් මිනිසුන්ට එහෙම කථා කරන්නේ නැහැ නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු ඇමතිතුමනි, අනවශ්‍ය විධියට බාධා කරනවා නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කාලකණ්ණියා කියන්නේ කාලය කන එකාට. වෙන කාටද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමා මූලාසනය බලා ගෙන කථා කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කාලය කන එකා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, මූලාසනය අමතන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
තමුන්නාන්සේලාගේ- [බාධා කිරීම්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අනේ මේ මන්ත්‍රීතුමා, තමුන්ගේ තිබෙන තරුණකමත් තියා ගෙන කියන දේ අහගෙන ඉන්නවා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*
දන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
රැවුල-

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
රැවුල මගේ සාඩම්බර-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Let us not provoke each other. Please address the Chair.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
රැවුල මගේ සාඩම්බර ප්‍රකාශයක්. ඒක දැන ගත්තෙ නැති එක ගැන මට කරන්න දෙයක් නැහැ. රැවුල නැති අය රැවුල අලවා ගන්න. ඒකට තවත් ගති ලක්ෂණ තිබෙන්න ඕනෑ ලිංග භේදයේ. හොඳයි. දැන් මම කියා ගෙන ආවේ 2005 ඉඳන් මේ ආණ්ඩුව කවදාවත් උද්ඝෝෂණයකට වෙඩි තියලා නැහැ කියලායි. කවදාවත් නැහැ. මේ ආණ්ඩුව කියන්නේ මහින්දගේ ආණ්ඩුව. මම එකතු වෙන්නේ මහින්දගේ ආණ්ඩුවටයි. මම වගකීම් භාර ගන්නේ චන්ද්‍රිකාගේ ආණ්ඩුවේ නොවෙයි. චන්ද්‍රිකාගේ ආණ්ඩුවෙන් ඉවත් වෙලා ඔන්න ඔය පැත්තේ වාඩි වෙච්ච මිනිහෙක් මම. එදා මම ප්‍රකාශයක් කළා. මේවා මොකක්වත් දන්නේ නැතිව - [බාධා කිරීමක්] කමක් නැහැ. ඉගෙන ගන්න කෝ හෙමිහිට. ආණ්ඩුවක් යම් යම් දේවල් පාලනය කර ගත යුතුයි. ඒකට ආණ්ඩුව යම් යම් ක්‍රම පාවිච්චි කරනවා. 1953 දී එක පෙළියට නව දෙනෙකු මැරුවා. කිසිම police inquiry එකකුත් නැහැ. පොලීසිය අත් අඩංගුවට ගත්තෙත් නැහැ. ඒ පිළිබඳව පොලිස්පති වගකීම් භාර ගත්තෙත් නැහැ. මම හිතන්නේ එදා හිටපු නායකයා වගකීම් භාර ගත්තා. එතුමා නම් ඉල්ලා අස් වෙලා ගියා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒ කාලයේ අපි හිටියෙත් නැහැ නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එතුමා ඉල්ලා අස් වෙලා ගියා. මොකද, එතුමාට ඉල්ලා අස් නොවී ඉන්න බැරි වුණා, ජෝන් කොතලාවලගෙන් තිබුණු පීඩනය නිසා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, your time is up. Therefore, do not entangle yourself with unnecessary debates.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මගේ කාලය කාපු එකයි මගේ හිතේ අමාරුව. මගේ කාලය කාලා සම්පූර්ණයෙන්ම තමන්ගේ මුග්ධභාවය නිරාවරණය කරලා තවත් මොනවා හරි තිබෙනවා නම් ඒකටත් ලැහැස්ති වෙන්න හදන්නේ.

ඊ ළඟට මම කියන්නේ මේ මරණය සිදු කළේ කවුද කියන එකයි. ඒ ගැන කියලා මම මගේ කථාව අවසන් කරන්නම්. මේ මරණය සිදු කළේ ජේවීපී එක. [බාධා කිරීමක්] ඔව්. ගිහිල්ලා හාද වෙන්න. ඔහෙලගේ යාළුවෝ දිහා බැලුවාම ඔහේලා කවුද කියලා කියන්න පුළුවන්. එහෙම කියමනක් තිබෙනවා. JVP එක මේ තරුණයා මැරුවේ. කොහොමද මැරුවේ? පොලීසියට ගල් ගහලා පොලීසිය ප්‍රකෝප කෙරුවා. පොලීසිය ප්‍රකෝපකාරී ආවේගයන්ට පත් කළා. "මෙය garment sector එකට බලපාන්න ඕනෑ නැත්නම් මෙය ක්‍රියාත්මක කිරීමේදී ඒක බලපාන්නේ නැහැ" කියලා කියන කොට එතැන හිටපු කම්කරුවන් cheer කළා. Cheer කරන කොට පිටි පස්සේ ඉඳන් ගල් ගැහුවා, ඇවිස්සීමට. එතකොට ඇති වුණු තත්ත්වය එක්ක ප්‍රකෝපකාරී ආවේගයෙන් ක්‍රියා කරපු පොලීසියේ දෙන්නෙකු, තුන් දෙනෙකු ඉන්න ඇති. ඒ අය දැන් ඉන්නේ අත් අඩංගුවේ. ඇයි නියෝගයක් නැතුව එහෙම

කළේ? ඒ අය ඒක කළේ නියෝගයක් නැතුවයි. පොලිස්පති මේ පිළිබඳව වග කිව යුත්තෙක් හැටියට කැමති වෙලා තිබෙනවා නැවතත් තමන්ගේ සේවය දීර්ඝ කිරීමට ඉල්ලා නොඉන්න. ඒ වගේ දැන්-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ගරු ඇමතිතුමා. පිළිතුරු කථාව කරන්නත් තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේ සම්බන්ධයෙන් මහානාම තිලකරත්න විනිශ්චයකාරතුමා යටතේ කොමිටියක් පිහිටුවලා තිබෙනවා. අන්න ඒ කොමිටියේ වාර්තාව අපි ලබා ගෙන බලමු මේකේ තවදුරටත් වංචා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසන් කරනවා. කියන්න තවත් බොහෝ දේවල් තිබුණත් මේ දැනුම හා-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ආණ්ඩු පක්ෂය වෙනුවෙන් විනාඩි 5ක් මෙතුමාට ලබා දෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දැනුම හා තොරතුරු. මේවා facts කියලායි අපි කියන්නේ. දැනුම හා තොරතුරු. මේවාට facts -කරුණු- කියලා අපි කියනවා. ඒවා අපි එකඟ විය යුතුම දේවල්. මතය ඕනෑ එකක් වෙන්නට පුළුවන්. ඒ නිසා මා කියන්නේ, ඇත්තටම මේ විශ්‍රාම අරමුදල ගැන හරියට තොරතුරු හා කරුණු ලබා ගෙන අපි විවාද කරමු; අපි සංවාද කරමු කියලයි. අපි ඒ ගැන මේ රටේ තව තවත් සාකච්ඡාවට ඉඩකඩ දෙමු. අපට කිසිම වුවමනාවක් නැහැ, මේක තල්ලු කර ගෙන, තල්ලු කර ගෙන ගිහිල්ලා, කාගේවත් බෙල්ල උඩින් තල්ලු කරන්න. අපි සාකච්ඡා කරමු; විවාද කරමු. ඒවාට එන්න. ඒවාට ඇවිල්ලා පල් වෙලා යන්න එපා.

මාත් එක්ක කෙරුණු විවාදයකදී ඇහුවා, IMF Agreement එක ගැන. මම ඇහුවා, කෝ ඒ agreement එක කියලා. එක්සත් ජාතික පක්ෂයේ එක් මන්ත්‍රීවරයෙක් දැන් මේ ගරු සභාවේ කියෙව්වා,"මෙන්න IMF-Ireland Agreement"කියලා. පැහැදිලියි. ඒ වාගේම අර එදා ආපු සමරසිංහ යන අයත් කථා කළේ IMF ගැන. මම කිව්වා, කෝ, ඒ කියන ලියවිල්ල මට පෙන්වන්න කියලා. ඒ අයට ලියවිල්ලක් පෙන්වන්න බැරි වුණා. එයා පෙන්නුවා කඩදාසි කෑල්ලක්. ඒ තිබෙන්නේ IMF එක සාමාන්‍යයෙන් විවිධ රටවලට දීලා තිබෙන තමන්ගේ නිරීක්ෂණ. ඉතින් ඔන්න ඔය වාගේ කථා උඩයි මේවා යැපෙන්නේ. IMF Agreement එකක් ගැන කථා කරනවා. මම ඇහුවා, අර්ථ සාධක අරමුදල කොහොමද මේකට වැය කරන්නේ කියලා. "නැහැ, එහෙම තමයි කරන්න ඉන්නේ, අපි දන්නවා." කිව්වා. මා ඇහුවා, කොහොමද මේ මුදල් ආණ්ඩුව පාවිච්චි කරන්නේ කියලා. "නැහැ, ඒකට තමයි ඔය මුදල් හොයන්නේ" කිව්වා. මේවායේ නීති රීති, නීතියේ රාමුව, නීතිවලින් නියම කරලා තිබෙන කොන්දේසි, ඒවා එකක්වත් සැලකීමට නොගෙන, නිකම් දූවිලි වාගේ පාරට විසි කරලයි මේ අය කථා කරන්නේ. ඔහොම විවාද කරන්න බැහැ. විවාද කිරීමේ දී කරුණු පිළිබඳව අපි එකඟ වන්නට ඕනෑ. මත ප්‍රකාශ කිරීම, අර්ථ කථනය ගැන අපට ස්ථාවරයන් දෙකක් ගන්නට පුළුවන්. දැනුවත්කමක් නැතිව හෝ දැනුවත්කම බල්ලට දමලා මෙතැන කෙබර කෙළින අයට එච්චරයි මම කියන්නේ.

ඊළඟට හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ ණය ගැන බොහෝ දේවල් කථා කරලා ගියා. එතුමන්ලා පෙනී සිටින්නේ, "අපි ස්වාධීන කට්ටිය, අපි ආණ්ඩුවට ඕනෑ උපදේශයක් දෙන්නම්, හරියට වැඩේ කරගෙන යනවා නම් තමයි අපි කැමැති, ඒක නොකරන එක ගැනයි අපි මේ කථා කරන්නේ" කියලයි. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියලා තිබුණා, මේ ණය බර පියවීමේ ප්‍රශ්නය ගැන. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට කවුරුවත් මේ පිළිතුර දුන්නාද කියලා මා දන්නේ නැහැ. අපේ ණය බර debt to GDP අනුපාතය අද සියයට 83 දක්වා පහළ වැටිලා, තවත් පහළ වැටෙමින් තිබෙනවා. දැනට අවුරුදු හතකට ඉස්සර වෙලා GDP එකට වඩා වැඩියෙන් සියයට 103ක තිබුණේ, debt to GDP ratio. අද ඒක සියයට 83ක් වී තිබෙනවා. ඒකෙන් තේරෙන්නේ නැහැ, ණය අඩු වුණාය කියලා. ණය බර වැඩි වුණා. නමුත් කොහොමද මේ ratio එක අඩු වන්නේ? Ratio එක අඩු වන්නේ, GDP එක වැඩි වීමෙන්. ඉතින් GDP එක වැඩි වනවාය කියලා කියන්නේ ඒ රටේ ආර්ථික හා මූල්‍ය ශක්තිය. ලෝකයේ ඕනෑම සාධකයක් සලකා බලන්නේ ඒ රටේ ණය අනුපාතය ගැන. ඉතින් මේවා ගැන මෙතැන එහෙම නොකියා, මේවා හංගා ගෙන කථා කරන එක ඒ තරමම ඥානවන්තකමක්වත්, එහෙම නැත්නම් ඒ අයගේ දැනුම ප්‍රකාශ කිරීමක්වත් නොවන බවයි මා කියන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, කරුණාකර අවසන් කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ණය පිළිබඳ එසේ වන විට අපේ මේ රවි කරුණානායක මන්ත්‍රීතුමා අහනවා, "ඒක පුද්ගල ආදායම මෙච්චරයි කියලා ලොකුවට පෙන්නුවාට හැමෝටම ලැබෙනවා ද?" කියලා. මේ මොන කථාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමාට පිළිතුරු දෙන්න වෙලාව නැතිව යනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හරි. මා අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි කවුරුත් දන්නවා, ඒක පුද්ගල ආදායම කියලා කියන්නේ, හැමෝටම ලැබෙන මුදල නොවන බව. නමුත් එතුමා ඒක ප්‍රධාන තර්කයක් කර ගන්නවා නේ. සමාජ දර්ශක කියලා එකක් තිබෙනවා. මානව දර්ශක, ආර්ථික හා මූල්‍ය දර්ශක කියලා තව තිබෙනවා. මෙන්න මේවා ගැන දැන ගෙන කථා කරනවා නම් හොඳයි කියා මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ. භා. 6.25]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විනාඩි කිහිපය තුළ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙනුවෙන් සියලු දෙනාට අපේ ස්තුතිය පුද කරන්නට ඕනෑ. මා

[ගරු ගීතාංජන ගුණවර්ධන මහතා]

හිතන හැටියට ඒ ටික තමයි මේ අවස්ථාවේදී අපට කරන්නට තිබෙන්නේ. පළමු කොට විශේෂයෙන්ම අද මේ සභාවේ විවාදයට සම්බන්ධ වුණු සියලුම පාර්ශ්වයන්ට අපේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරන්නට ඕනෑ. ඒ වාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරීන්ටත්, අද උදේ සිට මේ සභාව දැනුවත් කරමින් රැඳී සිටි නිලධාරීන්ටත්, ඒ වාගේම මෙම අවස්ථාව වෙනුවෙන් සියලු කටයුතු සම්පාදනය කළ සියලු දෙනාටත් අපේ ස්තුතිය පුද කරන්නට ඕනෑ. විශේෂයෙන්ම මහින්ද චින්තන ඉදිරි දැක්ම තුළ ඉදිරිපත් කරපු අය වැය ලේඛනයෙන් අද මේ සභාවේ විවාදයට ඉදිරිපත් කරපු නියෝග, යෝජනා හා නියමයන් පිළිබඳව විශේෂයෙන්ම අපි තමුන්නාන්සේලාත් සමඟ මෙම විවාදය ගැඹුරින් විවේචනයට, අනුමැතියට සහ සාකච්ඡාවට ලක් කළා. මෙහිදී ප්‍රධාන වශයෙන්ම ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නියෝග තුනක් පිළිබඳවත්, මුදල් පනත යටතේ නියෝගයක් පිළිබඳවත්, රේගු ආඥාපනත යටතේ යෝජනාවක් පිළිබඳවත්, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග පිළිබඳවත් සහ ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත යටතේ නියෝග හා නියමය පිළිබඳවත් අපි සාකච්ඡා කළා. මේ ක්ෂේත්‍ර සියල්ලම අපේ ආර්ථික ගමන් මඟ ශක්තිමත් කරන්නට ගත් පියවර හැටියටයි අපි සලකන්නට ඕනෑ.

විශේෂයෙන්ම 2005 - 2010 කාල පරිච්ඡේදය තුළ අපේ ආර්ථිකයේ ඇති වී තිබෙන වර්ධන වේගය 2005ට පෙර 2000 - 2005 කාල පරිච්ඡේදය තුළ ඇති වුණු වේගය හා සංසන්දනය කරන කොට ආර්ථික ගමන් මඟේ එදා 2000 - 2004 අවසාන කාල පරිච්ඡේදය වන කොට සියයට 4ක වර්ධන වේගයක් තමයි සාමාන්‍යයෙන් වාර්තා වුණේ. අද 2005 - 2010 කාල පරිච්ඡේදය තුළ ආර්ථිකයේ ඇති වී තිබෙන වර්ධන වේගයේ සාමාන්‍යය ගත්තොත් සියයට 6.4ක සාමාන්‍ය වර්ධන වේගයක් අප වාර්තා කරලා තිබෙනවා. ලෝක ආර්ථික අවපාතය මධ්‍යයේ, යුරෝපයේ සහ ඇමෙරිකාවේ ඇති වුණු මහා කඩා වැටීම මධ්‍යයේ, ලංකාවේ තීරණාත්මක අවුරුදු දෙකක යුද්ධයේ මහා වියදම් මධ්‍යයේ අපි ඒ සියල්ලටම මුහුණ දෙමින් 2009 සියයට 3.5ක්ව තිබුණු ආර්ථික වර්ධනය, 2010 වන කොට සියයට 8 දක්වා වැඩි කරන්නට පුළුවන් ආර්ථික කළමනාකරණයකට අපට යන්න පුළුවන් වුණා. කවුරු මොනවා කිව්වත් අද එය ජාත්‍යන්තරව සහ දේශීයව පිළිගත් සාධකයක් බවට පත් වෙලා තිබෙනවා. මේ ආර්ථික කළමනාකරණයට නායකත්වය දුන් මහින්ද චින්තනය, මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ ගමන් කරපු ආර්ථික ගමන් මඟත් සමඟ බැඳුණු ජනතාව ජනාධිපතිවරණයේදී, මහා මැතිවරණවලදී, පළාත් සභා මැතිවරණවලදී, පළාත් පාලන මැතිවරණවලදී ජන වරමින් ජන වරමට එය ශක්තිමත් කරමින් ඒ ලබපු ජයග්‍රහණ හැටියටයි අපි අද කවුරුත් භුක්ති විඳින්නේ කියන එක අපි මතක් කරන්නට ඕනෑ. බලහත්කාරයෙන් ගෙන ගිය ගමන් මඟක් නොවෙයි. බලහත්කාරයෙන් රටින් තුනෙන් එකක් අල්ලා ගන්නට තැත් කරපු, රට බෙදන්නට තැත් කරපු ම්ලේච්ඡ කොටි ත්‍රස්තවාදය 2009 මැයි මාසයේ 18වන දා පරාජය කළා. මේ රටින් ත්‍රස්තවාදය තුරන් කරන්නට දැවැන්ත වියදමක් දැරුවාය කියන තමුන්නාන්සේලාටත් මතක් කරන්නට ඕනෑ, 2000 - 2004 කාල පරිච්ඡේදය තුළ ආරක්ෂක වියදම් දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 4.3ක් වශයෙන් තිබුණු නමුත් 2005 - 2010 දක්වා කාල පරිච්ඡේදය තුළ යුද්ධය මධ්‍යයේ සියයට 3.7 දක්වා ආරක්ෂක වියදම්වල කළමනාකරණයක් කරන්නට අපට හැකි වුණාය කියන එකත්.

උදේ කිව්වා, මේ තුළ ඇති වුණු වංචා පිළිබඳව; මේ තුළ ගහපු කොමිස් පිළිබඳව.

නමුත් මා කලින් කියූ පරිදි, එවැනි කළමනාකරණයකින් මෙම යුද වියදම්, ආරක්ෂක වියදම් අඩු කර ගෙන යන්නට පුළුවන් වුණාය කියන ටික මතක් කරන්නට ඕනෑ. මා අන්තිම වශයෙන් වචන කිහිපයක් කථා කිරීමට ඔබතුමාගේ අවසරය ඉල්ලනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Since these are Financial Regulations, shall we take another one or two minutes with the consent of the House? Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Okay. You may carry on for another minute.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

මා දීර්ඝව කථා කිරීමට නොවෙයි බලාපොරොත්තු වුණේ. විශේෂයෙන්ම අපේ මේ කාලපරිච්ඡේදය තුළ මේ රටේ අපනයන කර්මාන්තයේ අපනයන වැඩි කරන්නට, ඒ වාගේම විදේශ තැන්පතු වැඩි කර ගන්නට මේ ආර්ථික ගමන් මඟ තුළ හැකි වුණාය කියන ටික අපි මතක් කරලා දෙන්නට ඕනෑ. සමහරු කිව්වා, එදා වැඩි කරපු දේ අද අඩු කරනවා, අද අඩු කරන දේ හෙට වැඩි වෙනවාය කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. ALHAJ A.H.M. AZWER left the Chair, and MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] took the Chair.*

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රධාන වශයෙන් විවේචනයට ලක් වුණු කාරණයක් තමයි දෙමුහුන් වාහන පිළිබඳ ප්‍රශ්නය. මේ වාහනවලට බදු වැඩි කිරීම පිළිබඳ ප්‍රශ්නය හා අඩු කිරීම පිළිබඳ ප්‍රශ්නය. තමුන්නාන්සේලා, අපි අද ජීවත් වෙන්නේ නවීන ලෝකයක් තුළයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමා ජීවත් වන, ඔබතුමා නියෝජනය කරන දකුණු පළාතේ මේ අවුරුද්ද අන්තිම වෙන කොට අධිවේගී මාර්ගයක් විවෘත වෙනවා. අධිවේගී මාර්ගයක බර කරත්ත දුවන්න බැහැ; පරණ වාහන දුවන්න බැහැ. මේ මාර්ගයේ දුවන වාහන නවීන වාහන සහ අලුත් තාක්ෂණය ඇති වාහන විය යුතුයි. එසේ නම් අපි මේ රටට අලුතෙන් වාහන ආනයනය කළ යුතුව තිබෙනවා. අපේ වාහන පද්ධතිය, අපේ ප්‍රධාන ප්‍රවාහන පද්ධතිය නවීකරණය කළ

යුතුව තිබෙනවා. ඒ නිසා එවැනි ප්‍රවේශයකට යන්නට අවශ්‍ය ඒ පියවර තමයි මේ තුළින් ලබා ගෙන තිබෙන්නේ කියන ටික අපි මතක් කරන්නට ඕනෑ. පරිසරය, ඉන්ධන පිරිමැස්ම සහ ඇති වන තදබදය පිළිබඳව ඉදිරිය බලන ප්‍රතිපත්තියක සිටගෙනයි මේ වාහන ආනයනය පිළිබඳ කළමනාකරණයේ අපි යෙදිලා තිබෙන්නේ කියන ටික මතක් කරන්නට ඕනෑ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා බොහොම ස්තුතියි, අවසන් කරන්න.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
අන්තිම වශයෙන් වචන කිහිපයක් මේ දැවෙන ප්‍රශ්නය පිළිබඳව අපි කථා කරන්නට ඕනෑ. මේ රටේ සියලු ජනතාව කුල මල භේදයකින් තොරව, ආගම් භේදයකින් තොරව, ජාති භේදයකින් තොරව, එදා දිනා ගත්ත නිදහස නිසා සැනසීමෙන්, ඒ ස්වාධීනත්වය රැකගෙන 2600 සම්බුද්ධත්ව ජයන්තිය සමරපු අවස්ථාවක, ඒ නිදහස කෙළෙසන්නට අද දරන උත්සාහය, ඒ නිදහස අපෙන් උදුරා ගන්නට දරන උත්සාහය මා හිතන හැටියට එදා අපි, තමුන්නාන්සේලා දැක්කා. ඒ උද්ඝෝෂණයෙන් මේ කාර්යභාරයට අද වෙන අතකට ගමන් කරවන්නටයි හදන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අවසන් කරන්න.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
වඳින්න ගිය දේවාලය හිස මත කඩා වැටුණාය කියන ප්‍රකාශයේ අරුත මේකෙන් වැටහෙනවා. මේ රටේ ජීවත් වන බහුතරයක් වන පෞද්ගලික අංශයේ කම්කරුවන්ට විශ්‍රාම වැටුපක් ලබා දීම සඳහා ගත් පියවර කඩාකප්පල් කරන්නට අද කටයුතු කරන්නේ, එය පිටුපස ඉන්නේ එදා කම්කරු ඇමතිතුමා හැටියට ජනාධිපතිතුමා කම්කරු ප්‍රඥප්තිය ගෙනාපු වෙලාවේ එයට විරුද්ධ වුණු බලවේග තමයි. ඒ අය තමයි අදත් මේ විරෝධතා පිටුපස සිටින්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අවසන් කරන්න.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
විනාඩි පහකට කාලය සීමා කිරීම පිළිබඳව විරෝධය ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
On behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Order made by the Minister of Finance and Planning under subsection 3 of Section 4 of the Registered

Stock and Securities Ordinance (Chapter 420) and published in the Gazette Extraordinary No. 1694/20 of February 25, 2011,

which was presented on 03.05.2011, be approved.

(Cabinet approval signified)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### III

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
On behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Order made by the Minister of Finance and Planning under subsection 3 of Section 4 of the Registered Stock and Securities Ordinance (Chapter 420) and published in the Gazette Extraordinary No. 1694/21 of February 25, 2011, which was presented on 03.05.2011, be approved.

(Cabinet approval signified)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මුදල් පනත : නියෝගය
## நிதிச் சட்டம் : கட்டளை
## FINANCE ACT : ORDER

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
On behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Order made by the Minister of Finance and Planning under Section 2 of the Finance Act, No. 11 of 2002 as last amended by Finance (Amendment) Act, No. 13 of 2009 relating to Port and Airport Development levy and published in the Gazette Extraordinary No. 1689/2 of January 17, 2011, which was presented on 03.05.2011, be approved.

(Cabinet approval signified)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආනයන හා අපනයන(පාලන) පනත : නියෝග
இறக்குமதிகள், ஏற்றுமதிகள் (கட்டுப்பாட்டுச்) சட்டம் : ஒழுங்குவிதிகள்
IMPORTS AND EXPORTS (CONTROL) ACT : REGULATIONS

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

On behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Regulations made by the President, under Sections 4(3), 14 and 20 of the Imports and Exports (Control) Act, No. 1 of 1969, as amended by Act No. 48 of 1985 and Act, No. 28 of 1987 read with Article 44(2) of the Constitution and published in the Gazette Extraordinary No. 1702/18 of 21st April 2011,which were presented on 25.05.2011, be approved.

(Cabinet approval signified)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රේගු ආඥාපනත : යෝජනාව
சுங்கக் கட்டளைச் சட்டம் : தீர்மானம்
CUSTOMS ORDINANCE : RESOLUTION

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

On behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Resolution under Section 10 of the Customs Ordinance (Chapter 235) relating to import duties, which was presented on 25.05.2011, be approved. (Gazette Extraordinary No. 1702/17 of 21.04.2011)

(Cabinet approval signified)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත : නියෝග
கொடுப்பனவு உபாயங்களின் மோசடிகள் சட்டம் : ஒழுங்குவிதிகள்
PAYMENT DEVICES FRAUDS ACT : REGULATIONS

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

On behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Regulations made by the President under Section 8 (2) of the Payment Devices Frauds Act, No. 30 of 2006, read with Article 44 (2) of the Constitution and published in the Gazette Extraordinary No. 1536/27 of 14th February 2008, which were presented on 25.05.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත : නියමය
கொடுப்பனவு உபாயங்களின் மோசடிகள் சட்டம் : கட்டளை
PAYMENT DEVICES FRAUDS ACT : ORDER

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

On behalf of the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs, I move,

"That the Order made by the President under subsection (1) of Section 8 of the Payment Devices Frauds Act, No. 30 of 2006, read with paragraph (2) of Article 44 of the Constitution appointing persons and institution to the Panel of experts for the purpose of subsection (1) of Section 8 of the said Act and published in the Gazette Extraordinary No. 1677/26 of 28th October 2010, which was presented on 25.05.2011, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ පැවැති සිද්ධියේදී මියගිය අයට සහ දේපළ හානිවලට වන්දි
கட்டுநாயக்க சுதந்திர வர்த்தக வலயத்தில் இடம்பெற்ற ஆர்ப்பாட்டத்தின்போதான மரணம் மற்றும் சேதங்களுக்கு நட்டஈடு
COMPENSATION FOR DEATH AND DESTRUCTION AT KATUNAYAKE FREE TRADE ZONE INCIDENT

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය පරිදි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත යෝජනාව ඉදිරිපත් කරනවා:

"පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන් වෙත රජය මඟින් බලයෙන් පටවන්නට උත්සාහ කරන විශ්‍රාම වැටුප් හේතුවෙන් එයට විරුද්ධව කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ සේවකයන් විසින් 2011 මැයි 30 දින උද්ඝෝෂණ ව්‍යාපාරයක් පවත්වන්නට යෙදුණි.

ප්‍රජාතන්ත්‍රවාදී රටක සේවකයන් හට තම අයිතීන් වෙනුවෙන් හඬක් නැගීමේ ප්‍රජාතාන්ත්‍රික අයිතියක් තිබෙන අතර ඒ වෙනුවෙන් ඔවුන්ගේ විරෝධය ප්‍රකාශ කරන්නට යෙදුණි. එහෙත් මෙම සාමකාමී විරෝධතා ව්‍යාපාරයට පොලීසිය බලෙන් මැදිහත්ව ඉතා අප්‍රසන්නකාරී ලෙස

සේවකයන්ට පොලු මුගුරුවලින් එලව එලවා පහර දෙමින්, කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කරමින්, රබර් උණ්ඩවලින් වෙඩි තබමින්, එයින්ද නොනැවතී ඔවුන්ට වෙඩි තබමින්, ඔවුන් මරණයට පත් කරමින් කළ ප්‍රහාරය අප තරයේ හෙළා දකින අතර එම සිද්ධියට, එම පොලිස් පහර දීමට අණ දුන් දේශපාලනඥයන් සහ නිලධාරීන් හට විනයානුකූලව දඬුවම් කරන ලෙසටත්, විනාශ කළ, නිදහස් වෙළෙඳ කලාපය තුළ පිහිටි කර්මාන්තශාලා සහ ඒවායේ දේපළවලට රජය වන්දි ගෙවන ලෙසටත්, තුවාල සිදු වූ සහ මරණයට පත් වූ සියලු සේවක සේවිකාවන් වෙනුවෙන් මරණයට පත් වූ එක් අයෙකු වෙනුවෙන් රුපියල් ලක්ෂ 100ක වන්දියක්ද, තුවාල සහ ආබාධවලට ලක්වූ එක් අයෙකු වෙනුවෙන් රුපියල් ලක්ෂ 25ක වන්දියක්ද ගෙවීමට කටයුතු කරන ලෙසටත් මෙම ගරු සභාවට මම යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ ඉල්ලීම කරන්නේ විශේෂ කාරණා කිහිපයක් සඳහායි. මේ ප්‍රශ්නය ඇති වුණේ කොහොමද කියන එක ගැන මා දිගින් දිගටම අද පැහැදිලි කරන්න යන්නේ නැහැ. හෙට, හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය අවස්ථාවේදී අපි උත්සාහ කරනවා මේ ගැන පැහැදිලි කර දෙන්න.

අපි පළමුවෙන්ම රජයෙන් ඉල්ලනවා, මේ ප්‍රශ්නය තවදුරටත් වැඩිදුර යන්න නොදී, රජය එක හඬකින් කථා කරලා, මේ පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගත්තාය කියලා කියන්න කියලා. ඒක කරන විධියක් තියෙනවා, මේ පාර්ලිමේන්තුව තුළදී මේ පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගැනීමෙන්. වාසුදේව නානායක්කාර ගරු ඇමතිතුමා කියපු විධියට, මේ පනත් කෙටුම්පත අහෝසි කරන්න රජය යෝජනා කර තිබෙන බවක් එතුමා තවම දන්නේ නැහැ. මේක ඉතාම කනගාටුදායක සිද්ධියක්. තවත් සමහර මන්ත්‍රීවරු, නැත්නම් ඇමතිවරු මේ ගැන කිසිම දෙයක් දන්නේ නැහැ. මේක ඉතා කනගාටුදායක සිද්ධියක්. මෙයින් වෙන්නේ ඇවිළෙන ගින්නට පිදුරු දමනවා වාගේ වැඩක්. තමුන්නාන්සේලා පුන පුනා කියන්න උත්සාහ කළා, මේ සේවක අර්ථ සාධක අරමුදල විශ්‍රාම වැටුපකට පරිවර්තනය කරන්න ලෑස්තියක් නැහැ කියලා. සියයට දෙකේ කථාවක් කිව්වා. ඒ ටික අරගෙන තමයි මේ අරමුදල හදන්න යන්නේ කිව්වා. සේවක අර්ථ සාධක අරමුදලට අපි අත තියන්නේ නැහැ කිව්වා. ඒක තමුන්නාන්සේලා පුන පුනා කිව්වා. තවමත් ඒක කියනවාද කියන්න මා දන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කියනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කියනවා. එහෙම නම් තමුන්නාන්සේලාගේ අවධානයට මම යොමු කරවනවා, අද දින න්‍යාය පත්‍රයේ 16වන අංකය යටතේ සඳහන් කර තිබෙන පනත් කෙටුම්පතට. අද දින න්‍යාය පත්‍රයේ අංක 16 යටතේ "විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත - දෙවන වර කියවීම" යනුවෙන් තිබෙනවා. ඒ එකක්. ඒක ගැන කවුරුවත් කථා කළේ නැහැ. ඒකත් මේ විශ්‍රාම වැටුපටම අදාළයි. කරුණාකරලා ඒක කියවන්න. එතකොට තමයි හොඳට තේරුම් ගන්න පුළුවන් වන්නේ. ඒ එක්කම අංක 17 යටතේ සඳහන් වන පනත් කෙටුම්පතත් කියවලා බලන්න. "සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවන වර කියවීම." මේ න්‍යාය පත්‍රයේ තිබෙන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පතේ 5 වන වගන්තියෙන් මොකක්ද කියන්නේ? එහි 5 වන වගන්තියේ මෙසේ සඳහන් වනවා:

" මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 24අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම ඇතුළත් කළ වගන්තියේ නීතිය බලපෑම වන්නේ රක්ෂණ යෝජනා ක්‍රමයක් හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවීම වේ."

මෙහෙම කියන්නේ සේවක අර්ථ සාධක අරමුදල් පනතට සංශෝධනයක් ගෙන ඒමෙන්. මේක තමයි ඒ සේවකයෝ කිව්වේ. මේ විශ්‍රාම වැටුප් පනතට මේ සේවක භාරකාර අරමුදලේ සල්ලි ගන්නේ නැහැ කියලා තමුන්නාන්සේලා පුන පුනා කියන්න උත්සාහ කළත් ඒක තමුන්නාන්සේලා නොදැනුවත්ව කියපු කථාවක්. නමුත් මේ න්‍යාය පත්‍රයේ ඒ වාගේ පනත් කෙටුම්පත් කිහිපයක් තිබෙනවා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ න්‍යාය පත්‍රයේ අංක 14 යටතේ සඳහන් වෙනවා, "සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත - දෙවන වර කියවීම" කියලා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order, Hon. Member?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, there is no Bill before the House for discussion. The Hon. Joseph Michael Perera is discussing an irrelevant matter. He must confine himself to the Adjournment Motion that he moved. But, he is discussing an invisible Bill.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
I am discussing the Adjournment Motion.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Whatever that is contrary to the Standing Orders will be expunged.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
That is right, quite correct. දැන් මෙතැන අනවශ්‍ය විධියට මේක හිර කර ගන්න -මේ න්‍යාය පත්‍රයේ තිබෙන පනත් කෙටුම්පත් ටික හිර කර ගන්න- මේ ගොල්ලන් ලෑස්ති වෙනවා. මේ පනත් කෙටුම්පතට එන්න ඉස්සෙල්ලා තව තිබෙනවා, විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත සහ විශ්‍රාම වැටුප් යෝජනා පිළිබඳව පනත් කෙටුම්පතක්. ඒ වාගේම විදේශවල රැකියා කරන අයගේ විශ්‍රාම වැටුප් පිළිබඳ පනත් කෙටුම්පත් තුනක් සාකච්ඡාවට භාජනය වන්න තිබෙනවා. අනෙක් පනත් කෙටුම්පත් දෙක න්‍යාය පත්‍රයේ හංගලා තිබෙනවා. මොකක්ද ඒ? එකක් සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත. ඒකෙන් ඉල්ලන්නේ විශ්‍රාම වැටුපක් බවට පත් කිරීමේ බලය කොමසාරිස්තුමාට දෙන්න කියලා. මේක තමයි අපි පුන පුනා කිව්වේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
කොහේද තිබෙන්නේ?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඇයි නැත්තේ? මේ තිබෙන්නේ, කියවා බලන්න. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගොල්ලන්ට තේරෙන්නේ නැත්නම් අපට කරන්න දෙයක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න දේශපාලනඥයින්ට, ආණ්ඩුවට තේරුණේ නැති වුණාට වැඩ කරන ජනතාවට මේ මොකක්ද කියලා හොඳට තේරුණා. ඒ වැඩ කරන ජනතාව දේශපාලන පසු බිමක් නැතිව එදා ඒ සටන ගෙනිච්චේ ඒකයි. ඒ සටන තුළ නැවත වරක් මම තමුන්නාන්සේලාට- [බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඔය යෝජනාව ඉල්ලා අස් කර ගන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඉල්ලා අස් කර ගන්න? තමුන්නාන්සේගේ ඔළු ගෙඩිය හොඳ නැහැ නේ. ඒක නේ වැඩේ වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේගේ අවධානය සඳහා නැවත වරක් මේ ප්‍රශ්නයට තුඩු දුන් ප්‍රධාන හේතුව මොකක්ද කියන එක මම විස්තර කරන්නම්. සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත මේ න්‍යාය පත්‍රයේ තිබෙනවා. ඒක න්‍යාය පත්‍රයේ හංගලා තිබෙන්නේ. [බාධා කිරීම්] ඔව්, නීතිය හැදිලා, මේක පාර්ලිමේන්තුවේ සම්මත කරන්න විතරයි තිබෙන්නේ. මේක න්‍යාය පත්‍රයේ තිබෙනවා. මේක න්‍යාය පත්‍රයේ තිබෙන්නේ කොහොමද? [බාධා කිරීම්] පස්වෙනි වගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට 24අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම ඇතුළත් කළ වගන්තියේ නීතිය බලපෑම වන්නේ රක්ෂණ යෝජනා ක්‍රමයක් හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවීම වේ."

[බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, there is an Adjournment Motion, which is very clear and what he is discussing is irrelevant. I only wanted to ask the Hon. Member whether any of the party leaders asked to withdraw this at the Party Leaders' Meeting. ඉල්ලා අස් කර ගන්න කියලා කවුරු හරි කිව්වාද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. - [*Interruption.*]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
සේවක අර්ථසාධක අරමුදල් පනත වෙනස් කරන්න බලය දෙන්න කියලා මේ න්‍යාය පත්‍රයේ තිබෙන විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පතෙන් බොහොම පැහැදිලිව කියනවා. තමුන්නාන්සේලාට නොතේරුණාට මේ ටික වැඩ කරන ජනතාව අවබෝධ කර ගත්තා. ඒක නිසා තමයි කිව්වේ අපට සංසද ඕනෑ නැහැ, මේක පිටුපස තිබෙන රහස අපි දන්නවා කියලා. සේවක අර්ථසාධක අරමුදලේ තිබෙන රුපියල් බිලියන 1,000ක් මේ වර්ෂය ඉවර වෙන කොට තමුන්නාන්සේලා විශ්‍රාම වැටුප් අරමුදලට ගන්නයි යන්නේ. විශ්‍රාම වැටුප් අරමුදල සංශෝධනය කරන කොට එයින් මොකක්ද වෙන්නේ? [බාධා කිරීම්]

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
පට්ටපල් අසත්‍ය.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
දැනටමත් මේ විශ්‍රාම වැටුප් අරමුදල සංශෝධනය කිරීමෙන් ඒ විශ්‍රාම වැටුප් අරමුදල වියදම් කරන විධිය-

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුළු සභාවත්, ජනතාවත් නොමඟ යවමින් ජනතාව උසි ගැන්වීමට කරන ප්‍රකාශයක් මේ. මේක මහා භයානක ප්‍රකාශයක්. අමූලික අසත්‍යයක්. කිසිසේත් එහෙම උත්සාහයක් නැහැ. මේ අමූලික අසත්‍යයක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
යෝජනාව ගෙනැල්ලා මම මේ ඒ ගැන කථා කරනවා. මම ආණ්ඩුවට අභියෝග කරනවා. එදා ඒ වැඩ කරන ජනතාව ගත් තීරණය හරි. දේශපාලනඥයන්ට නොතේරුණු දෙයක් ඒ ජනතාව තේරුම් ගත්තා. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විශ්‍රාම වැටුප නැති කළා. මතකද? උත්තර දෙන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
විශ්‍රාම වැටුප් අරමුදල් පනත සංශෝධනය කරලා, ඒ අර්ථසාධක අරමුදල විශ්‍රාම වැටුපක් බවට පරිවර්තනය කරන්නට මේ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ යෝජනාවක් තිබුණා. [බාධා කිරීම්] ජනාධිපතිතුමා කිව්වා, ඇමතිතුමා කිව්වා, විවිධ අය ගිහිල්ලා කිව්වා, මේක පැහැදිලි කරලා දෙන්න කියා, විශ්‍රාම වැටුපට සම්බන්ධ වෙන කොට -ඒ සංශෝධන පනත් කෙටුම්පත ගෙනෙන කොට- සේවක අර්ථසාධක අරමුදලට අත තියන්නේ නැහැ කියලා. අපි මේ පැහැදිලි කරලා කියන්නේ ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව ඉදිරියේ මේ න්‍යාය පත්‍රයේම තිබියදීයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. [බාධා කිරීම්] ඒ නිසා කෑ ගහන්න දෙයක් නැහැ. හදිසි වෙන්න දෙයක් නැහැ. මේ න්‍යාය පත්‍රයේ තිබෙන පනත් කෙටුම්පත් ටික ඔක්කොම කියවලා තමුන්නාන්සේලා කල්පනා කරලා බැලුවොත් මේ තිබෙන රහස මොකක්ද කියලා තේරෙනවා. ආණ්ඩුවට මුදල් නැති නිසා සේවක අර්ථසාධක අරමුදලේ තිබෙන රුපියල් බිලියන 1,000ක් අර විශ්‍රාම වැටුප් අරමුදලට පරිවර්තනය කරලා ඒ හරහා මේක විවිධ ආයතනවල ආයෝජනය කරන්න -පුද්ගලික අංශයේ ආයෝජනය කරන්න, රජයේ ආයෝජනය කරන්න- මේ හදන්නේ. ඒ සඳහායි මේ පනත් කෙටුම්පත් ඔක්කොම මේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා තිබෙන්නේ. මේක රහසක් නොවෙයි. කරුණාකරලා නැවත වරක් අවධාරණය කරලා බලන්න. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේ කම්කරු ඇමති හැටියට සිටියා නේද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
සිටියා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ හිටපු කාලය මතකද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඔව්, මතකයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ කාලයේ පුද්ගලික අංශයට සල්ලි දුන්නේ නැද්ද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැත්තේ මොකද? තමුන්නාන්සේ තමයි ඒ සල්ලි කොම්පැනිවලට දුන් පළමුවැනි ඇමති. දැන් කෑ ගහනවා. මම දෙන්නම් ගණන්, ලියා ගන්න. මෙතැනට ඇවිල්ලා අසත්‍ය ප්‍රකාශ කරනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉන්න ඇමතිවරු එක්කෙනෙක්වත් මේ පනත් කියවලා නැහැ. ඒ මුදල් ආයෝජනය කළේ සේවක භාරකාර අරමුදලේ සල්ලිවලින්. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
එදා හෘදය සැත්කමකට, නිවාස ණයකට, දරුවන්ට පොත් දෙන්න අපි හදපු සේවක භාරකාර අරමුදලින් තමයි අපි වියදම් කළේ. අර්ථ සාධක අරමුදලින් නොවෙයි. මෙන්න පටලවා ගත් තැන. අපි සේවක භාරකාර අරමුදල පිහිටුවූවේ ස්වාමියාගෙනුත් සියයට 3ක් අරගෙන.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා නැඟූ ප්‍රශ්නයට මට රීති ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා, මොකක්ද රීති ප්‍රශ්නය?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
CTB එකේ අර්ථසාධක අරමුදල්වලින් රුපියල් මිලියන 1,500ක් හොරකම් කළා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
[බාධා කිරීම්] එදා කම්කරුවන් වෙනුවෙන් ආයෝජනය කරන්නයි අපි සේවක භාරකාර අරමුදල සකස් කරලා දුන්නේ. ඒක තමයි ආයෝජනය කළේ. අද එක එක තැන්වලට ගෙනැල්ලා ළමයින්ට ශිෂ්‍යත්ව දෙනවා. කොහෙන්ද ශිෂ්‍යත්ව දුන්නේ? පළමුවෙන්ම ශිෂ්‍යත්ව දුන්නේ මෙම අරමුදල පිහිටුවූවාට පස්සේ ඩී.බී. විජේතුංග මැතිතුමායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ආසයි කියන්න, එදා මම ඉන්න කාලයේ තමයි ඒ සේවක භාරකාර අරමුදල පිහිටුවූවේ. [බාධා කිරීම්] එහෙම නම් කරුණාකරලා

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

තේරුම් ගන්න, මම ඇමතිවරයා හැටියට සිටි කාලයේ එක වෙනසක් කළා. ඒ තමයි සේවක අර්ථසාධක අරමුදල් පනත වෙනස් කරලා සියයට 75ක නිවාස ණයක් දුන්න එක. [බාධා කිරීමක්] තමුන්නාන්සේ දන්නේ නැත්නම් දන්නේ නැති දේවල් කථා නොකර ඉන්න. සියයට 75ක නිවාස ණයක් දුන්නා. සේවක අර්ථසාධක අරමුදල ඇපයට තබා ගෙන වෙනත් ඇපයක් නැතිවයි ඒ සියයට 75ක මුදල දුන්නේ. [බාධා කිරීමක්] CTB එකට මේකෙන් දුන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එයින් ගෙවල් හදා ගත් අය අද ගෙයක, ඉඩමක හිමිකාරයෙක් බවට පත් වෙලා තිබෙනවා. විශ්‍රාම යන කොට ඒ ගොල්ලෝ විශ්‍රාම ගියේ ගෙයක අයිතිකාරයෙක් හැටියටයි. ඒක තමයි එක්සත් ජාතික පක්ෂය කරපු වෙනස.

ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය තමයි පාරිතෝෂික ගෙවීමේ පනත මේ රටට හඳුන්වලා දුන්නේ. [බාධා කිරීමක්] පාරිතෝෂික ගෙවීමේ පනත හඳුන්වලා දුන්නේ එක්සත් ජාතික පක්ෂය. වෙන කවුරුවත් නොවෙයි. සේවක භාරකාර අරමුදල හඳුන්වලා දුන්නේ කවුද? එක්සත් ජාතික පක්ෂය. මේ රටේ ජනතාවට හෘදය සැත්කමකට වියදම් කරන්න වුණා නම්, දරුවන්ට පොත් දෙන්න තිබුණා නම්, අසනීපයක් වෙලා ආරෝග්‍යශාලාවට ගියා නම්, ඒ අයට මුදල් ගෙව්වේ ඒ අරමුදලින්. දැන් මේ ගොල්ලෝ මේක පටලවා ගෙන තිබෙනවා. මේ ගොල්ලෝ සේවක අර්ථසාධක අරමුදල විශ්‍රාම වැටුපකට පරිවර්තනය කරන්නේ වෙන මොකුත් නිසා නොවෙයි, මේ අවුරුද්ද අවසාන වන විට රුපියල් බිලියන 1,000ක් සේවක අර්ථසාධක අරමුදලට දායක වන විට ඒ මුදල් රජයට ගන්න විධියක් නැති නිසායි. විවිධ බැංකුවලින් අරන් තිබෙන ණය ගෙවන්න විධියක් නැහැ. ඒ සඳහා පාවිච්චි කරන්න සේවක අර්ථසාධක අරමුදල විශ්‍රාම වැටුපට සම්බන්ධ කරලා, විශ්‍රාම වැටුප ආයෝජනය කරන්න වැඩ පිළිවෙළක් තමයි හදලා තිබෙන්නේ.

අද කාලය නැති නිසා මේ පිළිබඳව මම හෙටත් කථා කරනවා. රටටම කියනවා. පුළුවන් නම් උත්තර දෙන්න. තමුන්නාන්සේලා මේ පනත් කෙටුම්පත් ඔක්කෝම මේ න්‍යාය පත්‍රයට ඇතුළු කරලායි තිබෙන්නේ. හංගන්න බැහැ. ආනුෂංගික විධිවිධාන පනත් කෙටුම්පතක් තිබෙනවා. පනත් දෙකක් වෙනස් කරන්න පුළුවන්. එයින් එක පනතක් දැනටම වෙනස් කරන්නට සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත මේ න්‍යාය පත්‍රයට ඇතුළු කරලා තිබෙනවා. තමුන්නාන්සේලා අද බොහොම පැහැදිලිව විශ්‍රාම වැටුපක් කියලා කියන එක ඒ මුදලින් පරිවර්තනය වෙන්නේ අවුරුදු 5කට විතරයි. ඉතිරි ටික තමයි තමුන්නාන්සේලා සේවක අර්ථසාධක අරමුදලින් ගන්න යන්නේ. [බාධා කිරීමක්] කෑ ගහන්න එපා. ගරු ඇමතිතුමා, කරුණාකරලා කෑ ගහන්නේ නැතිව ඉන්න කියන්න කෝ. [බාධා කිරීම්] අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලන්නේ- [බාධා කිරීම්] මේ රටේ ජනතාවට අපි නැවත වරක් කියනවා, මෙන්න මෙය. ආණ්ඩුව එක එක තැන්වල එක එක කථා කියන්නේ නැතුව මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම බල මණ්ඩලයේ තීන්දුවක් නැතිව කැබිනට් මණ්ඩලයේ තීන්දුවක් අර ගෙන රජය කියපු දේ සහතික කරමින් හෙට මේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙන් ඉල්ලා අස් කර ගන්න. ඒ ඉල්ලා අස් කර ගන්නා ගමන් තමුන්නාන්සේලාගේ වැරදි ක්‍රියා මාර්ගය නිසා මරණයට පත් වෙච්ච අහිංසක දරුවාට- [බාධා කිරීමක්] එදා අපි ආරෝග්‍යශාලාවට ගියා. පොලුවලින් ගහලා, කකුල් කඩලා, අත පය කඩලා තිබුණා. තමුන්නාන්සේලා කියනවා නම් මේක ප්‍රකෝප කිරීමක් කියලා -මම දන්න දේ කියන්නේ- CID එකේ වාර්තා අර ගෙන බලන්න. මොකක්ද කියන්නේ? මේ රොෂෙන් ශානකට වෙඩි තිබ්බේ කර්මාන්තශාලාව ඇතුළට ගිහිල්ලා. එළියේ ඉඳලා රණ්ඩු කරන කොට නොවෙයි. [බාධා කිරීම්] අත පය කඩපු ඒ අහිංසක තරුණ තරුණියන්ගෙන්-තරුණියෝත් ඉන්නවා.- අපි ඇහුවා. CID වාර්තාවල තිබෙනවා කොහේදීද ගැහුවේ කියලා. [බාධා කිරීම්] කර්මාන්තශාලාව ඇතුළට ගිහිල්ලායි මේ අයට ගහලා, වෙඩි තිබ්බේ. [බාධා කිරීම්] එළියේ නොවෙයි. මේක එළියේ වෙච්ච සිද්ධියක් නොවෙයි. මේක බොහොම පැහැදිලි කරලා, හොඳ සාක්ෂියක් තිබෙනවා. ඒ සාක්ෂිය තමයි, දැනට factories හතරක් තිබෙනවා. ඒ factories හතර ඇතුළට ගිහිල්ලා පොලීසිය ඒ factoriesවල තිබෙන උපකරණ කුඩු කෙරුවා. පාඩුව කෝටි ගණනක්. මේ සටන් කරද්දී ඒකේ තිබෙන machines එළියට එනවාද? ඇතුළට ගිහිල්ලායි මේ විනාශය කළේ. ඒ නිසා මේක එළියේදී වෙච්ච සිද්ධියක් කියලා කියන්න කවුරු හරි උත්සාහ කරනවා නම්, ඒකෙන් මුළු රටම ඉතාමත් නරක, වැරදි අර්ථකථනයට අපි යොමු කරනවා. මේ සිද්ධිය වුණේ -මේ මරණය වුණේ, මේ මරණය හා අනෙකුත් අයගේ අත පය කඩලා, හොඳටම ගහලා ඒ සියලු දේම සිදු වුණේ- කර්මාන්තශාලා ඇතුළේයි කියන එක අද CID එකේ වාර්තාවල තිබෙනවා. ඒක තමයි අද පොලීසියේ නිලධාරීන් remand කරලා තිබෙන්නේ. එහෙම නැවතිච වෙනින් කාරණයක් නිසා නොවෙයි. ඒ නිසා මුළු රටම- [බාධා කිරීම්] මම කථා කරන්නේ කල් තැබීමේ මේ යෝජනාව ගැන. තමුන්නාන්සේ තරුණ මන්ත්‍රීවරයෙක්. මම මේ කල් තැබීමේ යෝජනාව ගැනයි කථා කරන්නේ. වෙන එකක් ගැන නොවෙයි. ඒක අපි වෙනම කථා කරමු. මේ යෝජනාව තිබෙන්නේ වන්දි ගෙවන්න. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මේ මැරිච්ච එක්කෙනාට වන්දි ගෙවන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට අමතරව මේ තරුණයා අන්තරා වුණේ රාත්‍රී 7.00ට. ඒ ආරෝග්‍යශාලාවට විනිශ්චයකාරවරයෙක් ගෙනාවා. ඒ වාගේම JMO ගෙනාවා. ගෙනල්ලා මරණ පරීක්ෂණය තියලා, රාත්‍රී 7.00ට මැරුණු කෙනාගේ මිනිය 11.00 වන විට ඉස්පිරිතාලෙන් අර ගෙන ගියා. අර ගෙන ගියේ හමුදාවෙන්; අම්මා, තාත්තා නොවෙයි. මල් සාප්පුවට අර ගෙන ගියේ. මල් සාප්පුවේ ඉඳලා ඒ මිනිය ඒ ගෙදරට අර ගෙන ගියේ හමුදාවෙන්. ඒ එක්කම කොහේදෝ හිටපු නීතියක් නැති නඩුකාරයෙක් ඇවිල්ලා ගෙදරට නඩු තීන්දුවක් දුන්නා, කොහොමද මිනිය වළලන්න ඕනෑ කියලා. මම තමුන්නාන්සේගේ අවධානය යොමු කරනවා මෙන්න මේ ගැන. එවැනි නඩු තීන්දුවක් දෙන්න, එවැනි නියෝගයක් දෙන්න ඒ මිනුවන්ගොඩ මහේස්ත්‍රාත්ට අවසරයක් නැහැ; බලයක් නැහැ. ඒ පිළිබඳවත් අපි දැන් කටයුතු කර ගෙන යනවා.

ඒ විතරක් නොවෙයි. උදේ 10.00ට මිනිය පල්ලියට ගෙනියලා, පල්ලියේදී පෙන්වලා, සවස 4.00 වෙනකම් පල්ලියේ තිබුණා. කතෝලික සභාවේ පියතුමෙකුගේ මිනියක් හැර වෙන කොයිම මිනියක්වත් මේ විධියට උදේ 10.00 සිට හැන්දෑවේ 4.00 වෙනකම් පල්ලියේ තියන්නේ නැහැ. ඒ පියතුමන්ලාව භය ගන්වලා ඒ ටික කළා.

ඒ විතරක් නොවෙයි පියතුමන්ලාව භය ගන්වලා සදාචාර සම්පන්නව ගමේ මරණයකදී කථා කරන්න ඉන්න, ශෝකය ප්‍රකාශ කරන්න ඉන්න කාට හෝ වේවා ඒ ශෝකය ප්‍රකාශ කරන්න නොදෙන තත්ත්වයට පත් කළා. මිනීවළට වැලි මිටක් දාන සිරිතක් අපේ තිබෙනවා. නමුත් ඒ වළලන වෙලාවේ වැලි මිට දාන්න හමුදාවෙන් ඉඩ දුන්නේ නැහැ. එවැනි අවාසනාවන්ත තත්ත්වයකට පත් කරලා, මෙතැන රාජ්‍ය බලය, හමුදා බලය

පවත්වලා මුළු ලෝකයටම කිව්වේ මොනවාද? මෙන්න ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය. මෙන්න ශ්‍රී ලංකාවේ මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම. මේක තමයි අපි දුන්න පණිවුඩය. මේ පණිවුඩය රජයයි දුන්නේ. එක්සත් ජාතික පක්ෂය නොවෙයි. [බාධා කිරීමක්] මේ පණිවුඩය මුළු ලෝකයටම ප්‍රවෘත්ති මාර්ගයෙන් ගියා. එහෙම නම් ඒ අපකීර්තිය මේ රටට අරන් දුන්නේ කවුද? මේ ආණ්ඩුවයි.

මම දැක්කා අපේ පොලිස්පතිතුමා එක වෙලාවකදී කියනවා - සීදුව පොලීසියට ගහන කොට- ඒ අය වෙඩි තිබ්බා කියලා. [බාධා කිරීමක්] එතුමා කිව්වා.[බාධා කිරීමක්] කටුනායක. ඔව්. කටුනායක. දැන් එතුමා මේ සිද්ධිය පිළිබඳව මොකක්ද කියන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පක්ෂයටම තිබෙන්නේ තව විනාඩි හයයි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් ඉතුරු ටික හෙටට තියමු. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට මම අවසර දෙනවා ඉතුරු ටික කරන්න කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ යෝජනාව ස්ථිර කරනවා. ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා සඳහන් කරපු ආකාරයට අපි උද්යෝගයෙන් කොච්චර කෑ ගැහුවත් අද වටිනා තරුණයෙක් අප අතරින් වියෝ වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2001 දීත් මේ වාගේම සිදුවීමක් වුණා. ඒ අවස්ථාවේදී අපි උද්ඝෝෂණයක් කළා. එහිදී ජූලි මාසයේ 19 වන දා මට වෙඩි වැදුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් -ඒ උද්ඝෝෂණයේ ප්‍රතිඵලයක් වශයෙන්- ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ආණ්ඩුව බලයෙන් පහ කරන්න අපට අවස්ථාව ලැබුණා. මේ ආණ්ඩුව වාර්තාගත ආකාරයෙන් තමන් ඉදිරිපත් කරපු පනත අද අකුලා ගන්නා තත්ත්වයට ජනතා උද්ඝෝෂණය විශාල බලවේගයක් බවට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ පැහැදිලි නීතියක් තිබෙනවා. හදිසි නීතියක් තිබුණත් පොලීසිය විසින් තමන්ගේ බලය පාවිච්චි කළ යුතු ආකාරය මගේ නඩුවෙන් -"සේනසිංහ එරෙහිව රජය" කියන නඩුවෙන්- උගන්වනු ලබනවා. අවම බලය යෙදීම සම්බන්ධයෙන් අද පොලීසියට උගන්වනු ලබන්නේ ඒ නඩුව. එහි සඳහන් කර තිබෙනවා, "පොලීසිය ඕනෑම අවස්ථාවක, උද්ඝෝෂණයක් පවතින අවස්ථාවක අවම බලය හරියාකාර යෙදිය යුතුයි" කියා. එහෙම නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසියට මේ ආකාරයෙන් ටී 56 ආයුධයකින් පහර දෙන්න, වෙඩි තියන්න, 15 දෙනෙකුට තුවාල කරන්න කාගේ නියමයක් මත මෙය සිදු වුණාද කියන එක ගැන ආණ්ඩුව පැහැදිලි වග කීමක් ගන්න ඕනෑ. විශේෂයෙන්ම බැන් කී මූන්ගේ ප්‍රකාශය මත ඒ ප්‍රකාශයට අපි විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු වශයෙන් යුද්ධය සම්බන්ධයෙන් ආණ්ඩුවට පැහැදිලි ප්‍රකාශයක් කරලා තිබුණා, යුද්ධයේදී ආණ්ඩුව ගත්තු ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් අපත් -විපක්ෂයක් වශයෙන් තරුණ මන්ත්‍රීවරු වශයෙන්- වග කියනවා කියලා, ඒ යුද්ධයේදී ක්‍රියා කළ ආකාරය අපි හරියි කියා. හැබැයි, ආණ්ඩුවට වග කීමක් තිබෙනවා. ඒ ආකාරයෙන් අපි සහයෝගයක් ලබා දෙනකොට තමන්ගේ ඒ වගකීම රටේ නීතිය හරියාකාරව ක්‍රියාත්මක කරන්න. මේ ආකාරයෙන් 15 දෙනෙකුට ටී 56 ආයුධවලින් වෙඩි තියනකොට, ඇතුළට ගිහිල්ලා ගහනකොට ගැබිනි කාන්තාවකට - [බාධා කිරීමක්] පසු ගිය ප්‍රාදේශීය සභා ඡන්දයේදී ගැබිනි අපේක්ෂිකාවකට පහර දුන්නා කියා අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් විශාල උද්ඝෝෂණයක් කළා මම දැක්කා. හැබැයි මෙහිදී ගැබිනි මාතාවකට පහර දීමක් සිදු වුණා. එහිදී කිසිම ආකාරයක උද්ඝෝෂණයක් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරියන්ගෙන් අපිට දකින්න ලැබුණේ නැහැ. රටේ නීතියක් තිබෙනවා, අවම බලය යොදන්නේ කොහොමද කියා. ඔබතුමන්ලා අසාධාරණ යම්කිසි පනතක් ගෙනාවා නම් සාමකාමී උද්ඝෝෂණයක් කරන්න ජනතාවට අයිතිය තිබෙනවා. හැබැයි, මේ ආණ්ඩුවෙන් විශාල ලෙස පහර දීලා දෙසිය ගණනක් තුවාල කර 15 දෙනෙකුට වැඩි ප්‍රමාණයකට වෙඩි තියලා එක පුද්ගලයෙක් ඝාතනය කරලා ඒ පුද්ගලයන්ට විශාල වන්දියක් ගෙවීමට ආණ්ඩුවට බැඳීමක්, වගකීමක් තිබෙනවා. පොඩි වන්දියක් පමණක් නොවෙයි. උසාවි තීන්දුවක් ගත්තා, ලංකාවේ අතීතයේ නැති ආකාරයේ උසාවියේ තීන්දුවක් මේ ආණ්ඩුවට ගන්න හැකියාව ලැබුණා, තමන්ගේ මුදල් බලය පාවිච්චි කරලා. හැබැයි, අපි කියනවා මේ ආකාරයෙන් නීතිය කප්පාදු කරලා, සවස තුනට උස්සන්න තිබුණ මරණය උදේ දහයයි ගණනකට ඉස්සුවා කියලා. මේ ආකාරයෙන් මම හිතන්නේ වෙලාව සම්බන්ධයෙන් උසාවි නියෝගයේ කිසිම සඳහනක් තිබුණා නම් , මෙය උසාවියට අපහාස කිරීමක් සිදු වනවා කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පවුලේ පිරිස විසින් මෙහිදී පැහැදිලිව ප්‍රකාශ කරලා තිබෙනවා, කොයි ආකාරයෙන් ද ඒ පවුලට මේ මරණයේ අවසන් කටයුතු කර ගන්න අවස්ථාව ලැබුණේ කියලා. World Socialist Website එකේ පාඨය මා කියවන්නම්.[බාධා කිරීමක්] පත්තරයක් නොවෙයි මේක.

Sir, I quote from that website,- [*Interruption.*] it states:

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලා සඳහන් කළ ආකාරයට ජනතා විමුක්ති පෙරමුණ පමණයි මේ වාගේ තීන්දුවක් දීලා තිබුණේ. හැබැයි, එවැනි බංකොලොත් නීතියක් ක්‍රියාත්මක කරන්න අද මේ ආණ්ඩුවට සිදු වෙලා තිබෙනවා. මොකද තමන් ඉදිරිපත් කරපු -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Point of Order එකක් නැහැ.- [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
There is a point of Order being raised. -[*Interruption.*]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

He is reading from a website which is not in existence, Sir, and he is misleading the House as a result. [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

If it is not in existence that portion will be expunged.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Do not make use of the name of the family. ඒ පවුලේ නම දේශපාලනයට ගාවන්න එපා. ඒ පවුල විරුද්ධයි. [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Whatever [*Interruption.*] that is not in existence will be expunged. [*Interruption.*]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

"At around 9.45 a.m. the army suddenly arrived at ....." - [*Interruption.*]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මොනවාද, මේ කියවන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

බොහොම ස්තුතියි.

Again I quote:

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Those portions will be expunged. [*Interruption.*]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

I further quote:

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, the subject is *sub judice*. He cannot read this. The whole thing must be expunged.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Whatever that is submitted by him which is *sub judice*, will be expunged.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

It is a subject which is *sub judice*. The case is before the court. [*Interruption.*]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Such statements will be expunged.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මේ ආණ්ඩුව විසින්, මේ රටේ නායකයා විසින් ඒක කප්පාදු කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් රටේ නායකයා වශයෙන් මේ ආකාරයට නීතිය කප්පාදු කිරීම තමන්ගේ -[බාධා කිරීම්] අපට ආරංචිය ලැබුණේ මේ වෙඩි ප්‍රහාරයට ලක් වුණු පුද්ගලයා අර කටුනායක ජනාධිපතිතුමාගේ පිළිරුවකට යම්කිසි ආකාරයකින් පහර දුන්නාය, අන්න ඒ හේතුව නිසා වෙඩි තිබ්බාය කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොලීසිය යම් දෙයක් කළා නම් පොලිස්පති අයින් වෙලා ඒ වග කීමෙන් බැහැර වන්න බැහැ. නායකයෙක්, යම්කිසි කෙනෙක් ඒකට අණ දුන්නා නම් ඒ පුද්ගලයන් සියලු දෙනාම අනිවාර්යයෙන්ම ඒකට වග කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අපරාධය සිදු කළා නම් අනිවාර්යයෙන්ම ඒ පවුල්වලට විශාල වන්දියක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ඔබතුමන්ලා කියන්න ඕනෑ නැහැ. වන්දියක් දෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මීළඟට ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා ( ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத் துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා 2005 මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මහින්ද චින්තනයෙන් මේ රටේ ජනතාවට දීපු එක පොරොන්දුවක් තමයි පෞද්ගලික අංශයට විශ්‍රාම වැටුපක් ලබා දෙනවාය කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කවුරු මොනවා කිව්වත් එදා රටේ ජනතාවගෙන් සියයට 57ක් ඡන්දය දීලා "මහින්ද චින්තනය" අනුමත කළා. ජනතාව "මහින්ද චින්තනය" අනුමත කළා වාගේම ජනතාවගෙන් ඡන්දය ලැබුණු රජයක් හැටියට මහින්ද චින්තනයෙන් ජනතාවට දීපු පොරොන්දුවක් ඉෂ්ට කරන්නට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කටයුතු කළා. ඒක තමයි පෞද්ගලික අංශයට විශ්‍රාම වැටුපක් ලබා දීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා මොනවා කිව්වත් පෞද්ගලික අංශයට අපි ලබා දෙන්න බලාපොරොත්තු වුණු විශ්‍රාම වැටුප ලැබුණා නම් ඒක ලංකා දේශපාලන ඉතිහාසයේ ඓතිහාසික අවස්ථාවක් වනවා. ඒ කෙසේ වුණත් සේවක විරෝධතාව මැද්දේ රජයක් හැටියට අපි ඒක ඉල්ලා අස් කර ගත්තා. අපි ඒක ඉතාම නිහතමානීව කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි, අද මේ විවාදය ගේන කොට කටුනායක සිද්ධිය පිටුපස මහා දැවැන්තයකුව හිටපු ජේවීපී එක නැහැ. අනුර දිසානායක මන්ත්‍රීතුමා යන කොට මම එතුමාගෙන් ඇහුවා ඇයි යන්නේ කියලා. එතුමා මට කියනවා "අර පිස්සෝ ටිකක් දන්නේ නැති යෝජනාවක් ගෙනැල්ලා, අපි මොකටද ඒකට කර ගහන්නේ. අපි මේ යෝජනාවට කථා කරන්නේ රෙදි ඇඳ ගෙනද" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1988 මැයි 01 වැනිදා කම්කරුවන්ගේ දවසේ මිනිස්සු මරාපු යූඑන්පිය, එදා දඹරාවේ හාමුරුවන්ට වෙඩි තියපු යූඑන්පී එකේ උදවිය අද යෝජනා ගේන කොට මේවාට ඉන්න පුළුවන්ද කියලා තමුන්නාන්සේලා එක්ක විරෝධතා දක්වපු ජනතා විමුක්ති පෙරමුණ අද මෙතැනින් එළියට ගිහිල්ලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඔබතුමාට කියනවා ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා මේ ගරු සභාව නොමඟ යැව්වා කියලා. එතුමාට මේ පැත්තෙන් ලොකු බාධාවක් ආවා. කවදාවත් මෙහෙම බාධා කරන්නේ නැහැ. ඇයි? අර පැත්තෙන් ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා ඇවිල්ලා කිව්වා පොඩ්ඩක් කෑගහන්න කියලා. ඒ නිසා තමයි එතුමාට බාධාව වැඩි වුණේ. [බාධා කිරීම්] එහා පැත්තෙන් ඇවිල්ලා මට කිව්වා "මේක පක්ෂයේ යෝජනාවක් නොවෙයි, ජෝශප්ගේ පෞද්ගලික යෝජනාවක්, මල්ලි කෑගහන්න වැඩිපුර" කියලා. ඒ නිසා තමයි අපි බාධා කළේ. [බාධා කිරීම්]

විපක්ෂයේ මන්ත්‍රීවරුන් වන තමුන්නාන්සේලාට අපි වග කීමකින් කියනවා, මේ පනත් කෙටුම්පත ගෙනාවා නම්, සේවක අර්ථසාධක අරමුදලෙන්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙන් ශත පහක්වත් හෙල්ලෙන්නේ නැහැයි කියලා. ඒ විතරක් නොවෙයි. ඒකට ගේන්නේ නව විශ්‍රාම වැටුප් ක්‍රමයක්. අපි දැන් ඒ ගැන කථා කරලා වැඩක් නැහැ. එහෙම දෙයක් තමයි ඒ පනත් කෙටුම්පතේ අඩංගු වෙලා තිබුණේ. තමුන්නාන්සේලාගේ නොදැනුවත්කම, තමුන්නාන්සේලාගේ මෝඩකම, තමුන්නාන්සේලාගේ ගොන්කම නිසා - [බාධා කිරීමක්] තමුන්නාන්සේලා ඔය ඉඳ ගෙන සිටියාට වැඩක් නැහැ, මොළේ තැළෙනවා. තමුන්නාන්සේලාට ඒක නැති නිසා, මේක තේරෙන්නේ නැති නිසා, මේක අධ්‍යයනය කළේ නැති නිසා මේකට විරුද්ධ වුණා. ජනතාවගේ රජයක් හැටියට, ජනතාවගේ ඡන්දයෙන් පත් වුණු රජයක් හැටියට පැහැදිලිව අපි වග කීමකින් කියනවා, එහෙම දෙයක් කළේ නැහැයි කියලා.

ඊළඟ කාරණය මේකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක නිකම් දෛවයේ සරදමක් වාගෙයි. බලන්න, අද ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙනාවා. මෙතුමා තමයි 2001 රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුවේ කථානායක. තමුන්නාන්සේට මතකද, 2001 රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුව කාලයේ තමුන්නාන්සේ මේ මූලාසනයේ ඉන්න කොට යෝජනාවක් ගෙනාවා. ඒ කාලයේ අපි ජෝන් අමරතුංග මහත්තයාට කිව්වේ "ජෝන් පොලිස්" කියලායි. එතුමා තමයි එදා පොලිසිය භාරව ඉඳ ගෙන ඔක්කොම මැරවරකම් කළේ. මේ ජෝන් තමයි එදා පොලිසිය භාර ඇමති. තමුන්නාන්සේ තමයි එදා කථානායක. එදා මූලාසනයේ හිටිය එක ගැන තමුන්නාන්සේට මතක ද? 2001-2003 ආණ්ඩුවෙන් රනිල් වික්‍රමසිංහ මහත්තයා යෝජනාවක් ගෙනාවා. මොකක්ද, රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කරන්න.

රජයේ සේවකයාගේ විශ්‍රාම වැටුප අහෝසි කරන්න යෝජනා ගෙනාපු තමුන්නාන්සේලා -එක්සත් ජාතික පක්ෂය- අද පෞද්ගලික අංශයට විශ්‍රාම වැටුප ගෙනෙනවාට විරුද්ධ වනවා. තමුන්නාන්සේලා රෙදි ඇඳ ගෙනද මේක කියන්නේ? එදා රජයේ සේවකයාගේ විශ්‍රාම වැටුප අහෝසි කරන්න තමුන්නාන්සේලා මේ පාර්ලිමේන්තුවට යෝජනාව ගෙනෙන කොට එදා විපක්ෂ නායකවරයාව සිටි මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි ඒකට විරුද්ධව පාර්ලිමේන්තුවේ කථා කළේ. විනිසුරුවන්ගේ වැටුපට අත තියන්න බැහැයි කියලා එදා ශ්‍රේෂ්ඨාධිකරණය කිව්ව නිසා, ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ අයගේ විශ්‍රාම වැටුපට අත තියන්න බැහැයි කියලා තීන්දුවක් දුන්නු නිසා එදා රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කිරීම නවත්වා ගන්න පුළුවන් වුණා. ශ්‍රේෂ්ඨාධිකරණයට පින් සිද්ධ වන්නට, විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ මැතිතුමාට පින් සිද්ධ වන්නට රජයේ සේවකයාගේ විශ්‍රාම වැටුප එදා ආරක්ෂා කළා. තමුන්නාන්සේලා අද මේ ගැන කථා කරනවා. තමුන්නාන්සේලා රෙදි ඇඳ ගෙනද මේ කථා කරන්නේ? ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමාට මතක ඇති, ඔබතුමා එදා මූලාසනයේ ඉඳලා, රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප කප්පාදු කරන්න ඒ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් කළේ තමුන්නාන්සේ බව. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා වාගේ නොදන්නා කෙනෙක් මේ ගැන කිව්වාට මට කමක් නැහැ. මේ වාගේ දේවල් අඳබාලයෝ, පොඩි ළමයි කිව්වාට කමක් නැහැ. අපි හිතුවා, තමුන්නාන්සේ පරිණත දේශපාලනඥයෙක් කියලා. තමුන්නාන්සේට බාධා කරන්න කියලා ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කියපු එක සාධාරණයි. ඒක ඉතා සාධාරණයි. මොකද, තමුන්නාන්සේලා වාගේ නොදැනුවත් අයට -[බාධා කිරීම්] ජෝශප් මයිකල් පෙරේරා ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මතක තියා ගන්න. තමුන්නාන්සේලා කථා කරනවා පොලිසිය ගැන. තමුන්නාන්සේලා කථා කරනවා මේ මරපු සිද්ධීන් ගැන. [බාධා කිරීමක්] එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කරපු දේවල් තමුන්නාන්සේට අමතක වෙලාද? එදා විවියන් ගුණවර්ධන සහෝදරියට බිම දාලා ගැහුවා. ගැහුවාට පස්සේ එතුමිය ගියා මානව හිමිකම් නඩුවක් මඟින් ශ්‍රේෂ්ඨාධිකරණයට. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නා, පොලිස් නිලධාරියාගේ වැඩ තහනම් කරන්න කියලා. මොකක්ද, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කළේ? ආණ්ඩුව දඩය ගෙවලා, උසස් වීමක් දීලා පොලිස් නිලධාරියාව නැවතත් සේවයේ පිහිටෙව්වා. අද තමුන්නාන්සේලා පොලිසිය ගැන කථා කරනවා. බලන්න, අපේ පොලිස්පතිවරයා මොන තරම් හොඳ කෙනෙක්ද? තමන්ගේ ආයතනයේ ප්‍රධානීන්ගෙන් වෙච්ච වැරැද්දට පොලිස්පතිවරයා ඉල්ලා අස් වුණා. ලංකා ඉතිහාසයේ කවදාද එහෙම වුණේ? ආණ්ඩුවක් හැටියට කරන්න පුළුවන් හැම දෙයක්ම අපි කරලා ඉවරයි. පොලිස්පතිවරයා ඉල්ලා අස් වුණා. ඒ සිද්ධියට සම්බන්ධ වෙච්ච

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

පොලිස් නිලධාරින් අත් අඩංගුවට ගත්තා. ආණ්ඩුවක් හැටියට කරන්න පුළුවන් හැම දෙයම කළා. අද තමුන්නාන්සේලා කියනවා, ආණ්ඩුව බලය පාවිච්චි කරලා, අධිකරණ තීන්දු අරගෙන කියලා.

ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා කතෝලිකයෙක්. මට සැකයි, තමුන්නාන්සේ භාගෙට කතෝලිකයෙක්ද කියලා. තමුන්නාන්සේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා වාගේ වැදගත් කතෝලිකයෙක් නොවෙයි. තමුන්නාන්සේ අද පල්ලියට අගෞරව කළා. ඒ සහෝදරයාගේ දේහය ඒ පල්ලියේ තිබ්බ එක ගැන තමුන්නාන්සේ ලජ්ජා වන බව කිව්වා. තමුන්නාන්සේ කතෝලිකයෙක් නොවෙයි. තමුන්නාන්සේ කතෝලිකයෙක් නම් ඒ සහෝදරයාට කරන්න පුළුවන් උපරිම ගෞරවය, උපහාරය තමයි ඒ පල්ලියට ගෙනැල්ලා පල්ලියේ ඒ දේහය තබන එක. තමුන්නාන්සේ පල්ලි යන කෙනෙක් නම් ඒත් කමක් නැහැ. තමුන්නාන්සේට පල්ලි නැහැ. තමුන්නාන්සේට හොඳයි ඕක, මීගමුවේ බයස්කෝප් හෝල් එකේ තිබ්බා නම්. ඔය දේහය බයස්කෝප් හෝල් එකේ තිබ්බා නම් තමුන්නාන්සේ සන්තෝෂ වෙයි. ඒ නිසා අපි තමුන්නාන්සේට කියනවා -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා, බොරුවට නැඟිටින්න එපා. ඔබතුමා එතුමා කථා කරන විට කෑ ගහන්න කියලා දැන් බොරුවට නැඟිටිනවා shape කර ගන්න. මොකක්ද තමුන්නාන්සේගේ දෙබිඩි පිළිවෙත? තමුන්නාන්සේ ඉස්සෙල්ලා කෑ ගහන්න කියලා කිව්වා. දැන් ආපහු ඒ පැත්තට ගිහින් balance කරනවා. තමුන්නාන්සේ එක වෙලාවකට ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමාට කපනවා; එක වෙලාවකට එතුමාව බේරනවා. දවල් මිගෙල්, රෑ දනියෙල්. තමුන්නාන්සේලාට තිබෙන ලොකුම වේදනාව මොකක්ද? තමුන්නාන්සේලා උත්සාහ කළා, කටුනායක මුළු සේවකයන්ම ගෙනැල්ලා, මුළු යුළුන්පියම එකතු වෙලා සටන දාලා, එදා මේ සහෝදරයාගේ මරණයේ අවසන් කටයුතු දවසේ ලේ විලක් ඇති කරන්න. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවට පුළුවන් වුණා, ඒක ඉතාම හොඳින් වළක්වා ගන්න. මොකද, ඒ මිය ගිය දරුවාගේ දෙමවුපියන් දන්නවා, සිද්ධිය වෙච්ච වෙලාවේ සිට ඒ දරුවාගේ ජීවිතය බේරා ගන්න මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඇතුළු මේ ආණ්ඩුව උදවු කළ ආකාරය. අපි ස්තුතිවන්ත වනවා, ගම්පහ දිස්ත්‍රික්කයේ සහෝදර මැති-ඇමතිතුමන්ලාට. මීගමුව රෝහලේ ඒ වෛද්‍ය කාර්ය මණ්ඩලයට, පොලීසියට, හමුදාවට අපි ස්තුතිවන්ත වනවා, දිවා රෑ නොබලා ඒ දරුවාගේ ජීවිතය බේරා ගන්න කරන්න පුළුවන් සියලු කටයුතු කිරීම ගැන. තමුන්නාන්සේලා බලා ගෙන හිටියේ, එදා දවසේ කර ගන්න බැරි වුණු දෙය වෙනුවට, ඒ දේහය ගෙනිහිල්ලා, මුළු කටුනායකම ගෙනැල්ලා, තව මරණ ටිකක් සිදු කරලා පුම්බන්න බැරි විරුද්ධ පාර්ශ්වයේ නායකයාව පුම්බන්න පුළුවන්ද කියලා බලන්නයි. තමුන්නාන්සේලාට ඒක කර ගන්න බැරි වුණා. තමුන්නාන්සේලාට මේකෙන් ලකුණු දමා ගන්න බැරි වුණා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉදිරියේ තමුන්නාන්සේලාට බැරි වුණා මේ කටයුත්ත කරන්න. ඒ වේදනාවට අද පාර්ලිමේන්තුවට විවාදයක් ගෙනාවා. ජේවීපී එක නැඟිටලා ගියා. ඇයි ජේවීපී එක නැඟිට්ටේ? ඒ සහෝදරයාගේ මරණයේදී ඔබතුමාලාත් එක්ක හිටපු ජේවීපී එක ඇයි නැඟිටලා ගියේ? "මොළේ තිබෙන කෙනෙක් මේ යෝජනාව ගෙනාවා නම් කමක් නැහැ" යි කියලා කිව්වා. ඕක අපේ ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් මට කිව්වා, "මොළේ තිබෙන කෙනෙක් මේ යෝජනාව ගෙනාවා නම් කමක් නැහැ" කියලා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මම ඒක ප්‍රතික්ෂේප කරනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

නැවතත් එක්සත් ජාතික පක්ෂයට අපි වග කීමකින් කියනවා, මේ වාගේ "එදා වේල ටුවර්ස්" යෝජනා පාර්ලිමේන්තුවට ගෙනෙන්න එපා කියලා. "එදා වේල ටුවර්ස්" යෝජනා පාර්ලිමේන්තුවට ගෙනෙන්න එපා. මේ සිද්ධිය නිසා මිය ගිය ඒ සහෝදරයා වෙනුවෙන්, තුවාල ලැබූ සියලු දෙනා වෙනුවෙන් පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය හැටියට අපි කනගාටු වනවා; අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

අතිගරු ජනාධිපතිතුමා, මේ රජය ඇතුළු අප සියලු දෙනාගේම ශෝකය ප්‍රකාශ කරනවා. අපි වග කීමකින් කියනවා කිසි දවසක මේ ආණ්ඩුව යටතේ එවැනි සිද්ධියක් මින් ඉදිරියට අත් වන්නේ නැහැ කියලා. හැබැයි තමුන්නාන්සේලා මේ වාගේ දෙකේ පන්තියේ තුට්ටු දෙකේ වැඩ කරලා ආණ්ඩුව අල්ලන්න යන්න එපා. පුළුවන් නම් සජිත් ප්‍රේමදාසත් එක්ක ඡන්දයකට යන්න කියා තමුන්නාන්සේලාට අභියෝග කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)

අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ මගේ මිත්‍ර ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමායි. ඒ යෝජනාවේ තිබෙන්නේ සාමකාමී විරෝධතා ව්‍යාපාරයකට පොලීසිය බලෙන් මැදිහත්ව පහර දීමක් ගැනයි. මේක සාමකාමී ව්‍යාපාරයක්ද වුණේ අපේ මන්ත්‍රීතුමා? නැහැ. අපි දන්නවා මේ වෙලාවේ රජයෙන් මහානාම තිලකරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් -[බාධා කිරීමක්]

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரத் குமார குணரத்ன - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Sarath Kumara Gunaratne - Deputy Minister of State Resources and Enterprise Development)

බොරු කියන්න එපා මන්ත්‍රීතුමා. දන්නේ නැති මඟුල් කථා කරන්න එපා. ඒ සේරම අපි දැක්කා. [බාධා කිරීමක්] මොනවාද දන්නේ තමුන්නාන්සේලා?

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

මහානාම තිලකරත්න හිටපු විනිශ්චයකාරතුමාගේ ප්‍රධානත්වයෙන් ඒක පුද්ගල කොමිසමක් පත් කරලා තිබෙනවා. අපි මේකේ වාර්තාව එන තුරු ඉන්නේ. තමුන්නාන්සේලා මොනවා කිව්වත් රජයෙන් වන්දි ගෙවනවා. ඒකේ කිසිම සැකයක් නැහැ. හැබැයි මට මෙතැනදී ප්‍රශ්නයක් එනවා. මේ තරුණයාගේ මරණය ගැන අපි සියලු දෙනාම කනගාටුවට පත් වනවා. තුවාල ලැබූ උදවිය ගැන අපි සියලු දෙනාම කනගාටුවට පත් වනවා. මම එක දෙයක් අහන්න කැමැතියි. මරණකරු වෙනුවෙනුත්,

තුවාලවලට සහ ආබාධවලට ලක් වූ අය වෙනුවෙනුත් වන්දි ගෙවීමට කටයුතු කරන්න කියා මන්ත්‍රීතුමා යෝජනා කරනවා. මන්ත්‍රීතුමාට මතකද, 2001 ජූලි 19වැනි දා අපි පා ගමනක් ආවා. මමත් එක්සත් ජාතික පක්ෂයේ හිටියේ. සුජීව සේනසිංහ මහත්තයා කියපු දේ. ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමනි, අපේ ජෝන් අමරතුංග මැතිතුමනි, මතකද ඒ පා ගමන ඇවිල්ලා දැඩිගම, වරකාපොළ අජිත් ගුණරත්නයි, උතුරු කොළඹ ප්‍රසාද් මංජුල දෙන්නාම වෙඩි කාලා මැරුණා. 2001 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවා. අපට පුළුවන් වුණාද ඒ දරුවෝ දෙන්නා වෙනුවෙන් අඩු වශයෙන් රුපියලක වන්දියක් ගෙවන්න? [බාධා කිරීම්]

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා**
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
අහ ගන්න.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මම තව දෙයක් අහනවා. [බාධා කිරීම්] මම මේ කියන්නේ වග කීමකින්. මම දන්නා නිසා කියන්නේ. මේ මිය ගිය දෙදෙනාගේ දෙමව්පියන්ට කථා කරන්න අවස්ථාවක් අපි දුන්නාද කියලා කියන්න. [බාධා කිරීමක්] මම මේ කියන්නේ ලොකු වග කීමකින්. [බාධා කිරීමක්] වුට්ටක් ඉන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගෙවන්න ඕනෑ වන්ද්‍රිකාගේ ආණ්ඩුව.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවා නේ. [බාධා කිරීමක්] මම කියන්න හදන්නේ ඒක නොවෙයි. 2001 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවා නේ. [බාධා කිරීමක්]

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා**
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)
තමුන්නාන්සේ තමයි මිනී මරන්න පටන් ගත්තේ ජා-ඇල ඉඳගෙන. තමුන්නාන්සේ තමයි පටන් ගත්තේ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
මම අහන්න හදන්නේ ඒක නොවෙයි. 2001 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවා. අපිව මුණ ගැහෙන්න, අපේ නායකයන්ව මුණ ගැහෙන්න ඒ මිය ගිය දරුවෝ දෙදෙනාගේ දෙමව්පියන්ට අපි අවස්ථාවක් දුන්නාද? දුන්නේ නැහැ. ඒ පවුලේ කාටවත් අපි රස්සාවක් දුන්නාද? අපේ ආණ්ඩුව තිබුණේ. නැහැ. ඒ දෙදෙනා වෙනුවෙන් වන්දියක් ගෙවන්න ආණ්ඩුවක් හැටියට එදා අපි කථා කළාද? කථා කළා. දුන්නේ නැහැ. එහෙනම් මොකක්ද තමුන්නාන්සේලාට තිබෙන අයිතිය මේ වන්දිය ගැන කථා කරන්න? මට කියන්න. මේ අවස්ථාවේ මේ සභාවේ නැති වුණත් මම ස්තුතිවන්ත වනවා, මනෝ විජයරත්න හිටපු මන්ත්‍රීතුමාට. මනෝ විජයරත්න මැතිතුමා තමයි එදා ගුවන් තොටු පොළේ විධායක අධ්‍යක්ෂවරයෙක්ව හිටපු අපේ ගාමිණී අබේරත්න -ටැක්සි අබේ- මහත්තයාට කියලා මේ මිය ගිය දරුවෝ දෙදෙනාගේ සහෝදරයෝ දෙන්නාට රස්සා දෙකක් හදලා දුන්නේ. මතක තියා ගන්න. අපේ ආණ්ඩුව කළේ නැහැ; අපේ නායකතුමා කළේත් නැහැ. දෙමව්පියන්ට ගෙදරට එන්න දුන්නේත් නැහැ. එතකොට මොකක්ද මම අහන්නේ? තමුන්නාන්සේලා මෙතැන කියනවා දරුවෙක් මිය ගියා -තරුණයෙක් මිය ගියා-, වන්දියක් ඉල්ලනවා කියලා. මම අහන්නේ මේකයි. එහෙම අහන්න අයිතියක් තිබෙනවාද කියන ප්‍රශ්නයයි මම අහන්නේ.

ඊ ළඟට මම කියන්න කැමැතියි, භාරකාර අරමුදල ගෙනාවේ මගේ පියතුමායි කියලා. පාරිතෝෂික දීමනාව ගෙනාවේ මගේ පියතුමා. ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, එදා ඔබතුමා කම්කරු නියෝජ්‍ය ඇමති. කාලීනව යම් යම් දේවල් වෙනස් විය යුතුයි කියලා අපි පිළි ගන්න ඕනෑ. ඔබතුමාත් මාත් පිළි ගන්න ඕනෑ, විශ්‍රාම වැටුපක් පෞද්ගලික අංශයට ගෙනෙන්න පුළුවන් නම් ඒක මේ රටේ ඉතාම වැදගත් දෙයක් කියලා. ඉතාමත්ම වැදගත් දෙයක්. අපි කවුරුත් ඒක පිළි ගන්නවා. ඒකේ පුංචි පුංචි අඩු පාඩුකම් තියෙන්න ඇති. අපට තිබුණේ ඒක නොවෙයි. එක්සත් ජාතික පක්ෂය හැටියට තමුන්නාන්සේලාට තිබුණු එකම දේ මොකක්ද දන්නවාද? ජනතා විමුක්ති පෙරමුණේ පරණ පුරුදුවලට ඔවුන් යන එක වෙනම කථාවක් නොවෙයි. මොන ක්‍රමයකින් හරි මේක මේ රටේ ක්‍රියාත්මක කරන්න දායකත්වය දෙන එකයි තමුනාන්සේලාට තිබුණු යුතුකම මගේ හිතවත් ගරු මන්ත්‍රීතුමනි. ඒ දේ කළේ නැහැ. මිනියක් කර ගහගෙන රට වටේ යන්න පටන් ගත්තා. අපි කනගාටු වන්නේ අන්න ඒ පිළිබඳවයි. අපි ඉතාමත් කනගාටු වන්නේ අන්න ඒ පිළිබඳවයි. තමුන්නාන්සේලා මේ මිනිය ගැන කථා කරද්දී - ආණ්ඩුවක් හැටියට අපි සියලු දෙනාම ඒ වෙනුවෙන් කනගාටු වුණා- පොලීසියේ මහත්වරුන්ට එතැන වුණු හානිය ගැන කවුරුවත් කථා කළාද? ඒක තමයි අනික් පැත්ත. DIG රවි ගුණවර්ධන මහත්මයා අදත්ඉස්පිරිතාලේ ඉන්නවා, ඇහැක් නැතුව. තමුන්නාන්සේලා රූපවාහිනියෙන් දකින්න ඇති, එක DIG මහත්මයකුගේ බෙල්ල පාගා ගෙන හිටි ආකාරය; නිරායුධව හිටපු පොලිස් නිලධාරින්ගේ ඔළු කුඩු වෙන්න ගහපු ආකාරය. ඒකයි මම කිව්වේ වාර්තාව එන තෙක් ඉන්නය කියා. වාර්තාවේ හරි ලස්සනට තිබේවි, විස්තර ටික. කටුනායක පොලීසියට පැනලා armoury එක කඩන්න ආපු ආකාරය ගැන ඒවා ඔක්කෝම එළියට ඒවි. වැරැද්දක් වුණා. ජීවිතයක් නැති වුණා. අපි සියලු දෙනාම ඒ ගැන හදවතින්ම කම්පා වෙනවා. ඒ සඳහා වන්දි ලැබෙනවා. ඒක ආණ්ඩුවේ යුතුකම; ආණ්ඩුවේ වගකීම. ඒ ඔක්කෝම කරනවා. නමුත් ඒක පුද්ගල කොමිසමේ වාර්තාව එන තෙක් ඉන්නය කියන එක තමයි අපි මේ අවස්ථාවේදී කියන්නේ.

තමුන්නාන්සේලාට මෙතැනදී පුංචි වේදනාවකුත් ඇති. මොකද, මේකෙන් ලකුණු දමා ගත්තේ ජනතා විමුක්ති පෙරමුණයි. අද තමුන්නාන්සේලා මේ පිළිබඳව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනාවා. මොකද, මේකෙන් තමුන්නාන්සේලා ලකුණු දමා ගන්නයි. අවාසනාවට ඒක සිද්ධ වෙන්නේ නැහැ. අපි පොඩ්ඩක් හරි සන්තෝෂ වෙන්න ඕනෑ, ජනතා විමුක්ති පෙරමුණ ගැන. මිනිස්සුන්ගේ අත් කකුල් කපපු, මිනිය දණහිසෙන් උඩට උස්සන්න එපාය කියා නියෝග දීපු, ස්වාමීන් වහන්සේලාට පාංශුකූලය දෙන්න එපාය කියා තහනම් කරපු ජනතා විමුක්ති පෙරමුණ අද ඒ මැරුණු දරුවා වෙනුවෙන් සංවේදී වෙලා තිබෙනවා. පොඩ්ඩක් සංවේදී තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒක බොහොම හොඳ දෙයක්ය කියා අපි කල්පනා කරනවා.

[බාධා කිරීමක්] හරියට හරි. සැබෑ වෙනසක්. කොහොම වුණත් අවසන් වශයෙන් එක්සත් ජාතික පක්ෂයේ තමුන්නාන්සේලාගෙන් අපි ඉල්ලා සිටින්නේ මේ පෞද්ගලික විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත ඉදිරියට ගෙනෙන්න උදව් කරන්නය කියායි. ඒක මේ රටේ කළ යුතුම දෙයක්. ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මේ රටේ කම්කරු ඇමති කෙනෙකු වශයෙන් සිටියා. මමත් 88-89 කාලයේදී කම්කරු රාජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටියා. ගරු ජෝශප්

[ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා]

මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, ඒ නිසා මේක මේ රටේ ජනතාව වෙනුවෙන් කළ යුතුම දෙයක්. මේක කරන්න ඉඩ දෙන්න. මේකේ අඩුපාඩුකම් තිබෙනවා නම් -

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

පැහැදිලිවම අපි කියන්නේ මේ පනත් කෙටුම්පත අයින් කර ගන්නය කියායි.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

මම ඔබතුමාට කියන්නම්. මේක සංශෝධන එක්ක නේ ගෙනෙන්න හැදුවේ. [බාධා කිරීමක්] මගේ හිත මිත්‍ර ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, මේක අපට සංශෝධන සහිතව ගෙනෙන්න තිබුණා නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

බැහැ. ගෙනෙන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ඇයි බැරි? එහෙම කියන්න එපා. මම ඔබතුමාට එක දෙයක් කියන්නම්. [බාධා කිරීමක්] මේක තුනෙන් දෙකක බලයක් තිබෙන පාර්ලිමේන්තුවක්. නමුත් ජනාධිපතිතුමා ජනතාවගේ ඉල්ලීමට ඇහුම්කන් දුන්නා. පෞද්ගලික අංශයට විශ්‍රාම වැටුප් ලබා දීම පිළිබඳ පනත් කෙටුම්පත පැත්තකින් තිබ්බා. මේක තුනෙන් දෙකක බලයක් තිබෙන පාර්ලිමේන්තුවක්. අපි ඔක්කොටම මතකයි, දිවංගත ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට හයෙන් පහක බලයක් තිබෙද්දි අපි මේ පාර්ලිමේන්තුවේ නොකරපු දෙයක් නැහැ කියන එක. මමත් ඒ පාර්ලිමේන්තුවේ හිටියා. අපි නොකරපු දෙයක් නැහැ. ඉතින් තුනෙන් දෙකක බලයක් තිබෙන පාර්ලිමේන්තුවකට මේ පනත් කෙටුම්පත ගෙනෙන්න තිබුණා. නමුත් රටේ ජනතාවට ඇහුම්කන් දීලා අතිගරු ජනාධිපතිතුමා ඒ පනත් කෙටුම්පත පැත්තකින් තිබ්බා. නමුත් ඒ මිය ගිය දරුවාගේ නාමයෙන්, ඒ වාගේම මේ රටේ පෞද්ගලික අංශයේ සේවය කරන සියලු දෙනාගේම නාමයෙන් මා ඉල්ලා සිටින්නේ මේකේ යම් අඩු පාඩුකම් තිබෙනවා නම් ඒවා හරිගස්සාගෙන කරුණාකර මේකට සහයෝගය දෙන්නය කියායි. මේ විශ්‍රාම වැටුප මේ රටට ගෙන ආ යුතුමයි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ඒක අපි පිළිගන්නවා. අලුත් පනත් කෙටුම්පතක් හැටියට ගෙනෙන්න. [බාධා කිරීමක්] ඒක ගැන ආයෙත් කතා කරන්න එපා. ඒක ගැන ආයෙත් කථා කරලා තේරුමක් නැහැ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

තමුන්නාන්සේලා මේ ගැන රටට අරගෙන ගියේ සම්පූර්ණ බොරුවක්. ඒකයි අපි කනගාටු වෙන්නේ. මේ පනත් කෙටුම්පත කියවුවේවත් නැති -[බාධා කිරීමක්] මම තව දෙයක් කියන්නම්. මේ දරුවා නැති වෙන්න දවස් තුනකට ඉස්සෙල්ලා ජනාධිපතිතුමා පැහැදිලිව ප්‍රකාශයක් කළා, පනත් කෙටුම්පත අයින් කර ගන්නවාය කියා. ගරු වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මන්ත්‍රීතුමිය, සරත් කුමාර ගුණරත්න නියෝජ්‍ය ඇමතිතුමා ආදීන් එතැනට ගිහින් ජනාධිපතිතුමාගේ නියෝගය පරිදි පැහැදිලි ප්‍රකාශයක් කළා, රජය මේ පනත් කෙටුම්පත අයින් කර ගන්නවාය කියා. එහෙම කියා තිබෙද්දිත් ඊට දවස් දෙකකට පසුව තමයි මේ කනගාටුදායක සිද්ධිය ඇති වුණේ. මේ කනගාටුදායක සිද්ධිය ඇති වුණේ කොහොමද? පස්සෙන් හිටියේ කවුද? ජනතා විමුක්ති පෙරමුණයි. අන්න ඒ ගැනයි අපි කනගාටු වෙන්නේ. [බාධා කිරීමක්] අපි පනත් කෙටුම්පත අයින් කර ගන්නවාය කියා තීන්දුවක් කරලා තිබුණා. ඒක ප්‍රශ්නයක් නොවෙයි. මම නම් කියන්නේ මේකේ අඩු පාඩු ටික හදා ගෙන මේ පනත් කෙටුම්පත සකස් කර ගන්න තමුන්නාන්සේලාගේ සහයෝගය දෙන්නය කියායි. අපේ තිබෙන පුංචි පුංචි අඩු පාඩුකම් හදා ගනිමු. මේක රටේ අවශ්‍යතාවක්. මේ රටේ අවශ්‍යතාවය ඉෂ්ට කරන්න මේ සඳහා අවසර දෙන්නය කියා අපි ඉල්ලනවා. ආණ්ඩුවක් හැටියට අනිවාර්යයෙන්ම වන්දි ගෙවනවා. නමුත් ඒ වන්දිය කොපමණ ප්‍රමාණයක්ද කියා තීන්දු වන්නේ මහානාම තිලකරත්න මැතිතුමාගේ ඒක පුද්ගල කොමිසමින් ලැබෙන වාර්තාව අනුවය කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சரத் குமார குணரத்ன - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Sarath Kumara Gunaratne - Deputy Minister of State Resources and Enterprise Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතාම කනගාටු වෙනවා මේ මිනීමැරුමට වග කිව යුතු ජනතා විමුක්ති පෙරමුණ පැනලා ගිය අවස්ථාවක, ඒ මිනිය විකුණා ගෙන ඒකෙන් තවත් අවස්ථාවක් උදා කර ගන්න ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා අද මේ යෝජනාව ගෙනාපු එක ගැන. මේ සිද්ධිය අපි ඇස් දෙකෙන්ම දැක්කා. ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුලේ මන්ත්‍රීතුමිය මේ ගරු සභාවේ දැන් ඉන්නවා. මේ සිද්ධියේ සම්පූර්ණ ඉතිහාසය අපි දැක්කා. ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා කිව්වා වාගේ මරපු අය වළලන්න දෙන්නේ නැතිව, ඒ මිනිය දණහිසෙන් ඉහළට ඔසවන්න එපා කියපු ජනතා විමුක්ති පෙරමුණ මේ කරපු කුමන්ත්‍රණය, ඒ කර්මාන්තශාලාවල පාලක පක්ෂය ආරක්ෂා කරන්න කම්කරුවන්ව මෙහෙයවපු අවස්ථාවක් හැටියට ඉතිහාසගත වෙනවා. ලෝකයේ වෙනත් රටවල් විශ්‍රාම වැටුප් අවශ්‍යයි කියද්දී, කම්කරු පන්තියට වැරැදි අවබෝධයක් දීලා, ඔවුන්ගේ මනස අවුල් කරලා, විශ්‍රාම වැටුපක් එපා කියලා, වෙළෙඳ කලාපයේ සහෝදර සහෝදරියන්ගේ මනස සම්පූර්ණයෙන් අවුල් කරපු පළමුවෙනි කුමන්ත්‍රණය එළි දැක්කේ පසු ගිය 24 වැනි දා. එදා ගුවන් තොටුපොළ හන්දිය සම්පූර්ණයෙන්ම block කරලා පොලීසියට ගැහුවා. කටුනායක පොලිස් ස්ථානාධිපතිතුමාට ගැහුවා; පොලීසියේ අනික් අයට ගැහුවා; ජනාධිපතිතුමාගේ පිළිරුව කැඩුවා. නමුත් ජනාධිපතිතුමා ඒ අයටත් සමාව දීලා අත් අඩංගුවේ ඉන්න අයව මුදා හරින්න කිව්වා.

ඊළඟට අපි දැක්කා මේ කුමන්ත්‍රණය නැවත නැවත එන හැටි. ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිගේ යෝජනාවක් අනුව, බැසිල් රාජපක්ෂ මැතිතුමාට කියලා, ජනාධිපතිතුමාට කියලා, ගම්පහ දිස්ත්‍රික්කයේ සියලුම සංවිධායකවරු ගාමිණී ලොකුගේ ඇමතිතුමාත් එක්ක වෙළෙඳ කලාපයට ගිහිල්ලා, සියලුම නිලධාරින් එක්ක, ඒ හැම කර්මාන්තශාලාවකම සේවක කමිටුවල තුන් දෙනා තුන් දෙනා සමඟ එකඟත්වයකට ආවා. ඒ එකඟත්වය මොකක්ද? ඒ අය පැහැදිලිව කිව්වා, "අපට මේ ගැන අවබෝධයක් නැහැ, මීට වඩා පැහැදිලි කරලා දෙන්න" කියලා. ඒ විරෝධතා මැද්දේ අවසානයේ තීරණයකට ආවා ඒ අයට යම් කිසි පත්‍රිකාවක් නිකුත් කරන්න. ඒ පත්‍රිකාව අධ්‍යයනය කරලා ඒ අය නැවත අපිත්

එක්ක සාකච්ඡාවට එනවා කිව්වා. ඒ ප්‍රතිඵලය එන්න ඉස්සරවෙලා අපිට ආරංචි වුණා නැවත කුමන්ත්‍රණයක් දියත් වෙනවා කියලා. ජනාධිපතිතුමා එදා ගුවන් තොටුපොළට ආපු වෙලාවේ අපි එතුමාගෙන් ඉල්ලා සිටියා, "වෙළෙඳ කලාපයේ අයගේ මනස අවුල් කරලා තිබෙන්නේ ගරු ජනාධිපතිතුමනි, ඒ නිසා මේ විශ්‍රාම වැටුප් ක්‍රමයෙන් මේ වෙළෙඳ කලාපයේ අය අයින් කරන්න" කියලා. එතුමා අපිට කිව්වා, ගිහිල්ලා මේ ගැන පැහැදිලි කරලා, ඒ ගොල්ලෝ අකැමැති නම් ඒක ලිඛිතව ගේන්න කියලා. සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය, නිමල් ලාන්සා පළාත් සභා අමාත්‍යතුමා, ඇතුළු අපි සියලු දෙනා එහි ගියා. අපි දැක්කා එතකොට නැවත විරෝධය පටන් අරගෙන. ඒත් අපිට ලොකු විශ්වාසයක් තිබුණා කටානේ, මීගමුවේ කොල්ලෝ කෙල්ලෝ කවදාවත් අපි කියන දේ අත අරින්නේ නැහැ කියලා. අපි එතැනට ගියා. පොලීසිය පිටුපස්සෙන් ආවා. එක බැටන් පොල්ලක් අතේ තිබුණේ නැහැ; එක ආයුධයක් අතේ තිබුණේ නැහැ. මේක අපි දැක්ක සත්‍යය. එතැනට ගිහිල්ලා අපි බය නැතිව ඒ අයට මුහුණ දුන්නා. ඒ අයට අපි කිව්වා, "ඔබට මේ විශ්‍රාම වැටුප එපා නම් අපිත් ඔබ එක්ක ඉන්නවා, මේ පනත් කෙටුම්පත සම්මත කිරීම පාර්ලිමේන්තුවේ කල් දමලා තිබෙන්නේ, කම්කරු ඇමතිතුමා එකඟ වුණා අවශ්‍ය සංශෝධන ගේන්න, ඒ නිසා ඔය ගොල්ලන්ට මේ විශ්‍රාම වැටුප එපා නම් ජනාධිපතිතුමා කැමැතියි ඔබව ඒකෙන් අයින් කරන්න" කියලා. ඒ අය අත්පොළසන් දීලායි අපිව පිළිගත්තේ.

අපි දෙවැනි තැනටත් ගියා. එතැනදීත් ඒක කිව්වා. මම ළඟ තිබෙනවා ඒ සේරම වීඩියෝ පටි. පැහැදිලිව ඒ හැම එකකදීම ඒ අය ඒ කරුණ පිළිගත්තා. ඔබලාට විශ්‍රාම වැටුප එපා නම් ඔබලා එයින් අයින් කරනවා කියපු ඒ ප්‍රකාශය ඔවුන් පිළිගත්තා. ඊට පස්සේ මමත්, සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියත් ජනාධිපතිතුමා හමු වුණා. ජනාධිපතිතුමා එවෙලේම නිවේදනයක් නිකුත් කළා. ශබ්ද විකාශන යන්ත්‍රවලින් ප්‍රකාශ කරන්න කිව්වා වෙළෙඳ කලාපයේ අය මේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් අයින් කරනවා කියලා. ගරු කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමාට කියලා SMS නිකුත් කෙරුවා, වෙළෙඳ කලාපයේ සේවකයන් ඒකෙන් අයින් කරනවා කියලා. ඊට අමතරව කම්කරු අමාත්‍යාංශයෙන් නිවේදනයක් නිකුත් කළා. ඒ නිවේදන තියෙද්දී තමයි ඒ අය කෑ ගැහුවේ; මේක පිළිගන්න බැහැ කියලා පොලීසියට ගහන්න පටන් ගත්තේ. හැම මාධ්‍යයකින්ම පෙන්නුවා පොලීසියට කොයි ආකාරයෙන්ද ගැහුවේ කියලා. පයින් ගහ ගහා එළෙව්වේ. අපි ඒක ඇස් දෙකින් දැක්කා. මෙන්න මේකයි සත්‍යය. මේ සත්‍යය තියෙද්දී මේ මිනීමරු ජනතා විමුක්ති පෙරමුණේ කුමන්ත්‍රණකාරින් ඇවිල්ලා පොලීසිය වට කරලා පොලීසියේ ආයුධ ගබඩාව කඩන්න සූදානම් වුණා. පොලීසියට එළව එළවා ගැහුවා.

ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, ඇමති කාලයේ තමුන්නාන්සේට ආරක්ෂකයෝ ගොඩක් හිටියා නේ. දැන් අපටත් කීප දෙනෙක් වැඩියෙන් දීලා තිබෙනවා. තමුන්නාන්සේලාටත් දෙන්නෙක් හරි තුන් දෙනෙක් හරි දීලා තිබෙනවා. තමුන්නාන්සේට වට කරලා ගහද්දී ආරක්ෂකයා පිස්තෝලය ඉණේ ගහගෙන හිනා වෙවී බලා ගෙන ඉන්නවාද? රටේ ලෝකයේ එහෙම ක්‍රමයක් තිබෙනවාද? එහෙම නම් ඇයි ආරක්ෂකයෝ දෙන්නේ? තමුන්ගේ උසස් නිලධාරියකුට ගහද්දී පොලීසියේ සහෝදරයන්ට ඒක ඉවසා ගන්න බැරිව සමහර වෙලාවට යම් කිසි සිද්ධියක් වෙන්න ඇති. එහෙම වුණා කියලා ගුටි කාපු පොලීසියට ඇයි සම්පූර්ණයෙන් ඇඟිල්ල දික් කරන්නේ? මේ මිනීමරු කුමන්ත්‍රණකාරින්ව නිදොස් කරලා පොලීසියයි මේක කළේ කියලා කියන්නේ ඇයි? තමුන්නාන්සේ නොදැන කථා කරන්න එපා. ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා ජාඇලෙන් පටන් ගත්ත ගල් ගැහිල්ල මතකද? තමුන්නාන්සේගේ තරුණ කාලේ අමතක කරන්න එපා. එදා ඉඳලා වෙච්ච දේවල් මතකද? මහින්දානන්ද ඇමතිතුමාත්, ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමාත් කිව්වා නේ එක්සත් ජාතික පක්ෂය කරපු දේවල්. වන්දි ගෙවපු හැටි කිව්වා. ජනාධිපතිතුමා අඩියක් පස්සට අරගෙන කම්කරු ජනතාව එක්ක යන ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙක් බව පෙන්නුවා. එතුමා අඩියක් පස්සට අරගෙන කිව්වා, "හරි, ඔබට එපා නම් අපි සූදානම් මේක අයින් කර ගන්න" කියලා. දැන් ඔබතුමා එක එක දේවල් කියනවා. "තුනෙන් දෙකේ බලයක් තියෙද්දී මධ්‍යම කාරක සභාව අනුමත කළා" වාගේ විහිළු කථා කියන්න එපා ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා ගැන මම කනගාටු වෙනවා. ඔබතුමන්ලා මේ කළ කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළ නිසා සහෝදරයකු මැරුණා. ජනාධිපතිතුමා තවත් මිනී මැරෙන්න ඉඩ දෙන්නේ නැතිව තීරණය ගත්තා. එතුමා දෙවැනි කුමන්ත්‍රණයත් දැක්කා. ඒ සහෝදරයාට වෙඩි වැදුණාට පස්සේ ජනාධිපතිතුමා පුළුවන් තරම් උත්සාහ කළා විශේෂඥ වෛද්‍යවරුන් ගෙනැල්ලා ඒ සහෝදරයාව ගොඩ ගන්න. නමුත් තමුන්නාන්සේලා බලා ගෙන හිටියා මැරෙනතුරු. කොයි වේලේද මැරෙන්නේ කියලා බලා ගෙන හිටියා. මැරෙනතුරු බලා ගෙන ඉඳලා මැරුණාට පස්සේ තමුන්නාන්සේලා ගියා. සජිත් ප්‍රේමදාස මහත්මයා එකක් කියනවා. තමුන්නාන්සේලා එකක් කියනවා. දෙගොල්ලෝ දෙපැත්තෙන් ගිහිල්ලා මිනිය උස්සා ගෙන නැවත සෙල්ලමක් දාන්න උත්සාහ කළා. ජනාධිපතිතුමා ඒ කුමන්ත්‍රණය පැහැදිලිව දැක්කා. එතුමා මට කථා කරලා කිව්වා,"බිෂොප්තුමාට කථා කරන්න. කථා කරලා කතෝලිකත්වය වෙනුවෙන් කළ යුතු හැම දෙයක්ම කරන්න"කියලා. සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය, මහ ඇමතිතුමා ඇතුළු ගම්පහ දිස්ත්‍රික්කයේ අපේ සහෝදර සියලු මන්ත්‍රීවරු ආගම් භේදයකින් තොරව සහභාගි වුණා. ඒ අවස්ථාවේදී ඒ ගරු පියතුමන්ලා ඒ දීපු ගරුත්වය කතෝලිකයකු හැටියට මා ඉතා උතුම්කොට සලකනවා. දැන් තමුන්නාන්සේලා නීතිය ගැන කථා කරනවා. තමුන්නාන්සේලා මිනිය වටේ ගිහින් ඒ මිනිය විකුණාගෙන රටේ වෙනසක් කරන්න කවදාවත් බලාපොරොත්තු වන්නට එපා. ජනතාව මේ වනවිට කරුණු තේරුම් අර ගෙන ඉවරයි. තමුන්නාන්සේලා පක්ෂ නායක රැස්වීමේදී එක අවස්ථාවකවත් කිව්වාද මේ පනත් කෙටුම්පත ඉල්ලා අස් කර ගන්න කියලා?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
කිව්වා. [බාධා කිරීම්]

**ගරු සරත් කුමාර ගුණරත්න මහතා**
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)

නැහැ. කිව්වේ නැහැ තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා කියලා නැහැ කොයිම අවස්ථාවකවත්. [බාධා කිරීම්] කවදාවත් තමුන්නාන්සේලා කියලා නැහැ. [බාධා කිරීම්] මම අභියෝග කරනවා. මම තමුන්නාන්සේලාගේ විපක්ෂ නායකතුමාට අභියෝග කරනවා, පුළුවන් නම් පෙන්වන්න කියලා කොයි අවස්ථාවේද එහෙම කිව්වේ කියලා. කිව්වේ නැහැ තමුන්නානසේලා. දැන් බොරුවට මෙතැනට ඇවිල්ලා මිනියක් ගැන කථා කරනවා; වන්දියක් ගැන කථා කරනවා. ඒ සියලුම කම්කරු සහෝදරවරු අද අකම්පාල වෙනවා. සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියයි මායි එතැන ඉන්න කොට එක සහෝදරියක් ඇහුවා,"අපේ පඩියෙන් විශ්‍රාම වැටුපට කපා ගත්ත එක දෙන්නේ කවදා ද" කියලා. බලන්න, කොයි තරම් මනස අවුල් කරලාද කියලා. ඒ සහෝදර සහෝදරියෝ දැන ගෙන හිටියේ නැහැ මේ මොකක්ද කියලා. ඒ තරමට මනස අවුල් කරලා. අරක කපනවා, මේක කපනවා කියලා. එහෙම කරපු එකෙන් අද සිද්ධ වුණේ මොකක්ද? අර විදේශවල රැකියාව කරන අයට විශ්‍රාම වැටුපක් ගන්න තිබුණ අවස්ථාවත් නැතිව ගිය එකයි; ස්වයං රැකියාවක් කරන අයට ඒ අවස්ථාව නැතිව ගිය එකයි.

මේ පනත් කෙටුම්පතින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ ගැන සාකච්ඡා කරලා, මේ පනත් කෙටුම්පතට අවශ්‍ය සංශෝධන කරලා, ඒ සංශෝධන සහිතව ඉදිරිපත් කිරීමයි නියම

[ගරු සරත් කුමාර ගුණරත්න මහතා]

ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් විධියට, දේශපාලනඥයකු විධියට කළ යුතු යුතුකම. තමුන්නාන්සේලාට ඒක කරන්න තිබුණා. මෙතුමා - ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමා- කිව්වා වාගේ කවදා හෝ මේ පනත් කෙටුම්පතින් ලැබෙන ප්‍රතිලාභ ජනතාව දැන ගත්ත දාට, ඒ වෙළඳ කලාපයේ සහෝදරවරු පොලු මුගුරු අරගෙන ඔය කථා කළ අයට ගහලා එළවනවා. එහෙම දවසක් උදා වෙනවා කියලා මා මෙහිදී එඩිතරව ප්‍රකාශ කරනවා. ඒ නිසා මිනී විකුණාගෙන කන්න එපා.

ඔබතුමන්ලා ඒ කාලයේ කළ දේවල් අපි දන්නවා. මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා කිව්වා වාගේ ඔය ඉන්නේ ඒ කාලයේ හිටපු පොලිස් නායකයා. ඒ කාලයේ බොරු චෝදනා දාලා අපව ඇතුළට දමද්දී මේ කවුරුවත් කථා කළේ නැහැ. ඔබතුමා පොලීසිය මෙහෙය වූ හැටි මා දන්නවා. නමුත් මම අද බොහොම හොඳ මිත්‍රයකු විධියට කථා කරනවා. අපි ළඟ වෛරය නැහැ. අපිට කරපු දේවල් කියන්න ගියොත් පොත් ගණන් ලියන්න පුළුවන්. අපිට කරපු ඒ හානි ගැන කවුරුවත් කථා කළේ නැහැ. මගේ දේපොළ ඔක්කොම විනාශ කළා. බොරු චෝදනා දාලා මාව ඇතුළට දැම්මා. නමුත් දැන් ඒ අය කථා කරනවා. වෙච්ච දේවල් ගැන සුහදව කථා කරන තත්ත්වයකට අපි දෙගොල්ලො අද ඇවිත් තිබෙනවා. මෙන්න මේ දේශපාලන වෙනස අපි තේරුම් ගන්න ඕනෑ.

තුනෙන් දෙකක බලයක් සහිතව, දහඅට ලක්ෂයකට අධික වැඩි ඡන්ද සංඛ්‍යාවකින් බලයට පත් වෙච්ච නායකයාව වෙනස් කරන්න මේ වාගේ දෙයකින් බැහැ කියන එක අප දකිනවා. අපේ නායකයා බුද්ධිමත්ව අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය තීරණ ගන්න හැම වෙලාවේම සූදානම් වෙලා ඉන්නවා. එම නිසා මේ ගරු මන්ත්‍රීතුමා අද මේ යෝජනාව ගෙනැල්ලා, වෙන වෙන පනත් කෙටුම්පත්වල කැලි දාලා මේ කටයුතු නැවත අවුල් කරන්නට උත්සාහ කිරීම පිළිබඳව මා කනගාටු වෙනවා. මිනී විකුණන්නේ නැතිව තමුන්නාසේලාගේ පක්ෂයේ තිබෙන ශුද්ධභාවය එඩිතරව ප්‍රකාශ කරලා ඉදිරියට -මේ පාලක පක්ෂ ආරක්ෂා කරන්නට නොවෙයි- [බාධා කිරීම්] මිනිස්සු ජීවත් කරවන්නට කටයුතු කරන්න.

අපේ සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය සාක්ෂි දරනවා ඇති. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර කර්මාන්තශාලාවල පාලක පක්ෂ බස් අර ගෙන සේවකයන් එවා තිබුණා, මේ වර්ජනයට. ඒක ඒ පාලක පක්ෂයේ අවශ්‍යතාවයක්. මෙය, ජනතා විමුක්ති පෙරමුණ කම්කරු පන්තිය මෙහෙයවලා ඒ පාලක පක්ෂය ආරක්ෂා කරපු අවස්ථාවක් හැටියට ඉතිහාස ගත වනවා. ඉදිරියේදී ඒකට බිල්ලට දෙන්නට ගිය අය ආරක්ෂා කර ගන්න කකුලක් පස්සට ගෙන මේ තීරණය ගැනීම ගැන ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඉදිරියේ මෙවැනි කටයුතුවලදී අපි මීටත් වඩා ඉදිරියෙන් ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණේ මේ වාගේ දුෂ්ට කුමන්ත්‍රණකාරීන්ව ගම්වලින් පළවා හරින්න ඉදිරියේදී ජනතාව පෙළ ගැසෙනවාය කියමින් මා නිහඬ වනවා. ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 7.30 වුයෙන් නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2011 ජූනි 08 වන බදාදා අ.භා.1.00 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப.7.30 மணியாகிவிடவே பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2011 யூன் 08, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 7.30 p.m.,* MR. DEPUTY SPEAKER *adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 1.00 p.m. on Wednesday, 08th June, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.